තිසර



# කලියුගය

මාර්ටින් වික්‍රමසිංහ

Scanned by CamScanner

# 1

දස අවුරුද්දකට පෙර තමන් හැර ගිය ලොකු පුතාගෙන් ලැබුණු ලියුමක් නිසා හටගත් සන්තෝෂයෙන් නන්දගේ ශෝකාතුර මුහුණ මදක් එළිය වී ය. එහෙත් ඇගේ කට කොනට නැඟුණු මද සිනාව තමාම සරදමට භාජන කරන අවඥාවක වේශය ගත්තේ ය.

සුළිඟින් නඟින බසින පකුල් අනුව නඟිමින් බසිමින් වැනෙන පාරු, බත්තල් හා සුළුප්පු අතර සිටගත් නැව්, දියෙන් නැඟුණු වාෂ්පයෙන් කඳන් මෙන් නොසැලෙයි. පියන් ඉවත් වුණු නයිපෙට්ටිවලින් පැද්දෙමින් නඟින නයිපෙනා මෙන් දුම් නළවලින් අකැමැත්තෙන් පිට වන කළුදුම් කෙහෙළි හා අඟුරු මඩුවලින් නඟින දූවිලි ද පිසගෙන එන සුළඟ ආශ්වාස කළ නන්ද කිවිසීමට තතනන්නාක් මෙන් නැහැය මදක් හකුළා ගත්තා ය.

කළුගල්වලටත් වඩා බර අඟුරු ගෝනි පෙරළමින් උස්සන මිනිසුන්ගේ දෙතොල් අතරින් ඉඳ හිට විරිත්තෙන සුදු දතුත් ඇස් කෙවෙණි තුළ ගිලුණු සුදු ඇස් ලොඩිත් දකින නන්දට වැදි සන්නිය උදෙසා වෙස්වළාගත් ගැමි යකැදුරාගේ මුහුණ සිහි වී ය. දුම් කබලෙන් නඟින දුම්මල දුම් මෙන් අඟුරු කුඩු ද අහසට නැඟී විසිර අතුරුදහන් වෙයි. අඟුරු ගෝනි උස්සමින් පෙරළන කුලීකාරයෝත් පොල් තෙලෙන් දියකරන ලද දැලි මුහුණෙහි තවරාගෙන වැදි සන්නි නැටුම් නටන ගැමි යකැදුරාත් ජීවන වියදම සපයාගන්නා අදහසින් එක සේ වෙහෙසෙන්නෝ ය.

ගැමි යකැදුරා සිහි කළ නන්දගේ සිතට නැංගේ තමා දැරියකව සිටි කාලය පිළිබඳව සොම්නස් සිතිවිලි ය; අඟුරු ගෝනි සමඟ පොර බදන මිනිසුන් නිසා නැංගේ සිත කලකිරවන හැඟීමකි.

එංගලන්තයේ නැව්තොටවලදී ගිලගත් මහා බඩු පෙට්ටි බත්තල් තුළට වමාරන නැව් තුන හතරක් වරායෙහි නවතන ලද නැව් අතර වී ය. ඒ පෙට්ටි තුළ ඇති විසිතුරු බඩුවලටත් ඒ බඩු හරසරින් පිළිගන්නා නාගරික සමාජයටත් හසුව තමා පමණක් නොව තම සැමියා හා දරුවන් ද වෙනස් වීමෙහි ප්‍රතිඵල සිහි කළ නන්දට සන්තෝෂයක් මෙන් සියුම් සැතක් හදවතෙහි ඇනෙන කලක මෙන් වේදනාවක් ද දැනිණ. මිදුලෙහි වූ අසුනෙන් නැඟුණු ඇ ගෙයි ඇතුළු සැලට පිවිසෙන්ට සිතුවා ය.

"තිස්ස, අපි යමු ද ගේ ඇතුළට ?" යි අසමින් ඇ තම සහෝදරයාගේ මුහුණ බැලුවා ය.



Scanned by CamScanner

තිස්සගේ කට කොන් දෙක දෙකනට ළංවන තරම් දික් වී ය. දත් දැත්දෙහි දෙතිසම දක්වෙන තරම් ඔහුගේ දෙතොල දෙපැත්තට විදුහිණ. සන්තෝෂයෙන් සිනාසුණත් සරදම් කරනු පිණිස සිනාසුණත් ඔහුගේ කට දෙකොන දෙකන් දක්වා දික්වෙයි; දත් දැත්දම දක්වෙන තරම් දෙතොල් විවරය මහත් වෙයි.

ඔහුගේ මේ සිනාව ඇතැම් විට නන්ද කුප්පත්තකි. මෙවැනි සිනාවක් නැඟිය හැකි කටක් ඔහු ලැබුවේ කෙසේ ද? තමාගේත් ඔහුගේත් පියා වූ කයිසාරුවත්තේ මුහන්දිරම් කලාතුරකින් සිනාසුණෙකි. එකවෙක ගැටී සිටි දෙතොල් විදහමින් ඔහු සිනාසුණේ ඉතා කලාතුරකිනි. නොනසින ශෝකයෙන් තවනු ලබන මුහුණක් ඇති මව සිනාසුණ විට කට කොන් පමණක් මඳක් හැකිළිණ. තිස්සගේ සිනාව ඔහුට කෙසේ ලැබුණක් ද? උගැන්මත් කලකිරීමත් නිසා එය ඔහු වෑයමින් පුරුදු කරගත්තක් ද?

තිස්ස නන්දට පිටුපසින් ගමන් කොට සාලයට ඇතුළු වී ය. මුළු සාලය විසිතුරු පාටින් බබළවන බුමුතුරුණු පෑගූ තිස්ස තමා පා තබන්නේ කපු පුළුන් ගොඩකයයි සිතී ය. ඇලන්ගෙන් නන්දට ලැබුණු ලියුම පළමුව කියවා අනතුරුව සිංහලයට නැඟුවේ තිස්සයි. පිටු සියයකට අඩු නොවන ඒ ඉංගිරිසි ලියුමෙන් ඇලන් තම මවුපියන්ගේ චරිත මෙන් තමාගේ චරිතය ද නිර්දය ලෙස විවේචනය කරන්නේ කෝපයට වැඩි ශෝකයකින් පහරනු ලැබූ හද ඇත්තකු ලෙසිනි. ඒ දිග ලියුම කියවා හොඳින් තේරුම් ගැනුමට තරම් ඉංගිරිසි දැනුමක් නන්දට නොවී ය.

තිස්ස ඇලන්ගේ ලියුම කියවා වචනයකුදු නැර සිංහලයට නැඟුවේ අසන්තෝෂයෙන් වත් ශෝකයෙන් වත් නොවේ. සන්තෝෂයෙන් ද නොවේ. දැඩි උදාසීනත්වයකින් ජීවිතය සලකන්නකු ලෙසිනි.

පියල් හා නන්ද ගම හැරදමා මීට අවුරුදු බොහෝ ගණනකට පෙර නගරයට සංක්‍රමණය වූහ. ඉහළ සමාජයේ ගැනුන් හා පිරිමින් ඇසුරු කරන්ට වූ නන්ද, ඉංගිරිසි පොත් කියවීමෙහි නොව කතාවෙහි ශූර ගුරුවරියකගෙන් දැවුරුද්දක් පමණ ඉංගිරිසි බස උගත්තා ය. ඈ ඉංගිරිසිය උගත්තේ සමාජ වහරක් උගන්නක ලෙසිනි. ඇලන් රාජකීය විද්‍යාලයෙහි බාලාංශයෙහි උගන්නා කාලයෙහි සිට නන්ද පියල් හා ද පියල් නන්ද හා ද කතාබහ කෙළේ ඉංගිරිසියෙනි.

තිස්සගේ ඇනුම්පදය අසා රොස්වූ නන්ද ඔහුට නින්දා කරන අදහසින් දෙස් නැඟුවා ය; ගෙදරදී සිංහලයෙන් කතාබහ කිරීම ඇලන්ගේ ඉංගිරිසි උගැන්මට බාධාවකි. දරුවන් සමඟ ඉංගිරිසියෙන් කතා කරන්නයයි ගුරුවරයෝ පියල්ටත් මටත් නිතර කියති

Scanned by CamScanner

ඇලන් ඉගෙනීමෙහි ශූරයකු වූයේ ගෙදරදී ඉංගිරිසි බස වහරන්ට වූ නිසායයි ඇලන්ගේ ගුරුවරයා කී ය. ඇලන් හැම අවුරුද්දේම පන්තියේ පළමුවැනියා වී තෑගි ලැබුවේ ය.

නන්දගේ මේ වදන් ඇසූ තිස්ස සිනාසුණේ ය.

"ඔව් ගෙදරදී මවුපියන් කැඩීච්ච ඉංගිරිසියෙන් කතාබහ කරන නිසා තමයි ඇලන් උගැන්මෙහි සමර්තයෙක් උණේ."

මවුපියන්ට අකීකරු වී ලංකාව හැර ගිය ඇලන් දස අවුරුද්දකට පසු එවූ දිග ලියුම නන්ද වටහාගත්තේ තිස්ස ලවා සිංහලයට නැඟීමෙනි.

"My dearest Mammie" යනු විසින් පටන්ගන්නා ලද ඇලන්ගේ ලියුමේ ඒ ඇමතුම් වචන ඒ විදියෙන්ම කියූ තිස්ස අනතුරුව ලියුම සිංහලයට නැඟුවේ ය. නන්ද පුටුවෙන් නඟින්ට වෑයම් කිරීමෙන් ඇගේ සිත කය දෙක දමනය කරගත්තා ය.

"මම තිසාට කිව්වේ ලියුම සිංහලෙන් කියන්නයි. ඇලන්ගේ ඒ ඇමතුම් පදය සිංහලෙන් කියන්න බැරිද?" යි නන්ද තිස්සගේ මුහුණ නොබලාම තෙපලා ය. "ඒ ඇමතුම නොකිව්වත් පාඩුවක් තියෙනවා ය."

"ඒ ඉංගිරිසි ඇමතුම සිංහලට නඟන්න බැහැ" යි තිස්ස ලියුමෙහි නෙත් රඳවාගත් වනම පිළිතුරු දුන්නේ ය.

" 'ඉතා ආදරවන්ත මෑණියනි', යි ඒක සිංහලට නඟන්න බැරිය."

"නන්ද මට වැඩිය ඉංගිරිසියි, සිංහලයි, දෙකම දන්නව නෙව! මෙන්න—එහෙනම් ලියුම අරගෙන කියවා තේරුම් ගන්න"යි කියමින් තිස්ස, ලියුම නන්ද දෙසට දික් කෙළේ ය. තමාගේ කටට නඟින්ට ආ සුපුරුදු සිනාව මැඩ ගන්ට වෑයම් කළ තිස්සගේ මුහුණ සාව ඥ වේශයක් ගත්තේ ය.

නන්ද තිස්සගේ ගති දනියි. ඔහුගේ ඇනුම්පද අසා පුරුදු ඈ කෝප නොවූවා ය.

තිස්සගේ ඇනුම් පද නොඉවසන පියල් 'පිස්සා'යි කියමින් ඔහු තම සිතින් බැහැර කරයි. තිස්ස පිස්සකු නොව හොඳ සිහියක් හා හිසක් ඇති මිනිසකු ලෙස පියල් දනියි. ඔහු කියන දේ ඇනුම්පද ලෙස නොව කාරුණික වදන් ලෙස ඔහුගේ කටින් පිටවනොත් පියල් ඊට කන්දෙයි. නන්ද කෝප කරන්ට අකැමැති නිසා පියල් තිස්සට පිස්සායයි බැණ නොවදියි. ඔහු 'පිස්සා'යි සිතමින් තිස්ස තම සිතින් බැහැර කිරීමෙන් තම කෝපය ද පිට කරයි.

ඇලන්ගේ ලියුම කියවූ තිස්සට තමාගේත් නන්දගේත් අතීතය සිහි වී ය. ගරාවැටුණු මහගෙදර වූයේ පරණ කබල් පුටු, කනප්පු හා

මේස ය. ගෝනි පඩංගුවෙන් මහන ලද කුලිච්චමෙන් හා පැදුරෙන් ද වැසුණු ලනු ඇඳවල් එහි හැම කාමරයකම වී ය. කොග්ගල මහගෙදර නන්දත් තමාත් දැන් වෙසෙන ගෙදර හා සසඳන්ට තිස්සට සිතුණේ කුමක් නිසාදැයි ඔහු නොදනියි. එහෙත් මේ සැසඳීම නිසා නන්දගේ නගර ජීවිතයෙහි ඇතැම් කරුණු ඔහුගේ සිතට නැංගේ ය. ඉගෙනීමෙහි ඉතා ශූරයකු වූ ඇලන් ඉගෙනීම හැරදමා රටින් පිටවී ගියේ කුමක් නිසා ද? මවුපියන්ගේ වරදින් ද? ඇලන්ගේම වරදින් ද? ඇතැම් අවස්ථාවක දී දරුවන් මවුපියන් ගෙන් වෙන්වීම නගර ජීවිතයෙහි අංගයක් ද? මේ එකකට වත් පිළිතුරු සපයන්ට තිස්ස වැයම් නොකෙළේ ය.

අමුත්තන් පිළිගනු සඳහා ඉස්සුණු දත් වැනි ඇඳි සහිත පුටු හා සැටිත්, සුවඳ නහන මල් සහිත බඳුන් ගත් කනප්පුත් සුව පහසු පතන හැඟීමක් තිස්ස තුළ නොදනවයි. සාලය දෙසට පිවිසෙන නාලිකා දෙස බැලූ තිස්ස මෙසේ කී ය:

''නාලිකාත් එන්න—ඇලන් එවාපු ලියුම මම සිංහලෙන් තව සැරයක් කියවන්ටයි හදන්නේ. ඇවිත් අහගෙන ඉන්න.''

''තිස්ස මාමාගේ ඇනුම්පද අහගෙන ඉන්න මට බැහැ''යි කියමින් නාලිකා සිනාසුණා ය.

''ඇලන් ලියුම එවා තියෙන්නේ මට. නාලිකා ඒක කියවනවා අහගෙන ඉන්නේ කුමට ද?''යි නන්ද ප්‍රශ්න කළා ය.

''නෑ මෙී. මම ආවේ ඇලන් අය්යාගේ ලියුම කියවනවා අහ-ගෙන ඉන්න නෙවී.''යි පවසමින් නාලිකා තිස්සට සරදම් කරමින් සාලය මැදින් ගොස් ඉස්තෝප්පුවට පිවිසියා ය.

''පුතා අම්මට එවාපු ලියුම මම කියවන එකත් හරි නෑ නෙව''යි කියමින් තිස්ස සිනාසුණේ ය. ''නාලිකා එන්න—අම්මාගෙත් තාත්තගෙත් මනස්ගාත කපා හරින සැර කාරම් වගේ කියුම් ඇලන්ගේ ලියුමේ තියෙනවා. මේක ලියුමක් නෙවි පොතක්. මේ ලියුමේ නම් ගම් වෙනස් කරලා පොතක් වශයෙන් අච්චුගස්සන්නයි මම හිතාගෙන ඉන්නේ.''

''ලියුමේ තියෙන ඒවා තිස්ස මාමා මට පස්සේ කියන්න.''

නාලිකා උපන් විට කිරි කට ගා අවුරුද්දක් පමණ ගෙවෙන තෙක් කවා, පොවා, නාවා ඇතිදැඩි කරන ලද්දේ සාත්තුසේවිකාවක විසිනි. ගෙදරට ගෙන්වනු ලැබූ ගුරුවරියක් ඈ කුඩා කල ඇට ඉංගිරිසි බස ඉගැන්නුවා ය. ඈ පාසැලෙහිදී ඉංගිරිසිය හා ලතින් බස හොඳින් උගත්තා ය. නාලිකා ඇගේ සහෝදරයන් දෙදෙනා මෙන් මවුපියන්ට පටහැණිව ක්‍රියා නොකළා ය.

Scanned by CamScanner

ඈ මිදුලට බැස තාප්පය දෙරටුවට ගොස් පාර දෙපැත්ත බැලු-වා ය. තමා බලාපොරොත්තු වූ යෙහෙළිය මඟ එනු දුටු ඈ සිනාසුණා ය.

''වහින්න එන හැඩ යි; අද මුහුදු වෙරළේ ඇවිදින්න යන්න ලැබෙන්නේ නෑ'' යි තාප්ප දෙරටුවෙන් මිදුලට ඇතුළු වුණු යෙහෙළිය කීවා ය.

ළඟ එන රැයෙන් කලින් වෙන්ව දිවෙන අඳුරු පොදි මෙන් කළුවලා අහසෙහි පාවෙයි. වරායෙන් හා දියකාඩනයෙන් ඈත සක්වළගල බැස යන හිරුගේ රැස් වැදීමෙන් රතට හුරු රන් පාටින් බබළයි. ඒ සුන්දර දැක්ම වහ වහා අතුරුදහන් වනු බලා සිටි නාලිකාත් යෙහෙළියත් ගොස් ඉස්තෝප්පුවට ගොඩවැදුණෝ ය.

''යමු කාමරේට''

ඔවුන් දෙදෙනා සාලය මැදින් ආපසු යනු දුටු තිස්ස 'එන්න නාලිකා' යි යළිත් කීවේ ය.

Scanned by CamScanner

# 2

මා මේ ලියුම ඔබට ලියන්නේ ඉතා ශෝක ජනක සිතිවිලි වලිනුත් මගේ ජීවිතය මටම තිත්ත කරවන හැඟීම්වලිනුත් පහරනු ලබන අපරාධ කාරයකු ලෙසිනි. මම අපරාධ කළ එකෙක්මි'යි මා හඟින්නේ ඔබටත් පියාටත් අකීකරුව කළ කී දේ නිසාම නොවේ. ඔබටත් පියාටත් අකීකරුව කළ කී සමහර දේ ගැන මම මහත් ශෝකයෙන් පසුතැවෙමි. හිතුවක්කාර කම් කිරීමට මා එලවන ලද්දේ තාත්තාගේත් ඔබගේත් ගතානුගතිකත්වයත් ඔබ හිස උදුම්මා ගෙන කළ කී දේත් විසිනි. මම අපරාධ කාරයෙක්මි'යි යන හැඟීමෙන් මගේ හද වඩාත් පෙළෙන්නේ මා අතින් මගේ ප්‍රියතම අයිරින්ට සිදුවුණු වැරැදි මට අමතක නොවන බැවිනි. ඒ වැරැදි මගෙන් සිදුවූයේ මගේ අගහිඟ නිසා ය.

ඉගෙනීම සම්පූර්ණ කොට රක්සාවක් ලබාගෙන අයිරින් කසාද බැඳගැනීමට ය මා අදහස් කෙළේ. ඊට ඉඩ නොදී මා ලංකාවෙන් පැන්නුවේ ඔබත් තාත්තාත් විසිනි. අයිරින් නිසා හටගත් ආලයෙන් මා විනාශ වෙතියි යන හැඟීමෙන් ඔබ දෙදෙනාම ක්‍රියා කෙළේ කුමක් නිසාදැයි දැනුදු මට නොවැටහේ.

මීට මසකට පෙර අයිරින් මෙහි ඉස්පිරිතාලයකදී මළා ය. ඈ මළේ මගේ සුව පහසුව මිස තමා ගැන නොතකා, නොසිතා, මා උදෙසා වෙහෙස මහන්සි වීමෙන් හටගත් ආබාධයකිනි. අයිරින් සමඟ ලංකාවෙන් පිටවී මෙහි පැමිණි මම නියම රක්සාවක් නොලැබ අගහිඟවලින් මිරිකෙමින් දුක සේ ජීවත් වූයෙමි. එදිනෙදා ලැබුණු වැඩක් කොට මා සැපයූ මුදල අප දෙදෙනාගේ ජීවිකාවට තරම් නොවූ ආදායමකි. අයිරින් හෝටලයක රක්සාවක් ලබා ගෙන උදේ සිට හවස් වන තෙක් දසියක මෙන් වෙහෙසෙමින් සේවය කොට යන්තම් අපට පණකෙන්ද රැකගෙන ජීවත් විය හැකි තරම් මුදලක් සතිපතා ලබාගත්තා ය.

ඈ ගෙදරැවිත් මගේ සුව පහසුව උදෙසා වෙහෙසෙමින් ගෙදර වැඩ ද කළා ය. මෙහි වැඩකාරයෝ සුලභ නොවෙත්. වැඩකාරයකුගෙන් වැඩ ගැනීම සඳහා අප සපයන මුදලටත් වැඩි තරම් මුදලක් වියදම් කළ යුතු ය. අපි දෙදෙනා ගෙදර සියලු වැඩපල කරමින් දුකසේ වුව ද සන්තෝෂයෙන් ජීවත් වූයෙමු. මට වැඩ කරන්ට ඉඩ නොතබා අයිරින් හැම වැඩක්ම වෙහෙස නොතකා කළා ය. ඉවුම් පිසුම් කළ ඈ සීත හා වෙහෙස නොතකා කෑමට

බීමට උවමනා දේ ගැනීමට ගෙයින් පිට ගියා ය. අපට තිබුණේ ඇඳුම් කිහිපයක් පමණි. අයිරින් ඇගේ ඇඳුම් පමණක් නොව මගේ ඇඳුම් ද සේදුවා ය. මා මගේ ඇඳුම් සෝදන්ට තැත් කළ විට ඈ ඊට ඉඩ නුදුන්නා ය.

අප මෙහි පැමිණ හමසක් ගත වූ තැන් සිට මා ජීවත් වූයේ අවුල් වුණු හිසක් ඇත්තකු ලෙසිනි. හොඳ රක්සාවක් සොයා ගැනීමට මා කළ හැම උත්සාහයක් ව්‍යාර්ථවීම මගේ සිත අවුල් වීමට හේතු වුණු පළමු වන කාරණය වී ය. ලංකාවෙහිද මට මගේ උගැන්ම සම්පූර්ණ කරන්ට ඉඩ ලැබුණා නම් මෙහිදී වුව ද වැඩි පඩි ලැබෙන රක්සාවක් ලබා ගැනීම පහසු ය. මා උගත්තේ ඉංජිනේරු විබාග-යෙන් ජය ගන්නා අදහසිනි. කවර රටක මිනිසකු වුව ද ඉංජිනේරු-වකුට මෙහි විශාල වැටුපක් ගෙවනු ලැබේ. මේ කරුණු සිහිකළ මම ඇතැම් විටක ඔබටත් තාත්තාටත් තරයේ දෙස් නැඟුවෙමි.

'මවුපියන් ඔබට නොසලකා හැරියේ මා නිසා'යි අයිරින් කීවා ය. 'සමස්ත ශාස්ත්‍ර ශාලාවේ උගත් ඔබට අවසාන විබාග-යෙන් සමත්ව උපාධිය ලබාගැනීමට ඉඩ නුදුන්නේ මම. මා ඔබගේ සිත් නොගත්තා නම් ඔබට විබාගෙන් සමර්ථව හොඳ රක්සාවක් ලබා ගෙන මවුපියන් ගේ දේපල පමණක් නොව ඔවුන්ගේ වැඩි මනත් උපකාර හා සැලකිලි ද ඇතිව සුව සේ ජීවත්-වෙන්ට තිබුණා.'

'මට ඔවුන්ගේ දේපල උවමනා නැ'යි නොසන්සුන්ව තරහ-යෙන් සිටි මම කීවෙමි. 'ඔවුන් මා සමඟ කෝපවූයේ ඔබ නිසා නොව ඔවුන්ගේත් මගේත් වරදිනි. මට ආලය නොකොට කන්තෝරුවක සුළු පඩියකට වැඩ කරන ලියන්නකුට ආලය බැඳ ගත්තත් ඔබට එපත් ලෙස සුව සේ ජීවත්වෙන්ට තිබුණා. ඔබ මෙතරම් දුර රටකට ගෙනැවිත් අතරමං කෙළේ මා විසිනි......'

අයිරින් අසන්තෝෂයෙන් මගේ කථාව නවත්තන්ට වෑයම් කළා ය. ඇගේ අසන්තෝෂයට යටින් වූයේ මා නිසා උපන් ඇල්මයි. ඒ ඇල්ම නිසා ඇගේ දෙනෙතට කඳුළු ඉනුවේ ය. අප දෙදෙනා පසුගිය දේ ගැන මේ කතා බහ කෙළේ එක් සීත ඉර්තුවක සවස් කාලයෙහි ය. විදුලි පහන යට පුටුවක හිඳගත් අයිරින්ගේ ශෝකාකුල මුහුණ, මා සැනසූ අතර ඇගේ අනාථ භාවය පිළිබඳ වේදනා සහගත මගේ හැඟීම දියුණු කෙළේ ය.

සීත වළක්වාගැනීමට වුවමනා තරම් වූල් ඇඳුම්, අගහිඟවලින් මිරිකෙමින් ජීවත් වූ, අප සතු නොවී ය. අයිරින් කතා කෙළේ සීතෙන් ගැහෙමිනි. අපි දෙදෙනා ළංව එකිනෙකා බද අල්ලාගෙන සිටීමෙන් සීත මඳක් වළකාගන්ට වෑයම් කෙළෙමු.

Scanned by CamScanner

'ඇලන් කුමක් කීවත් සිතුවත් ඔබගේ උගැන්මට බාධා කෙළේ මා බව මට මතක නැති කරන්ට බැහැ'යි අයිරින් කීවා ය. 'ඔබ කොතරම් සූර ලෙස ඉගෙන ගත්තා ද? මගේ ආලය නිසා ඔබ ඔබගේ උගැන්ම හැරදමතියි මම සිහිනෙන්වත් සිතුවේ නැ'

'මම ඉගෙනීම හැරදැමුවේ අයිරින්ට හටගත් ආලය නිසා නොවේ. මවුපියන් නිසා හටගත් කෝපයෙන් මම ඉගෙනීම හැරදැම්මා'

'ඔබගේ මවුපියන් නිදෙස් යයි මම කියන්නේ නැ; ඔවුන්ට කිසිම චෝදනාවක් කරන්නෙත් නැ. හැම පන්තියේදී ම පළමු වන තෑග්ග දිනාගන්ට තරම් ඉගෙනීමෙහි සූරයකු වූ ඔබ ඉගෙනීම අතපසු කෙළේ මා නිසා. අම්මාත් තාත්තාත් වඩාම කෝප-වෙන්ට ඇත්තේ ඒ නිසායි' කියමින් අයිරින් ඇගේ ලියුම් ගොඩ ඇවිස්සුවා ය. මා උගන්නා කාලයේ යැවූ ලියුමක් සොයාගත් ඇ එය දිග හැර කියවූවා ය. ඇගේ කට කොනට සිනා නඟිනු මම බලා සිටියෙමි.

'ඔබ මේ ලියුමේ ලියා තිබෙන වගන්තියකින් ම මගේ කීම ඇත්ත බව එළිවෙනවා'යි කියමින් අයිරින් ලියුම මා අතට දුන්නා ය.

'නැයි' මම තරහයෙන් කියමින් ලියුම අතට ගත්තෙමි. මගේ ස්මරණ ශක්තියට නොදෙවැනි ශක්තියක් අයිරින්ට වී ය. ඈ කියවූ ලියුම්වල ඇතුළත් කරුණු පමණක් නොව ඔබත් තාත්තාත් කියන ලදැයි ඇසූ පුවත් පවා ඇට මතක ය. කිසිවකුගේ සිත් රිදවීම අයිරින්ට නම් තමාගේ ඇඟෙන් ඇටයක් උදුරා හැරීම මෙන් අමාරු කාරියකි. එය ඇගේ දුර්වල කමක් බව මට වැටහෙන්නේ දැන් ය. ඈ මා සමඟ එංගලන්තයට එන්ට කැමැති වූයේ මගේ සිත රිද්දන්ට නොහැකි නිසා මිස එහි විපාක නොසිතිය හැකිවූ නිසා නොවේ. ඔබත් තාත්තාත් නැඟූ ඇතැම් නොමනා දොෂාරෝපණ අයිරින් දනියි. එහෙත් ඒ කිසිවක් නිසා ඈ වචනයකින්වත් මගේ පමණක් නොව ඔබගේත් තාත්තාගේත් වුව ද සිත් රිද්දන්ට කැමැති නොවී ය.

මවුපියන් කෝප වූයේ මා අයිරින්ට ආලය බැඳගත් නිසායයි ඇට කීම වරදක්යයි මම සිතුවෙමි. මගේ කටින් වචනයකුදු පිට නොවී ය. මගේ සිතට කෝපයක් නැංගේ මවුපියන් නිසා හටගත් අසන්තෝෂයකින් නොව, මගේ ඉක්මන් කමත් ලංකාවෙන් පිටවී යන්ට සිතීමත් මගේ දුර්වල කම් ලෙස මට වැටහුණු බැවිනි.

අම්මාත් තාත්තාත් කොතෙක් අසන්තෝෂ වුවත් කිපුණත් චන්ද්‍රසෝම ඒ කාලයේ තමා හිතු කාරියක් කෙළේ ය. යන ගමනක් ගියේ ය. එහෙත් ඔහු වෙන ද මෙන් ගෙදර ආවේ ය. කිසි වරදක් නොකළ එකකු මෙන් අම්මාත් තාත්තාත් සමඟ කතා-බහ කෙළේ ය. මා චන්ද්‍රසෝම අනුගමනය නොකෙළේ කුමක්

නිසාදැයි මම ඇතැම් විටක මගෙන්ම ප්‍රශ්න කෙළෙමි. තාත්තාටත් අම්මාටත් ඕනෑ එකක් කියන්ට හැර හිතුණ දෙයක් කළා නම් උපාධියක් ලබාගෙන රස්සාවක් කරමින් අයිරින් ද කසාද බැඳගෙන මට ලංකාවේම ඉන්ට තිබුණා.

මා පිළිතුරු නොදී කරබාගත්තේ මවුපියන් නිසා හටගත් කෝපයත් කලකිරීමත් මැඩගන්ට වෑයම් කරන නිසායයි කල්පනා කළ අයිරින් මෙසේ කීවා ය.

'කාටවත් දෙස් නැඟීමෙන් පලක් නෑ ඇලන්. අමාරුවෙන් උණත් අපට මෙහි සන්තෝසෙන් ජීවත්වන්ට පුළුවනි. ඔබ උපන්නේ ගමේ. ඔබ සිතන්නේ නාගරයේ ඉපිද වැඩුණු උගත් තරුණයකු ලෙස.'

'මම උපන්නේ ගමේ නෙවි' යි මම තරහයෙන් කීවෙමි.

'උපන්නෙත් හැදුණෙත් කොළඹ' යි කියමින් අයිරින් සිනා-සුණා ය. 'ඔබගේ මවුපියන් සිතන්නේ ඔබ සිතන ලෙස නෙවි. ඔවුන් ගමේ ඉපිද එහිම ඇති දැඩි උණා. නාගරයට ඇවිත් පදිංචි උණු පසු නාගරයේ මිනිසුන් ආශ්‍රයෙන් ලැබූ ආසා, සිතුම් හා පැතුම් ඔවුන්ගේ දෙවැනි ගතිය උණා. ඔබ ඔවුන්ට කිපෙන්නේ ඔබගේ ගතිය අනුව සිතන නිසා. ඔවුන්ගේ දුෂ්කරතා ඔබට වටහාගැනීම ලේසි නෑ.'

'අයිරින් ඉපිද වැඩුණේ නාගරයේ. මට වඩා ඔබ මගේ මවු-පියන් හඳුනනවා ය කියන්නේ කුමක් නිසා ද? මවුපියන්ට දෙස් නගනු වළක්වන පිණිස ඔබ කොඳු කඩන්නාක් මෙන් තර්ක කරනවා.'

'නෑ.' යි අයිරින් මඳක් අසන්තෝෂයෙන් තෙපලා ය. 'මා උපන්නේ කොළඹ නොවේ: දෙනිපිටියේ. දස අවුරුදු වයස තෙක් මා වැඩිපුර ජීවත් වූයේ එහිමයි.'

'අයිරින් කියන සමහර කරුණු මට වැටහෙනවා' යි මම අසන්තෝෂයෙන්ම කීවෙමි. මා මගේ මවුපියන්ගේ ගති නොදැන ක්‍රියා කළ එකෙකියි මගේ සොඳුර වුව ද චෝදනා කරනු ඇසීමට මම කැමැති නොවෙමි. අයිරින් වහා නොකිපෙයි; වහා සන්තෝෂ නොවෙයි; අනිකකු කියන දේ එකවර විශ්වාස නොකරයි. අයිරින් මගේ දුර්වල තැන දකින්නේ මේ ගතිය නිසා මිස හොඳ දැනුමක් හා වැටහෙන නුවණක් ලැබූ නිසා නොවේ.

'අවුරුදු විස්සකටත් වඩා කොළඹ ජීවත්වූ මගේ මවුපියන්ට මා කියන කරන දේ සලකාගන්ට බැරිවීමට කරුණක් නැත. ඔවුන් සිතුවේ ගමේ ගති අනුව නොවේ. ආත්මාර්ථකාමීන් ලෙස. මම අයිරින්ට ආලය කරන්ට පටන් ගත්තේ ඉක්මනින් කසාද බඳින අදහසින් නොවේ. ඔබ ඒක දන්නවා. උපාධි ලබාගෙන තවත්

අවුරුදු දෙකක් තුනක් ගිය පසුයි අපි කසාද බඳින්න කතා කරගෙන සිටියේ. මවුපියන්ගෙන් මුදල් ඉල්ලාගෙන ඔබ කසාද බඳින්වත් ඔවුන්ගෙන් ඉල්ලාගන්නා මුදලින් ජීවත්වෙන්ටත් මම කවදාවත් සිතුවේ නැත. මගේ අදහස් තාත්තාටත් අම්මාටත් තේරුම් ගන්ට බැරි උණා. මම තාත්තාට කරදර කොට මුදල් ලබාගෙන ඒ මුදලින් අයිරින් කසාද බැඳගෙන තාත්තා හම්බ කරන මුදලෙන්ම ජීවත් වෙන්ට අදහස් කරගෙන සිටින නිවට මිනිහෙක් ය කියා අම්මාත් තාත්තාත් දෙන්නාම සිතාගෙන ඉන්ට ඇත. ඔවුන් එහෙම හිතන්ට ඇත්තේ මම අන් ජාතික තරුණියකට ආලය කරන නිසා මවුපියන් පිළිබඳ ඇල්ම නැතිවේ ය යන අදහසින්; මේ අදහස ඔවුන්ගේ සිතට නැංගේ ගමේ ගති නිසා නෙව්.........'

'ඇලන්ට ඉගැන්වීමටත් සැප පහසු කම් සැලසීමටත් වියදම් කෙළේ තාත්තාත් අම්මාත් දෙදෙනා. ඒ නිසා ඇලන් ඔවුන්ගේ අදහස්වලටත් හැඟීම් වලටත් ගරු කරනු ඇතැයි ඔවුන් බලාපොරොත්තු වෙන්ට ඇත. ඒක වැරදි ද?'

'අපේ තාත්තා දුප්පත් මිනිහෙක් නෙව්. අමාරුවෙන් මුදල් සපයමින් ළමයින්ට ඉගැන්වීම උදෙසා ආත්ම පරිත්‍යාගයක් කළ කෙනෙක් ද නොවේ. ඔහුට අවුරුද්දකට හැටහත්තෑ දහසක ආදායමක් ලැබෙනවා. මගේ උගැන්ම සඳහා වියදම් කිරීම මා රක්සාවක් කරන තුරු මට කන්ට අඳින්ට දීම වැනි ඔවුන් සතු යුතු කමක්. අම්මාත් තාත්තාත් දෙන්නාම අමාරුවෙන් මුදල් සපයමින් අගහිඟ නිසා දුක් පීඩා විඳගෙන මට ඉගැන්වීමට වෙහෙසුණා නම් ඔවුන්ගේ සිතැඟි සිදු කිරීම සඳහා ආත්ම පරිත්‍යාගයක් කිරීම මගේ යුතු කමක්......'

'ඇලන් කතා කරන්නේ තමා කළ හැම දේ හරියයි සිතන නිසා නොව හැම දේ හරියයි ඔප්පු කරන ආසා වෙන්' යි අයිරින් තෙපලා ය. ඈ මගේ මුහුණෙහි රඳවාගත් දෙඇස ඉවතට නොගත්තාය. මා නිසා හටගත් ඇල්ම ඇගේ හදින් නැඟී ඇසින් පිටව මගේ හදට පිවිසීමට වෑයම් කරන ගුප්ත එළියක් ලෙස මට හැඟිණ.

'ඔබගේ මවුපියන් දුක සේ ජීවත් වෙමින් ඔබට ඉගැන්වීමට ඉතා අමාරුවෙන් වියදම් කළ දිළින්දන් උණත් ඔබ ක්‍රියා කරන්නේ මීට වෙනස් විදියකින් නොවේ. ඔබගේ මවුපියන් දුක සේ ජීවත්වන දිළින්දන් උණා නම් ඔබ ඔබගේ ආදරය ඉවත දමා ඔවුන්ට කීකරු වෙනවා ද?'

'නෑ' යි මම තරහයෙන් කීවෙමි. 'මගේ තර්කය එය නො වේ. මගේ මවුපියන් දිළින්දන් උණා නම් මම කවදාවත් ඔබත් සමඟ එංගලන්තෙට එන්නේ නෑ. ලංකාවේම ඉඳගෙන වෙහෙස මහන්සි වී මුදල් සපයමින් ඔබටත් මවුපියන්ටත් සලකනවා.'

අයිරින් සිනාසුණා ය.

'දූන් මවුපියන්ට සලකන්ට බැරි මන්ද? එහෙනම් ඔවුන් නිසා දූන් කෝප වෙන්නේ කුමට ද? ඔවුන් වස්තුවෙන් දිළිඳු නොවූවත් සිතින් දිළින්දන් ලෙස සලකා ඔවුන් ආදරයෙන් හා කරුණාවෙන් සිහි කරන්ට බැරි මන්ද?'

'ඔවුන් ක්‍රියා කෙළේ සිතින් දිළින්දන් ලෙස නොවේ. නරක මිනිහෙක් හැර අනික් කිසිවෙක් සිතින් දිළින්දෙක් නොවේ. මිනිහෙක් බුද්ධියෙන් හා දැනුමෙන් දිළින්දෙක් වෙන්ට පුළුවනි. හොඳ මිනිහෙක් හැඟීමෙන්, කරුණාවෙන් දයාවෙන් දිළින්දෙක් වෙන්නේ නෑ. ඔවුන් අප දෙදෙනා ඔවුනොවුන්ට ආලය කරනු නොඉවසුවේ බොරු මානයත්, ඊර්ෂ්‍යාවත්, අහංකාරකමත් නිසා අයිරින්...........'

අනතුරුව කටට ආ වචන මම ගිලගත්තෙමි. ඒ වචන අයිරින් ඉදිරියෙහි වැමෑරීම නොමනායයි මට හැඟිණ. මා කුමක් කීවත් ඈ අසන්තෝෂ නොවන බව ද මම දනිමි. කිසිවක් නිසා වහා කෝප නොවීම අයිරින්ගේ ගතිවලින් ඉතා හොඳ ගතියයි.

'මවුපියන් පිළිබඳ ඔබගේ ඇතැම් විනිශ්චයක් සම්පූර්ණයෙන්ම වැරදි' යයි කියමින් අයිරින් මගේ අත ගෙන මිරිකුවා ය. 'මම ලන්සි ජාතියට අයත් නිසා ඔබගේ මවුපියන් විරුද්ධ වුණේ බොරු මානයවත් අහංකාර කමවත් නිසා නොවේ. මගේ අම්මාත් තාත්තාත් දුක සේ ජීවත් වන්නන් බව ඔබ දන්නවා. ඔබ විශාල ධනවතකුගේ පුතකු වුවත් ඔබ කසාද බඳිනවාට මගේ තාත්තා විරුද්ධ උණා. මගේ තාත්තාට ඇති බොරු මානයක් නැහැ. තාත්තා කොහෙත්ම අහංකාරත් නැහැ. ඔබ මට ආලය බැඳගත්තේ මගේ දිළිඳුකමට අනුකම්පාවෙන් නොවේ. මවුපියන් ගැන සිතන විට දරුවන්, ඔවුන්ගේ මානය හා අහංකාරකම් ගැන සිතීම හරියයි මට නම් වැටහෙන්නේ නෑ.'

අයිරින් නැඟිට ගොස් මේතලය උඩුනොහි තබා විදුලි ඇනය පාත් කළා ය.

'ඔබගේ මවුපියන් දිළින්දන් උණා නම් ඔබ මාත් සමඟ මෙහි එන්නේ නැයි කීවා නොවද?' යි අසමින් අයිරින් සරදම් සිනාවක් පහළ කළා ය. 'මෙහි නෑන්නේ මවුපියන්ට ඇති ආදරයකින් නොවේ. ඔබ මාත් සමඟ ලංකාවෙන් පිට උණේ ඔබගේ මවුපියන් ලොකු ධනවතුන් වූ නිසා. ඔවුන්ටත් ඔවුන්ගේ නෑයන්ටත් මිතුරන්ටත් පෙනි පෙනී දිළින්දන් ලෙස එහි ජීවත්වීම අප දෙන්නාටම අමාරු කාරියක් උණා! අපි මවුපියන්ට දෙස් කියන්නේ කුමටද?

Scanned by CamScanner

කේතලයෙහි වතුර 'ගොර ගොර' හඬින් නටයි. කේතල කෙමියෙන් පිට වන්ට එන දුම, කෙමිය කට ළඟදීම වාෂ්පයට හැරී විසිර වැටීමෙන් උදුනෙහි කොනක් තෙමෙයි.

'සීනි නෑ' යි කියමින් අයිරින් දුම් නඟන තේ කෝප්පයක් මා අතට දුන්නා ය. ඈ තවත් තේ කෝප්පයක් ගෙන ඇවිත් මා ළඟින් වාඩිවූවා ය.

අප වැඩිපුර තේ බිව්වේ සීනි නැතිවයි. සීනි නැතිව තේ බොන්ට අප පුරුදු වුණේ එයින් වැඩි රසක් වින්ද නිසා නොව සීනි ගැනීමට නිතර මුදල් වියදම් කළ නොහැකි වූ හෙයිනි. ඇඟ උණුසුම් කර ගැනීමටත් සිත කය පුබුදුවා ගැනීමටත් අපි දවසකට හතර පස් වරක් තේ බොන්ට පුරුදු වීමු. සීනි දැමූ තේ බොන්ට පටන් ගතහොත් අපගේ වියදම අපට උහුලන්ට බැරි සේ වැඩි වෙයි.

සීත ඉර්තුවෙහි දහවල් කාලයෙහි පවා අප ජීවත් වූයේ හිරු එළි-යෙන් එළිය වූ ලොවක නොවේ; දවාලත් රැයත් එක සේ දැඩි අඳු-රෙන් වසාගත්තා ලෝකයකයි. එහෙත් අපට අඳුරක් නොදැනිණ. ඔවුනොවුන් නිසා උපන් දැඩි ආදරය අපගේ හද මැඳුරු පමණක් නොව අපිස් ලෙස ජීවත් වූ අපගේ කාමර මැඳුර ද එළිය කෙළේ ය. අම්මාත් තාත්තාත් සිහි වූවිට මම ශෝක වීමි. ඇතැම් විටක මගේ සිතට නැඟුණු තරහත් අමනාපයත් මගේ දිවට ද දැනෙන තරම් කටුක වී ය. එවැනි හැඟීම් මගේ සිතින් පළවාහැරියේ අයිරින් විසිනි.

රෝගාතුරව මියෙන තෙක්ම අයිරින් මට දැක්වූ ආදරය මට කිසි කලක මතක නැති කළ හැකි නොවේ. ඈත් සමඟ ලංකාවෙන් පිටවී එන විට පවා 'සමහර විට අප දෙදෙනා අතර වාද භේද ඇති විය හැකි ය' යන හැඟීම මගේ සිතට නැංගේ ය. මරණය තෙක් අයිරින් හා මා ද ජීවත් වූයේ එක්කෙනකු ලෙස ය. අප දෙදෙනාට අමනාපවන්ට භේද වන්ට, තරහ වන්ට හේතු වන කිසිවක් සිදු නොවී ය. එවැනි බැඳුමකින් අප දෙදෙනාට ජීවත් වන්ට පුළුවන් වූයේ අයිරින්ගේ ගති හා ඇල්මත් දයාවත් නිසා ය. අතික් බිරිඳ-කට නම් මා හා අමනාප වීමටත් තරහ වීමටත් ඇතැම් විට කලහ කිරීමටත් හේතු වන වැරදි මගෙන් සිදු වී ය.

ලෙඩ ඇඳෙහි වැතිර සිටියදී ඈ දැක්වූ ඉවසිල්ලත් ආදරයත් සන්තෝෂයත් ඈට වෙදකම් කළ දෙස්තරගේ පවා පැසසුමට භාජනවී ය.

අප සිනිමා සිත්තමක්, නාටකයක්, ප්‍රසංගයක් බලන්ට ගියේ ඉතාම කලා තුරකින් දවසක පමණි. ඒ සඳහා අප හික්මවූයේ අපගේ ආත්ම ශක්තියක් නොව දිළිඳුකමයි. විනෝදස්වාදයට අපිදු ආසා කෙළෙමු. ඒ සඳහා වියදම් නොකළ හැකි හෙයින් අපි ඒ

ආසාව දැඩි සිතින් මැඩ ගත්තෙමු. කලකදී ඇතැම් විනෝද මඟක් අපට අමතක වී ය.

ලංකාවෙන් මෙහි පැමිණ ඉගෙනගන්නා තරුණයෙක් හෝ මෙහි විසිතුරු බැලීමට පැමිණියෙක් හෝ අප දෙදෙනාම නාටකයක් හෝ ප්‍රසංගයක් හෝ බලනු සඳහා කැඳවාගෙන යන්ට වෑයම් කෙළේ ය. සියලු වියදම් ඔහු අතින් කෙරෙතත් අපි එවැනි ආරාධනා බැහැර කෙළෙමු.

අපගේ හුදෙකලා ජීවිතය ගැන සිතූ ඇතැමෙක් අයිරින්ට දෙස් නඟමින් 'සිංහල මිනිසුන් ඇසුරු නොකිරීම කොළඹ ලන්සින්ගේ ගතියක්' යයි කීවේ ය. මා ඔහුගේ කල්පනාව වැරදියයි කී විට ඔහු මට වඩා හොඳින් අයිරින් අඳුනන ලොක්කකු මෙන් සිනාසුණේ ය. ඔහු අවුරුද්දකට දෙවරක් එංගලන්තයට එන්නේ නාඳුනන ගැනුන් හඳුනාගෙන ඔවුන් ඇසුරු කිරීමෙන් සන්තෝෂ වන පිණිසයයි මට පසුව අසන්ට ලැබිණ.

යහළුවන්ගේ වියදමින් විනෝදාස්වාදය සෙවීමට අයිරින් මටත් වඩා අකැමැති වූවා ය. මුදල් ගෙවා ලැබිය හැකි විනෝදස්වාදයන් මුදල් ඇතියන්ම විසින් සෙවිය යුතුයයි සිතූ ඇ එවැනි විනෝදස්වාද-යන් සොයන්නන් උදෙසා කැපුණු බොරු වල් සිය ගණනින් නොව දහස් ගණනින් මෙහි නගර ජීවිතයෙහි ඇතැයි කීවා ය.

ඇ එවැනි කරුණක් මට පහද දුන් කළ ඇට වඩා දහ වරක් හොඳින් පමණක් නොව විවිධ ලෙස ද සිතාගත හැකි කල්පනා ශක්තියක් හා බුද්ධියක් මට තිබුණේ ය. මා පුදුම වූයේ එවැනි විපත් මට ඉව නොවැටීම ගැනයි. එවැනි විපත් හඟින ඉව අයිරින් තම පරපුරෙන් ලැබූවක් විය යුතු ය.

මා මහදැනුමුත්තකු සේ මෙසේ ලියනු දකින ඔබත් තාත්තාත් සමහර විට මට කිපෙන්ට පුළුවන. මා මේ කරුණු ලියන්නේ මගේ සිත සනසා ගැනීමට කරන පාපොච්චාරණයක් ලෙසම නොව මගේ ප්‍රියාදර අයිරින් වෙනුවෙන් ද කළ යුතු පාපොච්චාරණයක් ලෙස සලකමිනි.

මා අයිරින් ගැන මෙතෙක් ලියුවේ ඔබගේත් තාත්තාගේත් සිතුම අසාධාරණ බව හෙළි කරනු පිණිසයි.

අයිරින් මැරී තුන් මසකට පසු මේ ලියුම ලියන මට මවුපියන් මතක් වූයේ මා තනි වූ විටයයි ඔබත් තාත්තාත් සිතනු ඇත. අයිරින්ගේ මරණය නිසා මම විසි අවුරුද්දක් ජීවත් වීමෙන් ලැබිය යුතු අත්දැකීමක් ලැබුවෙමි. මගේ දුර්වලකම පිළිබඳ හැඟීම මගේ හද තවමින් මගේ සිතට නැඟින්ට වී ය. මගේ වැරදි හා මෝඩකම් මෙන් මවුපියන්ගේ වැරදි ද මට වැටහෙන්ට වී ය.

Scanned by CamScanner

ඔබ තාත්තා සමඟ විවාහ වන්ට පෙර අගහිඟවලින් පීඩා ලබමින් දුක සේ ජීවත් වූ බව තිස්ස මාමා ඇතැම් විට කියනු මා අසා තිබේ. ඒ ජීවිතය ගැන අපට කිසිවක් නොකීවූ ඔබ එය අපෙන් සඟවන්ට වෑයම් කරන්නාක් මෙන් ජීවත් වූවා ය. අප නිවාඩු කාලයේ කොග්ගලට යනු වළකන්ට ඔබ වෑයම් කෙළේ කුමක් නිසා ද? චන්ද්‍රසෝමත්, නාලිකාත් මමත් නිවාඩු කාලයෙහි කොග්ගලට ගොස් ගඟෙහි ඔරු පදින්ටත් කැලෑ රොදවල ඇවිදින්ටත් බෙහෙවින් ආශා කෙළෙමු.

තිස්ස මාමා ගමදී කළ මෝඩකම් පවා සමහර විට අපට කීවේ ය. අම්මා තාත්තා සමඟ විවාහ වුණු දවසෙහි තාත්තාගේ අලුත් ගේ ඉදිරියෙහි සාදන ලද තොරණෙහි 'VIVELEPAIRE' යන ප්‍රන්ස බසින් ලියවුණු වාසගමක් වීයයි තිස්ස මාමා කීවේ ය.

'ප්‍රන්ස බාසාව ඉගෙනගත්තෙක් ගමේ උන්නා ද?' යි මම ප්‍රශ්න කෙළෙමි.

'නෑ! ඒ ගොන්කම කෙළේ මම!'යි කියමින් තිස්ස මාමා සිනාසුණේ ය. 'ඒ කාලේ ගමේ හැම ලොකු ගෙදරක මඟුලක් උණාම තොරණක් බන්ද WELCOME ඉංගිරිසි අකුරු පෙළ අඳිනවා. ඔවුන් ඉක්මවන අදහසින් මම ප්‍රන්ස බසින් යුවළට දිගායු පැතුවා!'

''මම කවදාවත් මගේ ජීවිතේ සඟවන්ට වෑයම් කෙළේ නෑ''යි නන්ද කෝපයෙන් තෙපලා ය. ''අපේ ගම රට ජීවිතේ ගැන ඇසුවා නම් කියනවා. ඇලන් කවදාවත් මගෙන් ඒ ගැන ඇහුවේ නෑ. නිවාඩු කාලේ කොග්ගලට යන ඇලන් ගඟේ ඔරු පදින්ට ගොස් දියෙහි ගිලේවියයි බයෙන් මම එයා කොග්ගලට යන එක වළකන්ට වෑයම් කළා. දරුවන්ට ඕනෑවට වැඩිය ඉගැන්වීමත් අනර්තයක්.''

''ඇලන් කියන්නේ ඇත්ත. ඒකට නන්ද කෝප වෙන්නේ කුමට ද? ඇලන් නොඇහුවත් ඒ තොරතුරු එයාට කියන්න ඕනෑ''යි තිස්ස කී ය.

නන්ද තිස්ස සමඟ තර්ක නොකළා ය. ඔහු ලියුම කියවූයේ ය.

මා මේ ලියුම ලියන්නේ ඔබගේත් තාත්තාගේත් උපකාර සොයා ලංකාවට එන අදහසකින් නොවේ. ලංකාවට එන අදහසක් මා තුළ නැත. යම්තම් ජීවත්විය හැකි තරම් පඩි ලැබෙන රක්සාවක් මට ලැබී තිබේ. ලංකාවෙහිදී නොලැබිය හැකි වූ උපාධිය ලබනු සඳහා මම දූන් උත්සාහයෙන් ඉගෙන ගනිමි.

මෙතැන් සිට ඔබත් තාත්තාත් අරබයා කෙරෙන විවේචනය කියවන ඔබ නොකිපෙතියි සිතමි. මම මවුපියන් පමණක් නොව මා ද නිර්දය ලෙස විවේචනය කරන්නෙමි. නාලිකා නංගි ඔබගේ පුතුන් දෙදෙනාට වඩා හොඳ දුවක වනු නිසැක ය. තිස්ස මාමාගෙන් කිසිවක් උගත්තේ නාලිකායයි මම සිතමි. හැමෝටම

Scanned by CamScanner

ද්වේෂ කරන ඔහු පොදුවේ හැමෝටම අනුකම්පා කරන්නෙක් ද වෙයි. ඔහුගේ බුද්ධියත් වැටහෙන නුවණත් කල්පනා ශක්තියත් ක්‍රියාවෙහි යොදවන්ට අවස්ථාවක් ලැබුණා නම් ඔහු ඉතා ශූර මිනිහෙක් වන්නේ ය.

තාත්තා තමාගේ වෙළඳාම ඔහුට ඉගැන්වීමට වැයම් කළ නමුත් ඊට හුරුකමක් නැති ඔහු වෙළඳාම තක්කඩිකමක් ලෙස සලකා ඊට සිනාසුණේ ය. අනතුරුව ඔබ තිස්ස මාමා නීතිඥයකු කරන්ට වැයම් කළා ය. අනික් සියලුම කාර්යයන්ට වඩා නීතිඥකම ඔහුගේ සිනාවටත් සරදමටත් භාජන වූවකි. තාත්තාගෙනුත් අම්මාගෙනුත් කකා ගෙදර නිකම් ඉඳින නිසා ඔහු නීතිඥ විභාගය සඳහා උගැන්මට ගියේ ය. යහළුවන් හා වාද විවාද කරමින් ඔවුන්ට ඇනුම්පද කියමින් සන්තෝෂ වුණු ඔහු තම සමර්ථකම නිසා විභාග දෙකකින් සමර්ථ වී ය. අනික් විභාගයෙන් ඔහු සමර්ථ නොවූයේ එයින් සමර්ථවී නීතිඥයකු වීමට කිසිම ආශාවක් ඔහු තුළ නොවූ හෙයිනි.

"ඇලන් ඉගෙනීම නවත්වා ගෑනු ළමයෙක් එක්ක එංගලන්තෙට ගියේ අපි එයාට උගන්වන්ට මහන්සි ගත් නිසා වෙන්න ඇති" කියමින් නන්ද කෝපයෙන් සිනාසුණා ය.

"ඇලන් එහෙම කියා නැහැ"යි තිස්ස කී ය.

"එයා නිසා ගැන ඔවා ලියන්නේ ඒ අදහස හිතේ තියාගෙන අපේ වැරදි පෙන්නන්න."

"මම හිතන්නේ නෑ. නන්දගේ හිත දන්නවා ඇලන් අයිරින් ආශ්‍රය කරනු වළක්වන්ට තදින් ක්‍රියා කළ එක වැරදි බව."

"අපි කෙළේ වරදක්යයි කවද වත් හිතුවෙත් නෑ; හිතන්නෙත් නෑ. ඉගෙනගන්නා ළමයෙක් ගෑනියෙකුට ආලය කරන්ට ගියාම ඒක වැළැක්වීම වරදක් ද? මේ කලි යුග කාලයක්! තිසා ඔය බණ ඉගෙනගත්තේ කවද ද?"

"මෙහි ආවාට පස්සේ"යි තිස්ස තෙපලේ ය. "ඇලන් ඉලන්දරි වයසේදී තරුණියකට ආලය කිරීම සිද්ද වෙන්න ඕනෑ දෙයක්."

"එයින් එයා වැළැක්වීමත් සිද්ද වෙන්න ඕනෑ එකක්."

බලාපොරොත්තු නොවූ මේ පිළිතුර අසා කර බාගත් තිස්ස ළිත් ඇලන්ගේ ලියුම කියවූයේ ය.

# 3

සමස්ත ශාස්ත්‍ර ශාලාවේ උගන්නා කාලයෙහි තුන්වන අවුරුද්ද පටන් ගනිත්ම මා මගේ ඉගෙනීම මඳක් අතපසු කොළේ අයිරින්ට ආලය බැඳගත් නිසා නොව මගේ යහළුවන් සමඟ මා ටිකක් සන්තෝෂවන්ට සිතූ හෙයිනි. ලොකු අම්මා ගමට ගියාට පස්සෙ ගෙදරදී පාඩම් කිරීම හැර වෙන දෙයක් කරන්ට මට හිතුණේ නැ. කුඩා වියෙහි පටන් සමස්ත ශාස්ත්‍ර ශාලාවේ දෙවන අවුරුද්දේ විභාගය තෙක් ශූර ලෙස සමත් වියහැකි සේ මම හොඳින් උගත්තෙමි. රාජකීය විද්‍යාලයේ උගන්නා කාලයේ හැම පන්තියෙහිම පළමු වන තෑග්ග මා දිනාගත්තේ වැඩි වෙහෙස-මහන්සියකින් උගැන්මෙනියි මම නොකියමි. උගැන්මෙහි ශූරකම මා ලැබුයේ ඔබ දෙදෙනාත් ලොකු අම්මාත් ගෙදර ජීවිතයත් නිසා විය හැකි ය. මා කුඩාකල අනු ලොකු අම්මා ගම කතා කීමෙන් හා මා හා කතාබහ කිරීමෙන් උගැන්මෙහි ආශාවක් හා ලොව ගැන කුහුලක් ද මා තුළ බහාලි ය.

අම්මාත් තාත්තාත් මහත් ඇල්මකින් මට වුවමනා දේ සපයමින් මගේ උගැන්මට අනුබල දුන් සැටි මට කිසි කලක අමතක නොවේ. එහෙත් තුන්වන අවුරුද්දෙහි මා උගැන්ම ටිකක් අතපසු කළ අවස්ථාවෙහි ඔබ දෙදෙනාම මා යන එන තැන් සොයමින් මට දෙස් නගමින් මා වෙහෙස කළ නිසා මම වඩාත් මුරංඩු වීමි. ඔබ සංවේගයෙන් මා හික්මවන්ට වෑයම් කොළේ මා අයිරින් සමඟ ඇවිදීමට කාලය ගත කරතියි යන හැඟීමෙනි. මා කරන කතාත් කරන ක්‍රියාත් හගින්ට වැයම් කොළේ ඔබ ඔබගේ සිත පිල්ලුවක් කරගෙන එය මගේත් අයිරින්ගේත් සිත කය දෙකට ආවේශ කරන්ට වෑයම් කිරීමෙනි. එහෙත් ඔබගේ සිත ඇතුළු වූයේ තරුණ වියෙහි වූ ඔබගේ සිත කය දෙකට ය. ඔබට හැඟුණේ ඔබ තරුණ වියෙහි සිතූ සිතුම් පමණි. එහෙත් ඔබ මගෙත් අයිරින්ගෙත් සිතුම් පැතුම් දත්තකු ලෙස මා හික්මවන්ට වැයම් කළා ය.

මා ඉගෙනීම හැරදමා අයිරින් කසාද බැඳගනිතියි යන හැඟීමෙන් මඩනා ලද ඔබ මා කියූ කිසිවක් විශ්වාස නොකළා ය. තාත්තා මා කියන්නේ බොරුයයි සිතුවේ ය. රෑ වී ගෙදර ආ හැම දවසෙහිම 'මෙතෙක් රෑ වෙන තුරු ගියේ කොහේද'යි ඔබ මගෙන් ප්‍රශ්න කළා ය. අනතුරුව තාත්තා ද ඒ ප්‍රශ්නයම ඇසුවේ ය.



Scanned by CamScanner

ඔබගේත් තාත්තාගේත් මේ ගතානුගතික ක්‍රියා කලාපය නිසා මගේ සිත ප්‍රචණ්ඩ වී ය. මුලදී මම අයිරින්ට ආලය නොකෙළෙමි. ඈ කාගේ වුව ද සිත්ගන්නා සේ කතාබහ කරන්ට පුරුදු වුණු තරුණියකි. කාගේ වුව ද සිත් පහදන පහන් මුහුණක් හා අහුමුළුවල නොසැඟවුණු හැඟීම් හා සිතුම් ද ඇති ඈ හා කතාබහ කිරීමෙන් මම සන්තෝෂවීමි. ඇට ආලයක්වත් ඈ කසාද බැඳගන්නා අදහසක්වත් මා තුළ නොවී ය. මා ඈ හමුවන්ට ගියේත් ඈ සමඟ කතා කෙළේත් අකපට මිතුරියක ලෙස සලකා ය. ඔබ මගේත් ඇගේත් ඒ ආශ්‍රය ගැන වැරදි හැඟීම් ආවේශ කරගෙන ඒ අනුව මා නටවන්ටත් වෙහෙසන්ටත් පටන් ගත් නිසා මම ඈ හමුවන්ට සතියකට වරක් වෙනුවට දෙතුන් වරක් යන්ට පටන්ගත්තෙමි. ඈ හා නිතර කතාබහ කිරීමෙන් මම ඈ කෙරෙහි වඩාත් පැහැදුණෙමි. ඇගේ හොඳ අවංක ගති පිළිබඳව මා තුළ දැඩි හැඟීමක් ඇතිවීය. ඇට මා තුළ ආදරයක් උපන්නේ මීට පසුවයි. ඔබ ඈ කපටි තරුණියක්යයි සිතන බව ඇසූ මම කෝපවීමි.

අයිරින්ට ආලය කරනු සඳහා මා ඈ වෙතට එළවූයේත් ඇගේ වටිනාකම පිළිබඳ දැඩි හැඟීමක් ඇතිකරගනු සඳහා මට අවස්ථා සැපයූවේත් ඔබත් තාත්තාත් කලබල වී කළ කී දේ බව සැලකුව මැනවි.

නාලිකාගෙන් ඇසුවොත් මා කියන මේ කරුණු සැබෑ බව සමහර විට ඔබට දැනගන්ට හැකිවෙතියි සිතමි. නාලිකා අයිරින් ගැන දනියි. අයිරින් හඳුනයි. එහෙයින් නාලිකා මා කියන මේ කරුණුවලින් සමහරක් දනීතියි මට හැඟේ.

ඔබගේ සිත් රිද්දන්ට සිතුණු මම නිතර අයිරින් හමුවන්ට ගියෙමි. ඈ තමා හමුවන්ට මා නිතර එනු වළකන්ට වෑයම් කළ නිසා මම වඩාත් මුරංඩුවීමි. ඈ සිංහල ස්ත්‍රියක නොවුව ද සිංහල මිනිසුන් අතර ජීවත්වීමෙන් ඔවුන්ගේ හොඳ ගති උකහාගත්තක බව මට හැඟුණේ එංගලන්තයෙහි ඈ සමඟ අවුරුදු තුනහතරක් ජීවත්වූ පසුයි.

නගරයෙහි සියලුම ගැහැනුන් ඔබ මනින්නේ ඔබ ඇසුරු කරන කතුන් දහදෙදෙළොස් දෙනාගේ ගති හා අදහස් මිනුමක් කොට ගැනීමෙනි. ඔබගේ ඒ මිනුම වැරදි බව මා මෙහි වෙසෙසින් නොකීවත් දැන් ඔබට වැටහෙතියි සිතමි. ඔබ ඇසුරු කරන කතුන්ගෙන් එක කතකවත් තමාගේ දූ දරුවන් හා පවුලේ ජීවිතය ද සම්බන්ධයෙන් තමා සිතන්නෙත් කරන්නෙත් මෙසේයයි හෙළි කෙරෙන බසකුදු ඔබට කියන්ට ඇතැයි මම නොසිතමි. ඔවුන්ගෙන් බොහෝ දෙනකුන් තමන්ගේ නෑ මිතුරන්ට පමණක් නොව දූ දරුවන්ට පවා හෙළි කරන්නේ ආරූඪ කරගත් හැඟීම් හා සිතුම්

Scanned by CamScanner

මිස ඔවුන්ගේ හදවත් තුළින්නගින අව්‍යාජ හැඟීම් හා සිතුම් නොවේ. මා මෙසේ කියන්නේ ඔවුන්ට නින්ද කරනු පිණිස නොවේ. එය නගර ජීවිතයෙහි එක් අංගයක් බව ඔබට මතක් කරනු පිණිස ය. සමහර විට ඔබ මට වඩා හොඳින් දැන් ඒ කරුණ දනිතියි සිතමි.

විද්‍යාලයෙහි දී මා ඇසුරු කළ මගේ සහළුවන්ගෙන් ටික දෙනෙක් මවුපියන් විසින් වෙහෙසනු නොලබන්නෝ වූහ. මවු පියන් විසින් ගෙදරින් පන්නනු ලැබූ දෙදෙනකුන් ගැන මම දනිමි. ඒ මවුපියෝ ජීවිතය ගැන එක්තරා හික්මීමක් ලැබුවෝ ය. ඔවුන් දරුවන්ගේ උගැන්මට වියදම් කෙළේ ඔවුන් හොඳින් උගන්නා තෙක් පමණි. ඔවුන් උගැන්ම නොසලකා මැරකම් කරන බව දැනගත් විගස අර මවුපියෝ ඔවුන්ගේ උගැන්ම සඳහා රුපියලකුදු වියදම් නොකළෝ ය. අත්හද බැලීමෙන් දන්නා ලද නීතිරීති සමූහයක් දන් ඇඳිල්ලට පිටි පසින් ඇත. ජීවිතයට පිටිපසින් ද මිනිසුන් විසින් පසක් කරගන්නා ලද නීතිරීති ඇතැයි සිතන ඔවුන් ක්‍රියා කරන්නේ ඒ නීතිරීති තර්කානුකූලව සලකන්නන් ලෙසිනි.

ඔබත් තාත්තාත් මා නරක පුතකු වෙතියි බියගත්තේ කුමක් නිසාදැයි මට නම් දුනුදු නොවැටහේ. අයිරින්ට ආලය කිරීම හැර මා කළ අනික් අපරාධයක් මට නම් සිහිකළ හැකි නොවේ. අයිරින් දනහැඳින කතාබහ කරන්ට වූ පමණින් ඔබ මට කිපී මා වෙහෙසන්ට වූ පසුයි මා ඇට ඇත්ත වශයෙන් ආලය කරන්ට පටන්ගත්තේ. මා තනිවෙතියි මා තුළ බියක් හටගත්තේ ය. ඒ බිය අඩුකරගනු පිණිස මම අයිරින්ට ආලය කෙළෙමි. මා ඇට ආලය කරන්ට පටන් ගත්තේ නොමැඩගත හැකි රාග චේතනාවකින් නොවේ.

ධනවත් ගැනුන් හා පිරිමින් ද සතියකට දෙතුන් වරක් ගෙදරට කැඳවාගෙන ඔබත් තාත්තාත් ඔවුන් හා කතාබහ කරමින් සිනාසෙමින් කැවිලි කමින් තේ බොමින් සමහර විට පිටකින් පැමිණියන්ට මත් පැනින් සංග්‍රහ කරමින් සන්තෝෂ වූහ. ඇතැම් දවසක තාත්තාත් ඔහුගේ යහළුවෝත් මත්පැන් බොමින් රැබෝවන තෙක් සන්තෝෂ වූහ.

ඇතැම් දවසක ඔබ වේලපහින් අපට කන්ට දී අප නිදන්ට යැවුවා ය. වරක් නින්දෙන් අවදිවූ චන්ද්‍රසෝම නත්තලට ලැබුණු රතිඤ්ඤා පෙට්ටියක් ගෙන ගොස්, ඔබත් තාත්තාත් අනික් ගැනුන් හා පිරිමිනුත් කතාබහ කරමින් සිටි සාලයට පිවිසෙන එක් දොරටුවක් ළඟ තබා ගිනි තබන්ට සිතුවේ ය. මම චන්ද්‍රසෝම එයින් වැළැක්වූයෙමි.

විසි ඇවිරිදි වියෙහිදී මා යහළුවන් හා එක්ව තේ බී වල්පල් දෙඩීමෙන් සන්තෝෂ වී පමා වී ගෙදර එනු දුටු ඔබත් තාත්තාත්

Scanned by CamScanner

බුමබාගත් මුහුණු ඇඹුල් කරගෙන තරහයෙන් දෙඩන්ට පටන් ගත්හ. ඔබටත් තාත්තාටත් සන්තෝෂවන්ට හොඳ නම් අපට නරක්වන්නේ කෙසේ ද?

"ඇලන්ගේ පුදුම කතාවක්" යයි නන්ද කෝපයෙන් කීවා ය. "අපි කසාද බඳින කාලය තෙක් යහළුවන් හා කා බී සන්තෝෂ වෙන්ට ගියේ නෑ. අපට එහෙම සන්තෝෂවෙන්ට උවමනා උණෙත් නැහැ."

"ඒ ගමේදී" යි කියමින් තිස්ස වටපිට බැලුවේ ය. යැටි පුටු මල් බඳුන් හා බිත්තියෙහි එල්ලී සිටින විසාල පින්තූර රාමු දෙස ද ඔහු බැලුවේ ය. "ගමේ මේවාත් තිබුණද? අර පින්තූරේ." බටහිර සිත්තරකු විසින් අඳින ලද සිත්තමක මුද්‍රිත පිටපතක් සහිත රාමුවක් දෙසට තිස්ස අත දික් කෙළේ ය.

තිස්සට පටහැණි වන නමුත් ඇගේ යටි සිත ඇට දෙස්නහයි. තම ඉගෙනීම අවසන් කරන්ට ඇලන්ට නොහැකිවූයේ ඔහු යන එන තැන් සොයමින් තමා හා පියල් ඔහුට හරස්කපන්ට ගිය බැවිනි. ඇලන් රටින් පිටවී ගියේ ඔහුගේ පමණක් නොව තමන්ගේ ද වරදින්ය. යන හැඟීම නන්දගේ යටි සිතින් උඩට එන්ට වැයම් කරයි. ඇ එය යටපත් කොටගෙන තිස්සට පිළිතුරු දුන්නා ය.

"ගමේ ගෙවල් නගරයේ නෑ. ගමේ තියෙන ලී බඩු නගරයේ නෑ.නගරයේ විදියට අපි ජීවත්වෙන්න ඕනෑ. වැරැද්ද මොකොද?"

"වැරැද්ද?" කියමින් තිස්ස සිනාසුණේ ය.

"මම තරහ තිසාගේ ඔය සිනාවටයි"

නන්ද ද සිනාසුණා ය. තම සහෝදරියගේ වදන් නොඇසුණකු මෙන් තිස්ස කතා කෙළේ ය.

"ඇලන් ජීවත්වෙන්ට මහන්සි ගත්තේත් නගරෙ විදියටයි."

"ඒ ගොල්ලන්න සන්තෝෂවෙන්න කාලෙ තිවුණා."

"කසාද බැඳලා දරුවන් ලැබුණට පස්සෙ ද සන්තෝෂ වෙන්න ඕනෑ?"

තිස්ස යළිත් ඇලන්ගේ ලියුම කියවූයේ ය:

ඔබ මා හික්මවන්ට වැයම් කෙළේ ඔබ ගම ජීවත්ව සිටිය දී ලත් අත්දැකීම් අනුව මිස නගරයෙහි ජීවත්වීමෙන් ලත් අත්දැකීම් අනුව නොවේ. සමස්ත ශාස්ත්‍ර ශාලාවෙහි උගන්නා කාලයෙහි මගේ අනාගතය ගැන මම සිතුවෙමි. ඉංජිනේරු විභාගයෙන් සමර්ථව හොඳ වැටුප් හිමි රක්සාවක් ලබාගෙන නගරයේ ඉහළ සමාජයේ සිංහලයකු සේ ජීවත්වන්ට මම ආශා කෙළෙමි. ඒ ආශාව මා තුළ බහාලූයේ ඔබ විසිනි. එහෙත් මා මගේ අනාගතය ගැනවත් මවුපියන් ගැනවත් නොසිතා මගේ යහළුවන් කියන කවර දෙයක්

Scanned by CamScanner

වුව ද කරන මෝඩයෙකියි ඔබ නොසිතුව ද එවැනි හැඟීමක් ඇත්තක මෙන් ක්‍රියා කළා ය.

වයසින් පැසීමත් අත්දැකීමත් නිසා ඔබත් තාත්තාත් මට නැති නුවණක් ලබන්ට ඇත. එහෙත් ඉංගිරිසි බස උගැන්මෙනුත් පොත පත කියවීමෙනුත් ඔබ දෙදෙනා නොලත් දැනුමක් මම අවුරුදු දහ අටෙහිදී ලැබුවෙමි. යහළුවන් ආශ්‍රයෙන් හා දූරියන් හා කතාබහ කිරීමෙන් ද මටත් මගේ උගැන්මටත් මහත් හානියක් කරගනිතියි යන හැඟීමෙන් ඔබ මා හික්මවන්ට තැත් කරතියි සිතුණු හැම විටම මම කෝපවීමි.

මා රුපියල් දහයක් පහළොවක් වියදම් කළහොත් ඒක කුරුගගා ප්‍රශ්න කිරීම ඔබගේ පමණක් නොව තාත්තාගේ ද සිරිත වී ය. මුදලිකම ලබා ගනු සඳහා තාත්තා කපටි මිනිසුන් උදෙසා මුදල් නාසති කෙළේ ය. වෙළඳාමෙහිදී කිසිවකුට නොරැවටෙන තාත්තා ගරු නමක් ලැබීමෙහි ආසාවෙන් සල්ලි වීසි කරන්නකු මෙන් වියදම් කෙළේ ය. මුදලිකම ලැබුණු පසු පවත්වන ලද උත්සවය සඳහා මුදල් වියදම් කෙළේ ය. ඔබ ද මහත් සන්තෝෂ-යෙන් ඒ සඳහා තාත්තාට අනුබල දුන්නා ය. උත්සවයට පැමිණ කා බී සන්තෝෂ වී තාත්තාටත් ඔබටත් ඉත සිතින් සුබ පතා පිටත් වුණු සියගණන් මිනිසුන්ගෙන් දෙදෙනකු කතාබහ කරමින් යන අතර එකකු 'මෝඩයා!' කියනු මට ඇසිණ. 'ඔව්' යි කියමින් අනිකා සිනාසුණේ ය. ඔවුන් එසේ හැඳින්වූයේ තාත්තා යයි සිතූ මම කෝප වීමි. සතියකට පසු දවසක සමස්ත ශාස්ත්‍ර ශාලාවෙහිදී මා පසුකොට ගමන් කළ ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් හතර දෙනෙකුගෙන් එකකු යටැසින් මා දෙස බලා 'හාමු' යයි කියනු ඇසූ මම යළිත් කෝපවීමි. මා කෝපවූයේ ඔවුන් මට 'හාමු' යයි කී නිසා නොව අර වැඩිහිටියන් දෙදෙනාගෙන් එකකුගේ කටින් පිටවුණු 'මෝඩයා' යන වචනය මට සිහිවුණු හෙයිනි.

මම දිවගොස් 'හාමු' යයි කිවූ ශිෂ්‍යයාට පහරක් ගැසුවෙමි. ඔහු පහර කා ඉවසාගෙන ගිය නිසා කලහයක් නොවී ය.

කිසියම් උත්සවයක් සඳහා මුදලි මුහන්දිරම්වරු රාශියක් රජ වාසලට ගෙන්වනු ලැබූහ. ඒ පෙරහැරට එක්වීමට අකැමැති වූ විට තාත්තාගේ යහළු වෙළෙන්දෙක් තාත්තා සමඟ වාද කෙළේ ය.

'නොගියොත් ආංඩුකාරතුමාත් මහමුදලිතුමාත් අසතුටු වේවි'යි ඔහු කීවේ ය.

'නෑ, මම හිතන්නේ නෑ'යි තාත්තා පිළිතුරු දුන්නේ ය.

'හොඳයි තරහවෙලා අපේ ගරු නම් ආපසු ගත්තොත්' යි ඔහු සංවේගයෙන් ඇසුවේ ය.

'නෑ ආපසු ගන්න එකක් නෑ.'

'අප කැඳවන්නේ රජ වාසල ලොකු උත්සවයකට. ඒකට නොගොහින් හොඳ නෑ. යන එක අපේ යුතුකමක්.'

'තව ටිකක් කල්පනා කරලා තීරණය කරන්න බැරිය. කලබල වෙන්නේ මොකට ද?'

'මෙහෙම එහෙකට නොගියොත් අපේ ඇඳුම් හා කඩු කස්තාන අඳින්ට අවස්ථාවක් ලැබෙන්නේ නෑ'යි අනික් මුදලිතුමා කීවේ ය.

නියමිත දවසෙහි අනික් මුදලි මුහන්දිරම්වරුන් සමඟ තාත්තා ද කඩු කස්තාන පැළඳගෙන කොටුවේ දුම්රිය පළේ සිට ගිනි ගහන අව්වේ ඩාදිය නහමින් පයින්ම රජවාසලට ගමන් කෙළේ ය.

තිස්ස මාමා මේ පුවත කියනු දෙවරක් මා විසින් අසන ලදී.

"ඇලන්ගේ සිත දූෂණය කරතියෙන්නේ නිසා" යි නන්ද දැඩි කෝපයෙන් කීවා ය. "හැදෙන දරුවන් ඉදිරියේ මවුපියන්ට මෙහෙම සිනාසෙන එක කොයි තරම් අපරාධයක් ද?"

"මම සිනාසුණේ පියල්ට නෙවී. අනිත් මුදලිවරුන්ට. ඒ කතාබහට මුල පිරුවේ අනිත් මුදලි කෙනෙක්."

පියා කළ කී ඇතැම් දේ ඇලන් මෙසේ විවේචනය කරනු ඇසූ නන්දගේ සිත චංචල වී ය. ඇලන් ඔහුගේ ලියුම අවසාන කරන්ට පෙර මව ද විවේචනයට භාජන කළහොත්! තමා කුලදම් බිඳින්ට එලවන තරම් දුෂ්කර අවස්ථාවන්ට හසු වීමත් ඇතැම් විටක තමා හා පියල් ද අතර වූ කලහයනුත් සිහි කළ නන්ද, තමා ඇඳි වත කඩා ඉවත දැමීමෙන් තම සෙළුව එළිකරනු ලබතියි යන හැඟීමෙන් තැති ගත්තක මෙන්, තැති ගත්තා ය. තම ජීවිතයෙහි තමා හා තවත් එකකු ද පමණක් දන්නා රහසක් පවා ඇලන්ට ඉව වැටෙන්ට ඇතැයි හැඟුණු ඈ, ඔහුගේ ලියුම කියවනු නොඅසනු පිණිස කන් දෙකෙහි ඇඟිලි ගසාගැනීමට සිතුවා ය. නන්ද පුටුවෙන් නැඟ වටපිට බැලුවා ය. සමරවීරත් ඇත් පිළිබඳ පුවත නිසා තම සහෝදරිය ද ඈට සිහි වී ය. සයරෝගයෙන් මියගිය ඈ ගැන තමාද වග කිව යුතු ය. කුලමානය, තමාගේ ආත්මාර්ථකාමී අදහස් හා හැඟුම් සඟවා ගැනීමට වහල් කොට ගත් වෙස් මුහුණකියි ඇගේ ඇතුළු හදින් නැගිනා කසුකුසුව කන්වල ඇඟිලි ගසා ගැනීමෙන් ද වැළැක්විය නොහැකි ය.

මවුපියන්ගේ පෞද්ගලික ජීවිතය දරුවෝ දනිති. ඔවුන් රහස් පරීක්ෂකයන් මෙන් මවුපියන්ගේ ජීවිතයෙහි සදොස් තැන් හෙළි කරන්ට සිතීම මහා අපරාධයකි. කවර හොඳ මිනිහකු අතින් වුව ද ගෙදරදී වැරදි සිදු වෙයි. මවුපියන්ගේ පෞද්ගලික ජීවිතය පිළිබඳ තොරතුරු ගැන කුහුලක් පිටත්තර මිනිහකු තුළ ඇති වුව ද දරුවකු තුළ ඇති නොවිය යුතු ය. ඒ කුහුල නිසා මවුපියන්ගේ ජීවිතයෙහි ඒ තොරතුරු කියමින් සංතෝෂ වීම හෝ කෝප වීම පුරාවස්තු

Scanned by CamScanner

සොයන ආසාවෙන් පිළිමවල හිස් හැරීම වැනි අපරාධයකියි සිතූ නන්ද කතා කෙළේ කෝපයෙනි.

''ඇලන් තාත්තාගේ දුර්වලකම් කියමින් සිනාසීම දුෂ්ටකමක්'' යි නන්ද සංවේගයෙන් කීවා ය. ''මේ විදියට දරුවන් මවුපියන්ගේ වැරදි සොයා මේ වැරදි මහත් කොට මවුපියන් ඉදිරියේම කියන්ට පටන්ගත්තොත් මවුපියන්ට මෙලොව ජීවිතෙ එපා වෙයි. දරුවන්ට ඕනෑවට වඩා ඉගැන්වීම අපරාධයක්.........''

''දරුවන් මවුපියන්ගේ වැරදි හෙළි කිරීම අපරාධයක් යයි මට හැඟෙන්නේ නෑ''යි තිස්ස තෙපලේ ය. ''දරුවන් වැරදි කියන්නේ ද්වේෂයෙන් නොවෙ; සිත් වේදනාවෙන්.''

''තිසා සන්තෝස වෙන්නේ මිනිසුන්ගේ හොඳ ගති නොව ඔවුන් අතින් කලාතුරකින් සිදුවන වැරදි සොය සොයා මහත් කොට සැලකීමෙන්.''

''මවුපියන්ගේ චරිත පටට ගසා එහි ඇතුළේ ඇති දේ පෙන්නීම ඔවුන්ගේ දරුවන්ට තරම් හොඳින් වෙන කිසිවෙකුට කරන්ට බැහැ. ඇලන් මවුපියන්ගේ මේ වැරදි හෙළි කරන්නේ අයිරින් ඔහු වෙනුවෙන් දුක් විඳ මැරුණු නිසා හටගත් කලකිරීමෙන්.''

''එයා කලකිරෙන්ට එංගලන්තෙට ගියේ කුමට ද? අපි එයාට උගන්වන්ට මහන්සි ගත්තා. එයා ලන්සි තරුණියකට අසුවෙලා එංගලන්තෙට ගියා. එයාට ඕනෑ නෑ අපේ වැරදි හොයන්න. අයිරින් මැරුණේ අපේ වැරද්දකින් නෙවි. එයාට අගහිඟ ඇති උණේ අපේ වැරද්දකින් නෙවි. මවුපියන්ගේ දරු සෙනෙහස ඇලන් එයාගේ වාසියට ආයුධයක් ලෙස පාවිච්චි කරන්න හදනවා.''

නන්ද යළිත් අසුනෙන් නැංගේ දැඩි කෝපයෙනි. කස පහර ලැබූ දරුවකු මෙන් තිස්ස වේදනාවෙන් කරබාගත්තේ ය.

''ඇලන් ඉහෙනිම තොසලකා තරුණියක් හාද කරගත් බව දැනගත් විට අපට කරන්ට තිබුණේ එයාගේ උගැන්මට සතයක් වත් වියදම් නොකර හැරීමයි. එහෙම කළා නම් ඇලන් ඔය වගේ අහංකාර ලියුම් ලියන්නේ නෑ. එයාව අයිරින් ලොකු උණා! අයිරින් මැරුණේ එයාගේ හිතුවක්කාරකම් නිසා.........අයිරින් ගැන එයා දන්නේ මොනවා ද?...........''

# 4

මා මේ කරුණු ලියන්නේ ඔබගෙනුත් තාත්තාගෙනුත් පළි ගන්නා අදහසකින් නොවේ. ඔබගේ පමණක් නොව මගේ වුව ද වැරදි හෙළි කිරීමෙන් පමණ ජීවිතය නිසා කලකිරී සිටින මගේ සිත මදක් සනසා ගත හැක්කේ.

මා කලකිරුණේ මා ඉක්මන්කමින් කළ කී දේවල විපාකයක් වශයෙනි. ඒ විපාක දැඩි සිතින් ඉවසාගන්ට නොහැකි වීම මගේ දුර්වල කමක්යයි ඔබ සිතනු ඇත. මට විඳින්ට සිදු වූයේ මා කළ වැරදිවල විපාක බව ඇත්තකි. එහෙත් ඒ වැරදි කරන්ට මා එලවූයේ ඔබත් තාත්තාත් විසිනි.

බෙහෙවින් ධනය සැපයූ තාත්තාත් ඔබත් ජීවත් වූයේ ගර්ව-යෙනි. කවුරුත් ඔබත් තාත්තාත් අපත් හරසරින් පිළිගත්හ. මා තුළ ද ඒ නිසා එක්තරා ගර්වයක් හටගත්තේ ය. අයිරින් සමඟ ලංකාවෙන් පිට වී මෙහි එන්ට මට සිතුණේත් ඒ ගර්වයෙන් ලත් අනුබලය නිසා මගේ සිත දැඩි වුණු හෙයිනි.

මෙහිදී ඉහළ පන්තියේ හා මැද පන්තියේ ඉංගිරිසි කාරයන් පමණක් නොව නූගත් කම්කරුවන් පවා පොදුවේ මට සැලකුවේ ඉංගිරිසින් අනුකරණයට වෑයම් කරන කාපිරි ජාතිකයකු නිසා උපදින කුහුලට වැඩි කුහුලකින් නොවේ. ඉංගිරිසින් ඉතා හොඳින් අනුකරණය කරන්නන් ලෙස සලකනු ලැබීම මෙහි එන සමහර සිංහල මිනිසුන් සලකන්නේ එය තමන්ට කෙරෙන ප්‍රශංසාවක් ලෙස ය. ඒ ප්‍රශංසාව මගේ සන්තෝෂයට හේතු නොවූයේ කුමක් නිසාදැයි මම නොදනිමි. මෙහි එන අනික් සිංහලයන් මෙන් සාර්ථක ලෙස ඉංගිරිසින් අනුකරණය මට තවම නුහුරු බව මට හැඟුණු නිසා විය හැකි ය මා ඒ ප්‍රශංසාවෙන් සන්තෝෂ නොවූයේ.

උතුරු ඉන්දියාවේ මිනිසුන්ගේ දිග කලිසමත් කබායත් හැඳ මැණික් එබූ රිදී තරුවක් වැනි දෙයකින් අලංකරණය වුණු තලප්-පාවකින් හිස වසාගත් තරුණයෙක් මෙහි සිටියි. ඔහු ලංකාවෙන් පැමිණි සිංහලයකු බව ඇසූ මම පුදුම වීමි. 'ප්‍රින්ස් වික්‍රමසේන' නමින් මෙහි බොහෝ දෙනා හඳුනන ඔහු තරමක් හොඳ රක්සාවක් ලැබ සන්තෝෂයෙන් ජීවත් වන්නෙකි.

ලංකාවෙහිදී ෂැල්ටන් වික්‍රමසේන නමින් දන්නා ලද ඔහු මෙහි පැමිණ ටික දවසකට පසු යුරෝපීය ඇඳුම් ඉවත දමා අර උතුරු ඉන්දියානු ඇඳුම් ඇඳගෙන 'ප්‍රින්ස් වික්‍රමසේන' යන නම ආරූඪ



Scanned by CamScanner

කරගත්තේ ය. ඔහු අඳුනන ඉංගිරිසි මිනිස්සු ඔහු ලංකාවේ පැරණි රජ පවුලකින් පැවත එන සිංහලයෙකියි සිතති. ඔවුන් එසේ සිතන්නේ වික්‍රමසේන කිසි විටක තමා රජ පෙළපතකින් පැවත එන්නෙකියි මෙහි කිසිවකුට කිසි විටක හඳුන්වා දුන් නිසා නොවේ.

'මම මගේ නම හා ඇඳුම් ද වෙනස් කෙළේ කිසිවකු රවටන අදහසකින් නොවේ'යයි වික්‍රමසේන මා හමු වූ අවස්ථාවේ කීවේ ය. 'මගේ ආත්ම විශ්වාසය දැඩි කොටගෙන, පිට රටින් පැමිණියකු ලෙස මට හිමි පොදු සැලකිල්ල ද ලබන අදහසිනි.'

වික්‍රමසේන මැට්රික් විභාගයෙන් සමත් වූ කීමෙහි බිණීමෙහි ශූර තරුණයෙකි. සිංහල හොඳින් දත් සිංහල පතක සඟරාවක ඇතැම් ලිපි ඉංගිරිසියට නඟනු සඳහා ආණ්ඩුවේ නිලධාරීන් විසින් වරින් වර කැඳවනු ලබන්නෙකි. 1912 යුද්ධ කාලයෙහි ලංකාවේ ඇතැම් සිංහල පත්වල පළ වූ ලිපි හා පුවත් ඔහු ලවා ඉංගිරිසියට පරිවර්තනය කරන ලදි. ඔහු මෙහි ඉංජිනේරු කර්මාන්ත ශාලාවක රක්සාව ලබාගෙන දියුණු වී සිටියි.

''අතමිට හිඟ වුවත් බොරු අහංකාර කමක් ඇතිව එංගලන්තෙට ගිය ඇලන් කලකිරීම පුදුමයක් නොවේ''යි තිස්ස තෙපලේ ය.

''එයාට එංගලන්තෙට යන්න කිව්වේ කවුද?'' යි අසමින් නන්ද තම ශෝකාකුල හැඟීම් මැඩගැනීමට වැයම් කළා ය.

''කවුරුවත් නොකිව්වාට ඇලන්ට යන්න සිද්ද උණා.''

''කාගේ වැරැද්දෙන් ද?''යි අසමින් නන්ද තරහයෙන් ඉවත බලාගත්තා ය.

තමා හා තම සැමියා ද තමන්ගේ දරුවන් නිසා උපන් ඇල්මෙනුත් ඔවුන් හොඳින් ඉගෙන ඉහළම තැනට නඟින ආසාවෙනුත් ඔවුන්ගේ සුව දුක් සොයමින් ඔවුන්ට උගන්වන්ට වෑයම් කළ සැටි සිහි කළ නන්ද බෙහෙවින් ශෝක වූවා ය. දුක සේ ජීවත් වූ නන්ද විවාහ ජීවිතයට ඇතුළත් වූයේ තරුණ විය ඉක්මවන්ට ළංවූ තැන ය. පියල් විවාහ ජීවිතයට ඇතුළු වූයේ ද ඉතා අමාරුවෙන් මුදල් සපයා ගෙන තරමක ධනවතෙකු වූ පසු ය. ඇලන් විසි හැවිරිදි වියෙහිදීම තරුණියකට ආලය බැඳගත්තේ ය. ඔහු එයින් වළකන්ට වෑයම් කළ විට කිපී රටින් පිට වී ගියේ ය.

''එහෙනම් අපට කරන්න තිබුණේ අවුරුදු විස්සෙදි වුවත් දරුවන්ට කසාද බැඳගන්ට ඉඩ දීලා පඹයන් වගේ නිකම් ඉන්න එකයි'' කියමින් නන්ද නැඟිට ගොස් විදුලි පහන දැල්වූවා ය.

විදුලි එළියෙන් සාලය එළිය වී ය. තිස්ස කතාවෙන් පළ කරන නිර්දය ගතිය ඔහුගේ මුහුණෙන් පළවෙතියි නන්ද නොසිතුවා ය. තිස්සගේ මුහුණ නන්දට සිහි කෙළේ තම මවගේ ශෝකා-

Scanned by CamScanner

තුර මුහුණයි. කෙනකු සිතන සිතුවිලි අනුව ඔහුගේ මුහුණ මඳ වශයෙන් වුවද වෙනස් වන්නේ නම් තිස්සගේ මුහුණින් පළවන්නේ දයානුකම්පාවත් කලකිරීමත් අතර වන භටනින් වෙහෙසුණකුගේ සිත්සතන් විය යුතු ය.

යහළු තරුණිය සමඟ නාලිකා සාලය මැදින් ගමන් කළා ය.

"තිස්ස මාමා තාමත් ලියුම කියවනවාද?'' යි අසමින් ඇ ඉස්තෝප්පුවට පිවිසියා ය.

"මේක මහා පතරංග ජාතකය වැනි කතාවක්''යි කියමින් තිස්ස සිනාසුණේ ය.

එය තමාට එල්ල කළ සරදමක්යයි නාලිකා සිතුවා ය.

"තිස්ස මාමා මටත් ඇනුම්පද කියනවා.''

"නෑ; නාලිකා සිංහල නොදන්නවාට මම පලිකාරයෙක් ද?''

"මම සිංහල දන්නේ නැද්ද? තිස්ස මාමාත් මට සිංහල ඉගැන්නුවා. මගේ සිංහල නොදන්නාකම ගැන එහෙනම් තිස්ස මාමාත් වැරදි කාරයෙක්.''

"නාලිකා සිංහල දැනගත්තාට සිංහල පොත් කියවා නෑ. ජාතක පොත කියවා තිබෙනවා ද?''

"ඔව්—මම උම්මග්ග ජාතකය කියෙව්වා.''

"මහා පතරංග ජාතකයයි කියන්නේ ඒ වාගේ දිග කතාවකට''

"එහෙනම් තිස්ස මාමා කිව්වේ ඇනුම්පදයක් නෙවි''යි තෙපලමින් නාලිකා තම යෙහෙළිය සමඟ මිදුලට බැස්සා ය.

තිස්ස යළිත් ලියුම කියවූයේ ය;

තාත්තා ඉගෙනගත් කාලේ ජීවත් වූයේ කෙසේදැයි මම නොදනිමි. තාත්තා මවුපියන්ගෙන් අවසර නොගෙන තරුණියක හා කතාබහ නොකෙළේ යයි මම සිතමි.

"නන්ද අනුලාත් පියල් සහ බලදසත් බරකරත්තවලින් පරගොඩ විහාරයට ගිය ගමන් ගැන ඇලන් දන්නේ නැතිව ඇති''යි කියමින් තිස්ස නන්දගේ මුහුණ බැලුවේ ය.

"තිසාගේ අටුවා නැතිව ඔන්න ඔය ලියුම කියවන්න''යි නන්ද කෝපයෙන් තෙපලා ය.

"අටුවාවක් නැතිව සමහර තැන් හොඳට තේරුම් ගන්න බැරිවේයයි මම හිතුවා.''

"මට තේරුම් ගන්න පුළුවනි.''

මම අම්මා හා සමහර විට තරහ වූ නමුත් අම්මා ගැන නොකල කිරුණෙමි. තාත්තා නිසා මම නොයෙක් විට කලකිරුණෙමි.

Scanned by CamScanner

තාත්තාට මගේ සිතේ හටගෙන තිබුණ ගෞරව ආදරය එයින් දෙදරුම් කැවේ ය. තාත්තා මා හික්මවන්ට වෑයම් කළ ඇතැම් අවස්ථාවක මා වඩාත් මුරංඩු වූයේ මේ කලකිරීම නිසායයි සිතමි.

ධනවතකුව සිටියදීත් තාත්තා මිනිසුන්ට මුදල් ණයට දී පොලිය අයකරන සැටි මට දැනගන්ට ලැබුණේ හරමානිස් බාස් අඬමින් කළ කන්නලව්වක් අහම්බෙන් ඇසීමෙනි. ඔහුගේ ගේත් වත්තත් උකසට ගෙන තාත්තා ඔහුට රුපියල් දහදහක් දී තිබෙන්නේ සියේට විස්ස බැගින් පොලී අයකිරීමෙනි. පොලී ගෙවාගත නොහැකි වූ විට තාත්තා ඔහුගේ ගේත් වත්තත් වෙන්දේසියේ විකුණුවා තමා දුන් මුදලටත් පොලියටත් සරිලන ගණනකට මිලට ගත්තේ ය. තාත්තාගේ කීම පිට අනික් කිසිම ධනවත් වෙළෙන්-දෙක් ගේත් වත්තත් නොඉල්ලූහ.

දරුමල්ලන් සමඟ තමාට මහට බසින්ට සිදුවීයයි කියමින් හර්මානිස් බාස් තාත්තාගෙන් රුපියල් දහක් ඉල්ලූ නමුත් දුන්නේ රුපියල් විස්සක් පමණි. හර්මානිස් බාස්ගේ දුකින් තැවුණු බැගෑ මුහුණත් ඔහු තාත්තාට කළ කන්නලව්වත් නිසා මා තුළ අනුකම්පාවක් උපන්නේ ය.

අගහිඟ නිසා අයිරින් හා මා විඳි දුක් පීඩාත් අයිරින් දුකින් මිය යාමත් සිහි වන කල හර්මානිස් බාස් මට මතක් වෙයි. මවුපියන් කරන ක්‍රියාවල විපාක දරුවන් විඳිතියි කියනු මා නොයෙක් වර අසා තිබේ. ඒ කියුම මා විශ්වාස නොකරන නමුත් මට මගේ සිතින් බැහැර කළ නොහැකි ය.

හර්මානිස්ට සිදු වූ විපත තාත්තාට ඒ වේලාවේ නොවැටහුණේ කෲර ගතියක් නිසා නොව ඔහු හා කළ ගනුදෙනුවත් එයින් ඔහුගේ ගෙයත් වත්තත් තමා සතු වීමත් සිතීමෙන් ලත් සන්තෝෂය නිසා විය යුතු ය.

තාත්තාට මෙලෙසින් දෙස් නගන්ට මා පෙළඹවූ කරුණු දෙකක් ඇත: එකක් අයිරින් දුක් විඳ මිය යනු දැකීමයි; අනික මෙහිදී උන්හිටි තැන් නැතිවීමෙන් දුක් විඳින මිනිසුන් දැකීමයි.

මා කුඩා කල සොල්දරයෙන් බිමට වැටී නාහෙන් හා හිසින් ලේ පිට කරමින් වැටී සිටිනු දුටු විගස තාත්තා කඳුළු සලමින් හැඬූ හැඬුම මට මතක් වෙයි. ඔහු අම්මාට ද අනික් දරුවන්ට ද මට මෙන් ආදරය කළ බව මම දනිමි. මිනිසුන් තළා පෙළා වුව ද මුදල් රැස් කිරීමේ දැඩි ආශාව නමැති කටුව තුළ හිරවීමෙන් තාත්තාගේ දයාව හා අනික් හොඳ ගති නොමේරූ බිජුවටක් වීයයි මම සිතමි.

දෙළොස් ඇවිරිදි වියෙහි සිටි මා කිසියම් උවමනාවක් සඳහා දවසක තාත්තාගේ කාමරයේ මේසය ළඟට ගියෙමි. බිම තුබුණු ලියුමක් දුටු මම එය අතට ගත්තෙමි. ආදර හසුන් ගැන කිසිවක්

නොදත් මම ඒ ලියුම කියෙවුවෙමි. ගැහැනියක විසින් ලියන ලද ඒ ලියුම අවසන් වූයේ රුපියල් තුන්සීයක චැක් පතක් එවන ලෙස ආයාචනා කරමිනි. තාත්තා තවත් ගැහැනියකට ආලය කරන බව මට වැටහුණු නමුත් මා තුළ සංවේගයක් හට නොගත්තේ ය. ඒ ලියුම කියවූ මම ඒ වේලාවේ සිනාසුනෙමි. මා අයිරින් ඇසුරු කරතියි අසා තාත්තා කිපුණු අවස්ථාවෙහි මේ පුවත මගේ සිතට නැංගේ දැඩි කෝපයකුත් සමඟයි. ඇත්ත වශයෙන් මා අයිරින්ට ආලය කරන්ට පටන්ගත් පසු අතික් තරුණියකට ආලය කිරීම අපරාධයක්ය යන හැඟීම මගේ සිතට නැංගේ ය.

''මම දන්නවා'' යි නන්ද තරහයෙන් කීවා ය. ''ඒක ගැන ලියා තියෙන අනික් කිසිවක් කියවන්න එපා. ඒකට එයාට මම සමාව දුන්නා. ඊට පස්සේ එයා ඒ ගැනි ආස්රය කෙළේ නෑ.''

''ඒ වගේ පුවත් තවත් තියෙනවා නම් ඒවාත් අත්හරින්න ද කියන්නේ''යි තිස්ස ප්‍රශ්න කෙළේ ය.

''මට ඇහෙන්න කියවන්න එපා.''යි නන්ද දැඩි කෝපයෙන් තෙපලා ය.

නන්දගේ සිතෙහි දැඩි කලකිරීමක් හටගත්තේ ය. පියල්ගේ චරිතයෙහි අශෝභන තැන් කිහිපයක් ඇගේ සිතට නැංගේ ය. නන්දගේ ඉවසීමත් ප්‍රස්තාවෝචිත ක්‍රියාත් නිසා පියල් චරිතයෙන් හොඳටම කිලිටි නොවී බේරුණේ ය. කොළඹ හැර දමා පියල් සමඟ ගමට ගොස් ජීවත්වන්ට සිතන තරම් වරක් නන්ද කලකිරුණා ය. ඈ ආපසු ගමට නොගියේ දරුවන්ට ඉගැන්විය යුතු ය යන අදහස සිතින් බැහැර කළ නොහැකි වූ බැවිනි.

බොහෝ කලක් යන තෙක් නන්ද කොළඹ ජීවත්වූයේ මහත් සන්තෝෂයෙනි. තමාත් සහෝදරියක් මවත් අඟහිඟ වලින් මිරිකෙමින් ජීවත්වූ බව ගැමියෝ දනිති. පියල් සමඟ විවාහ වූ පසු ඔහුගේ නෑයන් වන ගැමි ගැහැනුන් ඇසුරු කිරීම ඇට ප්‍රිය නොවී ය. ප්‍රිය නොවූයේ ඔවුන් ඇතැම් විට ඇනුම් පද කියූ බැවිනි. කොළඹ නන්ද ඇසුරු කළ කිසිවෙක් ඇගේ පවුල හා එහි අතීතය ගැන නොසෙවුවේ ය. පියල්ගේ මවුපියන් ගැන කිසිවෙක් කිසිවක් නොඇසුවේ ය. නන්දගේ කුලමානයද හේතු ප්‍රත්‍යය නොලැබී මෙන් යට යන කර්මයක් මෙන් යට ගියේ ය.

ඇලන් තම පියාගේ චරිතයෙහි යටගිය අශෝභන තැනක් පාදා මතු කිරීම නිසා නන්දගේ හද නොයෙක් හැඟීම් ගැටීමෙන් චංචල වී ය. ඇගේ සිත් වේදනාව මෙන් කෝපය ද දැඩි වූයෙන් ඇගේ මුහුණට සාහසික වේශයක් ආරූඪ වී ය. තම සහෝදරියගේ මුහුණ

ඇ පියල් සමඟ කලහ කළහොත් ඇලන්ගේ ලියුම කියවන්ට දඬු කුහුලක් පියල් තුළ හට ගන්නේ ය. ඇලන්ගේ ලියුම කියවන පියල් කිපෙයි. ඔවුන් කලහ කළහොත් ............

ඇලන් ලියුම එවන ලද්දේ නන්දට නොව තමාට යයි පියල්ට දැන්විය යුතුයයි තිස්ස කල්පනා කෙළේ ය. එවිට පියල් ඇලන්ගේ ලියුමෙහි තොරතුරු අසනු මිස ලියුම කියවන්ට නොසිතයි.

"ඇලන්ගේ ඒ වල්පල් මම නොකියවා අත්හරින්නම්"යි තිස්ස කීවේ ය. "මවුපියන්ගේ ජීවිතයෙහි සිදුරු සොයන්ට ඇලන්ට කොහෙත්ම උවමනාවක් නෑ. විපතක් දුකක් පැමිණි විට එය ඉවසා ගෙන හිත සනසා ගන්ට වෑයම් නොකොට ඇලන් මේ අනන්මනන් ලියන්නේ ඕනෑවට වැඩි නිදහස ඇතිව ඇතිදැඩි උණු නිසා........"

"පියල් ඒක ඒ දවස්වල කිව්වා."යි නන්ද ශෝකයෙන් තෙපලා ය.

"කරෝලිස් මුදලාලි තම පුතුන් කුඩා කල පටන් හැදුවේ කිසිම නිදහසක් නොදීමෙන්. ඔවුන් නාටකයක් බලන්ට ගියේත් පියාගෙන් අවසර අරගෙන යයි පියල් නොයෙක් වර කියනු මා අසා තිබේ"යි තිස්ස නන්ද සනසන අටියෙන් කී ය. "දරුවන් ලොකු උණාට පස්සෙත් පියාට කීකරුවම වැඩ කරන්ට පුරුදු උණා. පියාට ඔවුන්ගේ ආදරය අඩු උණෙත් නෑ. ඇලන් නිදහස ඇතිව හැදුණු නිසා කුඩා කල තමා කරපු වැරදිත් මේ ලියුමේ ලියා තිබෙනවා. නන්දගේ සිත සනසා ගැනීමට හේතුවන තොරතුරු ඇත්තේ ඇලන්ගේ ලියුමේ ඒ කොටසේ ය."

තිස්ස යළිත් ඇලන්ගේ ලියුම කියවූයේ ය.

මා තාත්තාගේත් අම්මාගේත් වැරදි හෙළි කෙළේ තරහයෙන්වත් ද්වේෂයෙන්වත් නොවේ. මගේ චරිතය වෙනස් වීමට ඒ වැරදි ද හේතු වී යයි මගේ වැටහීම බැවින් මගේ වැරදි හෙළි කරන්නාක් මෙන් ඒ වැරදිද හෙළි කරන්ට මම සිතුවෙමි.

මගේ සමහර ගති වෙනස් වී ය. අයිරින් මළ පසු මම මටම තරයේ දෙස් නඟා ගත්තෙමි. මවුපියන් කෝපයෙන් නොව ආදරයෙන් වුව ද මගේ වරදක් පෙන්වූ විට මා ඔවුන්ට පිළිතුරු දුන්නේ තරහයෙනි. මවුපියන් මට ආදරය දක්වනු ද මම නොඉවසුවෙමි; මගෙන් ප්‍රශ්නයක් අසනු ද නොඉවසුවෙමි. රාජකීය විද්‍යාලයෙහි උගන්නා කාලයෙහි 'වාර විභාගය පිළිබඳ ප්‍රශ්න පත්‍රයට හොඳින් පිළිතුරු දුන්නාදැ'යි ඔබ ප්‍රශ්න කළ විට වුව ද මා පිළිතුරු දුන්නේ සන්තෝෂයෙන් නොවේ. මා බෙහෙවින් සිනාසුණේත් සන්තෝෂ වූයේත් ගෙදරදී නොව පිටතදී ය. ගෙදරදී සෙල්ලම් කරන්ට මට පුරුදු නොවී ය. ගෙදරට පැමුණුණු විගස

මා සිතුවේ පොත් පාඩම් කිරීම ගැනය. අම්මාත් තාත්තාත් කළ කී දේ නිසා ඒ හැඟීම මා තුළ ඇති වී යයි මම සිතමි.

මා හැම අවුරුද්දෙහිම තෑගි ලබන සේ විභාගයෙන් සමත් වූයේ අර හැඟීම, උගන්නා විෂයන් දැඩි ලෙස සිතට අරමුණු කර ගැනීමට මා හික්මවූ හෙයිනි. අම්මාත් තාත්තාත් මා තුළ ඒ හැඟීම දියුණු කිරීම මගේ උගැන්මට ලොකු අනුබලයක් වූ නමුදු මගේ සම්හර ගති වෙනස්වීමට ද හේතුවක් වී ය. මගේ ගති වෙනස් වූයේ කුඩා කල නොව දහ අට ඇවිරිදි වියෙහි පමණ ය. ඒ වියෙහි දී මා ගෙදර ආවේ යහළුවන් සමඟ කතාබහ කරමින් ඇවිද ඇදිරි වූ පසුයි. ගෙදර මතක් වන විට මගේ සිතට නැංගේ පාඩම් කිරීම පිළිබඳ හැඟීමයි. එහෙයින් පාසැල වැසූ පසු හවස් වන තෙක් ගෙදරින් පිටතදී සන්තෝෂ වන්ට මම සිතුවෙමි.

යවුලකින් අන්නු ලබන කලක මෙන් මගේ හද කකියන්ට පටන්ගත්තේ අයිරින්ට ආලය බැඳගත් කාලයෙහි ඔබටත් තාත්තාටත් මා තුළ වූ ආදරය මගේ සිතෙහි යටටම ගිය බව සිහි වන විටයි. ඒ ආදරය යළිත් මගේ සිතට වේගයෙන් නැංගේ අයිරින් සමඟ මෙහි ඇවිත් හත් අට මසක් ජීවත්වූ පසුයි. මේ ලියුමෙන් ඔබටත් තාත්තාටත් චෝදනා නඟන්ට සිතුණේත් මගේ අන්තඃකරණය මට වධයක් වූ හෙයිනි. මා කළ වැරදි මගේ දුෂ්ට කමකින්ම අකෘතඥ කමකින්ම සිදු නොවීයයි සිතන්ට මම වෑයම් කෙළෙමි. ඔබත් තාත්තාත් කළ කී ඇතැම් දේ මගේ වෙනස් වීමට හේතු වීයයි මට හැඟුණේ ය.

අයිරින්ගේ මරණයෙන් පසු මම මාම නිර්දය ලෙස විවේචනය කරන්ට පටන්ගත්තෙමි. ආත්ම විවේචනයෙහි ඒ ආශාව ඔල්මාදයක් වන තරම් දියුණු වී ය. මේ නගරයෙහි ජීවත්වන්නන්ගෙන් බොහෝ දෙන ඉමක් ගමක් නැත්තන් වැන්නෝ ය. ඔවුන් ආපදවත් නිසා තමන්ගේ රටවල් හැර මෙහි සංක්‍රමණය වූවෝ ය. මොවුන් ජීවත් වන්නේ තමන්ගේ රට, මවුපියන් හා නෑයන් ද සිතින් බැහැර කළවුන් ලෙසිනි. මා පුදුමවන්නේ ඔවුන් මෙන් ලංකාව, මවුපියන් හා නෑ මිතුරන් ද අමතක කොට ජීවත්වන්ට මට නො හැකිවීම ගැන ය.

ඉගෙනීම හැරදමා අයිරින් සමඟ මෙහි එන්ට සිත්වන තරම් මගේ ප්‍රකෘති ගති පුබුදනා ලද්දේ ඔබත් තාත්තාත් විසිනියි යන හැඟීම මට මගේ සිතින් බැහැර කළ නොහැකි ය. ඒ ප්‍රකෘති ගති මා තුළ පමණක් නොව කවර හොඳ තරුණයකු මෙන් නරක තරුණයකු ද තුළ ඇත. අයිරින්ට ආලය බැඳගත් පසු මම ආත්මාර්ථකාමියෙක් වීමි. මගේ ඒ වැරැද්දට අබමල් රේණුවකින්වත් අයිරින් වැරදිකාරියක් නොවේ. තරුණියන්ගෙන් සියේට හැත්තෑපස් දෙනකුන්

එවැනි කරුණු වලදී වැරදිකාරියන් විය හැකි ය. අයිරින් ඇතුළු වන්නේ අනික් විසිපස් දෙනාගේ ගණයටයි.

මවුපියන්ගේ කෝපයත්, තරවටුවත් ආයාචනයත් අසා නොකිපී සිටින්ට නොහැකිවීම මගේ දූර්වල කමක් වී ය. ඒ දූර්වල කම ඉස්මතු වූයේ මවුපියන් නිසා උපන් ඇල්ම, මගේ සිතෙහි බිංගෙයක් වැනි යටම තට්ටුවට බැස අකෘතඥකම නමැති අඳුරෙන් වැසීයාම නිසා ය. පොතින් පතින් හා උගත් මිතුරන් ඇසුරෙන් ද ලත් දැනුම නිසා මම අහංකාර වීමි. ඉගෙනීම හැර දමන්ට සිතුණේ මගේ ඒ අහංකාරකම නිසා ය. ඔබත් තාත්තාත් ඇතැම් විට දෙඩූ අතන් මතන් ඉවසන්ට පුරුදු වී නම් මගේ ඉගෙනීම හැර දමන්ට මට නොසිතෙයි.

හෙට්ටි මිනිසුන් දරුවන් තනන සැටි තාත්තා නොයෙක් වර වර්ණනා කරනු මා අසා තිබේ. මට ද ඇසෙන සේ තාත්තා ඒ වර්ණනා කරන ලද්දේ මා හෙට්ටින්ගේ දරුවන් අනුගමනය කරනු දකින ආශාවෙනි. එහෙත් තාත්තාගේ ඒ වර්ණනා ඇසූ මා තුළ හටගත්තේ අමනාපයකි. හෙට්ටින් දරුවන් තනන සැටි තාත්තා වර්ණනා කරතියි මා වරක් කියූ විට තිස්ස මාමා හොඳටම සිනාසුණේ ය. 'හෙට්ටියා තලගොයකුගේ හම වැනි හමක් ඇති සතෙකි' යි ඔහු කීවේ ය. හෙට්ටියා සතයෙන් එකසිය විස්සෙන් පංගුව ද ගණන් හිලව් බැලීමෙහි දී බැහැර නොකරයි. හෙට්ටි ගෙදර දෙතුන් දෙනකුට මස් කන්ට හිතුණාම ඔවුහු එළුමස් ගැනීමට කෝකියාට මුදල් දෙති. ඔවුන් දෙන මුදල් වලට සරිලන එළුමස් කැලි කපා ඉරටුවල අවුනා පුස් කොළ කැබැල්ල බැගින් ඒ ඉරටු මිටිවල බැඳ ඔවුන් කෑම කන තැන තබන්නේ කෝකියා ය. තාත්තාගේ වර්ණනාවට භාජන වූ හෙට්ටියා ගැන තිස්ස මාමා කියූ මේ කතා ඇසූ මම ද හොඳට ම සිනාසුණෙමි.

'හෙට්ටින් ගැන මේ තොරතුරු දැනගත්තේ කොහොමදැ' යි මම තිස්ස මාමාගෙන් ඇසුවෙමි.

'ඒ තොරතුරු මම සඟරාවක පළවූ ලිපියකින් දැන ගත්තා'

තාත්තා මසුරකු නොවූවත් මුදල් ගොඩගැසීමෙ ආසාව ඇත්තෙකි. වැඩි උගැන්මක් නොලැබීමත් නූගත් මිනිසුන් ඇසුරු කිරීමත් නිසා ඔහු මා යුරෝපියයන් අනුකරණය කරන නාගරිකයන්ගේ දරුවන් ඇසුරු කරනු නොඉවසුවේ ය.

තිස්ස මාමා තරුණ වියෙහි දී යහළුවන් සමඟ සෙල්ලම් ගමන් ගියේ ය. වරක් කුරුම්බාවක වතුර බී ලොඳ කා දවල් වරුව ගත කෙළේ ය. ගඟින් එගොඩට ඔරුවෙන් ගොස් මයියොක්කා තම්බා ගෙන පොලුත් සම්බලුත් සමඟ කෑවේ ය. ඔහු කුඩා කර සතපහක් ගෙවා නාඩගම් බලන්ට ගොස් එළි වන යාමය තෙක්

තිටගෙන සිටියේ ය. මා මේ පුවත අවුලා ගත්තේ තිස්ස මාමා නොයෙක් වර කියූ කතා වලිනි.

මෙවැනි අපිස් ජීවිතයකින් මා ගික්මවනු ලැබුවේ අයිරින්ට ආලය බැඳගත් පසුයි. ඔබත් තාත්තාත් සමඟ තරහ වී ගෙයින් පිට වුණු ඇතැම් දවසක මගේ ආහාරය වූයේ පාන්පෙති දෙකක් හා සීනි සම්බෝලය ද පමණි. එක් දවසක අයිරින් සමඟ මම නගරයේ ඇවිද්දෙමි. අත තුබුණු මුදල් විදුලිරියටත් සිනිමා සිත්තම් බැලීමටත් වියදම් කොට ගෙදර ආ මම නිරාහාරව නිද ගත්තෙමි.

''රෑට කෑම කාලා ආවාය'' යි මා එද ඔබට කීවේ බොරුවකි. එහෙත් ඔබ 'ටිකක් හරි කාලා නිදගන්න' යයි ආදරයෙන් කීවා ය. 'මට දැන් කන්න බැහැ' යි මා තරහයෙන් පිළිතුරු දුන්නේ කුමක් නිසාදැ යි දැනුදු මට නොවැටහේ.

# 5

ඇලන්ගේ ලියුමේ අවසානය ඇසූ නන්දගේ දෙනෙතට කඳුළු නැංගේ ය. මවුපියන්ගේ සිත්සතන් විභාගකරන්ට වෑයම් කරන්නාක් මෙන් ඇලන් ඔවුන්ගේ චරිත විවේචනය කරනු ලැබීම නන්දගේ කෝපයට හේතු වී ය. එහෙත් ඔහු තමා කළ ගුණ නොසලකන්නකු මෙන් කළ හිතුවක්කාරකම් හා කී හිතුවක්කාර කියුම් ද තම ලියුමෙහි සඳහන් කරනු ලැබීම ගැන සිතා ඇ සිත සනසාගත්තා ය.

ඇලන් ඔලමොල තරුණයකු වෙතියි පියල් සිතුවේ ය. අවුරුදු ගණනක් ගෙවෙන තෙක් ඔහු මවුපියන්ට ලියුමකුදු නොඑවූ නිසා නන්ද සිත් වේදනාවෙන් වුව ද පියල්ගේ මතය පිළිගත්තා ය. ඔහු තමන් හැරදමා ගිය නමුදු හොඳ මිනිසකු ලෙස ජීවත් වන්ට වෑයම් කරන බව දැනගන්ට ලැබීම නිසා නන්දගේ සිත් වේදනාවත් ශෝකයත් බෙහෙවින් අඩු වී ය.

නන්දගේ අතීතය පිළිබඳ හැඟීම් ඇගේ වර්තමානය වනසන ගින්නක් සේ නැංගේ ය. එහෙත් ඇගේ වර්තමානය ඒ ගින්නෙන් දැවී විනාශ වන්නක් නොව අතීතය ගිලගෙන ජීර්ණ කොට දෙකම එකක් කරන්නකි.

අයිරින් මිය ගිය බැවින් ඇලන් විවාහ බැම්මෙන් නිදහස් වී ය. ඔහු මවුපියන්ට කොතෙක් දෙස් නැඟුවත් ජීවත් වන්නේ ඔහුගේ අතීතය ගැන කලකිරීමක් ඇතිවයි. ඔහු කෙසේ හරි ලංකාවට ගෙන්වාගත යුතු අවස්ථාව මේ ය. තමා සිටින තැන ඇලන්ගේ ලියුමෙහි සඳහන් නොවී ය. ඔහු සිටින තැන සොයාගන්නේ කෙසේදැයි සිතමින් නන්ද තම සිතට වද දෙන්ට වූවා ය.

''ඇලන් ලන්ඩන් නුවර නැවතී ඉන්න තැන දැනගන්න විදියක් නැද්ද?''

''ඇලන් ඉන්න තැන සොයන්න වෙහෙසීම පිදුරු ගොඩක යටවුණු ඉදිකටුවක් සොයන්ට වෙහෙසීම වැනි නිෂ්ඵල වැඩක්'' තිස්ස කීවේ ය.

තිස්ස ද ඇලන් සිහි කෙළේ ශෝකයෙනි. ඉගෙනීම අවසාන කරන්ට පෙර ඔහුගේ ආලය නොපිබිදුණා නම් ඔහු කවර විභාගයකින් වුව ද පහසුවෙන් සමත් වන්නේ ය. විකාශනය වුණු වැඩෙන තුවණක් ඇති උගැන්මෙහි ගූර ඇලන්ගේ ආලය අකාලයේ පිබිදුණේ අහම්බෙනි.



Scanned by CamScanner

"පියල් අඳුනන ඉංගිරිසි වෙළෙන්දෝ කිහිප දෙනෙක් ඉන්නවා. ඔවුන්ගේ මාර්ගයෙන් ඇලන් ඉන්න තැන සොයා ගන්න බැරි වෙන එකක් නැහැ."

"මම හිතන්නේ නැහැ"යි තිස්ස නොසිතා ම තෙපලේ ය. මඳක් කල්පනා කළ ඔහුගේ සිතට අමුතු අදහසක් නැංගේ ය. තරුණ වියෙහිදි කියවූ ඇතැම් රහස් පරීක්ෂක ඉංගිරිසි නවකතාවක තොරතුරු ඔහුට සිහි වී ය.

"නැතිවුණු මිනිසුන් හෝ බඩුබාහිරාදිය හෝ සොයා දෙන රහස් පරීක්ෂකයන් ඉන්නවා. රක්ෂාව වශයෙන් ඒ කාරිය කරන ඔවුන් පොලිසියට සම්බන්ධ වෙලා නෑ. ඔවුන් ලවා ඇලන් ඉන්න තැන සොයාගන්න පුළුවන් වේය කියා හිතනවා. ඔවුන් එවැනි වැඩ බාරගන්නේ මුදල් සපයන අදහසින්.........නමුත් ඔවුන් බොරුවෙන් මුදල් කඩාවඩා ගන්නා අදහසින් ක්‍රියාකරන්නේ නැහැ."

"ඇලන් ඉන්නා තැන සොයා අපට දන්නුවොත් ගාස්තුව විතරක් නෙවි, තෑගිත් දෙන්න පුළුවනි. තිසා ඒ ගැන සොයන්න."

ඩිරෙක්ටරියක් සොයා එහි පිටු පෙරළා බලනු පිණිස තිස්ස කාමරයට ගියේ ය. නන්ද තමාගේ හෝ පියල්ගේ හෝ අතීතය සිහි කරන්ට කැමැති නොවූවා ය. එහෙත් තමාගේ අතීතය සිහි නොකොට ඈට ඇලන් ගැන සිතිය නොහැකි ය. පියල් හා විවාහ වී දැවුරුද්දකට පසු නන්ද පියල් විසින් මෝදර සාදවන ලද ගෙයක පදිංචියට පැමිණියා ය. සිත කය දෙක වෙළඳාමට අවනත කොට මුදල් සපයන පියල්ට නිතර ගමට යෑමට ඉඩ නොලැබිණ. නන්ද අමතක කරවන තරම් ඔහුගේ සිත වෙළඳාමට ඇදී ගියේ ය. වරක් නොව දෙතුන් වරක්ම මසකට වරක්වත් ඔහු ගමට නොයාම ගැන බියගත් නන්ද 'කොළඹ පදිංචි වෙමු' යයි පියල් කළ යෝජනාව සන්තෝෂයෙන් පිළිගත්තා ය.

ඔවුන් ගම හැර යනු නොඉවසූ පියල්ගේ මව නන්දට දෙස් නැඟුවා ය:

"උපන් ගම හැර කොළඹ පදිංචියට යන්නේ මොකොට ද? අයාමකදී නොයාමකදී සලකන්න කවුද එහේ ඉන්නේ?"

"අම්මත් කොළඹ එන්න"යි නන්ද යෝජනා කළා ය. "ගමට වඩා එහේ හුඟක් හොඳයි. එහිදී පාත් පත්තුකරන්න මහන්සි වෙන්න ඕනෑ නෑ. අත්වල තෙල් ගෑවෙන්නේ නෑ. පුතා හැදෙවූ ගේ එළිය කරන්නේ විදුලි පහන්වලින්. ළිඳෙන් වතුර ගන්න මහන්සි වෙන්න ඕනැත් නෑ. ගේ ඇතුළට වතුර පයිප්ප දමා තියෙනවා."

"අපේ අම්මලාට තාත්තලාට පින්සිද්ද වෙන්න අපේ අතපය හයියට හඳ තියෙනවා. ළිඳෙන් වතුර ගැනීම මට නම් සන්තෝෂයක්,

ගමේ කවුරුත් හමුවෙන්නෙත් ඔවුන් එක්ක කතාකරන්න ලැබෙන් නෙත් පොකුණට නාන්න ගියාම.''

පියල්ගේ මව මේ බස් තෙපලේ අවලාදයක් කියන්නක ලෙසිනි. ඈ සමඟ තර්ක කරන්ට නොසිතූ නන්ද මෙසේ කීවා ය.

''අම්මා කොළඹ ටිකක් දවස් ඉඳලා බලන්න. ගමට එන්න හිතෙන එකක් නෑ.''

''ඒ මට නෙවි'' යි කියමින් පියල්ගේ මව සිනාසුණා ය. ''තෙපානිස් එයාගේ මාමා කෙනෙකුගේ ගම්පල කඩේට එක්ක ගියා. ඒ මිනිහා දෙමාසයක් ඉතා අමාරුවෙන් කඩේ ඉඳලා ගමට ආවා. 'ගම ඉඳගෙන කොරලි සෙත්තලෙක් අතගාන එක මට නම් ඔය සිදදිවල ගිහිල්ලා වෙළඳාම් කරනවාට වැඩි සන්තෝෂයක්'යයි ඒ මිනිහා හැමෝටම කියන්න පටන්ගත්තා.''

තම නැන්දම්මාගේ සිතුම් පැතුම් දන්නා නන්ද කර බා ගත්තා ය. නැන්දම්මා හා තර්ක කිරීම නිෂ්ඵල ය.

පුතා දන් හැම කරුණක් ගැන විමසන්නේ අම්මාගෙන් නොව නන්දගෙනි. අම්මාගේ අදහස් හා හැඟීම් ඔහු නොසලකයි. මව බැණ වැදුණත් පියල් මුවෙන් නොබැණ කර බා ගන්නා නමුදු මව කියන දෙයක් නොපිළිගනියි. මව කොළඹ පදින්චි වුවහොත් තමා සමඟ කලහ කරයි. කොළඹදී ඈගේ මේ දෙඩමළු කම වැඩිවෙයි. ඈට ගම නවතින්නට අනුබල දිය යුතු යයි නන්ද කල්පනා කළා ය.

''තෙපානිස්ට විතරක් නෙවි මටත් පුරුදු උණේ ගමේ ජීවත් වෙන්ට තමා''යි කියමින් නැන්දම්මා, නන්දගේ මුහුණ බැලුවා ය. ''ඉස්සර අපි ජීවත් උණු හැටි අපට මතක නැති කරන්න බැහැ. සිදදිවලට ගොහින් ගම මතක නැති කරන්න අපි කැමැති නැහැ.''

නන්දගේ මව (මාතර හාමිනේ) කොළඹ පදිංචියට අකැමැති නොවූ නමුත් 'මහ ගෙදර' හැර යෑමට කැමැති නොවූවා ය. වැදූ මවගේ ළය බදගන්නා දූරියක මෙන් ඈ තමාට සුපුරුදු ගෙය සිතින් බදගනියි. වයස්ගත වීමෙන් හා ආපදවන්ට හසු වීමෙන් දිරා යන ඈගේ මුහුණත් කයත් අනුව මහ ගෙදර ද නොවැළැක්විය හැකි සේ ගරාවැටෙයි.

කොළඹ පදිංචි වී අවුරුද්දක් ගෙවෙන්ට පෙර නන්ද නගරයේ ගැහැනියක මෙන් නාගරික සිරිත් විරිත් අනුකරණය කරන්ට උගත්තා ය. ඇලන් උපන් දවසෙහි රන්කිරි කට ගා ඔහු සුරතල් කෙළේ සාත්තුකාරියක විසිනි. දූඩී පුහුණුවක් හා ඉහළ පන්තියේ වැදුම් ගෙවල සේවය කිරීමෙන් ලත් අත්දැකීමක් ද ඇති ඒ සාත්තු කාරිය අනික් කිසිවකුගේ ඇඟිලි ගැසීමක් ප්‍රශ්න කිරීමක් නොඉවසී මින් තමා සතු හැම කාරියක්ම නොපිරිහෙළා කළා ය.

Scanned by CamScanner

පියල්ගේ මව තම ලේලිත් පුතාත් කෙරෙහි සාත්තුකාරිය පවත්වන ආධිපත්‍යය නොඉවසුවා අසන්තෝෂයෙන් ඇනුම් පද කියන්ට පටන්ගත්තා ය. වැදූම් ගෙයි අධිපතිකම තනි කොට සාත්තුකාරියට බාර දෙනු ලැබීම නොඉවසූ මාතර හාමිනේ තම අසන්තෝෂය මැඩගැනීමට වෑයම් කළා ය.

"මම දරුවන් තුන් දෙනෙක් වදූ මොනම සාත්තු කාරියෙකුගේ වත් උපකාර නැතිව කවා පොවා නාවා හැදුවා"යි නැන්දම්මා නන්දට ඇසෙන සේ කීවා ය.

සාත්තුකාරිය සිංහල වචනයකුදු නොදත්තක මෙන් තමා නැවූ බිළිඳා සන්තෝෂයෙන් තෙත මාත්තු කොට පුයර හැළුවා ය.

"මෙහිදී ගමදී වගෙ වැඩ කරන්න බෑ අම්මා" යි නන්ද සෙමින් කියමින් තම නැන්දම්මාගේ දෙඩුම නවත්තන්ට වෑයම් කළා ය.

"අනේ අපි නම් දන්නේ නෑ මේ අලුත් පන්නවලින් සිදුවෙන වැඩ අවැඩ. පොඩිම දරුවන් අතපත ගාන්න ඕනෑ අම්මා. පිට ගෑනියෙක් ලවා කිරි කට ගෑව්වේ ඇයි. ලොකු උණාම පුතා අම්මාට වැඩිය පිට ගෑනුන්ට ඇල්ම කරන්න උණොත්! බොලා දෙන්නට ඕනෑ විදියක් කරගන්න ඇරලා ගමට යන එකයි අපට කරන්න තියෙන්නේ."

"අම්මා ගම්දි හයියෙන් කතාකරලා පුරුදුවෙලා මෙහේදිත් හයියෙන් කතාකරනවා"යි කියමින් නන්ද මඳසිනාවක් පහළ කළා ය.

"කට තියෙන්නේ හයියෙන් කතාකරන්න මිසක් වෙන මොකොට ද?"

"මයි මදරින් ලෝ........"යි කියමින් නන්ද සාත්තුකාරියගේ මුහුණ බැලුවා ය. සිනාවකුදු නොනඟා ඇ කර බාගෙන තම කාරිය කරන්නේ අසතුටින් ද?

" I know ........"යි නන්දගේ නැන්දම්මා දෙස නොබලාම සාත්තුකාරිය පිළිතුරු දුන්නා ය.

පියල්ගේ මවත් මාතර හාමිනේත් දෙසතියක් කොළඹ ජීවත් වූයේ කුඩුවක සිර කරනු ලැබූ ගිරවියන් ලෙසිනි. ආත්ම සංයම-යෙන් කට රැකගත් මාතර හාමිනේ කතා කෙළේ ප්‍රශ්නයකට පිළිතුරු දෙනු පිණිස පමණි. ගෙදරට පැමිණෙන අමුත්තන් නන්ද සමඟ ඉංගිරිසියෙන්ම කතාබහ කරනු ඇසූ පියල්ගේ මවගේ සිතෙහි වේදනාවක් හට ගත්තේ ය.

නන්දගේත් ඇගේ පවුලේත් අතීත තොරතුරු පියල්ගේ යට සිතින් මතුව ජාගර සිතට නඟියි. තමාට හිමි සැලකිල්ල ආදරය හා කෘතඥතාව නොනෑයක වන සාත්තුකාරියට පුදන ලදැයි යන

Scanned by CamScanner

හැඟීමෙන් හටගත් ඊර්ෂ්‍යාව හා සිත් වේදනාව ද නිසා ඇගේ සිත පාතාල ලෝකයක් වී ය. පාතාලයෙහි අහුමුළුවලින් එබිකන් පාත කුත්සිතයන් මෙන් සැඟවී සිටි ඇගේ පියවී හැඟීම් නගින්ට වැයම කරයි. නන්දගේ අතීතය පිළිබඳ තොරතුරු ගිනි මල් වැස්සෙක් මෙන් ඒ පාතාලය එළිය කරමින් නැඟ එහ එහා අතුරුදහන් වෙයි.

නන්ද පළමුව විවාහ වූයේ කුලවත් පවුලක උපන් නිවටයකු සමඟ ය. ඔවුන් ජීවත් වූ ගරා වැටුණු ගෙය මඳක් ප්‍රකෘතිමත් කරවන ලද්දේ දෙවන වර නන්ද සමඟ විවාහ වුණු තම පුතාගේ මුදල් වියදම් කිරීමෙනි. නන්දගේ පළමුවන සැමියා ඉස්පිරිතාලයක හිඟන වාට්ටුවක මළේ ය.

කොළඹ පදිංචි වූ පසු නන්දගේ කුලමානයත් අහංකාර කමත් අමුතු වෙසක් ගත්තේ ය. ගමදී තමාට බෙහෙවින් කීකරුව තම බැත්තත් කර බාගෙන ඉවසූ නන්ද, කොළඹ පදිංචි වී අවුරුද්දක් ගෙවෙන්ට පෙර අමුතුම ගැහැනියක වූයේ කෙසේ ද? තම පුතා හා විවාහ වූ දවසෙහි පටන් නන්ද තමා රවටන අදහසින් ක්‍රියා කළා ය. කපටි හෙර............

කුලමානය නමැති දිරූ කඩතුරාවට මුවා වූ නන්ද හා ඇගේ සහෝදරියන් මවත් සටකපට කම් කිරීමෙන් තමන්ගේ දිළිඳුකම සඟවාගත්හ. එහෙත් තමාටත් තම පුතාටත් නොදැනෙන සේ ඒ දිළිඳු කම ඔවුන්ට සඟවාගත නොහැකි වී ය.........කපටි හෙර.

ලැයිසාගේ මඟුලට යන්ට අකැමැති වූ නන්ද 'උන්ගේ මඟුල් වලට මම යන්නේ නෑ' යි ගර්වයෙන් කීවා ය. නන්ද මුල සිටම ක්‍රියා කෙළේ තම පුතා තමාගෙන් වෙන් කොට ගෙන කොළඹ ගොස් පදින්චි වී තමා බැහැර කරනු පිණිස ය.........කපටි හෙර.....

ඇ තම ලේලි කෙරෙහි පැහැදී දැඩි විශ්වාසයෙන් සිටි කාලයෙහි තමාගේ කුඹුරත් ද අක්කර හතරක පොල් වත්තක් ද තෑගි ඔප්පුවකින් ලේලිට හිමි කළා ය. කුඹුරු උදුනේ ගින්න වැනි රෝෂයකින් නැන්දම්මාගේ හද දැවෙයි. දැඩි දිළිඳුකමින් බොහෝ කාලයක් හික්මවනු ලැබූ ඇ තම පුතාත් ලේලිත් සිතින් බැහැර කොට හුදෙකලාව ජීවත් වීමට සිතාගත්තා ය.

තම පුතා තමාගෙන් සොරාගෙන තමා හැරදමා ගිය නන්ද කපටි ගැහැනියකි. ශෝකයත් රෝෂයත් පුතාට ඇති ඇල්මත් එකම ගිනිමැලයක් සේ ඇවිලගෙන ඇගේ හද දවයි. එහෙත් ඒ ඇතුළු ගින්නෙහි සලකුණකුදු ඇගේ දෙඇසෙහි නොවී ය. මුහුණෙහි ද නොවී ය.

දිළිඳු පවුලක ඉපිද දිළිඳු ගැමියකු සැමියා කොට ගෙන විසූ ඇ උදේ සිට සවස් වන තුරු කය වෙහෙසා වැඩ කරමින් දසියන් කර කාර්යයන් ද කළා ය. ඇ පොල් කොටයෙන් තැනුණු කොඹු

උඩ පල් උණු පොල් ලෙලි තබා කිතුල් පොල්ලෙන් 'ටන් කටාන්' හඩින් තළා කොහු කොට ලනු ඇඹරීමෙන් මුදල් සැපයුවා ය. අනතුරුව පොල් ලෙලි පල් කොට විකුණන්ටත් රත්රන් බඩු උකසට ගන්ටත් පටන් ගත්තා ය. එයින් සපයාගත් මුදල් ඇති ඇ පොල් ඉඩම් බද්දට ගෙන ගස්වලට සාත්තු කොට එහි පලදාව වැඩිකිරීමෙන් ක්‍රමයෙන් ධනවත් වූවා ය. ඉතිරි කරගත් මුදල් ඇති ඇ ඉඩම් අක්කරය බාගය බැගින් මිලට ගෙන අක්කර දහයක පමණ පොල් ඉඩම් අයිතිකාරියක් වූවා ය.

ඇ තම අතීතය සිහි කෙළේ ලජ්ජාවෙන් වත් නිවට හැඟීමෙන්-වත් නොව ගර්වයෙනි. තම ලේලිගේත් පුතාගේත් වර්තමාන ජීවිතය සිහි කරන ඇගේ සිතෙහි හටගන්නා හැඟීම දිවට ද දැනෙන තරම් තිත්ත ය.

මාතර හාමිනේ තම දුව සමඟ කොළඹ ජීවත්වන්ට නොසි-තන්නේ එවැනි කටුක හැඟීමකින් නොව තම දුවටත් බෑනාටත් ප්‍රිය ජීවිතය තමාට නුහුරු බැවිනි. නන්ද ඇසුරු කරන ධනවත් ස්ත්‍රියක 'අර නාකි ගැහැණිය'යි තමා අනිකකට හැඳින්වූ සැටි මාතර හාමි-නේට මතක ය. එහෙත් ඇ ඔවුන් ගැන නොකලකිරුණා ය. නොකිපුණා ය. කොළඹට ඇවිත් එහි සතියක් දෙකක් ගත කරන තාක් ඇ සිතුවේ-බිඳ වැටෙන්ට ළං වන තෙක් ගරා වැටුණු තම මහ ගෙදර ගැන ය. මහ ගෙදර සිහිවන විට ඇ තුළ බියක් හා භක්තියක් ද හටගනියි. මියගිය තම සැමියා සිහි නො කොට ඇට රුක්ස අඹ ගහ සිහි නොකළ හැකි ය. රතු වීදුරු බෝල වැනි ලොවි පොකුරුවලින් බර වුණු ලොවි ගස දූත් දෙදෙනාගේත් පුතාගේත් බාල විය ඇට සිහි කරවයි. සැමියා, අඹ ගහට අරක්ගත් දේවතා-වකුව ඉපිද ඉන්නේ තමාටත් දරුවන්ටත් උපන් දූඩි ඇල්මෙනි.

ගමත් ගෙදරත් නන්දගේ මඟුල උදෙසා ගෙදරට පිවිසි අලුත් මේස, පුටු, කන්නාඩි මේස, පිඟන්, බේසන් ආදියත් පියල්ගේ මව සිහි කරන්නේ සන්තාපයෙනි. නන්ද තම පුතාගේ බිරිඳ වූයේ තමා නිසා ය. තමා විරුද්ධ වුණා නම් පියල් කොතරම් නන්ද පැතුවත් ඇ විවාහ කර නොගනියි. නන්ද තම බිරිඳ කරගැන්මට පෙර පියල් තමා කී හැම කාරියක් කර බාගෙන කෙළේ ය. තමා 'එපා' යි කී කිසිවක් කළ හැකි සිතක් ඔහුට නොවී ය. පියල් කෙරෙහි පැවැත්වූ මේ ආධිපත්‍යය නන්දගේ අතට යන බව නොදැන නොවේ පියල්ගේ මව නන්දට කැමැති වූයේ. මහලු වියෙහි වූ ඇ සන්තෝ-ෂයෙන් ජීවත් වනු දැකීම ඔවුන් දෙදෙනාගේ ද සන්තෝෂයට හේතු වනු ඇතැයි ඇ විශ්වාස කළා ය. වාතාබාධයෙන් පෙළෙන ඇ මැරෙන තෙක් වත් ඔවුන් දෙදෙනා ගම හැරදමා නොයෙතියි ඇ සිතුවා ය.

Scanned by CamScanner

මාතර හාමිනේත් සමඟ ගමට යෑමට සූදනම් වූ පියල්ගේ මව තම පුතා සමඟ කතා කෙළේ මේ සිතුම් හා හැඟුම් විසින් අළලනු ලැබූ හද ඇත්තක ලෙසිනි.

''මාතර හාමිනේත් මමත් හෙට ගමට යනවා පුතා'' යි මව තෙපලා ය. ඈ කතා කෙළේ කෝපයෙන් නොවේ; කවුක හැඟීමෙන් ද නො වේ. ඇගේ වදන්වලට යටින් වූ ශෝකාකුල හැඟීම පුතාට නොවැටහිණ. එහෙත් ඈ අනතුරුව තෙපලූ තෙපුල් පුපුරවාගෙන ඒ හැඟීම ක්‍රමයෙන් පිට වී ය.

''බොලාගේ මේ අලුත් ගෙදරදී නොකිය යුතු මොකුත් මගෙන් කියැවුණා නම් මට සමා වෙයල්ලා. මෙහේ අවුරුද්දක් උන්නත් මට ගම මතක නැති කරන්න පුළුවන් වෙන්නේ නෑ. වේලුණු රිටක් නවන්න බැහැ. නැවුණොත් කැඩෙනවා. උඹලා ලවා ඒ වැඩේ කරවන්න මම කැමති නෑ.''

''අම්මා මෙහේ නවතින්න''යි අන්දමන්ද වූ පියල් කීවේ ය. ''මෙහේ ටිකක් කල් ඉන්න කොට අම්මාට පුරුදුවේවි ඔයිට වෙනස් විදියට හිතන්න.''

''වෙනස් විදියට හිතන්න මට දැන් උණත් පුළුවනි. වෙනස් විදියට හිතුවාට මම වෙනස් වෙන්නේ නැහැ නෙව. වෙනස් නොවන හැම දේම ඉවත දමා ජීවත් වෙන්නයි උඹලාට දැන් සිදුවී තියෙන්නේ.''

විදහාගත් දෙනෙත් ඇති මවගේ මුහුණ බැලූ පියල් නැති ගත්තේ ය.

''වයස්ගත වීමෙන් විතරක් නෙවි; ලෙඩිනුත් අබලන් වූ මම තව අවුරුදු හත අටකට වඩා ජීවත් වෙන එකක් නෑ'' යි ඈ විදහාගත් දෙ ඇස නොවසාම කීවා ය. සන්සුන්ව කතා කරන ඇගේ මුහුණට සන්තාපයත් කෝපයත් ආවේශ වී ය. ''උඹලා කොළඹ පදිංචි වෙන්ට ආවේ ගමත් මාත් ගෙදරත් හැරදමන අදහසකින්යයි මම හිතුවේ නෑ. උඹේ වයස කීය ද? අවුරුදු හතළිහට වැඩි නෑ. උඹට තාන්ද අවුරුදු දහයක් ගම නවත්වාගන්න බැරි උණා......''

''කොළඹ පදිංචි වෙන්න යෝජනා කෙළේ තාන්ද නොවී'' යි පියල් කීවේ ය. ''කොළඹ පදිංචි වෙන්න යෝජනා කෙළේ මමයි. ඒ යෝජනාව කෙළේ අම්මා හැරදමා යන අදහසකින් නොවේ.

කෝපය පිට කරනු පිණිසදෝ පියල්ගේ මව හඩනගා සිනා සුණා ය.

''තාන්ද ඒ තරම කපටියි'' මව සෙමින් තෙපලා ය.

Scanned by CamScanner

මවගේ චෝදනාව අසාධාරණයයි සිතූ නමුත් පියල් වචනයකුදු නොකීවේ ය. නන්ද නොව තමා වැරදිකාරයෙකි. ඔහු සිතුවේ වෙළඳාම ගැන පමණි. ඔහු නන්ද විශ්වාස කළේ ය. මව විශ්වාස කළේ ය. ඔවුනොවුන් ජීවිතාන්තය දක්වා ඔවුනොවුන් කෙරෙහි බැඳී ජීවත් වෙතියි ඔහු සිතුවේ ය.

නන්ද ක්‍රියා කෙළේ කපටි අදහසිනි. ඒ හැඟීම මෙතෙක් කල් තම සිතෙහි කුමන අස්සක මුල්ලක සැඟවී සිටියක්දැයි සිතන්ට පියල්ගේ මව අපොහොසත් වූවා ය. කොළඹට නොපැමිණියා නම් ඒ හැඟීමත් ඊර්ෂ්‍යාවත් ඈ තුළ කිසි කලක හට නොගන්නා බව ඈ නොදනියි.

නන්ද නැන්දම්මාටත් මවටත් ආදර සැලකිලි දැක්වූයේ ගමදී මෙන් නොවේ. නාගරිකයන් හා සාත්තුකාරිය ද ඉදිරියෙහි දී ගමදී මෙන් කතාකළ නොහැකි ය; ගමෙහි මිනිසුන්ගේ වගතුග සෙවිය නොහැකි ය. වරක් අමුත්තන් සමඟ රෑ කෑමට මාතර හාමිනේත් පියල්ගේ මවත් වාඩි වූහ. අතින් කන්ට සිතාගෙන සිටි නැන්-දම්මා හැඳි ගෑරුප්පුවලින් කෑවේ නන්ද කී නිසා ය. එහෙත් අවසානයේ ඈ කෑම මේසයෙන් නැගිට්ටේ අමනාපයෙනි. තමාට නුහුරු කාරියක් තමා ලවා කරවන්ට නන්ද සිතුවේ කුමට ද? තමා අතින් කෑවා නම් මාතර හාමිනේ ද කෑම කන්නේ අතින් බව පියල්ගේ මව දනියි. එදට පසු, කොළඹ නැවතී සිටි තාක්, පියල්-ගේ මව අමුත්තන් සමඟ කෑමට වාඩි නොවූවා ය. මාතර හාමිනේ ද වාඩි නොවූවා ය. 'මේසෙට වාඩි වන කවුරුත් කතාකරන්නේ ඉංගිරිසියෙන්–කතා කරන මිනිසුන්ගේ කටවල් දිහාව බලාගෙන ඉන්න මට නම් බැහැ'යි මාතර හාමිනේ දවසක පියල්ගේ මවට කීවා ය.

තම මවත් නැන්දම්මාත් කොළඹ තම නිවාසෙහි නැවතී සිටි කාලය තුළ වූ මෙවැනි අවුල් හා එයින් ඇති වන සිත් රිදුම් ද නන්ද තම නුවණැසින් දුටුවා ය. එහෙත් අනික් විදියකින් ඔවුන්ගේ සිත් නොතළා එය වළැක්විය හැකි මඟක් ඈ නුදුටුවා ය.

මේසයට නොකැඳවූවාහු නම් මවත් නැන්දම්මාත් අසන්තෝෂ වෙති. ඔවුන්ට අතින් කන්ට අනුබල දීමට නන්දට නොසිතුණේ තමාගේ ගතානුගතිකත්වයත් නාගරික සිරිත් මහත් කොට සැල-කීමත් නිසා ය යන හැඟීම ඈ තුළට පිවිසියේ සතියකට පමණ පසු තිස්ස කියූ ඇනුම්පදයක් ඇසීමෙනි. එහෙත් ඒ වරද නැන්දම්-මාගේ සිත ඒ තරම් රිදවන්නක්යයි නන්ද නොසිතුවා ය.

මැතදි පොහොසත් වූ ගැමියකු—කොර්නේලිස් සිල්වා බාස්—ඔහුගේ ගෙදරට ආ ඉංගිරිසිකාරයකුටත් නෝනාටත් අතින් බත් කන්ට සැලැස්සූ සැටි පියල්ගේ මව සිහි කළා ය. අවුරුදු විස්සක්

මම හිතාගෙන ඉන්නේ ගමට ගොස් මෝඩකම කරන මිනිසුන් සමඟ ජීවත්වෙන්ට පුළුවන්වන සේ මගේ හිතේ පුරවාගෙන තියෙන අනන්මනන් එළියට ඇදලා දමන්නයි.''

''තිස්ස ගමට ගියාම ගමේ මාළු බාන්න යනවා. ඒක පව් වැඩක් නිසා මම නම් විරුද්ධයි. ඒ වැඩේට නොගොහින් තිස්ස ගම ඉන්නවා නම් මම බොහොම කැමතියි. එහෙනං නම් මගේ ගේම ඉඩමයි තිස්සට ලියා දෙන්නම්.''

''ගෙයක් එහෙ කරන්නේ කසාද බැඳපු මිනිහෙකුට.''

''තිස්සට කසාදයක් බැඳගන්න බැරිය''යයි කියමින් පියල්ගේ මව තිස්සගේ මුහුණ බලා ගූඪ සිනාවක් නැඟුවා ය.

ඈ අමුතු විදියක සිනාවක් නැඟුවේ තමාගේ ජීවිතයෙහි කිසියම් රහසක් දත් නිසා ද? පියල්ට නෑකමින් ලේලි වන තරුණියක් ද පියල් හා නන්ද සමඟ දෑවුරුද්දක් පමණ කොළඹ වාසය කළා ය. කඩවසම ඇති කයක් හා කාගේ වුව ද හිත ගන්නා මුහුණක් ඇති ඈ ගමෙහි නොව කුඩා නගරයක—වැලිගම—ඉපිද වැඩුණාකී. හඳුනන කෙනකු වුවද නොහඳුනන කෙනකු වුව ද දෙස බලන කල ඇගේ කට කොනට සිනාවක් නඟියි. ඔහු ඈ අඳුනන්නෙක් නම් ඇගේ සිනාව මුහුණ පුරා පැතිරෙයි. කවරකු සමඟ වුව ද ඈ කතා බහ කරයි. වරක් ඈ සමග කතා බහ කළ කෙනෙක් යළිත් කතාබහ කිරීමට ආශා කරති. සෝමාගේ මේ ගතිය නොයෙක් විට ඇගේ නෑයන්ගේ දෙෂ දර්ශනයට භාජන වී ය. ඇට නෑකම් ඇති තරුණයෝ ඇගේ මව බලන්ට යන්නාක් මෙන් ඇගේ ගෙදරට ගොස් ඈ හා කතා බස් කරන්ට පුරුදු වූහ. එහෙත් ඈ ඔවුන්ගෙන් එකකුටවත් ආලය නොකළා ය. මවුපියන් ඈ කොළඹට යවන ලද්දේ ඇගේ අර ගතිය ඕපාදූපයන්ට හේතු වෙතියි බියගත් බැවිනි.

ඈ හා කතාබහ කිරීමෙන් සන්තෝෂ වූ තරුණයන්ගෙන් එකකු දෙන්නකු නොව හතර පස් දෙනකුන්ම ඇට ආලය කරන්ට ඇත. එහෙත් ඔවුන්ගෙන් එකෙකුදු තමා ඇට ආලය කරන බව ඈ ඉදිරියෙහි කීමට තරම් එඩිතර නොවී ය.

සෝමා, පියල් හා නන්ද සමඟ කොළඹ ජීවත්වූ කාලයෙහි ඇගේ සුහද ගතිය දියුණු වී ය. නන්ද ඇසුරු කළ නාගරික ස්ත්‍රීන් හා පිරිමින් ද සමඟ සෝමා ද කතාබහ කිරීමෙන් සන්තෝෂ වූවා ය. ඉංගිරිසියෙන් කතාබහ කිරීමෙන් ලත් පුරුදු කමක් නැති ඈ ඔවුන් සමඟ බොහෝවිට කතාබහ කෙළේ සිංහලයෙනි. ඔවුන් ඉංගිරිසියෙන් ඇසූ ප්‍රශ්නයකට ඈ හැමවිට පිළිතුරු දුන්නේ සිංහලයෙනි. අනතුරුව සිංහල කතාව පුහුරු නාගරිකයා පවා ඈ සමඟ වඩාත් සන්තෝෂයෙන් සිංහලයෙන් කතා කෙළේ ය.

සෝමා නොයෙක් විට තිස්ස කතාවට අල්ලා ගත්තා ය. ඔහු මුලදී ඇ හා කතා බහ කෙළේ වැඩි කැමැත්තකින් නොවේ. ක්‍රමයෙන් ඇ කෙරෙහි පහන් වූ ඔහු ඇගේ කතා බහත් ඇත් ප්‍රියකරන්නට වූයේ ය. ඇ තිස්සට ඇතැම් විට සරදම් කරන්ට ද පටන් ගත්තා ය.

''තිස්ස කසාද බඳින්නේ නැද්ද''යි ඇ ඇතැම් විට තිස්සගෙන් ඇසුවා ය.

සුහද ගතිය නිසා ඇ කටට ආවක් කියයි. බොහෝ කලක් තිස්ස ඇසුරු කිරීම නිසා ඇ එවැනි ප්‍රශ්න ඔහුගෙන් ඇසීමෙන් සිනාසෙන්ට පුරුදු වූවා ය.

''තිස්ස තරුණියකට ආලය කරලාම නැද්ද''යි ඇ තවත් විටක තිස්සගෙන් ඇසුවා ය. ඇගේ එවැනි ප්‍රශ්නවලට තිස්ස පිළිතුරු දුන්නේ කලාතුරකිනි. වරක් ඇ ඒ ප්‍රශ්නය ඇසූ විට තිස්සට මතක් වූයේ කොළඹ රක්ෂාව කළ කාලයේ වරක් දැක කතාබහ කළ තරුණ ගණිකාවක දකින අදහසින් රෑයෙහි මුඩුක්කුවක් ඔස්සේ ගිය ගමනයි.

ආශාවෙන් ගණිකාව සොයා ගිය සැටි සිහිකළ තිස්සගේ සිතෙහි හටගත්තේ සන්තෝෂයක් නොවේ; ලජ්ජාවක් ද නොවේ. සෝමා ඒ වග දැනගත්තොත් තමා ගැන කුමක් සිතයි ද? යන ප්‍රශ්නය පමණි ඔහුගේ සිතට නැංගේ. ගණිකාව දකින ආශාවෙන් ගිය ගමන හැර තරුණියක දකින ආශාවෙන් අනික් ගමනක් නොගිය බව තිස්සට නිසැක ය. තමා එක තරුණියකට පමණක් නොව කිහිප දෙනකුට ද විවාහවුණු ගැහැනුන් කිහිප දෙනකුට ද ආසා කළ බව ඔහු දනියි. විවාහවුණු ගැහැනුන් දෙදෙනකුන් නිසා සිතෙහි උපන් ආසාවෙන් ඔහු සිතින් ඒ ගැනුන් සිප වැළඳ ගැනීමෙන් තිවු ආස්වාදයක් ලැබුවේ ය. ඇතැම් තරුණියක නිසා ඔහු තුළ හටගත්තේ විරාග රාගයකි. සමහර විවාහක ගැහැනුන් නිසා ඔහු තුළ හට ගත්තේ ආසාවක් පමණි. අවුරුද්දක් පමණ යන තෙක් තිස්ස සෝමා දැකීමෙනුත් ඇ හා කතාබහ කිරීමෙනුත් සන්තෝෂ වූයේ ය. ඇ හා හුදෙකලාව කතාබහ කිරීමට ඔහුගේ ආසාව ටිකින් ටික දියුණු වී ය. ඔහු හා කතාබහ කළ සෝමා වෙන ද මෙන් ඔහුට සරදම් කොට සිනාසුණා ය. ඔහු ඇ හා හුදෙකලාව කතාබහ කරන්ට වෑයම් කළ ඇතැම් විටක ඇ ඔහු සාලයට කැඳවූවා ය. නොඑසේ නම් මිදුලට ගොස් 'එන්න තිස්ස' යි ඔහුට හඬ ගැවා ය.

වෙන ද මෙන් සෝමා දැකීමෙන් හා කතාබහ කිරීමෙන්ම තෘප්තියට නොපැමිණිය හැකි අවස්ථාවකට තමා ළඟාවීයයි තිස්සට වැටහිණ. ඔහු සෝමා හා කතාබහ කරන්ටත් ඇගේ මුහුණ දැකීමටත් ආශා කළ අවස්ථාවේ දුරින් සිටගෙන ඇට ඇල්ම

කිරීමෙන් තමාට තෘප්තවිය හැකියයි සිතුවේ ය. කායික ස්පර්ශයෙන් තොරව ගැහැනියක ඇසුරු කිරීමෙන් හා ගැහැනියකට ආලය කිරීමෙන් සැහීමට පත්විය හැකියයි මෙතෙක් කල් සිතා සිටි තිස්සගේ ඒ හැඟීම ඔහුට ද නොදැනෙන සේ වෙනස් වී ය. පලිදුවූ ඒ හැඟීම සකස් කොට ගැනීමට ඔහු කළ වෑයම නිෂ්ඵල වී ය. ඔහු සෝමා හා මුහුදු වෙරළෙහි ඇවිදින්ට ගිය කිහිප අවස්ථාවකදි ඇගේ අත අල්ලා ගත්තේ ය. ඇතැම් විටක ඔහු ඇගේ අත මඳක් ද අනතුරුව දැඩිකොට ද මිරිකුවේ ය. ඒ හැම විට ඔහුගේ මුහුණ බලා සිනාසුණු ඈ වචනයකුදු නොතෙපලා ය.

ඔහු වරක් සෝමාගේ මුහුණ සිඹින්ට වෑයම් කළ විට ඈ ඔහුගෙන් බේරී පලා ගියා ය. එහෙත් ඈ පසුද වෙනද මෙන් තිස්ස හා කතාබහ කළා ය. ඔහුට සරදම් කළා ය. තුන්වන වාරයෙහි තිස්ස පොරබැදීමෙන් පසු ඇගේ මුහුණ සිප ගත්තේ ය.

ඇගේ මුහුණ සිපගැනීමෙන් පසු ඈ තමාගේ උකුලෙහි වාඩි කරවා ගැනිමට තිස්ස ආසා කෙළේ ය. ඇගේ මුහුණ සිපගත් හැම විට ඈ විරුද්ධවූ බැවින් ඈ අල්ලා උකුළෙහි වාඩිකරවා ගැනීමට ඔහු බිය ගත්තේ ය. ඔහු නොයෙක් වර සිතින් ඈ තමාගේ උකුළෙහි වාඩිකරවාගෙන මුහුණ සිපීමෙන් ආස්වාදයක් ලබන්ට පුරුදුවීම නිසා කායික ස්පර්ශය පිළිබඳ ඔහුගේ ආසාව දැඩි නොවී ය.

දවසක කාමරයෙන් එළියට ආ නන්ද, තිස්ස සෝමාගේ මුහුණ සිපිනු දැක කිපී ඔහුට බැණ වැදුණා ය.

"මේ යෝදයට යෝජනා කීයක් කරාද? හැම යෝජනාවටම කීවේ 'මම කසාද බඳින්නේ නැත' කියා........ කසාද බඳින්නෙ නැති මිනිහා................"

තිස්ස කර බාගෙන සාලයෙන් පිටවී මිදුලට බැස මුහුදු වෙරළ බලා ගමන් කෙළේ ය.

දෙසතියකට පසු නන්ද හා පියල් සෝමා ගෙන ගොස් ඇගේ මවට බාර කළෝ ය.

ඈ නිසා පිබිදුණු ඔහුගේ ආදරය ගැනියකගේ කායික ස්පර්ශය පතන රාගයක් වී ය. මීට අවුරුදු හත අටකට පෙර දුටු ගණිකාව තිස්සට සිහි වී ය. ඈ දකින ආශාවෙන් ඈ වෙසෙන වීදියට යන්ට ඔහු තුළ දැඩි ආසාවක් හට ගත්තේ ය. ගණිකාවන් වෙසෙන ඒ වීදිය පෙරට වඩා බෙහෙවින් වෙනස් වූවක් බව ඔහුට වැටහිණ. මීට අවුරුදු හත අටකට පෙර ඒ වීදියෙහි ගමන් කළ ඔහුට දැනුණු බැදෙන මසින් නික්මෙන පුළුටු ගඳ, කානුවෙන් එන දුගඳ, මෙදින ඔහුගේ නාසයට නොදැනිණ. එක් ගෙයකින් නික්මුණු රොස් පරොස් බස්, ගුටි බැට හඬ ඔහුගේ දෙකනෙහි නොවැකිණ. එක් ගෙයක දොරටුවෙහි සිටි ගැහැනියක් ඔහු දැක සිනාවක් පහළ කළා ය.

Scanned by CamScanner

දැඩි ආසාව නිසා තිස්ස ඈ තමා පෙර හඳුනාගත් ගණිකාව යයි සිතමින් ඇගේ ගෙට ඇතුළු වූයේ...........

තමාගේ වරදින් සෝමා ගමට යවනු ලැබීම ගැන කනගාටු වූ තිස්ස ඈ බැලීමට වැලිගමට ගියේ කනගාටුවෙනි. එහෙත් ඈ තිස්ස ගිය විට පුරුදු පරිදි සිනාසෙමින් තිස්ස හා කතා කළා ය. තමාගේ වරදින් ඇට කොළඹින් එන්ට සිදුවීම ගැන තිස්ස කනගාටුව ප්‍රකාශ කොට තන්දට දෙස් නැඟුවේ ය. ඒ කිසිවක් නැසුණක මෙන් සෝමා තිස්සගෙන් කොළඹ තොරතුරු ඇසුවා ය; නාලිකාගේත් ඇලන්ගේත් තොරතුරු ඇසුවා ය; මාමාගේත් නැන්දගේත් සුවදුක් විචාළා ය.

සෝමා හා කතාබහ කළ තිස්සගේ ශෝකය දුරු වී ය. තමා නිසා 'ආදරයක්' හෝ අමනාපයක් හෝ ඈ තුළ හට නොගත් බව දැනගත් ඔහුගේ සිත සැහැල්ලු වී ය.

සෝමා ගමට යවනු ලැබූ පසු තමා ගණිකාව වෙත ගිය බව සිහිකළ ඔහුගේ සිතෙහි ශෝකයක් හා කලකිරීමක් හට ගත්තේ ය. ගණිකාවක සොයා යෑමෙන් සිත කය දෙකම කිලිටුකර ගත් තමා සෝමා හා ආසාවෙන් කතාබහ කිරීමට සුදුසු කමක් නැති කුත්සිතයෙකියි යන හැඟීම ඔහුට තම සිතින් බැහැර කළ නොහැකි ය.

සෝමා තිස්ස හා කතා කෙළේ, ඔහු තමාගේ විරුද්ධත්වය නොතකා මුහුණ සිඹීම සම්පූර්ණයෙන් අමතක කළ එකක ලෙසිනි. ඒ නිසා හටගෙන සැඟවුණු තරහක් හෝ සිත්වේදනාවක් ඈ තුළ ඇතැයි සිතන්ට අනුබල දෙන වචනයකුදු ඇගේ කටින් පිට නොවී ය.

පියල්ගේ මව කසාදයක් බැඳගන්නයයි යෝජනා කළ අවස්ථාවේ සෝමා පිළිබඳ පුවත තිස්සට සිහි වූයේ ඈ තවමත් අවිවාහකව සන්තෝෂයෙන් ජීවත්වන බව දන්නා හෙයිනි. තිස්ස හා ඈ පිළිබඳ පුවත නන්ද හා පියල් පමණක් නොව පියල්ගේ මව ද දනියි. ඈ 'තිස්සට කසාදයක් බැඳගන්න බැරිය' යි කීවේ සෝමා පිළිබඳ පුවත දන්නා හෙයිනි. සෝමා පියල්ගේ මවගේ ළඟම නෑයකුගේ දුවකි. ඈ ඇගේ ගෙයත් ඉඩමත් තමාගේ නමට ලියන්ට යෝජනා කෙළේ සෝමාත් තමාත් ඔවුනොවුන් කෙරෙහි ඇල්මෙන් බැඳී අඹු සැමියන් ලෙස ජීවතවනු දකින ආශාවෙන් වියයුතුයයි සිතූ තිස්ස පිළිතුරු දෙන්ට පමා වූයේ ය.

මෙතෙක් කල් තමාගේ මතක පටින් මැකී ගියේ යයි සිතූ සෝමාගේ ස්වරූපය වලාපටලයක් බිඳගෙන මතුවන්ට වෑයම් කරන සඳ මඩලක් මෙන් මතුවන්ට වෑයම් කරයි. වැලිගම කොග්ගලින් මයිල හතකට වඩා ඈත් නොවූ කුඩා නගරයක් විගෙන යන තියම් ගමකි.

තිස්සගේ ගමට යන ආශාව දැඩි වී ය.

Scanned by CamScanner

"මම පුළුවන් ඉක්මනින් ගමට එනවා........." යි තිස්ස තෙපලේ ය.

කවරකු වුවද මීට පෙර විවාහ යෝජනාවක් කළ විට 'කසාද බඳින අදහසක් නැහැ' යි තිස්ස පිළිතුරු දුන්නේ ය. මෙදින ඒ පිළිතුරු තමාගේ කටින් පිට නොවීමට හේතුව කුමක් ද? කසාද බඳින අදහසක් දැනුදු තමා තුළ නැති බව ඔහු දනියි. සෝමාගේ මුහුණ දැකීමටත් ඈ හා කතාබහ කිරීමටත් මෙතෙක් යටපත්ව තුබුණ ඔහුගේ ආශාව යළිත් මතු වී ය.

වරක් ඈ ඔහුගේ හිසෙහි වූ සුළු තුවාලයක බෙහෙත් බඳිද්දී ඇගේ ළය ඔහුගේ පිටට තබා තද කළ සැටි මතක් කළ තිස්සගේ සරාගි හැඟීම් පිබිදුණේ ය.

තිස්ස දවසක යතුරු කටුවක් ඉල්ලා ගනු පිණිස සෝමාගේ කාමරයට ගියේ ය. ගමනක් යනු සඳහා ඇඳුම් මාරු කළ ඈ චෝලියෙන් අඩක් වැසුණු ළය ඇතිව සිටියා ය. ඈ තිස්ස කාමරයට ඇතුළු වනු දැක වහාම හැට්ටය ගෙන ළයට තබා එක් අතකින් අල්ලාගෙන සිනාසෙමින් බිම බලා ගත්තා ය.

"මම පස්සෙ එන්නම්" කියමින් තිස්ස ආපසු යන්ට හැරුණා ය.

"තිසාට මොනව ද ඕනෑ?"

"යතුරු කටුවක්"

ඈ අනික් අතින් යතුරු කටුවක් ගෙන තිස්ස අතට දුන්නා ය. ඇගේ අඩක් වැසුණු උඩු කය දෙස යළිත් වරක් බලනු සඳහා උපන් ආශාව මැඩගෙන ඔහු කාමරයෙන් පිට වී ය.

තිස්සගේ පිළිතුර පියල්ගේ මවගේ සන්තෝෂයට හේතු වී ය. 'කසාද බඳින අදහසක් නෑ' යි තිස්ස නොකීවේ තමා කළ යෝජනාවට දැඩි අකැමැත්තක් නැති නිසා විය යුතු ය. නන්ද හා පියල් පමණක් නොව මාතර හාමිනේ ද මීට පෙර කළ විවාහ යෝජනා තිස්ස බැහැර කළ සැටි දන්නා පියල්ගේ මව තමා කරන යෝජනාවකට ඔහු කැමැති වෙති යි සිතුවා ය.

තම නැන්දම්මා ඇගේ ගෙයත් ඉඩමත් තිස්සට තෑගි කරන්ට යෝජනා කළ බව ඇසීම නන්දගේ සන්තෝෂයට හේතු නොවී ය. මවුපියන්ගේ පරණ ගෙය විශාල කොට තැනවූයේ පියල් ය. ඉඩම වටකොට බඳිනු ලැබූ තාප්පය සඳහා ඔහු රුපියල් දහසකට වඩා වියදම් කොළේ ය.

සෝමා හා තිස්ස පිළිබඳ පුවත මේ අවස්ථාවේ නන්දගේ සිතට නැංගේ කෙසේදෑ යි ඇටම නොවැටහිණ. සෝමා ගමට පිටත් කළ පසු නන්ද හා පියල් ඈ බැලීමට එක් වරකුදු නොගියේ ය. නන්දගේ

සිත චංචල වූයේ තම නැන්දම්මා ගෙයත් වත්තත් තිස්සට තෑගි කරන්ට අදහස් කළ නිසා නොවේ. සෝමා තිස්සට කසාද බන්දා දී ඔවුන් කොග්ගල නවත්තා ගනිතියි යන හැඟීම නිසා ය.

පියල්ගේ මවත් මාතර හාමිනේත් පසු ද උදය වරුවේ පිටකොටුවේ දුම්රිය පළෙන් දුම්රියෙහි නැඟී වටපිට බලමින් ගම බලා ගමන් කළෝ ය.

"මම කනගාටුවෙන් ඉන්නේ තිසා ගැන"යි කියමින් වටපිට බැලූ මාතර හාමිනේ මුහුදෙන් එක පිට එක නඟිමින් බිඳවැටෙන රළ පෙළ දුටුවා ය. රිය මැදිරියෙහි අනික් කිසිවකු නොසිටි නිසා ඔවුන් දෙදෙනාට රිසි සේ කතාබහ කරන්ට ඉඩ ලැබිණ. මුහුදු වෙරළ දෙස බලා සිටි පියල්ගේ මව වහා කතා නොකළා ය. ගල්කිස්සේ හෝටලය අසල වෙරළෙහි, නාන ඇඳුම් ඇඳගත් සුදු මිනිස්සුත් ගැහැනුත් සක්මන් කරති. සමහරු වෙරළෙහි වැතිර අව්ව තපිති. සමහරු මුහුදු බොක්කෙහි පීනති.

ඔවුන් දෙදෙනාම ගම බලා පිටත්වූයේ සුපුරුදු වාඩිපලෙන් ඉවත් කරනු ලැබ අකැමැත්තෙන් දවස් ගණනක් හෝටලයක ජීවත් වූවන් ලෙසිනි. තමන්ගේ දූවත් පුතාත් සමඟ ගමදී මෙන් තනිව සතුටු සාමීචි කතාබහක් කිරීමට ඔවුන් දෙදෙනාටම ඉඩ නොලැබිණ. අමුත්තන් නොපැමිණෙන වේලාවෙහි සාත්තුකාරිය නන්ද සමඟ කතාබහ කරයි. අම්මාත් නැන්දම්මාත් සමඟ කතා බහ කිරිමෙන් ලබන සන්තෝෂයට වැඩි සන්තෝෂයක් නන්ද සාත්තුකාරිය හා කතාබහ කිරීමෙන් ලබයි. වෙළඳාම ගැන සිතන පියල් සන්තෝෂ වන්නේ රැයෙහි තමන්ගේ යහළුවන් කිහිප දෙනකු හා කතාබහ කිරීමෙනි. ඔහු, තම මවත් නැන්දම්මාත් සමඟ දවසකට වචන හය අටකට වඩා කතා නොකළේ ය.

"තිස්ස ඉතා හොඳ ළමයෙක්," යි පියල්ගේ මව· කීවා ය. "තිස්ස ම්ගේ පුතා වගේ මහාස්ගාත ඉවසන්නේ නෑ."

"මම කනගාටු වෙන්නේ තිස්ස කසාද නොබඳින නිසා. තිස්සට කොළඹ ඉන්නත් බැහැ. ගම ඉන්නත් බැහැ; කොළඹදී අක්කත් අයියත් එක්ක සංඩු වෙනවා. ගමදී ගමේ මිනිස්සු එක්ක සංඩු වෙනවා."

"සංඩු වෙනවා?"

"සංඩු වෙනවා නෙවි. දෙස් කියා මිනිස්සු අසන්තෝෂ කරනවා තිස්ස මිනිසුන්ගේ ඇදකුද කවදාවත් සොයන්නේ නැහැ. නමුත් එයාගේ සිතට අසුවෙන්නේ මිනිසුන්ගේ ඇදකුදමයි."

"තිස්ස පිට මිනිසුන්ගේ විතරක් නෙවි අක්කාගේත් අයියා-ගේත් දෙස් කියන එක හොඳයි නෙව; වැරැද්ද දුටු තැන දෙස්

Scanned by CamScanner

කියන්නේ තිස්ස විතරයි. තිස්සට එහෙම දෙස් කියන්න පුළුවන් වී තියෙන්නේ කිසිම දේකට ආසා නොකරන නිසා වෙන්න ඇති.''

''තිස්ස ගමේදී ජීවත් උණේ දූත් වගේ නෙවි. ගමේදී එයා හොඳ දේට ආසා කරා; නරක දේට පිළිකුල් කරා; විරුද්ද උණා. පවුලේ පිරිමියා එයා විතරයි. එයා කසාද නොබැන්දෙත් අපේ පරම්පරාවේ නමත් නැති වෙනවා''යි කියමින් මාතර හාමිනේ ශෝකවූවා ය.

තිස්ස හා සෝමා අඹු සැමියන් ලෙස ජීවත්වනු දැකීමට පියල්-ගේ මවගේ ආසාව දැඩිවී ය.

බෙම්මතොට පාලම පසු කළ ඔවුහු කොළඹත් ගමත් සසඳන්ට වූහ. හම ගසන ලද හරකුන්ගේත් එළුවන්ගේත් එල්ලෙන මළ කඳන් ඇති මස් කඩ සිහි කළ ඔවුන්ගේ සිතට නැංගේ අමුසොහොන පිළිබඳ හැඟීමකි. කොළඹදී දවසක් පාසා උදය වරුවේ ඇසූ කපුටු-වන්ගේ ගොරහැඩි නාදය හැම විටම ඔවුන් තුළ ඇති කෙළේ පාළු පෙදෙසක් පිළිබඳ හැඟීමකි. ගමේ කපුටුවෝ කළු මැදිරිය මෙන් දිලෙන කළු පාට ඇත්තෝ ය. කොළඹ කපුටුවෝ දුඹුරු පාටට හුරු කළුවෝ ය. පියල්ගේ මවගේ මේ කියුම් මාතර හාමිනේ අනුමත කළා ය.

මාතර හාමිනේත් පියල්ගේ මවත් ඇඳිරි වැටීගෙන එද්දී ඔවුන්ගේ ගෙවලට ගොඩවැදුණේ සැනසුම් සුසුම් පිටකරමිනි. දෙල්ගස් පොල්ගස් මුදුන් හා කැලෑ රොදවල් ද පිසගෙන එන වාතය පියල්ගේ මව ආසාවෙන් ආශ්වාස කළා ය. වීදියෙහි දැල්වෙන ගෑස් ලාම්පු එළියෙන් හා ගෙයි පහන්වලින් නික්මෙන විදුලි එළි-යෙන්ද වෙහෙසුණු නෙත් සිත් ඇති ඈ පොල්තෙල් පහනෙහි තිර තුනෙන් නික්මෙන මුදු එළියෙන් ලැබුවේ සැනසීමකි. මුදුන් වහලට ළං කොට තැබුණු කුඩා කවුළුවක් ඇති කාමරයක කුඩා කල පටන් විසි තුන් ඇවිරිදි විය වනතෙක් නිදීමෙන් ලත් පුරුද්ද ඇති ඈ පොල්තෙල් පහන් එළියෙන් තුනී වුණු අඩ අඳුර ප්‍රිය කළා ය. ඈගේ ගෙමිදුල හා පාර ද දෙල්ගස් හිසින් හා පොල්ගස් හිසින් සෙවණ කරනු ලැබීම නිසා පිහියෙන් දෙදෙල් කපන්නාක් මෙන් කැපිය හැකි දැඩි අඳුරෙන් වැසී ඇත.

ගැමි ගෙදරක මඩුවක් තුළ සිරකරනු ලැබූ වස්සකුගේ උඹෑ හඬ ඇසූ ඈ තමාගේ බාල විය සිහි කළා ය. ඈගේ මවගේ එළදෙනගේ පැටියා හැම ද හවස් වරුවේ මඩුවෙහි දමා පොල්පිති හරස් කිරී-මෙන් දොරටුව වසන ලද්දේත් උදය වරුවේ වැස්සි පැමිණි විට ඈගෙන් කිරි දෙවාගෙන පැටියා මුදන ලද්දේත් ඈ විසිනි. තරුණ වියෙහි සිට අත් පා වෙහෙසා වැඩ කිරීමෙන් දැඩි වුණු කයක් හා සිතක් ඇති ඈගේ හිසින් එඩිතර සිතුම් දුරු නොවී ය. වාතාබාධයට ගොදුරුවන්ට ගිය ඈ ඒ ආබාධය පිළිබඳ හැඟීම් සිතින් පැලවූයේ

කය වෙහෙසා වැඩ කිරීමෙනි. එයින් මැඩුණු රෝගය නයා ගිලින පොළඟකු මෙන් ඈ විසින් දැඩි සිතින් ගොදුරු කොට ගන්නා ලදී. ලෙඩට ගොදුරු වන්ට සිටි ඈ ලෙඩේ ගොදුරු කොට ගත්තා ය. කොළඹ දී ඇගේ සිතට පිවිසි මුසල හැඟීම් බරින් මැඩී යට බැස සිටි ඇගේ ආසා යළිත් නැංගේය.

මැද විය ඉක්මවූ ඈ ජීවත් වීමෙන් ලැබිය හැකි ආස්වාදය නොකලකිරුණු සිතින් සිහි කළා ය. 'මාතර හාමිනේට මෙන් අවිවාහක දූ පුතුන් නැති මා තාත්තුවා වන්නේ කුමටද?'යි ඈ කල්පනා කළා ය; මා ඉතිරි කරගත් මුදල් වියදම් කොට අවසාන කළ හැකි තාක් මට ජීවත් විය නොහැකි ය. පුතාගෙන් වුව ද මුදලින්-හදලින් මට උපකාරයක් නුවුවමනා ය. මා වැවූ පොල් ගසින් දෙල්ගසින් කොස්ගසින් ලැබෙන පොල්, දෙල්, කොස් දිළිඳු ගැමියන්ට ද දී අනුභව කිරීමෙන් වැඩි ප්‍රීතියක් ලැබේ. හැකි තාක් කල් ජීවත් වී හදිසි ලෙඩකින් මියයන්ට ලැබුණොත් වාසනා-වකි.

පුතාගෙන් හා ලේලිගෙන් වෙන්ව ජීවත් වන්ට ඉටාගත් ඈ, රෝගාතුර වී දෙසතියකුදු ඇගෙහි වැතිර කිසිවකුගෙන් සත්කාර ලබන්ට කැමැති නොවූවා ය.

Scanned by CamScanner

# 6

ඇලන්ට පසු නන්ද දුවක ද පුතකු ද ලැබුවා ය. ඈ දුව ලැබූ අවස්ථාවෙහි මාතර හාමිනේ පැමිණ දෙසතියක් කොළඹ නැවතී සිටි නමුත් පියල්ගේ මව නොපැමිණියා ය.

මාස හත අටකට වරක් නන්ද සහ පියල් තමන්ගේ මෑණියන් බැලීමට ගමට ගිය නමුත් අවුරුදු හත අටකට පසු නන්දගේ ගමන නැවතිණ.

පියල් තමාගේ මව බලන්ට ගියේ නන්ද ඇගේ මවගේ සුවදුක් සොයාගෙන එන්නයයි යෝජනා කළ විට පමණි. දෙළොස් අවුරුද්දක් පමණ තමා සමඟ විසූ අනුලා ගමට යන්ට සිතීම නන්දගේ සංවේගයට හේතු වි ය. තමාගේ පුතුන් දෙදෙනාගේත් දුවගේත් සුවදුක් සොයමින් මෙතෙක් කල් තමාටත් වඩා වෙහෙසුණේ අනුලා බව නන්ද දනියි. අනුලා ගමට ගියහොත් දරුවන් සොයාබලා ගැනීමේ කාරිය තමාගේ කරපිටම වැටෙයි.

ඉහළ පන්තියේ නාගරික ස්ත්‍රීන් හා පිරිමින් ද ඇසුරෙන් වැඩි සන්තෝෂයක් නොලැබූ අනුලා මහත්ම සන්තෝෂය ලැබුවේ නන්දගේ දරුවන්ට ආදර සැලකිලි දැක්වීමෙනි. ඔවුන්ට ගම කතා කිමෙන් හා ඔවුන් අසන අනන්මනන්වලට පිළිතුරු දීමෙන් සන්තෝෂවීමෙනි. ඇලන් හා නාලිකා තමන්ගේ මවට මෙන් අනුලාට ද ඇල්ම කළහ. කුඩා කල පටන් දඟකාරයකු ලෙස වැඩුණු චන්ද්‍රසෝම මවුපියන්ට අකීකරු වූ නමුත් අනුලාට ළැදි වූයේ ය.

චන්ද්‍රසෝම කුඩා කල මවුපියන් කියන දේ නොකෙළේ ය. සෙල්ලම් බඩුවක් අතට හසු වූ විට ඔහු සන්තෝෂ වූයේ එය කඩා බිඳදැමීමෙනි. දඬුවම් කරනු ලැබූ විට වඩාත් මුරංඩු වූ ඔහු තිස්ස පමණක් කෝප කරන්ට බියගත්තේ ය. චන්ද්‍රසෝම තිස්ස ගුප්ත මනුෂ්‍යයකු ලෙස සැලකුවේ ය; සැඟවුණු කිසියම් තපුරු ගතියක් ඔහු කෙරෙහි ඇතැයි සිතූ චන්ද්‍රසෝම තුළ, තපුරු ඇස් දෙකක් ඇති තවුසකු දුටු කිසිවකු තුළ හටගන්නා හැඟීම වැනි අනියත බියක් හටගත්තේ ය.

ඇලන් උගැන්මෙහි ශූරයකු වූ නමුත් චන්ද්‍රසෝම උගැන්මෙහි අසමර්ථයෙක් වී ය. රාජකීය විද්‍යාලයට ඇතුළු වුණු ඔවුන් දෙදෙනාගෙන් ඇලන් හැම පන්තියෙහිදීම තැගි දෙක තුන බැගින් දිනාගත්තේ ය. උගැන්මෙහි අසමර්ථයකු වූ චන්ද්‍රසෝමට රාජකීය විද්‍යාලයෙන් අස්ව අනික් පාසැලකට යන්ට සිදු වී ය.



Scanned by CamScanner

පියාගේ මොටෝරියෙහි යතුරු පුවරුවේ යතුරු ඇදීමෙන් හා කරකැවීමෙන් සන්තෝෂ වූ ඔහු ඇතැම් විට යතුරක් කැඩුවේ ය. රියකරු හා යාළු වී රිය පැදවීමට වෑයම් කෙළේ ය. ඔහු ඇලන් හා කලහ කෙළේ ය. දවසක බෙහෙවින් කිපුණු ඇලන් තම මලයාට ගැසුවේ ය. චන්ද්‍රසෝම කරබාගෙන පසු බැස්සේ ය.

චන්ද්‍රසෝම කලහ නොකෙළේ අනුලා සමඟ පමණි. දඟ කළත්, තමාට ඇතැම් විට බැන්නත් අනුලා ඒ කිසිවක් නොතකා ඔහු නැවුවා ය; ඇතැම් විට ඔහුට බත් කැවුවා ය. අතන මෙතන විසුරුවන ලද පොත් එකතු කොට ඔහුගේ කුඩා මේසය උඩ තැබුවා ය. පියල් විසින් දඬුවම් කරනු ලැබූ ඇතැම් දවසක කෝප-යෙන් බුම්මාගෙන සිටි ඔහු අනුලා තම කාමරයට කැඳවාගෙන ගොස් තමාගේ ඇඳෙහි නිදි කළා ය.

අනුලා දරුවන් බලාසොයාගැනීම නිසා නන්ද වැඩි නිදහසක් විශ්‍රාමයක් හා සැනසීමක් ද ලැබුවා ය. ඇ වඩ වඩාත් ඉහළ සමාජයේ ගැනුන් හා පිරිමින් ඇසුරු කිරීමෙන් සන්තෝෂ වීම එහි එක් ප්‍රතිඵලයක් වී ය. ඔවුන් හා කතාබහෙන් ඔවුන්ගේ උත්සව වලට යෑමෙන් නන්ද ලබන ආස්වාදය කිසිවකු මත්පැන් බීමෙන් ලබන ආස්වාදයට අසමාන නොවී ය.

නන්ද සමඟ කොළඹ පදිංචියට ආ අනුලා අවුරුදු තුන හතරක් ගෙවෙන තෙක් නගර ජීවිතයට ආශා කළා ය. නගරයේ අලංකාර ගෙවල් ඉහළ පන්තියේ ගැනුන්ගේ විසිතුරු ඇඳුම් පැළඳුම්, ඔවුන්-ගේ විනීතාචාර සමාචාර විධි හා ගෙවල ඇඳ පුටු මේස ආදියෙහි සුන්දරත්වය හා පිරිසිදු බව ද දකින ඇ ලස්සන දෙයින් සන්තෝෂ වන කුඩා දැරියක මෙන් සන්තෝෂ වූවා ය.

ඒ හැම දෙයෙහි විසිතුරුවෙන් ඇ දැන් සන්තෝෂ නොවෙයි. තම මවත් ගැමි පරිසරයත් සිහි වූ විට ඇ තුළ හටගන්නේ වේදනා-වකි. අවුරුදු හතක් අටක් ගෙවුණු තැන ය තමාගේ කායික දුර්වලත්-වය ගැන හැඟීමක් ඇ තුළ හටගත්තේ. ඒ දුර්වලත්වය කලින් ඇට නොදැනුණේ ඇගේ කය අවුරුදු තුන හතරක සිට තමාට නොදැනෙන සේ ටිකින් ටික වෙනස් වූ හෙයිනි. කොළඹ ඇට එපා වූයේ ඇ සිත කය දෙකින් කෙමෙන් දුර්වල වූ නිසායයි කිසිවකු කී විට අනුලා තරහයෙන් ඒ කීම බැහැර කළා ය.

විදුලි කෙටුමෙන් එළිය වුණු අඳුරෙහි සැඟැවුණු බිහිසුණු දෙයක සලකුණු දකින්නාක් මෙන් ඇ නගරයෙහි විචිත්‍රත්වයට, ඔපයට හා බැබළීමට යටින් ඇති කුත්සිත ලෝකයක් දුටුවා ය. එයින් උපන් කුහුල ඇති ඇ, නිතර දකින විසිතුරු දෙයින් වෙහෙසුණාක මෙන් අර අඳුරු ලෝකය දකිනු පිණිස වෑයම් කරන්ට වූවා ය.

Scanned by CamScanner

නන්ද හා පියල් ඇසුරු කරන නාගරිකයන්ගේ ගෙදරවලට ඉඳහිට යන අනුලා ඒ ගෙවල විචිත්‍රත්වයට යටින් කැත ලොවක් ඇතැයි සැක කළා ය. විදුලි එළියෙන් බැබළෙන ඔප ඇති මේස පිඟන් පිරිසි හා අනික් බඳුන් දැකීමෙන් හා ඒ බඳුන් පුරා සිටින ප්‍රණීත ආහාර වර්ග අනුභවයෙන් ද සන්තෝෂ වී හදින් උදන් ඇනූ අනුලා වරක් නොව කිහිප වරක් ඇතැම් නාගරිකයන්ගේ ගෙවල කුස්සිත් ඊට ළංව පිහිටි කානුත් දුටුවා ය.

ගෘහිණියන් වැඩකාරයන්ට බැණවදිනු ඈ නොයෙක්වර අසා ඇත. අඹු සැමියන් පොරකනු, ඔවුනොවුන්ට චෝදනා නඟනු ඈ දැක ඇත; අසා ඇත. නගරය ගැන කලකිරුණු ඈ ඇසූ දුටු මෙවැනි දේ සිතින් අතිශයෝක්තියට නැඟුවා ය.

පියල් වරක් නන්ද සැක කෙළේ ය. ඔහු අනික් ගැහැනුන් සොයා යතියි යන සැකයෙන් නන්ද ශෝක වූයේ, ඔහු හා කලහ කෙළේ, වරක් දෙවරක් නොවේ. අනුලා ඒ සියල්ල දනිතත් මෙතෙක් කල් ජීවත් වූයේ ඒ කිසිවක් නොදන්නක: ලෙසිනි. නගරයේ අනික් ධනවත් පවුල්වල අඹුසැමියන්ගේ ජීවිතය මීට වඩා වෙනස් විය නොහැකි ය.

අනුලා, පියල් හා නන්ද ද වරක් වාසල මුදලිතුමකු, ඔහුගේ අඹුව හා දරුවන් ද සමඟ සෙල්ලම් ගමනක් ගියෝ ය. රිය නවත්වා ගස් සෙවණට වී කා බී සැනසුණු ඔවුන්ගෙන් දෙදෙනකු හැර අන්‍යයන් සුළඟින් සිහිල් කරනු ලබන වියන් පටක් වැනි සර්මය යටින් මදක් ඇතින් වූ වැවක් කරා ගියෝ ය. වෙහෙස දැනෙන්ට වූයෙන් අනුලා මොටෝරියෙහි පිටිපස අසුනෙහි හාන්සි වූවා ය. ගස් සෙවණත් සුළඟත් නිසා රිය ඇතුළත උෂ්ණය අඩු වී ය.

ආ පසු පැමිණි තම රියකරුගෙන් වාසළ මුදලිතුමා මෙසේ ඇසුවේ ය.

"කෝ ඉතුරු සල්ලි?"

"හාමුදුරුවනේ රුපියලේම කෑවා. හුඟක් බඩගිනිවෙලා තිබුණා."

වටපිට බැලූ මුදලිතුමා පියල්ගේ රියකරු අසලක නැති බව දැනගත්තේ ය. ඔහු රියකරුට බැණවැදුණේ ය.

"උඹට රුපියල දුන්නේ මාරු කරපු සල්ලි නොතිබුණ නිසා. උඹට කෑම කන්ට සත පනහක් හොඳටම ඇති. අනික් සත පනහ උඹේ පඩියෙන් අඩු කරනවා" යි කියමිනි ඔහු බැණුම අවසාන කෙළේ. ඔහු රියකරුට යළිත් තර්ජන කොට මුහුණෙහි ඩාදිය පිසදමමින් වැව කරා ගමන් කෙළේ ය. අනුලා අසුනෙහි අතක් ගසා නැඟී පිටුපා ගමන් කළ මුදලිතුමා දෙස බැලුවා ය. සුළඟින් සිසිල් කරනු ලබන අවටෙහි ගමන් කළ ඔහු ඩාදිය නඟන්නේ කුමක් නිසා ද?

Scanned by CamScanner

ඔහු ලේන්සුවෙන් නැවත නැවතත් මුහුණ පිසදමන්නේ ඩාදිය උණනා නිසා විය නොහැකි ය. එය ඔහු කිපුණු විට කරන ගතානුගතික ක්‍රියාවක් විය යුතුයයි අනුලා සිතුවා ය. වැවෙන් එගොඩ වෙලෙහි ගොවියෝ දෙදෙනෙක් හිරු රැසින් සිඳෙන තෙතමනය ඇති පස්, උස් මිටි ඇති උදළුවලින් ගස ගසා පෙරළති. වැස්ස ළඟ එතියි සලකවන සලකුණු මෙන් කුඩා කළු වලා බටහිරින් නැඟී හිරු රැසට හසුව අතුරුදහන් වෙයි. සියදහස් මකුළු දැල් පටවල් සේ බසින හිරු රැසින් දියකඳ පලින් පල රිදී පටක් සේ බබළයි.

පළමුව තමාගේ සිත් ගත් කොළඹ වටපිටාව දැන් අනුලාගේ සිත වෙහෙසන්නකි. වැහි කාලයෙහි තෙතමනය, නියං කාලයෙහි කපුටුවන්ගේ ළතෝනිය. වතුර නැති නිසා ගිනියම් වූ මහා කල්දේරමකින් ඇසට පෙනෙන සේ පිට වන උෂ්ණය වැනි කොට සැඩ හිරු රැසින් කකාරවන වාතය හා තමාගේ කායික දුර්වල්ත්වය ද සිහි කළ ඈ කොළඹ හැරයාමට සිතුවා ය.

තමා සයරෝගයෙන් පෙළෙන්නකයි සිතූ ඇගේ හද පමණක් නොව ගත ද කම්පනය වී ය. තමාට කොළඹ තිත්ත වූයේ සයරෝගයෙන් පෙළෙන නිසා ද නොඑසේ නම් කොළඹ තිත්ත වීම නිසා තමාට සය රෝගය වැළඳිණි දැයි යන ප්‍රශ්නය අනුලාගේ සිතට නඟියි. ගමෙහිදී නොඇසූ විරූ එවැනි රෝගයකට ඈ ගොදුරු වූයේ කෙසේ ද?

කිසියම් රෝගයකින් පෙළෙතියි සිතවන බාහිර ලකුණක් ඈ කෙරෙහි නොවී ය. ඈ උගුර පාදන නමුත්, නොකහියි. වරක් ඈ වැරෙන් උගුර පෑදූ අවස්ථාවක ලේ බින්දුවක් පිටවීමෙන් දිවට ලේ රස දැනිණ. ඈ සුදු රෙදි කඩක් ගෙන කෙල පිඩ එහි තැබුවා ය. ලේ පාට වුණු කෙල පිඩ දුටු ඈ තැතිගත්තා ය. ඈ කිසිවකුට නොදන්වා පියල්ගේ පවුලේ දොස්තර හමුවී කතාබහ කළා ය. ඈ හොඳින් පරීක්ෂා කළ දොස්තර ඇට කිසිම අසනීපයක් නැතැයි කීවේ ය. උගුර පෑදීම නිසා සිවිකාවක් පිපිරීමෙන් ලේ බින්දුවක් නිකුත්වන්ට ඇත.

අනුලා වෙන ද මෙන් ගෙදර වැඩපළ කළා ය. එහෙත් ඇගේ ගමට යන ආසාව දැඩි වී ය.

"අනු—ගමට යන්නේ මොකොට ද?"යි නන්ද විචාළා ය. අනුලා කොළඹ ගැන කලකිරී කියූ කියුම් නන්ද අසා ඇත. එහෙත් 'ගමට යන්ට ඕනැ'යි ඈ යෝජනා කළ පළමු වන වතාව මේ ය.

"ගමට යන්න ඕනැනම් ගොහින් දවස් දෙකක් තුනක් නැවතිලා අපට ආපසු එන්න බැරිය. ඇලන් කොග්ගල ඔයේ ඔරු පදින්ට හරියට ආසයි."

"මම යන්නේ ගම නවතින්න"යි අනුලා දැඩි සිතින් තෙපලා ය.

"මොකොට ද අනු ගම නවතින්නේ? ටිකක් දවස් ඉන්න කොට අනුට ගම එපා වේවි."

අනුලාගේ සිතෙහි හට ගත්තේ වේදනාවකි. තමා කයින් පිරිහුණේ ටිකින් ටික වුව ද නන්දට ඒ පිරිහීම දැනුදු නොදැනෙන්නේ කුමක් නිසා ද? ඈ බලාපොරොත්තු වූයේ 'අනු ගමට යන්නේ මොකොටද?'' යන ප්‍රශ්නය නොව 'අනුට සනීප නැද්ද' යි නන්ද ප්‍රශ්න කරනු ඇසීමට ය.

නගරයේ දිළින්දෝ ජීවනය සපයනු සඳහා උදේ සිට සවස් වන තෙක් වැරවෑයමින් වැඩ කරති. ධනවත්තු ඔවුනොවුන්ට හුරු පුරුදු සමාජ ජීවිතයට අනුකූලවනු පිණිස උදේ සිට හවස් වන තෙක් වැඩ කොට අනතුරුව රෑ වන තෙක් විනෝදය සඳහා වෙහෙස මහන්සි වෙති. දූ දරුවන් කෙට්ටු වනු මවුපියෝ නොදකිති. කෙට්ටුවුණු දරුවකු ගෙන දෙස්තරකු වෙතට යන මවට ඔහු කියන්නේ මේය: "දරුවාගේ අම්මාත් තාත්තාත් දෙන්නම කෙට්ටු නම් ඒ දෙදෙනාට වඩා දරුවා තරවෙන්නේ කොහොම ද?''

නාලිකා උපතින්ම ලත් සිහින් කයක් ඇත්තකි. ඇලන් කෙට්ටු වුණු කයක් ඇත්තෙකි. නොතිවෙන කුසගින්න ඇත්තකු මෙන් කන බොන චන්ද්‍රසෝම හොඳ කඩවසම ඇති කයක් ඇත්තෙකි.

පියල් උදේ වෙළඳ සැලට ගොස් ගෙදර එන්නේ රෑ හතට පෙර නොවේ. දරුවෝ උදය වරුවේ පාසැලට ගොස් සවස ගෙදරවිත් මඳ වේලාවක් හති ඇර කෑම කන තෙක් පාඩම් කරති. නන්දත් අනුලාත් රෑ වන තෙක් වෙහෙසෙති. නන්ද හා පියල් සතියකට දෙතුන් දවසක් රෑයෙහි ගෙදරට එන අමුත්තන් හා කතාබහ කරමින් සන්තෝෂවෙති.

අනුලා තම සිත් වේදනාව මැඩගත්තා ය. එහෙත් ඇගේ කලකිරීමත් කෝපයත් අඩු නොවී ය. ඈ කෝප වූයේ තමා ගැන නොව නන්දගේ අනාගතය ගැන සිතීමෙනි.

"මට කොළඹ එපා වෙලා; මම ගමට යන්නේ ඒ නිසා''යි කියමින් අනුලා, නන්දගේ මුහුණ බැලුවා ය.

"මම හිතා හිටියේ අනුට කවදාවත් ගමට යන්න හිතෙන එකක් නෑ කියා.''

"ගමට යන්න හිතේය කියා මම හිතුවෙත් නෑ.''

අනුලාගේ කටකොනට නැඟුණේ අනාදර සිනාවකි.

"කොළඹ එපා වෙන්න හේතුව?''

"මට සනීප නෑ''යි කියූ අනුලා, දෙනෙතට කඳුළු නඟන තරම් දුඩි ශෝකය සඟවනු පිණිස බිම බලාගත්තා ය.

Scanned by CamScanner

මේ වදන් ඇසූ විගස අනුලාගේ දිරාණු කයත් දුර්වලත්වයත් නන්දගේ නෙතටත් සිතටත් හසු වී ය. ලේ අඩු වීමෙන් සුදුමැලි වුණු ඇගේ මුහුණත් ඇස් දෙකත් හඳුනාගත් නන්ද මඳක් තැති ගත්තා ය. තම දරුවන් බලාසොයාගනු පිණිස අනුලා බෙහෙවින් වෙහෙසුණා ය. නාගරික ගැහැනුන් හා පිරිමින් ඇසුරු කරමින් විනෝදවීමට තමාටත් පියල්ටත් විශ්‍රාමයක් ලැබුණේ අනුලා නිසා ය. අනුලාගේ අසනීපය ගැන නන්ද ද වග කිව යුතු ය. දරුවන් බලා සොයාගනු පිණිස වෙහෙසුණු අනුලාගේ සුවදුක් මෙතෙක් නොසොයා හැරීම වරදකි.

"අසනීපයක් තියෙනවා නම් කියන්න එපා ය. ළමයින් බලාසොයාගන්න අනු හුඟක් මහන්සි උණා. දන්නවා නම් තව ආයා කෙනෙක් ගෙන්නාගන්නවා."

"මම සන්තෝෂ උණේ ළමයින් බලාසොයා ගැනීමෙන්" යි අනුලා පිළිතුරු දුන්නා ය. "ඇලන් ඉගෙනීමට හැබෑම සමර්තයා. ළමයින් මට හොඳට ආදරෙයි. ඇලන්ගෙන් වෙන්ව යන එක මට ඉවසන්න බැරි දුකක්.........මට සනීප නෑ......යන්නේ ඒ නිසා."

"අසනීපෙ හොඳකරගන්න ගමට යන්නේ මොකොට ද? ඕනෑ අසනීපයක් හොඳ කර ගන්න පුළුවනි මෙහිදී. ගමට ගොහින් වෙදකම් ගන්නේ කාගෙන් ද? ගම දැන් හොඳ වෙද්දු නැහැ."

නන්ද මෙන් දෙස්තරුන් හා නාගරිකයන් ද ළංව ඇසුරු කිරීමෙන් ලත් දැනුමක් නැති අනුලා ගැමි වෙදුන්ගේ ගුලි, කල්ක හා කෂාය මහත්කොට සලකයි. කොළඹම නැවැතී දෙස්තරුන් ලවා වෙදකම් කරවාගැනීමට ඈ ආයා නොකළා ය. කුඩා කල පටන් තිස් ඇවිරිදි විය ඉක්මවන තෙක් ගමෙහි ජීවත් වූ ඈ ලෙඩ වූ හැම අවස්ථාවෙහිම ගැමි වෙදුන් හා යකැදුරන් විසින් සුව කරනු ලැබුවා ය. නන්දට වැළඳුණු මූර්ච්ඡා රෝගය සුව කෙළේ ගැමි යකැදුරෙකි.

"නෑ, මම ගමට ගොහින් වෙදකම ගන්නවා."

"ගමට ගොහින් කාගෙන් ද බෙහෙත් ගන්නේ?" යි නන්ද යළිත් ප්‍රශ්න කළා ය.

අනුලා අසන්තෝෂ වූවා ය.

"ගමදී බෙහෙත් නොගත්තත් මගේ ලෙඩේ හොඳ වේවි."

"අනුට එහෙනම් කොළඹ එපා වෙලා!"

"ඔව" යි අනුලා ඍජුවම පිළිතුරු දුන්නා ය.

කොළඹ එපාවීමට හේතු වූ කරුණු නන්දට කිව යුතු ද? නොකිව හොත් එය සහෝදර කමට පටහැණි ආත්මාර්ථකාමිත්වයක් වෙයි. එහෙත් ඒ කරුණු අසන නන්ද අසන්තෝෂ වෙයි. ඈ

Scanned by CamScanner

අසන්තෝෂ වන නිසා මගේ අවංක හැඟීම නොකිවහොත් මා ඇගේ සහෝදරිය නොව පිටත්තර ගැනියකි.

"නන්ද තරහ වෙන්න එපා මා මේ කරුණු කියන්නේ තරහ-යෙන් නොවේ" යි කියමින් ඈ තම සහෝදරියගේ මුහුණ බැලුවා ය.

වේදනාවෙන් තැවුණු ඇගේ දිරාගිය මුහුණත් තිල්පැල්ලම් සහිත සුදු පිහන් බෝල දෙකක් වැනි දෙ ඇසත් දුටු නන්ද තුළ ශෝකයක් හා වේදනාවක් ද හටගත්තේ ය. අනුලා තමාට චෝදනා කරන්ට යන්නී ද? තමාත්.........දෙස්තරත් පිළිබඳ කරුණු ඈ දනියි ද? රහසේ පව් කළ ගැහැනියක මෙන් නන්ද ලජ්ජාවෙන් හා බියෙන් කරබා ගත්තා ය.

"මම මෙහි නැවතී වෙදකම් ගත්තත් මගේ ලෙඩේ සනීප වෙන්නේ නෑ"යි අනුලා කීවා ය. "අපට එක දවසකවත් රෑ එකොළහ දෙළහ වන තුරු නිදගන්ට ලැබෙන්නේ නෑ. සෙනසුරාද රෑ එක වන තෙක් කවුරුත් අවදියෙන් ඉන්න ඕනෑ. එක දෙක වන තුරු අපි කාටවත් එදට නිදගන්ට වෙන්නේ නැහැ. කලින් ඇඳන්වල වැටී නිදන්ට යන ඇලනුත් චන්ද්‍රසෝමත් නිදගන්නවා. නමුත් නාලිකා සමහර දට අවදියෙන් ඉන්නවා. සුමානෙකට සැරයක් සමහර විට දෙවරක් රෑ කෑමට මිනිසුන් එනවා........."

නන්ද සැනසුම් සුසුමක් පිට කළා ය.

"මේ කරදර ගැන සමහර විට මාත් කල්පනා කළා. නමුත් මොනවා කරන්න ද? ඒ මිනිසුන් ආශ්‍රය නොකොට නගරේ වැදගත් විදියට ජීවත් වෙන්න බැහැ. එක්කෝ ගමට යන්න ඕනෑ නැති නම් නගරෙ මිනිසුන් ජීවත්වෙනා විදියට ජීවත් වෙන්න ඕනෑ........."

"නගරෙ ඇරලා ගමට යන්න ඕනෑ නෑ නංගි. ඕවා අඩු කර-ගෙන නගරෙ ජීවත් වෙන්න බැරි ද? සමහර විට මගේ අසනීපෙ නිසා මට නගර ජීවිතෙ එපා වෙන්න ඇති. මම වගේ නන්දත්..."

අනික් වචන අනුලා ගිලගත්තා ය.

"මම පියල් එක්කත් කතාකරලා මේවා අඩු කරන්නම්. දෙස්තර ළඟට එක්ක ගොස් අනුට බෙහෙත් අරන් දෙන්නම්......"

තමාගේ අසනීපය කුමක්දැයි නන්දට හෙළි කළ යුතු ද? යන ප්‍රශ්නය අනුලාගේ සිතට නැංගේ ය. අනුලා අවුරුදු දහයකට වැඩි කාලයක් කුඩා දරුවන්ගේ ඇහේ දූවටෙන්නාක් මෙන් ජීවත් වූවා ය. ඈ සය රෝගයෙන් පෙළෙන බව දැනගත්තොත් නන්ද බිය ගනියි. නන්ද තම දරුවන් ඇගෙන් වෙන් කරනු නිසැක ය. සය රෝගය බෝ කරගත්තායයි පියල් ඈට කිපෙයි. 'නෑ—මගේ රෝගය කුමක් දැයි මම නන්දට නොකියමි'යි අනුලා සිතාගත්තා ය.

Scanned by CamScanner

"මම ගමට යන්න ඕනෑ. එහේ ටිකක් කල් ඉන්න කොට මගේ ලෙඩේ හොඳ වේවි. ටිකක් කල් ගම ඉඳලා ආයිත් මෙහි එන්න බැරිය."

අනුලා මෙසේ කීවේ යළිත් කොළඹට එන අදහසින් නොවේ; නන්දගේ සිත සනසනු පිණිස ය. තමාගේ රෝගය සුව වෙතියි යන හැඟීමක් ඇගේ සිතට නොපිවිසියේ ය.

අනුලා ගමට යන්ට තීරණය කරන ලද්දේ අසනීපය නිසාම නොව තමා කෙරෙහි හටගත් අමනාපයකිනියි නන්ද සිතුවා ය. තරුණ විය ඉක්මෙන තෙක් අනුලාට විවාහ ජීවිතයට ඇතුළු විය නොහැකි වූයේ මවුපියන්ගේ දිළිඳුකම නිසා බව නන්ද සිහි කළා ය. කොළඹට පැමිණ හත් අට මසකට පසු, බිරිඳ මිය ගිය ලිපිකරුවකුට අනුලා විවාහ කර දීමට නන්ද හා පියල් යෝජනා කළෝ ය. ඒ යෝජනාව අනුලා බැහැර කෙළේ කෝපයෙනි. ගෙදරට එන අමුත්තන් හා කතාබහ කරනු පිණිස අනුලා නොකැඳවූ බව සිහි කළ නන්දගේ සිතෙහි තියුණු වේදනාවක් හටගත්තේ ය. ඉංගිරිසි කතාව නුහුරු ඈ ඔවුන් හා කතාබහ කරන්ට නොඑයි. එහෙත් නන්ද ඈ නොකැඳවූයේ දරුවන්ට ආදර සැලකිලි දැක්වීමෙන් හා ඔවුන් හා දෙඩීමෙන් ඈ වැඩි සන්තෝෂයක් ලබතියි යන හැඟීමෙනි.

අනුලා ගමට යන බව ඇසූ ඇලන් ඈ වෙතට ගියේ ශෝකයෙන් මැලවුණු මුහුණිනි. නාලිකා හඬන්ට වූවා ය.

"ලොකු අම්මා ගමට යන්නේ මොකොද? මාගේ වැරැද්දක් නිසාදැ"යි කුඩා චන්ද්‍රසෝම මඳක් ලජ්ජාවෙන් ඇසුවේ ය.

"නෑ, මගේ පුතා" යි කියමින් අනුලා චන්ද්‍රසෝමගේ හිස සිම්බා ය.

ඇලන් මවට ඇල්ම කළ නමුදු ඇගේ සමහර ගති නොඉවසූවේ ය. "මම් ගෙදර එන මිනිසුන් එක්ක කතා කරකර හිනාවෙමින් සන්තෝස වෙනවා; ලොකු අම්මා ඒ ගොල්ලන් එක්ක කතා කරන්න යන්නේ නැත්තේ ඇයි?' යි ඇලන් කීප වරක් අනුලාගෙන් ඇසුවේ ය. 'මම පුතාලා එක්ක දෙඩීමෙන් සන්තෝස වෙනවා'යි ඇතැම් විට අනුලා සිනාසෙමින් පිළිතුරු දුන්නා ය.

දෙතුන් මසකට වඩා මවගේ තනපුඩුවෙන් කිරි නොබිවූ ඇලන්, රබර් තන පුඩුවෙන් කිරි පොවා, නාවා ඇතිදැඩි කරන ලද්දේ සාත්තුකාරිය විසිනි. සාත්තුකාරිය ගිය පසු ඇලන් වැඩුණේ මවගේ ළයට වඩා අනුලාගේ ළයට ළංවයි. කුඩා කල අනුලාගේ තුරුල්ලෙහි නිදන්ට ද පුරුදු වුණු ඇලන්ගේ හැඟීම, ඉව අල්ලන සිවුපා සතකුගේ හොට මෙන්, ඇගේ කායික ස්පර්ශය නිසා තියුණු විය. අනුලාගේ කයින් නික්මෙන පුස්බ දැනුණු විගස ඔහුගේ සිත

Scanned by CamScanner

මෙලෙක් වෙයි. ලොකු අම්මා විසින් තුරුළු කරගනු ලැබීමට ඔහු ආශා කරයි; හැට්ටයෙන් නොවැසුණු ඇගේ ගෙල සිඹීමටත් අතගෑමටත් ආශා කරයි.

ඉතා කුඩා වියෙහි පටන් තමා දෙඩූ අනන්මනන්වලට කන් දී ලොකු අම්මා සිනාසුණු සැටිත් ඇසූ අමන ප්‍රශ්නවලට පිළිතුරු දුන් සැටිත් අපූර්ව ස්මරණ ශක්තියක් ඇති ඇලන්ට සිහි කළ හැකි ය. පාසැලට යන්ටත් පෙර, රැයෙහි නිදන්ට පෙර, අනුලා කියූ ගම කතා නොවරද්දා දනුදු කිය හැකි තරම් ඇලන්ට මතක ය. ඒ ගම කතාවලින් චිත්‍රණය කරනු ලැබූ ගැමි ලොව සිහි කරන ඔහු දනුදු ආස්වාදයක් ලබයි. ඒ ගැමි ලොව ඔහුගේ සිතෙහි ඇඳුණු සිත්තමක් වැන්න. ඒ සිත්තම තම මතක පටට නඟාගැනීමෙන් ඔහු විසිතුරු ලොවක් දක්වෙන සිත්තමක් දෙඇසින් බැලීමෙන් ලබන සන්-තෝෂය ලබයි. කුඩා කල අවුරුද්දකට දෙතුන් වරක් මවුපියන්ගේ ගමට ගොස් සතිය දෙක බැගින් එහි ජීවත් වූ ඇලන්, ගැමි පරිසර-යෙහි එකක් අඩු දහසක් රූපාදි අරමුණුවල රස වින්දේ ය. ගම කතාවලින් චිත්‍රණය කෙරෙන ලොව ඔහුට වඩාත් සුහද ලොවක් වී ය.

වරක් ඇලන්ට උණ ගැනුණු අවස්ථාවක අනුලා ඔහුගේ ඇඳෙහිම වාඩිවී ඔහුගේ අතක් අල්ලා උකුළෙහි තබාගෙන කොග්-ගල තොරතුරු කීවා ය. ඇලන්ගේ සීයා මුහන්දිරම් කෙනෙකි. ඔහු දූවරුන්ට හා පුතාටත් බෙහෙවින් ඇල්ම කෙළේ ය. දූවැන්ත කොස් උළුවහු, ජනේල, පරාල, යටලී හා අහල් දහ හතරක් පමණ ගන බිත්ති ඇති මහ ගෙදර වූකලී ඇලන්ගේ සීයාගේ මවුපියන් විසින් තනවන ලද ලොකු ගෙයකි. වාරනිස් ගා නිතර අලුත්වැඩියා කරනු ලැබීම නිසා කුලීන මැඳුරක් සේ ගර්වයෙන් නැඟී සිටි මහ ගෙදර ඇලන්ගේ සීයා කෙමෙන් දිළිඳු වීම නිසා කලකදී ගරාවැටෙන්ට වී ය.

සීයා වඩාත් දිළිඳු වූයේ ඇලන්ගේ අම්මාට හැදුණු අමුතු ලෙඩක් උදෙසා බෙහෙවින් වියදම් කළ බැවිනි. වෙදුන් දෙස්තරුන් ලවා වෙදකම් කරවා එයින් නන්ද සුව නොලැබූ විට සීයාගේ දුර නෑයකු 'සාස්තරයක්' අසනු පිණිස හීනටිගල 'සාස්තරකාරයා' වෙත යවන ලදි. කිසිවකු විසින් කවන ලද අඳුනක් නිසා නන්ද ලෙඩ වීයයි සාස්තරකාරයා කී ය. ඊට පසු සීයා තුන් මාසයක් පමණ තොවිල් හා යකැදුරුකම් කරවීමෙන් අම්මාගේ රෝගය සුව කෙළේ ය.

"අඳුනය කියන්නේ මොකක්ද?" යි ඇලන් ප්‍රශ්න කෙළේ ය.

Scanned by CamScanner

නන්ද අන්දමන්දව කල්පනා කළා ය. ගමේ ඉපිද වැඩුණු කුඩා ළමයා ද අඳුනය කියන්නේ කුමක්දැයි දනියි. දෙළොස් ඇවිරිදි ඇලන් එය නොදනියි. ඔහුට එය විස්තර කරන්නේ කෙසේ ද?

"බේතක්"යි ඇ පිළිතුරු දුන්නා ය.

"බේතට අඳුනය කියන්නේ මන්ද?"

"ඒක ලෙඩට දෙන බේතක් නොවන නිසා"

"එහෙනම් ඒක ඇඟ සනීප වෙන්න දෙන බේතක් ද?"

"නෑ........" කියමින් ඈ කට කොනට සිනාවක් නැඟුවා ය.

ඇලන්ගේ කුහුල වැඩිණ.

"එහෙනම් ඒ බෙහෙත කවන්නේ මොකක් නිසා ද?"

"අඳුන නන්දගේ සිත් ගනු පිණිස කැවූ බේතක්" යි කීවද එය ඇලන්ට නොතේරෙයි. ගැනුන්ගේ සිත් ගැනීමට බෙත් ඇතැයි කීමෙන් ඇලන්ගේ සිත කිළිටි කිරීම නොමනා ය.

අනුලා ඇලන්ගේ කුහුල අන් අතකට හරවන අටියෙන් තොවිල්පවිල් ගැන කීවා ය. දහඅට පාළිය අරඹන යකැදුරා වැදි සන්නි නැටුම නටනු පිණිස වෙස් මාරු කරන සැටි ඇ මහත් ආයාසයෙන් විසිතුරු කොට වර්ණනා කළා ය.

කකුල්වල ඇලී සිටින කළු මෙස් කලිසමක් හැඳ ගෙජ්ජි බැඳ ගන්නා යකැදුරා බුරුල්ල කොළ ඉණහැදයක් ඉණ වටා බැඳගනියි. බෙල්ල වටා බැඳි බුරුල්ල කොළ මාලයෙන් යකැදුරාගේ සෙළු ළයෙහිත් පිටෙහිත් අඩක් වැසෙයි. වළඳෙහි දලි පොල්-තෙලෙන් දිය කොට ගානු ලබන මුහුණ, සිප්පියෙන් තනන ලද කොටි දත් වැනි දත් දැන්දෙහි සුදත් ඇස්වල සුදත් බබළවයි. ඔහුගේ මුහුණ බලන ළමයි බයවෙති; ඇතැම් විට ළමිස්සියක් බියෙන් සැලී මූර්ච්ඡා වෙයි.

වෙස්වලාගත් යකැදුරා, අතින්ගත් බුරුල්ල කොළ මිටි දෙකින් මුහුණ වසාගෙන නටයි. එක වර බුරුල්ල කොළ මිටි දෙක ඉවත් කරමින් ඔරවාගත් ඇස් හා විරිත්තුණු දත් ඇති රකුසු මුහුණ පෙන්-නයි. අනතුරුව ඔහු ඇස් ඔරවමින් තර්ජනාත්මක නැටුමක් නටයි. පත්තු වන පන්දම කට ඇතුළේ දමා එළියට ගන්නේ නිවුණු පසුයි.

"වැදි සන්නිය නටන යකැදුරා සැරෙන් පත්තු වෙද්දි ද පන්දම කට ඇතුළට දමාගන්නේ" යි ඇලන් විස්මයෙන් ප්‍රශ්න කෙළේ ය.

"ඔව්........ගිනි සිහිල් කරන මන්තරෙන් පන්දම්වලට මතු-රනවා"

"මෑ ඕවා ගැන අපට කවදවත් කිව්වෙ නෑ. කොග්ගලට ගිය දවසක මම තොවිලයක් බලන්න යන්න හැදුවාම මෑ කිව්වා 'නිදි මරාගෙන ඔය විකාර බලන්න යන්න එපා' කියා."

අනුලා දූත් යකැදුරු කම් හා තොවිල් උදසීනත්වයෙන් සලකතත් විකාරයයි බැහැර නොකරයි. එහෙත් ඒවා කුඩා ළමයින් විසින් නොබැලිය යුතු ය.

"තොවිල් නැටුම් විකාර කෝලම් තමා. අම්මා ඒවා ගැන ඇලන්ට කිසිවක් නොකියන්නේ ඒ නිසා. නමුත් උණත් හිස රදෙත් හැදුණාම මම තෙල් මතුරවාගෙන තියෙනවා. අම්මත් තෙල් මතුරවාගෙන තියෙනවා."

"තෙල් මතුරවාගත්තාම ඉසේරදේ හොඳ උණා ද?"

"ඔව්".

"මට උණට වැඩිය ඉසේරදේ අමාරුව තමයි දැනෙන්නේ. තෙල් මතුරන්නේ කොහොමද?"

තමා තවත් අමාරුවක වැටිණැයි අනුලා සිතුවා ය. තෙල් මතුරන සැටි ඇලන්ට හඳුන්වන්නේ කෙසේ ද?

"කෝප්පෙට තෙල් ටිකක් වක්කරගෙන යකැදුරා මතුරා මතුරා පිඹිනවා. ඊ ළඟට යකැදුරා මැදැඟිලි තුනට තෙල් ටිකක් අරගෙන ලෙඩාගේ නළලේ ගගා සෙමින් මතුර මතුරා පිඹිනවා."

"මගේ ඉසේ රදේ හොඳ වෙනවා ද බලන්න තෙල් ටිකක් ගගා මතුරන්න."

"මම මන්තර දන්නේ නෑ" යි කියමින් අනුලා සිනාසුණා ය.

"මන්තර නොකිව්වට කමක් නෑ. තෙල් ටිකක් මගේ නළලේ ගගා පිඹින්න.

හිරු බැස යෑම නිසා පැතිරෙන අඳුරෙන් වැසෙන මුහුද, හරිත ලද කවුළුවෙන් පෙනෙයි. වරායේ නැව් කුඹගස් මුදුන්වල දැල්වෙන පහන් අහසින් පාත්වුණු තරු මෙන් පළින්පළ බබළතු දුටු අනුලාට සිහිවූයේ මහගෙදර මිදුලේ තොවිලේ පළ හතර කොන තබනු ලැබූ පිඳෙනිවල විලක්කුවලින් නැඟුණු එළියයි.

"මට බෑ"යි කියමින් අනුලා යළිත් සිනාසුණා ය. "දූන් කරුවල වෙගන එනවා. විදුලි පාන පත්තු කරන්න ද?"

"එපා; ඉසේ රදේ වැඩිවෙනවා. ලොකු අම්මා මගේ නළලේ තෙල් ටිකක් ගගා පිඹින්න. අනේ තෙල් ටිකක් ගේන්න."

Scanned by CamScanner

අනුලා අතිකක් ගැන කතා කරන නමුත් ඇලන් 'අනේ තෙල් ටිකක් ගේන්න' යි කියයි. ඇලන්ගේ වදෙන් ගැළවිය නොහැකි වූ අනුලා කුඩා කෝප්පයකට පොල් තෙල් ටිකක් වත්කොට ගෙන ඇවිත් ඇලන්ගේ නළලෙහි ගා සෙමින් නළල පිරිමදිමින් නැළ-විල්ලේ කටින් පිඹින්ට වූවාය.

''යකැදුරා තෙල් මතුරන විට තව එකක් කරනවායි කියමින් අනුලා සිනාසුණා ය.

''ඒ මොකක් ද ?''

අනුලා මාපටැඟිල්ල මැදැඟිලි තුඩෙහි වද්ද ඇඟිලි දෙක ගස්සා මැත් කළා ය.

''මට ඒක හරියට කරන්න බැහැ. යකැදුරා ඒක කරාම 'ටික්' හඬ නඟිනවා'' යි කියමින් අනුල යළිත් සිනාසුණා ය.

ඇලන් මාපටැඟිල්ල මැදැඟිලි තුඩෙහි වද්ද ගස්සා මැත් කෙළේ ය. හඬ නොනැඟිණ. තුන් වන වාරයෙහි හඬ නැගෙන සේ ඇඟිලි තුඩු ගැස්සූ ඔහු සන්තෝෂ වී ය. ඇලන් ඉතා ශූර ළමයෙකියි කල්පනා කළ අනුලා බෙහෙවින් සන්තෝෂ වූවා ය.

අනුලා ඉතා සෙමින් ඇලන්ගේ නළල පිරිමදිමින් නළලට පිඹියි. පිට අත ගානු ලැබූ බළලකු මෙන් ටික වේලාවකින් ඇලන් දෙඇස අඩවන් කරගෙන සැනසිලි සුසුම් හරින්නාක් මෙන් සෙමින් හුස්ම ගන්ටත් පිටකරන්ටත් වී ය. මිනිත්තු දහයකින් ඇලන් නිදනු දුටු අනුලා පුදුමයෙන් සන්තෝෂවූවා ය. ඈ පාත් වී ලෙඩාට නොදනෙන සේ ඔහුගේ නළල්තලය සිඹ තෙල් කෝප්පය මේසය උඩ තබනු සඳහා ඈතට ගියා ය. අඩ නින්දෙන් අවදිවුණු ඇලන් පිටු පා යන ලොකු අම්මා දෙස බලා යළිත් ඇස්වසා ගත්තේ ය.

අනුලා ඇවිත් ඔහුගේ ඇඳෙහි වාඩිවී යළිත් සෙමින් නළල අතගාන්ට වූවා ය. ඇගේ කයින් නික්මෙන සුපුරුදු පුස්ඹ ඔහුගේ ඇල්මත් ආසාවත් පුබුදු කෙළේ ය. අඩ නින්දට ළංව සිටි ඔහු ලොකු අම්මා තමාට දක්වන ආදර සැලකිලි සිහි කිරීමෙන් ආස්වාදයක් ලැබුවේ ය.

වරක් ඇලන් කළ වරදක් නිසා මව ඔහුට දඬුවම කරන අදහසින් තර්ජන කළා ය. ඇලන් කෝපයෙන් මව දෙස රවා බලා බුම්මා ගත්තේ ය. නොකිපී සිටින විට ඇලන්ගේ දෙනෙත කරුණාවෙන් හා ඇල්මෙන් එළිය වෙයි. ඔහු කිපී රවා බලන විට ඔහුගේ දෙඇසට ආරූඪ වන තපුරු ගතිය දුටු අනුලා ඇතැම් විට බියගත්තා ය. මුදු මොළොක් හදක් ඇති ඇලන්ගේ දෙනෙත රෞද්‍ර වේශයක් ගත්තේ කෙසේදැයි ඈ පුදුම වූවා ය.

Scanned by CamScanner

අනුලා ඇලන් අතින් අල්ලාගෙන මිදුලට බැස වරායේ නවතන ලද නැව් හම්බන් පෙන්නමින් ඔහු හා කතාබහ කළා ය. කෝපය සිතින් මෝචනය කළ ඇලන් සිනාසුණේ ය.

"අම්ම බැන්නට ඇලන් තරහ උණා ද? අම්ම බැන්නේ ආදරේට. අම්මට රවා බලන්න හොඳ නැහැ. අම්මා දිහාව රවා බලන්න එපා. බොහොම පව්."

ලොකු අම්මාගේ මේ බණ දෙසුම ඇලන්ට හොඳින් නොවැටහුණ නමුත් නොමැකිය හැකි සේ ඔහුගේ සිත් සතන් පටෙහි ලියවිණ.

ඇලන් හැර යෑම අනුලාගේ දැඩි ශෝකයට හේතුවකි. එහෙත් සය රෝගයෙන් පෙළෙන ඈ කුඩා දරුවන් ඇසුරු නොකළ යුතු ය. ඇලන් හා අනික් දරුවන් දෙදෙනාගෙන් ද වෙන්වීමෙන් ඇති වන දුක ඉවසීම ඇගේ සිතට සැනසීමක් වෙයි. ඔවුන්ගේ අනාගතය සලකා ඔවුන්ගෙන් වෙන්වීම ආත්ම පරිත්‍යාගයකි.

"මම ගමට යන්න ඕනෑ ඇලන්; නොගොහින් බෑ. මට ටිකක් සනීප නෑ. ගමට ගොහින් මාස හත අටක් ඉන්න කොට මට සනීප වේවි"යි අනුලා තෙපලා ය.

"සනීප නැත් නම් මෙහේ හොඳ දොස්තරෙකුගෙන් බෙහෙත් ගන්න පුළුවනි" යි ඇලන් යෝජනා කෙළේ ය. "ගමට යන්නේ මොකොට ද? අමාරු ලෙඩවලට වෙදකම් ගන්න ගම්වල මිනිස්සුත් එන්නේ කොළඹට."

ඉස්තෝප්පුවේ දැල්වුණේ සැර එළියක් පතුරුවන විදුලි පහනකි. අනුලාත් ඇලනුත් හිඳගත්තේ ඈතම කෙළවරේ බිත්ති මුල්ල අසල වූ පුටු දෙකක ය. හඳ එළියත් නැව්වලින් පැතිරෙන එළියත් පාර අයිනේ පහන් කනුවෙන් පැතිරෙන එළියත් නිසා වරායේ දිය කඳ කැටපත් තලයක් සේ අහසට නැඟුණු දේ පිළිබිඹු කරමින් බබළයි. බඩු පටවන ලද ගැල්වල පූණුගෙවුණු රෝද හැළහැප්පෙන හඬ ද එක් හරකකුගේ බුරුල්වුණු ලාඩම් තාර පාරෙහි වැදීමෙන් නගින හඬ ද අනුලාට ඇසෙයි. ගමට යන අදහස නිසා උපන් සන්තෝෂයත් අසනීපය පිළිබඳ හැඟීමත් නිසා පිබිදුණු ඇගේ සිත, සියුම් හඬ ඇසීමට වෑයම් කරන සතකුගේ උඩුකුරු කොට ගත් දෙකන් වැන්න.

"බෙහෙත් නැතිව ලෙඩ හොඳ වෙන්නේ නෑ. ලොකු අම්මා මෙහේ නැවතිලා ඉඳගෙන බෙහෙත් ගන්න. ලෙඩේ හොඳ උණාට පස්සෙ ගමට ගොහින් එන්න පුළුවනි" යි ඇලන් ආයාචනා කෙළේ ය.

"මට එහෙමකට අසනීපයක් නෑ. ඇඟ කෙට්ටු වෙනවා. ඇඟට පණ නෑ............"

ඇලන් ලොකු අම්මාගේ මුහුණත් කයත් දෙතුන් වරක් බැලුවේ ය. ඇගේ මැලවුණු මුහුණත් දිරූ කයත් මතුවුණු ඇට හන්දි හා නහර සහිත සීන් දෑතත් හඳුනාගත් ඇලන් තැතිගත්තේ ය.

ලොකු අම්මාගේ කයෙහි මේ සලකුණු මීට කලින් මගේ ඇසට හසු නොවූයේ කුමක් නිසා ද? යන්තම් උණගැනීමෙන් මගේ මුහුණ මඳක් වෙනස් වූ අවස්ථාවෙහි පවා ලොකු අම්මා ඒ වෙනස දුටුවා ය.

"ලොකු අම්මා ටිකක් කල් ගමට ගොහින් ඉන්න" යි ඇලන් මැඩගත් ශෝකයෙන් කීවේ ය; "කොළඹ කරදර වැඩියි. ලොකු අම්මා නිදගන්න යන්නේත් හුඟක් රෑවෙලා උණාට පස්සේ. ටිකක් දවස් ගම ඉන්න එක හොඳයි. එහේ කොළඹ වගේ කරදර නෑ."

"පුතාගේ කීම හරි"යි කියමින් අනුලා පුටුවෙන් නැංගා ය.

ඇලන් පුටුවෙන් නැඟී ලොකු අම්මාගේ දෙකකුල් බදගෙන ඇගෙ මුහුණ බැලුවේ ය. තමා කුඩා කල සිතින් මවාගත් ආදර-වන්තයා තමා වැලඳගත් කලක මෙන් අනුලාගේ සිත පිනා ගියේ ය.

Scanned by CamScanner

# 7

ගෙදර සමහර වැඩ ද කරමින් ළමයින් බලාසොයාගනු පිණිස අනුලා කොතෙක් වෙහෙසෙන්ට ඇද්දැයි නන්දට හොඳින් වැටහුණේ ඈ ගමට ගොස් සතියක් ඉකත්වූ පසුයි. අනුලා ගොස් දෙසතියක් ගෙවෙන්ට පෙර නන්ද වැඩි වැටුප් ගෙවා ඉංගිරිසි උගැන්මක් ද ලැබූ ගැහැනියක ගෙන්වාගත්තා ය.

ඇලන් වෙන ද මෙන් උනන්දුවෙන් පාඩම් නොකළ නමුදු හැම සතියෙහිම පන්තියේ පළමු වැනියා වෙයි. ඔහු ගෙදර සිටින අන්‍යයන්ට දක්වන්නේ සන්තෝෂයෙන් පිබිදුණු මුහුණක් නොවේ. මව තරවටු කළ විට ඔහු වෙනදාට වඩා කිපෙයි; එහෙත් මව දෙස රවා නොබලයි.

අලුත් ආයා ඔහු හා ඉංගිරිසියෙන් කතාකරනු අසන විට ඔහු කිපෙයි; ඇතැම් විට සිනාසී ඈට සරදම් කරයි. ලොකු අම්මා තමා හා හැම විට කතා කෙළේ සිංහලයෙනි. මව කතා කරන්නේ ඉංගිරිසියෙනි. ලොකු අම්මා සමඟ සිංහලයෙන් හා අම්මා සමඟ ඉංගිරිසියෙන් ද කතාකිරීම ඇලන්ගේ ගතානුගතික පුරුද්දක් වී ය. ඉංගිරිසි හොඳින් කතාකරන්ට නොදත් ආයා තමා හා ඉංගිරිසියෙන් කතාකළ හැම විටම ඇලන් අමනාප වූයේ ය. ඈ ඉංගිරිසියෙන් කතාකරන්ට වෑයම් කරන්නේ මවගේ තැන ගන්නා අදහසින් දැයි ඇලන් ඇතැම් විටක සිතුවේ ය. ලොකු අම්මා තමා බලා සොයා ගත්තේත් තමාට ආදර සැලකිලි දැක්වූයේත් ඉතාම සුහද හැඟීමෙනි. ඈ කිසි විටක කිසිවක් කරන්ට තමාට අණ නොකළා ය; 'එහෙම කරන්න එපා' යි ඈ තමාට කීවේ ඉතා කලාතුරකිනි. ආයා මෙන් හැම දෙයක් නියමිත වේලාවටත් නීතියක් රීතියක් අනුවත් තමා ලවා කරවන්ට ලොකු අම්මා වෑයම් නොකළා ය.

දවසක රැයෙහි ඇලන් නොනිද චාල්ස් ඩිකන්ස්ගේ Edwin Drood නමැති නව කථාව කියවූයේ ය. කාමරයට පැමිණි ආයා,

''It is time fur you to sleep'' කියමින් විදුලි පහන නිවූවා ය.

දැඩි කෝපයෙන් පුටුවෙන් නැඟුණු ඇලන්,

''Get out .........'' යි ගුගුරමින් යළිත් පහන දැල්වූයේ ය. ඔහු 'bitch' යන වචනය කටින් පිට නොකොට ආයා දෙස රවා බැලුවේ ය.

කුප්පනු ලැබූ සිංහ පැටවකුගේ ගෙරවුම වැනි හඬක් විදහාගත් ඇස් දෙකෙහි විශාලත්වයත් දුටු ආයා අන්දමන්දව කාමරයෙන්



Scanned by CamScanner

පිටවූවා ය. කිපුණු විට මෙතරම් විශාල වන ඇස් ලොඩි සහිත දෙඇසක් ඔහුට ඇතැයි ආයා හීනෙනුදු නොසිතුවා ය.

තමා පමණක් නොව අනික් කවරකු වුව ද කියන්නක් කර බාගෙන කරතියි සිතවනා මුදු ගුණ ඇලන් කෙරෙහි ඇතැයි ආයා සිතා සිටියා ය. ඔහුගේ මුහුණ, කපන ලද කොංඩය ඇති තරුණියකගේ සුන්දර මුහුණ මෙන් ආයාගේ සිත් ගත්තේ ය. තරුණියකගේ මෙන් ඔහුගේ අත්ගොබ වටකුරු ය. නිතර අඩවන් වූ දෙඇසත් දෙබැමත් නිසා ඔහු තරුණියකගේ මුහුණුවර ලැබියයි ඈ සිතුවා ය.

ආයා තුළ වුව ද ඇලන් නිසා හටගත්තේ අනුලා තුළ හටගත් ඇල්ම වැනි ඇල්මකි. නගරයෙහි සුද්දකුගේ ගෙදර ද අනතුරුව ධනවත් සිංහලයකුගේ ගෙදර ද ආයාකම කිරීමෙන් ගතානුගතික ශික්ෂණයක් ඈ ලැබුවා ය. නගරයට සක්මන් කළ ගැමි ගැහැනියක වන ඇට තම හදින් නගින අවංක හැඟීම යට කරගෙන සිතන්ටත් ක්‍රියා කරන්ටත් අනුබල දෙන්නකි ඒ ශික්ෂණය. එය ඇගේ පියවි ගති වසන සුලබ විසිතුරු වෙස් මුහුණක් වී ය. ඇලන් දකින්නේ ඇගේ ඒ වෙස් මුහුණ පමණි.

අනුලා තම ගැමි ගති හා දුබල කම් ද සඟවාගැනීමට කිසිම වෑය මක් නොකොට තම ඇල්ම හෙළි වන සේ හැම විට කතාකළා ය; ක්‍රියා කළාය. ඇගේ සුහද ගති නිසා පිබිදුණු ඇලන් තමාගේ හද විදහා පාන්නාක් මෙන් ඈ හා කතා කෙළේ ය; හිතුණු දෙයක් කෙළේ ය. ආරූඪ කරගත් විනීතකම්වලින් පියවි ගති සඟවාගන්ට පුරුදු වුණු ගෑනු වුව ද පිරිමි වුව ද ඔහුට ප්‍රිය නොවූහ. ඔහුගේ ඒ ගතිය තම ලොකු අම්මා නිසා පිබිදුණකි. අලුත් ආයාට ඔහු නොපැහැදුණේ ය. ඔහු කටින් හා දෙනෙතින් පිට කෙළේ ඒ වේලේ සිතට නැඟුණු කෝපයක් නොව හද තුළ හටගෙන කෙමෙන් වැඩුණු අමනාපය නිසා උපන් කෝපයකි.

අනුලා සිටියදී ඇලන් තම ඇඳුම් උනා දෙපලක දැමුවේ ය; සපත්තු දෙක දෙපළක තැබුවේ ය. පොත පත එක තැනක නොතැබුවේ ය. ඒ ඇඳුම් තමා තැබිය යුතු තැනත් සපත්තු දෙක සපත්තු රාක්කයේත් තබන ලද්දේ අනුලා විසිනි. පිබිදෙන සියුම් හැඟීම් කෙතක් ඇති ඇලන්, අලුත් ආයා පැමිණ දෙසතියක් ගත වන්ට පෙර තමාගේ එවැනි ඇබ්බැහිකම් මැඩගන්ට වෑයම් කෙළේ ය. ලොකු අම්මා මෙන් නොව ආයා තමා හික්මවනු පිණිස ඒ ඇබ්බැහිකම් අවියක් කොට ගනිතියි ඇලන් සිතුවේ ය.

වෙන ද මෙන් නොව දැන් ඇලන් මවුපියන් කරන කියන දේ සිතින් විවේචනය කරන්ට වෑයම් කරයි. පොත් පාඩම් කිරීමෙන් පසු ඇලන් සෙවූයේ ලොකු අම්මාගේ සමාගමයි. කෑම කා නිදන්ට

යන තෙක් ඔහු අනුලා හා අනන්මනන් දෙඩීමෙන් මහත් සන්තෝෂ යක් ලැබී ය. ඒ සන්තෝෂය අලුත් ආයාගෙන් ඔහු නොලැබී ය. පියාත් මවත් ගෙදරට එන අමුත්තන් හා රෑ බෝ වන තෙක් කතා බහ කිරීමෙන් සන්තෝෂ වනු දකින ඔහු තුළ හටගන්නේ මළ කලකිරීමකි.

පියා ඇලන් සමඟ වැඩිපුර කතා නොකරයි. "ඇලන් මේ සුමානේ පන්තියේ කීවෙනියා ද?" යි පියා සතියක් පාසා ඇලන්-ගෙන් ප්‍රශ්න කරයි. ඇලන්ට ඔහු දකින්ට ලැබෙන්නේ රැයෙහි පමණි. ඔහු ඇතැම් දවසක චොක්ලේට් ගෙනැවිත් පුතුන් දෙදෙ-නාටත් දුවටත් බෙදා දෙයි.

ලොකු අම්මාගෙන් වියෝ වුණු පසු වරක් ඇලන් උණ ගැනී තුන් දවසක් ඇඳෙහි වැතිර උන්නා ය. ඒ තුන් දවස තුළ මව දවසකට හත් අට වර බැගින් කාමරයට ඇවිත් ඔහුගේ සුව දුක් සෙවුවා ය. පියා දවසක් තමාගේ කන්තෝරුවට නොගොස් පුතාගේ ලෙඩේ ගැන සොයමින් ගෙදර නැවතුණේ ය. අනික් දෙදවසෙහි දවසකට හතර වර බැගින් ඇලන්ගේ සුව දුක් සොයනු පිණිස ඔහු ගෙදර ආවේ ය.

අනුලා ගමට ගොස් දෙමසක් ගත වන්ට පෙර ඇලන් වෙනදට වඩා හවස් වී ගෙදර එන්ට පටන් ගත්තේ ය. පාසැල වැසූ පසු ඔහු වෙන දාට වැඩි කාලයක් යහළුවන් සමඟ සෙල්ලම් කරන්ටත් අනන් මනන් දෙඩීමෙන් සන්තෝෂ වන්ටත් පුරුදු වී ය. ඔහු ගෙදරැවිත් කේක් කෑල්ලක් හෝ බටර් හා ජෑම් ගාන ලද පාන් පෙති දෙකක් හෝ කා තේ කෝප්පය බී අනතුරුව ඇඳට වී ඉංගිරිසි නවකථාවක් කියවයි. ලොකු අම්මාගෙන් වියෝ වූ පසු ඔහු වඩාත් දැඩි ආශා-වෙන් පොත් කියවන්ට පටන් ගත්තේ ය. විසි ඇවිරිදි වියෙහි වූ ශිෂ්‍යයන් විසින් කියවිය යුතු දුෂ්කර ඉංගිරිසි නවකථා හා නිබන්ධ ද කියවන්ට වූ ඔහුගේ ඉංගිරිසි දැනුම බෙහෙවින් දියුණු වී ය. අවුරුද්ද අවසානයෙහි විභාගයෙන් සමර්ථ වූ ඔහු ලැබූ තෑගි අතර ඉංගිරිසි භාෂාව හා සාහිත්‍යය පිළිබඳ තෑග්ග ද වී ය.

ඇලන් ඉංගිරිසි භාෂා සාහිත්‍යය පිළිබඳ තෑග්ග දිනා ගැනීම මවගේත් පියාගේත් අපමණ සන්තෝෂයට හේතු වී ය. මවත් පියාත් එක්ව ඇලන්ට වටනා ඇඳුමක් මස්වා දී රුපියල් පනහක ඉංගිරිසි පොත් මිලට ගෙන තෑගි කළෝ ය. පොත් තෝරන ලද්දේ තිස්ස විසිනි. ඉංගිරිසි සාහිත්‍යය පිළිබඳ ඇලන්ගේ දැනුම ගැන පැහැදුණු තිස්ස ජෝර්ජ් එලියට්ගේ නවකථා දෙකකුත් Matyr-dom cf Man නමැති පොතත් මිලට ගෙන ඇලන්ට තෑග්ගක් වශයෙන් දුන්නේ ය.

Scanned by CamScanner

ඇලන් ඉංගිරිසි භාෂා සාහිත්‍යය පිළිබඳ තෑග්ග දිනුවේ අලුත් ආයා ඉංගිරිසි උගැන්මට ඔහු උනන්දු කළ නිසායයි නන්ද හා පියල් කල්පනා කළෝ ය. අනුලා ඇසුරු කළ කාලයේ ඉංගිරිසි පොත් කියවන්ට ඇලන් තුළ දූන් තරම් දැඩි ආසාවක් නොවී ය. ඔහු වඩා ආසා කෙළේ ගම තොරතුරු හා ගැමි කතා අසනු පිණිස ය. ගැමි කතා ඇසීමෙහි ආසාව නිසා ඇලන් ඉංගිරිසි පොත් කියවන්ට දූන් තරම් කාලයක් ගත නොකෙළේ ය. නන්ද, පියල්ගේ අදහස් ද විමසා අලුත් ආයාගේ පඩිය රුපියල් දහයකින් වැඩි කළා ය. ආයා, වෙන ද මෙන් ඇලන් වේලාවට කෑම කනු, පාඩම් කරනු, නිදන්ට යනු, හොඳින් අඳිනු දකින ආසාවෙන් නොමඩිනු ලැබුවා ය. ඇලන්ට රිසි සේ පොත් කියවන්ටත්, තමාගේ කටයුතු කරගන්ටත් ඈ අනුබල දුන්නා ය. ඈ නිසා හටගත් අමනාපයත් කෝපයත් කෙමෙන් ඇලන්ගේ සිතින් තුනී වී ය. එහෙත් ලොකු අම්මාට උපන් ඇල්ම තවත් දැඩිවීම නිසා ආයා ඔහුට ප්‍රිය නොවී ය. තමාගේ වැටහෙන නුවණත් කියවීමේ ආශාවත් පුබුදු කෙළේ ලොකු අම්මා බව ඇලන් දනියි.

ඇලන් පාඩම් කොට වෙන දට වඩා කලින් බත් කා නිදන්ට යයි. එහෙත් ඔහු නිදනු වෙනුවට බොහෝ වේලාවක් යන තුරු නොනිද ඉංගිරිසි නවකථා කියවන්ට පටන්ගත්තේ ය. තමා නෙත් සිත්, තමාගේ ඇතුළු කයට හැරවූවකු භාවනා කරන්නාක් මෙන් ඇලන් වැඩි ආසාවකින් පොත් කියවන්ට පටන් ගැනීම නිසා නාලිකා වෙන දට වඩා කලින් නිදන්ට පුරුදු වූවා ය. රෑ කෑම කෑමෙන් පසු ඇලන්, අනුලා කියන ගැමි කතා හා තොරතුරු අසන්ට පුරුදු වූයේ ය. නාලිකා ද ඔවුන්ට එක්ව දොඩමින් සන්තෝෂ වූවා ය. ලොකු අම්මාගේ ගැමි කතා මල්ල කාවදුවත් හිස්නොවන්නක් ලෙස සැලකූ ඇලන් පුදුම වූයේ ය. ඇගෙන් වියෝ වූ පසු ඇලන්ට හා නාලිකාට වෙන ද තරම් ඔවුනොවුන් හා කතාබහ කිරීමෙන් සන්තෝෂවන්ට අවස්ථා නොලැබිණ. නාලිකා ගැමි කතාවක් කියන ලෙස ආයාට ආරාධනා කළ හැම විට ඈ "මම ගමකතා දන්නේ නෑ"යි කීවා ය.

ඈ සිංහල කතා කරන්නේ නාගරික ස්ත්‍රියක මෙනි. සුද්දකුගේ ගෙදරත් අනතුරුව ඉහල පන්තියේ සිංහලයකුගේ ගෙදරත් ආයා කම කළ ඈට ඒ කතාව නිතැතින් පුරුදු වූවකි.

"ආයා උපන්නේ කොළඹ ද?" යි දවසක් නාලිකා ප්‍රශ්න කළා ය.

"ඔව්"

ඇලන් නිසා දූන් ආයා තුළ හටගන්නේ බියකි. ඇලන් ඈට විරුද්ධ වුවහොත් ඈට අස්වන්ට සිදු වෙතියි යන හැඟීම ද ඇගේ

Scanned by CamScanner

බියට එක් හේතුවකි. හිතුණු දෙයක් කරන දඟකාරයකු වන චන්ද්‍ර-සෝම හික්මවන්ට ආයා කිසි විටක වෑයම් නොකළා ය. තමාගේ කතාවට කන්දෙමින් තමා කියන දෙයක් කර බාගෙන කරන නාලිකා කෙරෙහි තම ආධිපත්‍යය පැවැත්වීමෙන් ආයා මහත් සන්තෝෂයක් ලැබුවා ය. ආයා නාලිකාත් සමඟ මුහුදු වෙරළෙහි ඇවිදින්ට යයි; ඈ කුඩා දූරියට වරායෙහි නොයෙක් දේ පෙන්නමින් විස්තර කරයි; වෙරළෙහි ඇවිදින්ට එන ඉංගිරිසිකාරයන් හඳුනන්-නක මෙන් ඈ ඔවුන්ගේ නම් කියයි. ඉංගිරිසිකාරයකු හමු වූ විට ඈ මඳ සිනාවක් පා හිස පාත් කරයි; ඉංගිරිසි කාරයා ද සිනාසී ඇට ආචාර කොට යයි.

ඈ දවසක වරායෙහි නවත්වන ලද නැවු පෙන්නමින් ඒ නැවු නාලිකාට හඳුන්වා දුන්නා ය.

"අර පෙනෙන්නේ ජේර්මන් නැවක්"යි කියමින් ඈ නැවක් දෙසට අත් දික් කළා ය.

"මේක ඉංග්‍රීසි නැවක්" යි කියමින් ඈ සුදු පාටින් බැබළෙන ඉතා විශාල තවත් නැවක් පෙන්නුවා ය. කළු කුඹගස් හා කළු, සුදු, දෙපාටින් අලංකාරණය වුණු දුම් නල දෙකක් ද සහිත ඒ නැවේ කඳෙහි පින්තාරු කරන ලද අකුරු පෙළ කියවන්ට නාලිකා වෑයම් කළා ය. ඒ අකුරු ඉංගිරිසි හෝඩියේ අකුරු නොවෙතියි නාලිකා කල්පනා කළා ය.

"ඒ නැවේ නම ලියා තියෙන්නේ ඉංගිරිසි අකුරෙන් නෙවි."

"නැව්වල නම් ලියංඩේ වෙනස් වර්ගයක ඉංගිරිසි අකුරුවලින්" යි ආයා වහා පිළිතුරු දුන්නා ය. නාලිකා ඇගේ කියුම විශ්වාස කළා ය. ආයා තමාගේ ප්‍රස්තාවෝචිත නුවණ මහත් කොට සලකා සන්තෝෂ වූවා ය.

"මම ඒ නැවට ගොහින් තිබෙනවා"යි ආයා කීවා ය. "ඒ නැවේ ඇතුළ හරියට පැලස්එකක් වගෙයි. මම නැවට යංඩ ගියේ සුදු නෝනාත් එක්ක. නැවේ කප්පිත්තන් මහත්මයා මම එක්කත් කතාකරා. 'Beautiful Cingalese Ayah' කියමින් එයා බීම වීදුරු-වක් බොංඩ මට කතාකරා........."

"ආයා බීම බොනවා ද?"යි නාලිකා විස්මයෙන් ඇසුවා ය.

ඈ සිනාසුණා ය.

"ඉංග්‍රීසි මහත්මයලගේ ගෙදර ඉංඩ කාලේ මහත්මයා වරදක් කලා මට බරන්ඩි බොංඩ පුරුදු කරා."

වෙරළෙහි ගමන් කළ නොවැසුණු කදිම උඩු කය ඇති මිනි-හෙක් දෑඩි ආසාවෙන් ආයා දෙස බැලුවේ ය. ඈ රවා බලා පිළිකුලෙන් මෙන් හිස අනික් අතට හැරවූවා ය. මඳ වෙලාවකට

Scanned by CamScanner

පෙර කළු දුම් කෙහෙළි නඟමින් වරායෙන් පිටත්ව ක්ෂිතිජය බලා යාත්‍රාකරන කළු කඳක් ඇති නැවක් දෙස බලා නාලිකා 'ඒ නැව යන්නේ කොහාට ද?'යි ඇසුවා ය.

"එංගලන්තෙට යන බඩු නැවක්" යි ආයා පිළිතුරු දුන්නා ය.

අනුලාගෙන් වියෝ වුණු තම දරුවන් තිදෙනාගෙන් ඇලන් වැඩි ආසාවකින් පොත් කියවන්ට වීම පමණ නන්දගේ මහත්ම සැලකිල්ලට හසු වූයේ. ඇඳට වී හෝ කාමරයෙහි පුටුවක හිඳගෙන හෝ පොත් කියවන්ට වූයේ ඇලන්ගේ සිතුම් පැතුම් මඳක් වෙනස් වූ නිසා ය යන හැඟීම නන්දගේ සිතට නොනැංගේය. හැම විෂයක් සඳහා ඇලන් වෙන දට වඩා ලකුණු ලබයි. ගණිතය හා ඉංගිරිසි බස උදෙසා ඔහු හැම සතියෙහි ම සියේට අනූපහක් ලකුණු ලබයි. එහෙත් ඔහු වෙනද මෙන් ගෙදරදී සන්තෝෂ නොවෙයි; වැඩිපුර කතා නොකරයි; මව හෝ පියා හෝ අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. ඇලන්ගේ මේ වෙනස්වීම පියල් පමණක් නොව නන්ද ද නුදුටුවෝ ය.

පෙර ගෙදරදී කතාබහ කිරීමෙන්, සිනාසීමෙන්, ලත් සන්තෝෂය දැන් ඔහු ලබන්නේ ගෙදරින් පිටතදී තම යහළුවන් ඇසුරෙනි. ඔහු ඇතැම් විට ගෙදර එන්නේ ඇඳිරි වැටෙන්ට ළංවූ පසු ය. එහෙත් උගන්නා විෂයන් උදෙසා වැඩි ම ලකුණු ලබන නිසා නන්ද, ඔහු පමා වී ගෙදර එන්නේ කුමක් නිසාදැයි අසන්නේ ඉතා කලාතුරකිනි.

නන්ද හා පියල් සිතන්නේත් සොයන්නේත් ඇලන්ගේ උගැන්ම ගැන මිස ඔහු සිත කය දෙකින් වැඩෙන සැටි නොවේ. ඔවුන්ගේ දැඩි ආසාව වූකලී උගැන්මෙහි ශූර ඇලන් හැම විබාගයකින් උසස් ලෙස සමත් වී ආංඩුවේ ඉහළම රක්සාවක් ලබනු දැකීමට ය. පියල් තම දරුවන්ගේ උගැන්ම උදෙසා දක්වන උනන්දුවෙන් දහයෙන් පංගුවකුදු අනික් කරුණක් සඳහා නොදක්වයි.

තමාගේ වෙළඳාමෙහි අනාගතය ගැන ඔහු සිතට වධ නුදුන්නේ ය. වෙළඳාමෙන් විශාල ආදායමක් ලබන ඔහු තමාගේ දරුවෙකු වෙළඳාම උදෙසා පුහුණු කිරීම ආත්ම ලාභය තැකීමක්යයි සිතුවේ ය. සමාජයයේ මහත් කොටසලකන ඔහු දරුවන්ට ඉහළම උගැන්මක් ලබාදීමට වැයම් කරන්නේ එය දරුවන් උදෙසා තමා විසින් කළ යුතු උසස්ම සේවයය යන අවංක හැඟීමෙනි.

ඔහු ධනවතකු වුව ද උසස් උගැන්මක් නොලැබීමත්, කුලීන පවුල්වල කුලමානයත් නිසා පීඩා වින්දෙකි ; නන්ද ඉවසුවෙකි. නන්ද තමා හා පළමුව විවාහ වීමට අකැමැති වූයේ තමාගේ මේ අඩුපාඩු නිසා ය යන හැඟීම දැනුදු ඔහුගේ යටි සිතෙහි සැඟවී සිටියි. කොළඹ පමණක් නොව ගම ද ඉහළ සමාජයේ ගැනුන් හා පිරිමින්

Scanned by CamScanner

'මුදලාලි' නමින් වෙළෙන්ද හඳුන්වන්නේ සුහද හැඟීමකින් නොවේ. තමන්ගේ කුලීනත්වය සිහිකරමින් පහළ පන්තියේ මිනිසකුගේ මඟුල් ගෙදරකට යන විට නඟින හැඟීම වැනි හැඟීමක් යටි සිතෙහි ඇතිවයි. තම දරුවන්ට වෙළඳාම ඉගැන්වීම ඔවුන්ගේ අනාගතය තම වෙළඳාමෙහි අනාගතය උදෙසා කැපකිරීමකි.

අනුලා ගිය පසු චන්ද්‍රසෝම වඩාත් දඟ කරන්ට වූයේ ය. මවු පියන්ට පවා පටහැණි වන චන්ද්‍රසෝම හික්මවන්ට අලුත් ආයා වැයම් නොකළා ය. දවසක චන්ද්‍රසෝමගේ මුරංඩුකම නිසා කිපුණු පියල් ඔහුට වේවැලකින් තැළුවේ ය. වේදනාවෙන් මිරිකුණ ද නොහඬා සිටි ඔහුගේ විලාසය දුටු පියල් ඔහුට කළ සැර අඩුවම ගැන ශෝක වූයේ ය. ඔහු චන්ද්‍රසෝමගේ හිස අතගා අතින් අල්ලා තම කාමරයට කැඳවාගෙන යන්ට වැයම් කෙළේ ය. නුබුරා සපාකන බල්ලකු මෙන් චන්ද්‍රසෝම පියාගේ අත විකුවේ ය. එයින් සන්සිඳුණු කෝපය හා වේදනාව ඇති ඔහු රැයෙහි වෙනද මෙන් පියා සමඟ කතාබහ කෙළේ ය.

හමසක් ඇතුළත දෙවරක් අනුලා බැලීමට නන්ද තම දරුවනුත් සමඟ කොග්ගලට ගියා ය. තුන්වන වාරයෙහි නන්ද තම සහෝදරිය බැලීමට ගියේ දරුවන් සමඟ නොවේ. ඇලන් හා නාලිකා ලොකු අම්මා බලන්ට යනු පිණිස මව සමඟ කලහ කළෝ ය.

''ලොකු අම්මාට සනීප නැහැ. පොඩි ළමයින් යන එක හොඳ නෑ'' යි නන්ද කීවා ය.

''සනීප නැති නිසා නොවෙන්නම් ලොකු අම්මා බලන්න යන්න ඕනෑ.''

''ලොකු අම්මාට හැදී තියෙන්නේ බෝවෙන ලෙඩක්. පොඩි ළමයින් එක්ක යන්න එපායයි දොස්තර කියා තියෙනවා. පුතාලාත් දූත් එක්ක එන්න එපායයි ලොකු අම්මත් කිව්වා.''

ඇලනුත් නාලිකාත් කෝප වූහ. තමන් එක්ක එන්න එපායයි ලොකු අම්මා කවදවත් නොකියති. ලොකු අම්මා දැකීම ඔවුන්ට මහත් සන්තෝෂයකි. කොග්ගලට යන හැම වාරයෙහිම ඔවුහු නදියෙහි ඔරු පදින්ට යති. නදියෙහි පෙඳකැටි ඉස්සූ විට එහි හිරවී සිටින කුනිස්සන් දියට පනිනු දැකීමෙන් ඔවුහු සන්තෝෂ වූහ. තනපට බැඳගත් ගැහැනු කොහුකඳන් අසල ඇනතිබාගෙන පල් වුණු පොල් ලෙලි තලති. පොල්ලෙලි මඳක් තැළෙන තෙක් නඟින්නේ බොල් හඬකි. අනතුරුව නඟින 'කටාන් කටාන්' හඬ අසන්නන්ට සිහි වන්නේ ලී කෙළියෙහිදී කිතුල් ලී කැලි එකිනෙක හැපීමෙන් නඟින හඬයි. ඔයත් ඔය අසල තොටුපළත් කොළඹදී නුදුටු විරූ කොරවකුන්, කබරගොයින්, ගොඩ බඩ ගා අව්ව තපින කිඹුලන් ආදී ආදිකාලීන සතුන්ට තිප්පලක් වන කිරල ගස් හා කඩොල්, කැරන්

Scanned by CamScanner

පඳුරුත් සහිත ගං ඉවුරු ඇලන්ට හා නාලිකාට අපූර්ව සුන්දර ලෝකයකි. අසනි සරටයා, වෘහත් සරටයා යන නම්වලින් හැඳින්වෙන දැවැන්ත කබරගොයින් සහිත ආදිකල්පික මහා මඩවගුරු සහිත අතීත ලෝකයට නෑකම් ඇත්තකි මේ නදී තීරය. යුග ගණනක් තිස්සේ සත්ව සන්තතිය අතරින් නොකැඩී දිවෙන ඉවෙන් ඒ නෑකම හඟින්ට වෑයම් කරන්නන් මෙන් කුඩා දරුවෝ නදී තීරය ප්‍රිය කරති.

තමන්ගේ මවුපියන්ගේ ගම ද, සුහද ලොකු අම්මා ද දැකීමෙන් ඔවුන් ලබන්නේ මහත් සන්තෝෂයකි. තම මව බියෙන් හා ශෝකයෙන් තැවෙනු ඇලන් හා නාලිකා නොදනිති. අනුලාට වැළඳී තිබෙන්නේ සයරෝගය බව නන්ද දැනගත්තේ ඇ කහින විට ලේ බින්දු පිට වන බව දැනගත් දවසෙහි ය.

ඉතා කුඩා වියෙහි පටන් තම දරුවන්ගේ ඇඟේ දැවටෙන්නාක් මෙන් අනුලා ඔවුන් ඇසුරු කළා ය. අනුලාගේ රෝගය ඇසූ නන්ද ගේ පවුලේ දොස්තර බියගත්තේ ය. නන්ද තැතිගත්තේ දොස්තර බියගත් පසුයි. සයරෝග බීජ දරුවන්ගේ ඇඟට ඇතුළුව එහි සැඟවී ඇත. අවස්ථාවක් ලත් විට ඒ රෝග බීජ මතු වීමෙන් ළමයින් රෝගාතුර විය හැකි ය. පරෙස්සමින් ළමයින් රැකගත යුතු ය. ලෙඩා බලන්ට ළමයින් සමඟ නොයා යුතු ය.

දොස්තරගේ මේ උවදෙස් ඇසූ නන්ද බෙහෙවින් තැති ගත්තා ය. එහෙත් දොස්තර ඒ කරුණු තෙපලේ නන්ද තැතිගන්වන අදහසින් නොවේ.

අනුලාගේ රෝගය ඇසූ පියල් නන්දටත් වඩා බියගත්තේ ය. අනුලා මෙතෙක් කල් රෝගය සඟවාගෙන සිටියායයි සිතූ පියල් කෝප වූයේ ය.

"ලෙඩේ ගැන අනූ දන්නෙත් නැහැ. අපේ දොස්තරට ඇගේ අමාරුව ගැන කිව්වාම එයා අනූ සෝදිසි කරලා බලා කිසිම ලෙඩක් නැතෙයි කියා තියෙනවා. අනූ හිතාගෙන තියෙන්නේ කොළඹදි කරදර වැඩි නිසා කෙට්ටු වෙනවාය කියා."

"දොස්තර මොන වෙදෙක්ද"යි පියල් කෝපයෙන් කීවේ ය. දොස්තරට එවැනි ලෙඩක්වත් හඳුනාගන්ට බැරි වී ය. දැන් ඔහු මහදැනමුත්තෙකු මෙන් අවවාද කරයි.

"අපි වෙනින් දොස්තර කෙනෙක් අල්ලාගනිමු"යි පියල් යෝජනා කෙළේ ය.

නන්ද පමණක් නොව පියල් ද සයරෝගය ගැන අසා ඇතත් ඒ රෝගය ගැන කිසිවක් නොදනිති. නොදන්නාකම නිසා වැඩි වුණු බිය ඇති ඔවුහු තමන් ඇසුරු කරන නගරයේ නෑ මිතුරන් ලාදුරු

රෝගීන් ලෙස සලකා තමන්ගෙන් ඈත් වෙතියි සිතූහ; අනුලාගේ රෝගය කිසිවකුට නොකීහ.

පියල් තවත් දෙස්තරුන් දෙදෙනකු ලවා තමාගේ දරුවන් පරීක්ෂා කරවූයේ ය. එකෙක් ඔවුන් තිදෙනාටම ශක්ති ජනක ඖෂධයක් නියම කොට නැවත ඔවුන් තමා වෙතට ගෙනෙන්ටයයි කීයේ ය. දරුවන් තිදෙනා පරීක්ෂා කළ දෙවන දෙස්තර ඔවුන් හොඳ සනීපයෙන් සිටිති යි කී ය.

"බයවෙන්න කරුණක් නැ"යි ඔහු කීවේ ය. "ළමයි තුන් දෙනාගේම ඇඟවල් හොඳයි. සීන් කයක් ඇතත් නාලිකා නිරෝගී දැරියකි. කොළඹ ජීවත් වන මිනිසුන්ගෙන් සියේට හැට දෙනකුගේ ඇඟවල සයරෝග බීජ තියෙනවා. නමුත් ලෙඩේ හැදෙන්නේ ඔවුන් ගෙන් ඉතාම ටික දෙනෙකුට පමණයි. මහත්මයාගේ නෝනාගේ පවුලේ කාටවත් සයරෝගේ හැදිලා තියෙනවා ද?"

පියල්ගේ මුහුණ බැලූ දෙස්තර ඔහු නිරෝගි කයක් ඇති පුද්ගලයෙකියි සිතුවේ ය.

"නැහැ" යි පියල් පිළිතුරු දුන්නේ ය. "නෝනාගේ අක්කාට ලෙඩේ බෝ උණේ කොළඹදී."

ලොකු අම්මා සයරෝගයෙන් පෙළෙතියි ඇලන් අනුමානයෙන් සිතාගත්තේ ය. එහෙත් පියාත් මවත් බිය රැඳි දෙනෙතින් අනුලා ගැන කතාකරන්නේ කුමක් නිසාදැයි නොදනියි. ලොකු අම්මාට වැලඳී තිබෙන්නේ සයරෝගයයි මව කිසි දවසක නොකීවාය. ලොකු අම්මාගේ රෝගය කුමක්දැයි අන්‍යයන් දැනගනු මව නොඉවසන්නේ කුමක් නිසා ද? අකාලයේ පැසුණු හිසක් හා හැකිළි නෙතක් ද ඇතත් ඇලන් ලෙඩට බියගන්නෙක් නොවේ. මවුපියන් තමාත් නාලිකාත් චන්ද්‍රසෝමත් දෙස්තරුන් ලවා මෙතරම් පරීක්ෂා කරවන්නේ කුමක් නිසා ද?

තම දරුවන්ට හෙම්බිරිස්සාව හැදුණු විට පවා නන්ද ඔවුන් දෙස්තර වෙතට කැඳවාගෙන යන්ට පටන්ගත්තා ය.

"දෙස්තර ළඟට යන්න ඕනැ නැ මමී–මට හෙම්බිරිස්සාව. මට හෙම්බිරිස්සාව හැදුණාම ලොකු අම්මා දුන්නේ සීනි හුනක් දමා හැදූ ඉඟුරු කොත්තමල්ලි කෝප්පයක්"යි ඇලන් දවසක කීවා ය.

"ඉස්සර වගේ නෙවි; දැන් ලෙඩ හැදුණාම ටිකක් පරෙස්සම් වෙන්න ඕනැයයි දෙස්තර මහත්තයා කියනවා. පිට රටින් මිනිසුන් බොහොම එන නිසා නැති ලෙඩ කොළඹට බෝවෙලා තියෙනවා."

තම මවත් පියාත් තමාට සුළු අසනීපයක් හැදුණු විට පවා මෙතරම් බියගන්නේ ලොකු අම්මාගේ රෝගය නිසා බව ඇලන්

දනියි. ඒ බය නිසා ඔවුහු තමන් කරන හැම එකක්ම දොස්තර පිට පටවති.

කොළඹ ඉහලම පන්තියේ දොස්තරුන් තිදෙනාගෙන් එකකු තමන්ගේ පවුලේ වෙද මෙන් සලකාගෙන ඔහුගෙන් උවදෙස් ලබාගන්ට හැකි වීම පියල්ගේත් නන්දගේත් බිය අඩු වීමට කාරණයක් වී ය.

නන්ද, තම සහෝදරියගේ අසනීපය කුමක්දැයි තිස්ස දැනගනු වැලැක්වීමට මුලදී වෑයම් කළා ය. තිස්ස දැනගත්තොත් අනුලාගේ රෝගය පිළිබඳ පුවත තවත් බොහෝ දෙනකුන් අතර පැතිරෙයි. එහෙත් තිස්සට නොදැන්නුවහොත් ඔහු කිපෙයි. කිපී ඇනුම්පද කියයි. අනුලාගේ රෝගය සුව වන ලකුණු නුදුටු නිසා බියගත් නන්ද මහත් ශෝකයෙන් ඇගේ රෝගය ගැන තිස්සට කීවා ය.

"අනු ගමට ගියේ අසනීපෙන්ද"යි තිස්ස ප්‍රශ්න කෙළේ ය.

"ගමට යද්දී අනුගේ ඇඟේ අසනීපෙ තියෙන්න ඇති. නමුත් අසනීපයක් ඇතැයි අනු හිතුවෙත් නෑ. අපි හිතුවෙත් නෑ. ගමට ගොස් මාස දහයකට දෙළහකට පස්සේ අසනීපෙ වැඩි වෙලා තියෙනව.

අනුලාගේ සුවදුක් සොයන්ට නිතර නොයෑම ගැන තිස්ස ශෝක වූයේ ය. ඇගේ අසනීපය නන්ද මෙතෙක් තමාගෙන් සඟවන්ට වෑයම් කළ බව තිස්සට වහා වැටහිණ.

"අනුගෙ අසනීපය ගැන මට කලින් නොකිව්වේ ඇයි?"

"අනු ගමට ගොහින් මාස ගණනකට පස්සෙයි අපටත් එයාගේ අසනීපෙ දැනගන්න ලැබුණේ."

"සය රෝගය ලොකු මිනිසුන්ට නොහැදෙන ලෙඩක් නෙවි"යි තිස්ස නෙපලේ ය. "හැදුණු හැටියෙ නම් හෙම්බිරිස්සාව හොඳකර ගන්නා වාගේ හොඳ කරගන්න පුළුවනි. අනුට ලෙඩේ හැදිලා හුඟක් කල් වෙනවා ඇති."

"අනු දොස්තර බෙහෙත් ගන්න කැමැති නැහැ."

"දැන් කොයි බෙහෙත් ගත්තත් එකයි" තිස්ස තරහයෙන් කීවේ ය. "බෙහෙත්වලින් ලෙඩ හොඳ වෙන්නේ නෑ."

"එහෙනම් තියා ගමදී ලෙඩ උණාම බෙහෙත් බිව්වේ?"

"මගේ ලෙඩ හොඳ උණේ බෙහෙත් නිසා නෙවි."

"ඉබේට!"

"ඉබේට කියන වචනය මට තේරෙන්නේ නෑ. ලෙඩ හොඳ වෙන්නේ සිත කය දෙක නිසා."

''එහෙනම් ලෙඩ හැදෙන්නේ කොහොමද''යි අසමින් නන්ද තිස්සගේ මුහුණ බැලුවා ය. තිස්ස පිළිතුරු නුදුන්නේ ය.

අතුලා ගමට ගිය පසු උගැන්මෙන් පිරිහුණේත් චන්ද්‍රසෝමයි. ඔහු පන්තියේ අන්තිමයා ය. ඔහු. අතට හසුවන මුදල් ගෙන ගොස් යහළුවන් සමඟ රසකැවිලි කයි. දවසක ඔහු චොක්ලේට් චීත් දෙකක් මිලට ගෙන යහළුවන්ට සංග්‍රහ කෙළේ ය; ඉතුරුවුණු චොක්ලේට් සහිත ටින් එක ගෙනැවිත් මවට දුන්නේ ය. නන්ද සන්තෝෂයෙන් චොක්ලේට් බෝලයක් කැවා ය.

''පුතාට සල්ලි කොයින් ද?''

චන්ද්‍රසෝම සිනාසුණේ ය. නන්ද යළිත් ඔහුගෙන් ප්‍රශ්න කළා ය. ඔහුගේ දෙඇසට දඟකාර බැල්මක් ආරූඪ වී ය. ඔහු මවගේ මුහුණ බලා යළිත් සිනාසෙමින් කාමරයට දිවුවේ ය.

නන්ද තුළ සැකයක් ද සැකය නිසා කෝපයක් ද හට ගත්තේ ය. ඇ මීට පෙරත් චන්ද්‍රසෝමගේ ආදර සැලකිලි නිසා රැවටුණා ය. ඔහු වරක් දෙබෑයේ කිතුල් හකුරු මුලක් මවට ගෙනැවිත් දුන්නේ ය.

''තිස්ස මාමාගේ කොග්ගල යාළුවෙක් ඔය හකුරු මුල දුන්නා.''

''එයා හම්බ උණේ කොහේදිද''යි නන්ද ඇසුවා ය.

''මම ඉස්කෝලේ ඉඳලා එද්දි මඟදි හම්බ උණා.''

හකුරු මුලේ චිත්තිය බොරුවක් බව පසුව දැනගත් නන්ද චන්ද්‍රසෝමට දඬුවම් කළා ය. ඔහු මවගේ අල්මාරියෙන් සොරාගත් මුදල් ගෙවා හකුරු මුල් දෙකක් ගත්තේ ය; යහළුවන් සමඟ එකක් කා අනික ගෙදර ගෙනාවේ ය. ගෙදරට පිවිසුණු විගස මව හමුවූ බැවින් ඔහු ඉතිරි හකුරු මුල ඇ අතට දුන්නේ ය.

ඔහු හකුරු මුල් දෙකම යහළුවන්ටත් බෙදා දී කන්ට නොසිතුවේ තම පියා අරපිරිමසන හැටි මතක් වූ බැවිනි. වරක් තම පියා ගෙනා කේක් කැලි දෙළහෙන් එකක් අඩු වී ය. ඒ ගැන සොයා බැලූ ඔහු වැඩ කාරයකු සැක කෙළේ ය. කේක් කැල්ල ඒ වැඩකාරයා විසින් කන ලදැයි සැක හැර දැනගත් ඔහු එහි මිල වැඩකාරයාගේ පඩියෙන් අඩු කෙළේ ය. මේ පුවත සිහි කළ චන්ද්‍රසෝම, අනික් හකුරු මුල කන්ට වැයම් කළ යහළුවන් අතට නොදී එය ගෙදර ගෙනාවේ ය.

පොතින් පතින් ගණිතය තුගත් හෙට්ටියා දෙයිකුට පවා නැර පොලී ගණන් බැලීමට දනියි. ගණිතය වැඩි දුර තුගත් පියල් ගණන් තිලට් බැලීමෙහි ගුරුයෙකි. දිළින්දන් ලෙස ජීවත් වූ ඔහුගේ මවුපියෝ සත භාගයක් ඉතුරු කරගනු පිණිස හෝ ලාභ ලබනු පිණිස හෝ වෙළෙන්දන් හා පෑ බාගයක් වුව ද හෙට්ටු කරන්ට පුරුදු වූවෝ ය. පියා පමණක් නොව මව ද අවුරුදු දෙක තුනක කාලය

තුළ ටිකින් ටික එකතු කරන ලද මුදල මෙපමණයයි කියන්ට දන සිටියේ පොතක පතක ගණන් ලියූ නිසා නොවේ. දැඩි දිළිඳු කම නිසා ඔවුන් මුදල් සැපයුමේ වහලුන් මෙන් කය වෙහෙසා වැඩ කිරීමෙනි; වියදම් කෙළේ දැඩි මසුරන් ලෙසිනි; මුදල් එකතු කෙළේ තුඹස් බඳින වේයන් ලෙසිනි.

පියල් අත මිට දිග හැර මුදල් වියදම් කරතත් මුදල් එකතු කරන්නේ තම මවුපියන් සිහි කරන්නකු ලෙසිනි.

''ඊයේ මගේ සාක්කුවෙන් රුපියල් පහක් අඩු වෙලා තියෙනවා''යි හවස ගෙදර ආ පියල් නන්දට කීවේ ය.

නන්දගේ සිත යළිත් නොසන්සුන් වී ය. ඈ චන්ද්‍රසෝම පිළිබඳ පුවත පියල්ට නොකියන්ට සිතා ගත්තා ය. ඔහු කිපී සිටින්නේ චන්ද්‍රසෝම මුදල් නාස්ති කරන නිසා නොවේ; උගැන්මට කිසිම උත්සාහයක් නොකරන බැවිනි. උගැන්මෙහි ඉතා අසමර්ථයකු නිසා ඔහු රාජකීය විද්‍යාලයෙන් පිට දමනු ලැබුවොත්! පියල් එහෙම සිතා බියගත්තේ තමාට ඉතා ලැදි ඇලන්ගේ ගුරුවරයා කියූ කියුමක් නිසා ය.

''කාටවත් දීපු මුදලක් ලියාගන්ට මතක නැති වෙන්න ඇති''යි නන්ද කීවා ය.

''නැහැ'' යි පියල් දැඩි සිතින් කී ය. ''කාටවත් සත පහක් දුන්නත් ඒක මට මතක නැතිවෙන්නේ නැහැ.''

නන්ද එදින නිදන්ට ගොස් සිතුවේ චන්ද්‍රසෝම හා අනුලා ද ගැන ය. අනුලා සිටිද්දී චන්ද්‍රසෝම මෙතරම් මැරකම් නොකෙළේ ය. කොතරම් මැර කම් කළත් අනුලාගේ ඔවදන් ඔහු ඉවසුවේ ය.

අනුලා පෙළෙන්නේ සය රෝගයෙන් ද නොඑසේ නම් හෙම්බිරිස්සාව නරක්වීමෙන් හැදුණු කැස්සෙන් ද? තම පවුලේ කිසිවකුට මීට පෙර සය රෝගය නොවැලඳිණ. ගමේ කිසිවකු සය රෝගයෙන් මියගිය බවක් නන්ද නොදනියි. සය රෝගයට බියගන්නේ නගරයේ මිනිසුන් පමණි. අනුලාට වැළඳුණේ සය රෝගය නොවෙතියි සිතමින් නන්ද තම සිත සනසාගන්ට වෑයම් කළා ය.

# 8

අනුලා ගැමි පරිසරයට අනුරූප වූයේ කූඩුවෙන් නිදහස් කරනු ලැබූ ගිරවියක රැහැණට එක්වන්නාක් මෙනි. විදුලි පහන් එළියෙන් බැබළෙන විසිතුරු බුමුතුරුනෙන් වැසුණු සාලය, සුව පහසු දෙන කොට්ට, මෙට්ට හා ඇතිරිල්ලෙන් වැසුණු ඇඳන් සහිත කාමර ඇති කොළඹ ගෙයින් අනුලා පිටවූයේ තමාගේ සිතුම් පැතුම් වලටත් ක්‍රියාවන්ටත් අනුචිත පරිසරයක් හැර යන්නක ලෙසිනි. ඇ කොළඹ නගරය ගැන කලකිරුණේ සිත කය දෙක පුබුදන ජීවය කෙමෙන් ක්ෂය කරවන සය රෝගයට ගොදුරු වීමෙන් පසු ය.

තමාට වැළඳුණේ ගැමියකු කිසි කලක නොඇසූ විරූ රෝගයකියි අනුලා කල්පනා කළා ය. ගැමියෝ කහිති; කෙට්ටු වෙති; උණෙන් පෙළෙති. එහෙත් ඔවුහු ටික දවසකින් සුව ලබති. නගරයෙහිදී එවැනි ලෙඩකට ගොදුරුවන්නා ක්ෂය රෝගියකු වන්නේ නගර පරිසරයෙහි වරදිනි. උණ හෙම්බිරිස්සාව වැන්නක් ක්ෂය රෝගය වන්නේ නගරයෙහිදී මිස ගමෙහිදී නොවේ.

දෙතුන් දවසක් යන තෙක් අනුලා මහ ගෙදර ජීවත් වූයේ තාන්තුවාවෙනි. පොල්තෙල් පහනින් හා එල්ලෙන ලාම්පුතෙල් පහනින් එළිය කරනු ලබන මහ ගෙදර පාළුව අනුලාට වඩාත් දැනුණේ රැයෙහි ය. මදුරු ලේ පැල්ලම් සහිත කිලිටි බිත්ති, මෙතෙක් කල් වසා තබන ලද කාමර වලින් නඟින පුස් ගඳ, අඳුර හා පාළුව අකැමැත්තෙන් වුව ද යළිත් තමා කොළඹට එලවන තර්ජනයක් ලෙස අනුලාට හැඟිණ. ගිරවියක මෙන් දෙඩවන වැඩකාර ගැහැනිය ගැමි ජීවිතයෙහි ප්‍රියංකර පක්ෂය අනුලාට මතක් කළා ය. සාද වෙනස් නොවන මිනිසෙකියි සිතවන තරම් වෙනස් නොවූවෙකි. පියල් සමඟ සිංහල අවුරුදු උළෙල නිමිත්තෙන් පංචි කෙළිය දවසෙහි දුටු සාදගේ ස්වරූපය ඇබිත්තකිනිදු වෙනස් නොවීයයි අනුලා සිතුවා ය. පැසුණු කෙස් අනුලාගේ හිසෙහි අතරින් පතර ඇතත් සාදගේ හිසෙහි කෙස් කපුටු පිහාටු මෙන් කළු ය. බුලත් නොකන ඔහු සිනාසෙන විට ඔහුගේ දත් ඇත්ද කිරි පාටින් බැබළෙයි. බඳින ලද කොංඩය ඇතත් ඔහුගේ වෙනස් නොවූ මුහුණ ගැහැණු මුහුණක් ද නොවේ. පිරිමි මුහුණක් ද නොවේ ; නපුංසකයකුගේ මුහුණකි. එහෙත් සාද නපුංසකයෙක් නොවේ. මීට අවුරුදු විස්සකට පමණ පෙර ගාල්ලෙහිදී වෙසඟනකට හසුවූ ඔහු කාමරෝගයකට ගොදුරු වී ය. ගමෙහි වෙදගෙන් වෙදකම් ගැනීමෙන් ඔහු ඒ රෝගය සුවකරගත්



Scanned by CamScanner

බව අනුලා දැනගත්තේ වරක් තම මවත් කත්තිරිනාත් කළ කතාබහ ඇසීමෙනි.

''ලොකු නෝනා ගමට ආ එක හොඳයි'' සාද මහත් සන්තෝෂයෙන් කීවේ ය. ''ඉද හිට කහින්නේ හෙම්බිරිස්සාව නරක් කරගත් නිසා වෙන්න ඇති. හුළං නොගැහී සුමානයක් හිටියොත් නිකම්ම හොඳ වේවි.''

දෙසතියක් ගෙවෙන්නට පෙර අනුලාගේ සිතෙහි හටගත් දොම්නසට හේතුවුණු පාළුහැඟීම අතුරුදහන් වී ය. අඹ ගසින්, ලිඳ ළඟ ලොවි ගසින්, පැළඉණි වැටෙහි ගඳපාන පඳුරුවලින් උදය වරුවේ නඟින කුරුළු ගීතය දොම්නසින් හැකුළුණු ඇගේ සිත පුබුදු කෙළේ ය. උදය වරුවේ හිරුරැසින් පිබිදෙන ගස් කොළන් පිසගෙන එන උණුසුම් සුළඟ ස්පර්ශ කරන අනුලාට සිහිවන්නේ තමා කුඩා දැරියක මෙන් කළ කී දේ ය.

නන්ද හා තවත් ගැමි දැරියන් ද සමඟ කැලෑ රොදවලට වැදී බලුදන් පොකුරු හා පේර ගැට කෑ සැටි සිහිකළ අනුලා සන්තෝෂ වූවා ය. ඉදිමෙන් පැළුණු බෝවිටියා ගෙඩි කෑමෙන් තොලුත් දිවත් නිල්පාට කරගත් සැටි සිහිකළ ඇට මතක් වූයේ රතු සායම්කුරු ඇතිල්ලීමෙන් තොල් රතු කරගන්නා කොළඹ ගැහැනුන් පිළිබඳ තොරතුරු ය. නගරයේ සිරිත අනුව නන්ද තොල් රතු කළ නමුත් අනුලා තොල් රතු නොකළා ය.

උදය වරුවේ තොටි පළට රැස්වන ගැහැනුන්, පල්කරන ලද පොල්ලෙලි තළන හඬ අනුලා හැම ද අසයි. නන්ද හා තවත් දැරියන් ද පියල් ද සමඟ ගිහි වැල්ලේ විහාරය වැඳීමට තමා බත්තලෙන් කළ යාත්‍රාව සිහිකළ අනුලාගේ සිත පිනාගියේ ය. බලදස දවසක ගහේ මසුන් අල්ලන්නන්ගෙන් රුපියලක මාළුගෙන මහ ගෙදරට එවූයේ ය. ඔහු නන්ද කෝපකරනු පිණිස පියල් ගැන කෙළි කවට තෙපුල් තෙපලේ ය. නන්ද කෝප වී හාන්සි පුටුවෙහි තුබුණු කොට්ටය ගෙන බලදසගේ මුහුණට දමාගසා ගෙය තුළට ගියා ය.

තමාගේ ළමා කාලයත් තරුණ වියත් සිහිකළ අනුලාගේ සිත සැහැල්ලු වී ය. දොම්නස යට කරගෙන නැගෙන සොම්නසින් ඇගේ ඇතුළු හද එළිය වී ය. ඇගේ රෝගය ඇට අමතක වී ය. මවගේ ළය බදගන්නා බිළිඳක මෙන් ඈ පැරණි ගැමි ජීවිතයෙන් ආස්වාදයක් ලැබුවා ය.

තමාට සයරෝගය වැළඳුණේ කර්ම විපාකයක් වශයෙනියි යන ආගන්තුක හැඟීම අනුලාගේ හිසට නැංගේ ය. මව ගම සිටියදී අනුලා දොළොස් අවුරුද්දකට වැඩි කලක් කොළඹ වාසය කළා ය. කොළඹ වාසය ඇට එපා වූයේ සයරෝගය වැලඳුණු පසු ය.

Scanned by CamScanner

හදිසියේ හැමූ සුළඟක් දූවිලි හා වියලි කැලෑ මල්වල රේණු ද අහසට නැඟී ය. අනුලා දෙවරක් පිට පිටම කිවිස අනතුරුව කහින්ට වූවා ය. කැස්ස නැවතුණේ ඈ ඇදීම අදින්නක මෙන් අමාරුවෙන් හුස්ම ගන්ටත් පිට කරන්ටත් වූ විට ය. ඇගේ සොම්නස යළිත් දොම්නස ට ගොදුරු වී ය. අවසානවර කැහීමෙන් පසු පිට දැමූ සෙම පිඩෙහි රතු තිතක් දුටු ඈ පාත් වී බලා ආ පසු ගෙට ගියා ය. උගුර මඳක් පාද සෙම ටිකක් සුදු ලේන්සුවකට ගත්තා ය. සෙම උරාගත් ලේන්සුවෙහි රතු පැල්ලම් කිහිපයක් දුටු ඈ කාමරයට ඇතුළු වී ඇඳෙහි වැතිරුණා ය.

''වෙද මහත්තයාගේ බෙත්වලින් වැඩි ගුණයක් නෑ''යි කාමරයට ඇතුළු වුණු මවගේ මුහුණ බැලූ අනුලා කීවා ය.

''අද හවසට වෙදමහත්තයා ඒවි. ආවාම ඇඟ සෝදිසි කරලා බලා වෙනින් කසායකුත් බෙතකුත් දේවි. ඉතා හෙමින් හොඳ කරන්න ඕනෑ ලෙඩක්යයි වෙදමහත්තයා කිව්වා.''

ගමට ඇවිත් තුන්හාර මසකට පසු අනුලා මඳක් තර වූ නමුත් කහින විට ලේ පිට වීම වැඩි වී ය. ලේ පැල්ලම සහිත සෙම දකින විට අනුලා කාමරයට වී ඇඳෙහි වැතිර තුන් හතර දවසක් යන තෙක් කාමරයෙන් එළියට නොයයි. එවැනි අවස්ථාවල දී පියල්ගේ මව ඈ සන්තෝෂ කරන්ට වෑයම් කරයි.

මාතර හාමිනේ කන්නේ බොන්නේ අනුලාගේ කෝප්ප වල නොවේ. එය බියක් නිසා නොව නගරවල ජීවත් වන තමන්ගේ පොහොසත් නෑයන් අනුකරණයෙන් කරන්නකි. අනුලා ද තමාගේ පිඟන් කෝප්ප වෙනම තබන්නයයි මවට අවවාද කළා ය. සිදදිවල මිනිසුන්ගේ සිරිත්වලට අවඥා කරන පියල්ගේ මව අනුලාගේ කෝප්පයෙහිම වක්කළ තේ බොයි; ඈ වතුර බොන වීදුරුවෙහිම වතුර බොයි. ඇතැම් දවසක අනුලාගේ පිඟානම සෝද එහි ම බත්කයි.

''නැන්ද මගේ පිඟන් කෝප්ප පාවිච්චි කරන්න එපා''යි අනුලා කිහිප වරක් කීවා ය.

''අපි කවදාවත් අපේ දූදරුවන්ගේ පිඟන් කෝප්පවෙනම වෙන් කොට තිව්වේ නෑ''යි මාතර හාමිනේටත් ඇසෙන සේ පියල්ගේ මව හඬනඟා කීවා ය. ''මීට ඉස්සර අපේ නෑයන්ට ලෙඩ හැදුණේ නැද්ද? ඔය මනස්ගාත පුරුදු උණේ මෑතදී: ලෙඩ හැදෙන්නෙත් බෝවෙන්නෙත් සිදදිවල මිනිසුන්ට තමයි. ලේලි හොඳට කාලා වෙන ද වගේ සන්තෝසෙන් ඉන්න. ලෙඩේ හිතින් මතක නැති කරන්න. ඕක හිතේ ලෙඩක්. ලේලිට ලෙඩක් නෑ.''

ඈ තම පුතාටත් ලේලිටත් සරදම් කරමින් සිනාසුණා ය. 'ඒ ගොල්ලන්න සිදදි ලෙඩ බෝවෙලා' යි කියමින් ඈ අනුලා දෙස බැලුවා ය.

Scanned by CamScanner

"මමත් සිදුවීවල මිනිසුන් කියන කරන දේ බාරගත්තේ නෑ, නැන්ද. මගේ හිතේ ලෙඩක් නෑ. නමුත් මට ටිකක් සනීප නැති බව මට දැනෙනවා..........."

"අනුලාට සනීප මදිකමක් නෑ"යි කියමින් නැන්ද යළිත් සිනාසුණා ය. "කහින්නේ නැත්තේ කවුද? කැස්සත් ලෙඩක් ය. කෙට්ටු වීමත් ලෙඩක් ය. පියල්ගේ තාත්තා මැරුණේ අවුරුදු හැටපහක් පමණ ජීවත්වෙලා ඉඳලා. ටිකක් වයසට ගියාට පස්සේ එයා ඉඳහිට කහින්නටත් නිතර උගුර පාදන්නටත් පටන්ගත්තා. කැස්ස නිකම්ම හොඳ උණා. උගුර පාදන එක පුරුද්දක් උණා."

"මාමා ලෙඩ උණේ ගමේදී. මම ලෙඩ උණේ කොළඹදී. බෝවෙන ලෙඩ තියෙන්නේ කොළඹ; ගමේ නෙවි."

"ගම්වල නැති ලෙඩක් කොළඹ තියෙන්නේ කොහොම ද? අනුලා ඇඳේ හාන්සිවෙලා හිතහිතා ඉන්න කොට නැති ලෙඩ හැදෙනවා. එන්න අපේ ගෙදරට යන්න. හොඳට කකා දෙමාසයක් එහේ ඉන්න කොට ඔක්කොම අසනීප හොඳ වේවි."

පියල්ගේ මව කොළඹ සිට ගමට ආවේ පුතාත් ලේලිත් නිසා හටගත් දැඩි අමනාපයෙනි. නැන්ද මෙතෙක් නන්දට දැක්වූ ආදර සැලකිලි තමාට දැක්වීම අනුලාගේ සන්තෝෂයට මෙන් ශෝකයට ද හේතුවකි. අනුලා ගමට ආවේ කොළඹ ගැන කලකිරීමෙනි. නන්ද සහ පියල් තමන්ගේ දරුවන් ද නාගරික ජීවිතයට අනුරූප වන සේ උගන්වා ඇතිදැඩි කරනු සඳහා කරන වෑයම අනුලාගේ සන්තෝෂයට හේතු නොවී ය. පාසැල් නිවාඩු කාලයෙහි පවා දරුවන් තමන්ගේ මුතුන් මිත්තන්ගේ ගමට යනු මවුපිය දෙදෙනාම දුන් නොඉවසති. අනුලාගේ මෙන් පියල්ගේ මව ද නන්ද තමන්ගේ දරුවන්ට ගම අමතක කරවන්ට කරන වෑයම නොඉවසයි. එහෙත් නන්දගේ අක්කා නැන්දම්මාට ඇසෙන සේ නන්දට දෙස් නොකියයි; නිවාඩු කාලයෙහි දරුවන් කොග්ගලට එනු වළකන්නේ ඔවුන්ගේ උගැන්මට බාධා වන බැවිනියි කියමින් අනුලා නන්ද නිදෙස් කරන අදහසින් නැන්දම්මාට පටහැණි වෙයි. ඇලන් විසින් උගත යුතු විෂය රාශියක් ඇත. පාසැලෙහිදී උගත් පාඩම් නිවාඩු කාලයෙහි ඔහු යළිත් උගත යුතු ය. එසේ නොකළහොත් උගත් පාඩම් අමතක වෙයි. නන්දට දෙස් කීම වැරදි යි.

නන්දට දෙස් කිවහොත් නන්දම්මා වඩාත් කලකිරෙයි. නන්දට කලකිරෙන නැන්දම්මා තමාට වැඩි ආදර සැලකිලි දක්වතියි සිතූ අනුලා බිය ගත්තා ය. පියල්ගේ මව තමාට අයිති ඉඩම් තිස්සට ලියා දෙන්ට වරක් යෝජනා කළා ය. එවැන්නක් සිදු වුවහොත් නන්ද හා පියල් තමාටත් තිස්සටත් කිපෙති.

නැන්දම්මාගේ යෝජනාවට තිස්ස සරදම් කෙළේ ය.

Scanned by CamScanner

"සල්ලිවලටත් දේපලවලටත් මගේ ආසාවක් නෑ නැන්ද. ආසාවක් නැත්තේ මම ලෝකයත් ජීවිතයත් නොදන්නා මෝඩයකු නිසා විය හැකියි. එහෙත් මම මගේ මෝඩකම් දන්නා මෝඩයෙක්. නැන්ද දේපල මට ලියා දෙන්ට යෝජනා කරන්නේ පුතාත් ලේලිත් නිසා කලකිරීමෙන් විය හැකි යි."

"නෑ" යි නැන්දම්මා පිළිතුරු දුන්නා ය. "ඒ ගොල්ලන්න දෙන්න ගන්න තිළිණ දේ දුන්නා. තිස්සට ලියන්නේ මම හම්බ-කර සල්ලිවලින් ගත් දේපල. තිස්ස ගම පදිංචි වෙනවාට මම කැමතියි. කොළඹ ජීවත් වන පුතාටත් දුවටත් ගම ඉඩම්වලින් වැඩක් නෑ. ඒ ගොල්ලන්න වතු තියෙනවා; ආදායම් ලැබෙනවා. මම නැති කාලෙක මේ ඉඩම් ඒ ගොල්ල තුට්ටුවට දෙකට විකුණාවි."

"දේපලවලට ආසා කිරීමත් නොකිරීමත් දෙකම එකයි. නැන්දගේ පුතා සල්ලි හම්බකිරීමෙන් සන්තෝෂ වෙනවා. මම සල්ලි හම්බකරන්න වෙහෙසෙන්නේ නැතිව සල්ලි හම්බ කරන මිනිසුන්ට නින්ද කිරීමෙන් සන්තෝස වෙනවා. මම අනුන්ගෙන් කනවා. මම ඉඳහිට හම්බකරන සල්ලි ටික ඉල්ලන කවරෙකුට උණත් දෙනවා. මගෙන් උපකාර ඉල්ලන්නන්ගෙන් වැඩි දෙනා තක්කඩියන් කම්මැලියන් බව මම දන්නවා. ඔවුන් තක්කඩියන් ලෙස සිතන්නෙත් තක්කඩිකම් කරන්නෙත් මා රවටන අදහසින් නොවේ. සමාජයෙන් පළිගන්නා අදහසින්."

නැන්ද අමනාප වෙතියි හැඟුණු නිසා තිස්ස අනන්මනන් දෙඩීම නැවැත්වූයේ ය.

"මගේ දේපල තිස්සට ලිව්වාම ඒවායින් ලැබෙන ආදායම තක්කඩින්ට නොවේ නම් හොරුන්ට දුන්නත් මට කමක් නෑ" යි නැන්දම්මා කීවා ය. "මම කැමැතියි ගම දේපල තිස්සට ලියා දෙන්න. තිස්ස ගම පදිංචි වෙන්න. මහ ගෙදර බැරි නම් මගේ ගෙදර ඉන්න. තිස්ස කසාදයක් බැඳගන්න........."

"මට එක තැනක ඉන්න බැහැ නැන්ද. කොළඹට ගියාම ගමට එන්න හිතෙනවා. ගමට ආවාම කොළඹට යන්න හිතෙනවා........."

"කසාද බැන්දම ඒ ගතිය වෙනස් වේවි."

නැන්ද තමාට සෝමා කසාද බන්ද දෙන අදහසින් කතාකරතියි තිස්ස සිතුවේ ය. ඇ කොළඹදී තමා හා කතා කෙළේ ඒ අදහස ඇතිව විය යුතු ය. නන්ද සෝමා ගමට එවූයේ ඈ තිස්සගේ සිත් ගනිතියි යන සැකයෙනියි නැන්ද සිතන්ට ඇත. නැන්ද ඇගේ ඉඩම් තමාට ලියා දෙන්ට සිතන්නේ පුතාත් දුවත් නිසා උපන් අමනාපයකින්ම නොවේ; බොහෝ කාලයකට පෙර සිතූ සිතුමක්

මුදුන් පමුණුවන අදහසින් විය යුතු ය. පුතාත් දුවත් නිසා හටගත් අමනාපය ඈ ඒ සඳහා උනන්දු කෙළේ ය.

සෝමා නැන්දගේ ළඟ නෑයෙකි. ඈ රෝගාතුර වුවහොත් පුතාගෙනුත් දුවගෙනුත් සාත්තු සැලකිලි ලබන්ට සිතීම නිෂ්ඵල ය. සෝමා කසාද බන්ද දී මාත් ගම නවතා ගතහොත් එවැනි ආපදාවක දී ඈ නැන්දට මහත් සැනසිල්ලක් වෙතියි තිස්ස කල්පනා කෙළේ ය.

සෝමා පිළිබඳ හැඟීම, දේපල බැහැර කරන්නාක් මෙන් නොසිතා සිතින් බැහැර කළ නොහැකි වීම තිස්සගේ පුදුමයට හේතුවිය. විවාහ ජීවිතයට ඇතුළත් වන අදහසක් තමාට නොදැනෙන සේ තමාගේ යටි සිතෙහි සැඟවී සිටිතියි කිසිවෙක් කීවේ නම් තිස්ස එය අවඥාවෙන් බැහැර කරයි. එහෙත් සෝමා දැකීමටත් ඈ හා කතාබහ කිරීමටත් ඔහු ආසා කරයි. තමා මෙන් සෝමා ද විවාහ ජීවිතය පිළිබඳ අදහස් හා හැඟීම් සිතින් බැහැර කරන ලද ගැහැනියක් යයි තිස්ස හඟියි. එසේ හඟින්නේ කුමක් නිසාදැයි ඔහු නොදනියි.

තමා පිළිබඳ කරුණකදී තීරණයකට බැස එහි පිහිටා ක්‍රියා කිරීමට කුඩා කල තිස්ස සමර්ථ වී ය. ඒ ශක්තිය ක්‍රමයෙන් දුර්වල කළ හේතු සොයනු පිණිස ඔහු තමාගේ අතීතය සිතින් විවේචනය කෙළේ ය. උගැන්මෙන්, අත් දැකීමෙන්, තැන්පත් නුවණින් වැඩෙත්ම ඔහුගේ අර දුර්වලකමත් දියුණු වූ බව ඔහු දනියි. ඔහු ආගම භක්තියෙන් නොපිරිහිණි නම් ඒ දුර්වලකම විරාගයටත් උග්‍ර ශික්ෂණයටත් හැරෙතියි යන හැඟීම ඔහුගේ සිතට නඟියි.

තමාගේ අදහස් හා ක්‍රියා කුඩා කල පටන් වෙනස් වුණු සැටි තිස්ස සිහි කෙළේ ය. දියෙහි වැටුණු සකුරු දිය වන්නාක් මෙන් ඔහුගේ මමත්වය වැගිරෙනු එයින් වැළකිණ.

ආගම උතුම් කාව්‍ය විශේෂයක් ලෙස ද ගුණදහම් කාලය හා දේශය අනුව වෙනස් වන සිරිත් විරිත් ලෙස ද සලකන ඔහුගේ වර්තමාන සිත කය දෙක ලෝකයටවත් සමාජයටවත් අනුරූප වීමට නැත් කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවූහයි ඔහු නොසිතයි. සිත කය දෙකින් ඔහු ඒ විදියෙන් වෙනස් වූයේ තමා කියවූ පොත පත නිසාවත් තමා අනුභව කළ ආහාරපාන නිසාවත් නොවේ. තමා කියවන පොත පත කියවන තමා කනබොන ආහාරපාන කනබොන මිනිසුන් තමාට හාත්පසින් වෙනස් සිත කය ඇත්තන් වූයේ කෙසේ ද? මිනිසකු උපදින්නේ ඔහුටම විශේෂ වූ මමත්වයක් ඇතිවයි. එය ඔහුගේ ආත්මය ද නොවේ; අනාත්මය ද නොවේ. මේ මමත්වය ගසක කොළයක ද ඇත. ගසක එක කොළයක් අනිකට අසමාන ය. එහෙත් මුල්වලින් හා හිරු රැසින් ලබන්නේ සමාන ආහාර වෙයි.

Scanned by CamScanner

අට ඇවිරිදි වියෙහි වූ තිස්ස දවසක මුහුදු වෙරළට ගොස් ආපසු ගෙදර එද්දී රේල් ගේට්ටුව අසල වූ මුර පැල පසු කෙළේ ය; එහි මිදුලෙහි රතු මල් පොකුරු සහිත රාජ පොහොට්ටු පඳුරු දැක නැවතී මඳවේලාවක් බලා සිටියේ ය. රතු මල් පොකුරු සහිත එයින් පැළයක් වුවමනායයි ඔහු, තමාගේ තනියට තමා සමඟ ගමන් කළ වැඩිහිටියකුට කී ය. රාජ පොහොට්ටු ගසකින් මල් සහිත කිනිත්-තක් මුරකාරයාගෙන් ඉල්ලා දීමට ඔහු තැත් කළ විට තිස්ස එය 'එපාය' කියමින් කලහ කෙළේ ය. වැඩිහිටියකු තිස්ස හඬව හඬවා උස්සා ගෙනගෙදර ගියේ ය. එහෙත් ඔහු රාජපොහොට්ටු මල් පොකුරු සහිත පැළයක් ඉල්ලමින් ගෙදර ඉස්තෝප්පුවේ පෙරළි පෙරළී හඬන්ට වී ය. මල් පොකුරු සහිත ඉත්තක් ගෙන්නා දුන් නමුත් ඔහු එය ඉවත දැමුවේ ය. කෝප වූ මව ඔහුට ඉරටු තුනකින් තැළූ නමුත් ඔහු වෙහෙසෙන තෙක් හැඬීම නොනැවැත්වූයේ ය.

මල් පොකුරු සහිත මල් පැළයක් වුවමනා කෙළේ එය සිටුවූ විට පැළවී එසේම සිටිතියි යන හැඟීමෙන් මඩනා ලද හෙයිනි. මල් පැළය මැරී වියළෙතියි වැඩිහිටියන් කී නමුත් කුඩා තිස්ස එය නොපිළි ගත්තේ ය.

කුඩා වියෙහිදීම යකුන් පෙරේතයන් නොඇදහූ ඔහු වැඩිහිටියන් හා වාද කෙළේ ය. එහෙත් රැයෙහි කැලෑ රොදක් අතරින් වැටුණු අඩි පාරක ගමන් කළ තරුණ වියෙහි වූ ඔහුට සිතින් බිය දුරු කළ නොහැකි වී ය. ඔහු රැයෙහි සොහොන් පළක් පසු කොට ගමන් කෙළේ ඇස් දෙක වසාගෙන මන්තරයක් මතුරන්නාක් මෙන් 'ඉතිපිසෝ' ගාථාව කියමිනි.

අනුලාගේ රෝගය නරක අතට හැරී ඇතැයි සිතූ තිස්ස ශෝක වූයේ ය. ඔහු නන්දට සිතින් දෙස් නැඟුවේ ය. නගර ජීවිතයට අනුරූප වීමට වැයම් කරන නන්ද හා පියල් ඒ වැයමින් ආස්වාදයක් ලබයි. ඔවුන් තම දරුවන්ට උසස් උගැන්මක් ලබාදීමට කරන ආයාසය ද එහිම අංගයකි. අතීතය ඔවුන්ගේ සිතෙහි එල්ලී සිටින බරක් නොවී ය.

අනුලා තමාගේ රෝගය නරක් කරගත්තේ නන්දගේ හෝ පියල්ගේ හෝ වරදකින් නොවේ. නගර ජීවිතයෙන් වැඩි සන්-තෝෂයක් නොලැබිය හැකිවූ අනුලා නන්දගේ දරුවන්ගේ ඇල්ම දිනා ගැනීමෙන් සන්තෝෂ වූවා ය. අනුලා රෝගාතුර වූ ඇලන්ට සාත්තු කෙළේ ඔහුගේ අසනීපය තමාගේ හිසට ගත්තක ලෙසිනි.

පියල් සහ නන්ද, අනුලා බැලීමට පැමිණි එක් අවස්ථාවක පියල්ගේ මව සිටියේ මහ ගෙදර ය. අනුලාට සාත්තු කරමින් සන්තෝෂ වන ඈ තම පුතාත් දුවත් පිළිගත්තේ ආගන්තුකයන් දෙදෙනකු පිළිගන්නාක් මෙනි.

Scanned by CamScanner

"අපි එද්දී අම්මලයි ගෙදර දෙර වහලා තිවුණ නිසා එහි බැස්සේ නෑ. අපි දැන් එහාට යනවා. එන්න අපිත් එක්ක යන්න" යි නන්ද යෝජනා කළා ය.

"මම දැන් ගෙදර යන්නේ දවස් ගණනකට සැරයක්."

"නැන්ද හරියට මහන්සි වෙනවා"යි අනුලා කීවා ය. "මහන්සි වෙන්න එපාය කිව්වට නැන්ද අහන්නේ නෑ. නිදා-ගන්නෙත් මගේ කාමරේමයි. අනිත් කාමරේ නිදාගන්නයයි කොච්චර කිව්වත් අහන්නේ නෑ."

"ලෙඩා ඉන්න කාමරේ නිදාගන්න හොඳ නැත්තම් ලෙඩාට සාත්තු කරන්නත් හොඳ නෑ නෙව. කැස්ස හැදෙන්නේ මේ දරිවිට විතරක්ය. මට දහ දොළොස් සැරයක් කැස්ස හැදුනා. කාටවත් බෝ උණේ නැහැ."

"හැම කැස්සම එක වගේ නෙවි" යි පියල් සිනාසෙමින් කීවේ ය.

"කොළඹදී හැදෙන්නේ අමුතු කැස්සක්!"

තම නැන්දම්මා පුරුද්දක් වශයෙන් කතා කරන්නේ ඇනුම් පද කියන්නාක් මෙනියි දන්නා නන්ද වෙන ද මෙන් සිනාසුණා ය. ඒ සිනාව දැන් නැන්දම්මා කුප්පන්නකි. නන්දගේ සෙවණැල්ල ද දැන් නැන්දම්මා දකින්නේ ඇද කුද ඇත්තක් ලෙසිනි.

නන්ද, තම පුතා තමාගෙන් සොරාගෙන කොළඹට ගියා ය. ඈ පියල් සමග විවාහ වන්ට පළමුව අකැමැති වූයේ ඔහු සමග ගම වාසය කරනු නොඉවසූ බැවිනි.

පියල්ගේ ළඟ නෑයකු වන කත්තිරිනාගේ දුවගේ මඟුලට යෑමට නන්ද කැමැති නොවූවා ය.

"උන්ගේ මඟුල්වලට අපි කවදාවත් ගියේ නෑ."

නන්දගේ මේ අහංකාර වදන් සිහි කළ පියල්ගේ මව තිත්ත කසායක් කටට ගත්තක මෙන් සිතින් ඔක්කාරය කළා ය. තම ලේලි කළ කී හැම දෙයක් දැන් ඈට පෙනෙන්නේ ඊර්ෂ්‍යාව හා සැකය අතරිනි.

නන්ද වැඩි ළැදි කමකින් සමන් සමරවීර දෙස්තර හා කතාබහ කරනු, ඇගේ හැපෙන තරම ඔවුනොවුන් ළංවනු කොළඹදී දුටු පියල්ගේ මව ඔවුන් ගැන සිතන්නේ අමුතු සැකයකිනි. ඈ ගැනුන්ගේත් පිරිමින්ගේත් ආශ්‍රය හැම විට සලකන්නේ සැකයෙනි, ඊර්ෂ්‍යාව හා කුකුස විසින් කුප්පනු ලැබූ ඈ තම ලේලිත් සමරවීරත් අතර නොමනා හාදකමක් ඇතැයි සිතයි. ඇගේ සිත ඒ හැඟීම නමැති හෙලුගරවුන්ගේ නැටුම් පළක් වී ය.

සමරවීර හැම විට නන්දට ළංව සිටීමට වෑයම් කෙළේ ය; ඈ කියන්ට පෙර ඈට වුවමනා දෙය සැපයුවේ ය. ඇගේ ගමන බිමන කතාබහ හා ඇඳුම් පැලඳුම් ගැන සමරවීර තරම් කුහුලක් දක්වන අනිකකු නොවූහයි පියල්ගේ මව සිතයි. ඔවුන් නිසා වැඩුණු කුහුල ඇති ඈ ඔවුන් කියන දේ අසන්ට ඇරුණු කන් ද කරන දේ දකිනු පිණිස තියුණු වුණු ඇස් ද ඇත්තක් වූවා ය. එය තමා සතු යුතුකමකි. ලේලි මඩෙහි වැටී එරෙන්නට පෙර බේරා නොගත්තොත් එයින් පුතාගේත් දරුවන්ගේත් පිරිහීමට මඟ පැදෙයි.

පියා තම දුව සමඟ කැලයෙහි අඩි පාරක් ඔස්සේ ගමන් කෙළේ ය. ඔහු සරාගී චේතනාවෙන් තම දුවගේ අත අල්ලා ගත්තේ ය. දුව අඩන්ට වූවා ය. "මම අත ඇල්ලුවේ උඹ විමසනු පිණිස ය" යි පියා කීවේ ය.

ජාතක කථාවක එන මේ පුවත සිහි කළ පියල්ගේ මව එය වටහාගත්තේ ගැමි ජීවිතයෙන් ලත් තම අත්දැකීම අනුවයි.

මෝද්දුවා ............මැද පන්තියේ ගැමියා.................... අනියම් බිරිඳගේ දුව............. නියම බිරිඳ වස කා මළා............... හේතුව ගැමියෝ දනිති............... ඒ සෙල්ලම හොඳ නෑ............ මගේ පුතා.................. අනුලා දන්නවා ..............වහන්න හද-නවා. අනුලා ලෙඩ උණෙත් ඒකෙන් හිත නරක් වෙලා. හිතේ ලෙඩක්....................කෑස්ස. මොන කැස්සක් ද ? හිතේ ලෙඩක්....................නන්ද කපටි ගෙර...............ජීනදාස නැති කළා. පුතාත් නැති කරනවා.

නැන්දගේ මුහුණ බලා සිටි අනුලා පුදුම වූවා ය. ඈ සිතන්-නේ නන්ද හා පියල් ගැන විය යුතු ය. නැන්ද තම දේපල තිස්සට ලියා දෙන්ට යෝජනා කෙළේ නන්ද කෙරෙහි හටගත් අමනාප-යත් කෝපයත් දැඩිවූ හෙයිනි.

"අර කොළඹ දෙස්තර කොහෙ මිනිහෙක්ද ?" යි පියල්ගේ මව ප්‍රශ්න කළා ය.

"මොන දෙස්තර ද ? ' යි අනුලා ඇසුවා ය.

' කොළඹ පුතාලයි ගෙදරට නිතර එන දෙස්තර............... සමරවීර."

'අර දෙස්තර' යන පදයෙන් නැන්දම්මා සමරවීර හඳුන්වන්ට වෑයම් කෙළේ කුමක් නිසා ද ? දිය බිඳක් වැටුණු උණු තෙලක් මෙන්, සමරවීරගේත් නන්දගේත් හාදකම පිළිබඳ තොරතුරු කැකෑරෙමින් අනුලාගේ සිතට නඟියි.

"ඒ දෙස්තර කොහේ මිනිහෙක් ද කියා මම දන්නේ නෑ" යි අනුලා මඳක් අසන්තෝෂයෙන් පිළිතුරු දුන්නා ය.

Scanned by CamScanner

හැම දෙයක් කුරුගාමීන් අවුස්සන සිතකුත් හැම දෙයක් බැලෙන විපරම් ඇසකුත් ඇති නැන්ද, නන්දත් සමරවීර දෙස්තරත් නිසා උපන් සැක ඇත්තක වීම අනුලාගේ පුදුමයට හේතු නොවී ය. නන්ද සමඟ කතා බහ කළ සමහර පිරිමින් හා ගැනුන් කියූ කියුම්-වල අරුත් දැනගන්නා අදහසින් පියල්ගේ මව ඇතැම් විටක තිස්සගෙන් වටින් පිටින් ප්‍රශ්න ඇසූ බව නන්ද දනියි. "ඒ ගොන්නු කතා කරන ඒවාට මම කන්දෙන්නේ නෑ නැන්ද" යි තිස්ස වරක් පිළිතුරු දුන්නා ය.

"මම හිතන්නේ නැන්දේ ඒ මිනිහා මිරිස්සෙන් ගොස් කොළඹ පදිංචි උණු පවුලක උපන්නෙක්ය කියා. වෙන කල්පනාවකින් සිටි නිසා එයා කොහේ මිනිහෙක් ද දන්නේ නැයි මට කියවුණා."

අනුලා සිනාසෙන්ට වෑයම් කළ නමුත් ඇගේ කටට සිනාවක් ආරූඪ නොවී ය.

"දකුණු පළාතෙන් ගිය පවුලක මිනිහෙක් වෙන්න ඇතැයි මමත් හිතුවා."

පියල්ගේ මව අනුලාගේ මුහුණ බැලුවේ යටැසිනි. නන්ද-ගේත් දෙස්තරගේත් හාදකම අනුලා දනිතියි ඈ සිතුවා ය.

"එයා දැක්ක දවසෙම මට හිතට ඇල්ලුවේ නෑ" යි අනුලා දෙඩවන අටියෙන් නැන්දම්මා කීවා ය. "එයා ලංසි මිනිහෙක් වෙන්න හදන සිංහල මිනිහෙක් ය කියා මට හිතුණා."

"එයා ඉංගිරිසි කාරයෙක් වෙන්න හදන කළු මිනිහෙක්."

නැන්දම්මා සන්තෝෂයෙන් සිනාසුණා ය. තමා සිතන සැටි-යෙන්ම සමරවීර ගැන අනුලා ද සිතයි. නංගිගෙ හැඹිලියෙ හුණු පොඩ්ඩක් ඇති බව අක්කා දනියි. අක්කා ඒක වහන්ට වෑයම් කරයි. නංගි කොළඹට ගියේ ඔය නැටුම් නටන්න. පින්දසට දව උපන් ළමයා මියගියා..............අලුත් කතුර.............. ඇකිරිල්ල සහිත කනප්පුව..............හං කතුර..............පෙක-ණිය..............පෙර. අනුලා හොඳයි. නමුත් කපටියි. තිස්ස හොඳ මිනිහා. නන්ද අම්මාගේ දූ..............පින්දස මැරුණා. පූතාගේ ඇහේ එල්ලුණා.

තාත්තා මැරෙන්ට ඉස්සර පූතා ගෙන්නුවා. කඳුළු වැගුරුවා. තොල් සෙලවුණා. හුස්ම ඇද්ද ; එපමණයි. තාත්තා මැරුණු හැටියේ ආවේ වඩුරාළ. කොස්ලැලි ඉරා කපා යතු ගා පුරුද්ද මිටියෙන් යකඩ ඇන ගහන හඬ..............මට ඇහුණා. වාර-නිස් ගා පිදි තහඩු සවි කිරීමෙන් අලංකාරණය කරන ලද ඔප ඇති පෙට්ටිය. මුහන්දිරම් වළ දමන ලද්දේ එපමණ හොඳ පෙට්ටියක බහා නොවේ.

"දවසක මට උංට බණින්න හිතුණා" යි පියල්ගේ මව කෝප-යෙන් කීවා ය. ඇගේ දෙඇස කෝපයකින් හා ද්වේෂයකින්

Scanned by CamScanner

දූවෙතියි ඇගේ මුහුණ බැලූ අනුලා සිතුවා ය. නැන්ද හිටි හැටියේ කිපුණේ කුමක් නිසා ද ?

"දවසක මට ඌට බණින්න හිතුණා" යි නැන්ද නොසිතාම යළිත් තෙපලා ය.

"ඌට ? කාටද ?"

"සමරවීරට"

කෝපයෙන් හා ශෝකයෙන් ගිනි ගත් ඇගේ දෙඇස හඳුනා-ගත් අනුලා සමරවීර පිළිබඳ පුවත ඇගෙන් සඟවන්ට වෑයම් කිරීම නිෂ්ඵල යයි සිතුවා ය. එහෙත් අනුලා අසන්තෝෂයෙන් මෙසේ කීවා ය.

"නොබැන්න එක හොඳයි. සමරවීරට බණින්නේ කුමට ද ? තිසා හිතන්නේ එයා බූරුවෙක්ය කියා. නන්ද ඒ මිනිහා මෝඩයෙක් ලෙස සලකනවා............."

අනුලා කාමරයෙන් පිටවී සාලයට පිවිසියා ය. මව මිදුලේ පාත්තියෙහි හෙන්දිරික්කා මල් පැළවලින් මල් කඩා කුඩා වට්ටි-වට්ටියක දමයි. පියල්ගේ මව ද මිදුලට බැස මල් කඩා වට්ටි-යෙහි දමයි. මවත් නැන්දත් සමඟ මලසුන් ගෙට පිවිස බුදුන් වඳින්ට අනුලාට ද සිතිණ.

මාතර හාමිනේ හැම ද උදේ සවස මල් පුද බුදුන් වඳියි. උදේ වරුවේ බුදුන් පුදනු පිණිස ඈ අරලිය, පිච්ච, පස්පෙති, ආදි මල් නෙලාගනියි. ඈ මිදුලේ හෙන්දිරික්කා මල් පැළ සිටුවා වවන්-නේ හවස බුදුන් පුදනු පිණිස නොපරවුණු මල් ලබාගනු පිණිස ය.

මහ ගෙදර පිට කාමරයක් මාතර හාමිනේගේ මලසුන් ගෙයයි. එහි එක් මුල්ලක වන මේසයක් උඩ බෝමුල වැඩ සිටින බුදුන් පරාජය කරනු සඳහා සාහසික වෙස්ගෙන පැමිණි මාරසේනාව දක්වෙන පාට පින්තූරයක් ද, පිත්තල බුදුරුවක් ද, ප්‍රවෘත්ති පත්‍ර-යකින් කපාගෙන රාමුවක දමන ලද සමාධි ප්‍රතිමාවක ඡායා-රූපයක් ද වී ය. මාතර හාමිනේ උදේ සවස දෙක්හි පුදන මලින් නඟින සුවඳින් ඒ කුඩා කාමරය දහවල් කාලයෙහි පමණක් නොව රැයෙහි ද සුවඳ වෙයි.

අනුලා ද මිදුලට බැස හෙන්දිරික්කා මල් දෙක තුනක් කඩා මව අතෙහි වූ වට්ටියෙහි දැමුවා ය.

උදය වරුවේ ඉඳලෙන් අතුගාන ලද තෙත පොළොව දූන් වියලී ඇත. එකිනෙකට ඇදුණු පොල් අතුවල හැඩ හුරුකම දක්වෙන ඉරටු පාරවල් තවම දක්ක හැකි ය. මිදුල වියලී ඇතත් අතුපතරින් සෙවණ වුණු වත්ත තවම තෙත ය. තෙත් බැහුණු වාතය අනුලාට ප්‍රිය නොවේ. තෙත වාතය ඇගේ නැහැයත් පෙණහළුත් පොහවතියි ඈ සිතයි.

# 9

පියල්ගේ මව නන්දගේත් සමරවීරගේත් හාදකම පිළිබඳ කිසිවක් නිසැකව දනිතියි අනුලා කල්පනා නොකළා ය. පුතාත් දුවත් කෙරෙහි කලකිරුණු ඇගේ සිතෙහි සමරවීර ගැන කුහුලක් ඇති වන්ට ඇත. ඈ ඔහු ගැන සැක කරන්නේ ඔවුන්ගේ හාදකම ගැන කිසිවක් දන්නා නිසා විය නොහැකි ය. නැන්ද සමරවීර ගැන ප්‍රශ්න කෙළේ තමාගෙන් කිසිවක් දැනගන්නා අදහසින් බව අනුලාට නිසැක ය.

නන්ද හා සමරවීර වැඩි සන්තෝෂයකින් ඔවුනොවුන් ඇසුරු කරන බව පියල් පමණක් නොව අනුලා ද දනියි. ඔවුන් අතර නොමනා හාදකමක් ඇතැයි අනුලා සිතෙනුදු නොසිතුවා ය. ඔවුන් දෙදෙනාගේ ආශ්‍රය සඳෙස් එකක් බව අනුලා දැනගත්තේ අහම්බෙනි. ඔවුන් දෙදෙනා හුදෙකලාව කතාබහ කරමින් සිටි අවස්ථාවක නන්දගෙන් කිසිවක් දැනගනු පිණිස අනුලා ඔවුන් අතරට ගියා ය. සමරවීර නන්දගේ මුහුණ සිඹින්ට වෑයම් කෙළේ ය. නන්ද ඔහු ඉවතට තල්ලුකරදමා කෝපයෙන් ඔහු දෙස බැලුවා ය. අනුලා තම කෝපයත් සංවේගයත් මැඩගත්තේ නන්දගේ හැසිරීම සිහි කිරීමෙනි.

අනුලා අනික් පසට හැරී ආපසු ගියා ය. නන්ද තමා දක්නා ලදදැයි අනුලා නිසැකව නොදනියි. නන්ද සමරවීර ඉවතට තල්ලු කොට ඔහුගෙන් ඈත් වූයේ තමා එනු ඉවවැටුණ නිසාද? නොඑසේ නම් සමරවීරගේ ක්‍රියාව ඇත්ත වශයෙන් ඈ නො ඉවසූ නිසාද? මේ ගැන විනිශ්චයකට බැසගත නොහැකි වූ අනුලා නොසන්සුන් වූවා ය.

තම සහෝදරිය සැක කිරීම නොමනායයි සිතන්ට වෑයම් කළ නමුදු අනුලා තමාගේ බිය සැක සිතින් පළවන්ට අසමත් වූවා ය. අකැමැත්තෙන් වුව ද අනුලා, සමරවීරත් නන්දත් කියන කරුණු දේට අමුතු අරුත් දෙන්ට පටන් ගත්තා ය.

සමරවීර කඩවසම් ඇති කයක් හා සොම්නසින් එළිය වුණු සුන්දර මුහුණක් ද ඇති තරුණ විය ඉක්මවූ අවිවාහකයෙකි. සරාගී බැල්මෙන් තොර වුව ද ඔහුගේ දෙනෙත කවර ගැහැනියක-ගේ වුව ද සිත් අදින්නකි. පියල්ගේ ගෙදරට පැමිණෙන හැම ගැහැනියකම සමරවීර හා කතාබහ කරන්නේ ආසාවෙනි. ඔහු නන්ද හා වැඩි ආසාවකින් කතාබහ කරතත් අනික් ගැනුන්ගේ ද සිත්ගන්නා අදහසින් කෙළි කවට තෙපුල් තෙපලයි.



Scanned by CamScanner

පොතක් පතක්, පැරණි දෙයක්, සමාජ ප්‍රශ්නයක් ගැන කිසි විටෙක වචනයකුදු කතා නොකරන ඔහු ඇතැම් විට තිස්සගේ උප-හාසයට හසු වූයේ ය. ඔහු ඒ හැම විට කතා කෙළේත් හැසුරු-ණේත් තිස්සගේ උපහාසය නොතේරෙන්නකු ලෙස ය. තිස්සගේ ඉංගිරිසි බසත් සිංහල බසත් නොවැටහෙන්නකු ලෙස ඔහු වටපිට බලා අන්කකු හා කතා කරයි.

''තිසා ඔහොම ඇනුම්පද කියන කොට සමරවීර තරහ වෙච්'' යි දවසක අනුලා කීවා ය.

''ඒ මිනිහා බූරුවා; බූරුවා තරහ වෙන්නේ නෑ, නොවැට-හෙන නිසා.''

''එහෙනම් එයා හිනාවෙන්නේ ? බූරුවෙකුට හිනාවෙන්න පුළුවන.''

''තිසා සමරවීරට කිපෙන්නේ ඔහු නන්ද සමඟ පමණ ඉක්මවා කතාකරන නිසා ද ?''

''සමරවීර කතාකරන්නේ ගැනුන් එක්ක විතරයි. මම කියන එකක් එයාට වැටහෙන්නේ නෑ.''

''ඒ මිනිහා නරක මිනිහෙක්'' යි කියමින් අනුලා තිස්සගේ මුහුණ බැලුවා ය.

''ඒ මිනිහා නරක මිනිහෙකුත් නෙවි; හොඳ මිනිහෙකුත් නෙවි'' යි තිස්ස පිළිතුරු දුන්නේ ය. ''මිනිහෙක් එක්කෝ නරක මිනිහෙක් වෙන්න ඕනෑ; නැති නම හොඳ මිනිහෙක් වෙන්න ඕනෑ. සමරවීර ඒ දෙවර්ගයටම අයිති නැති මිනිහෙක්. සමරවීරට හොඳ දේත් හොඳයි; නරක දේත් හොඳයි.''

වරක් නන්දට උණ ගැනිණ. ඇ ඇඳෙහි වැතිර සිටි ඒ අවස්ථාවෙහි ගෙදර කටයුතු කළ අනුලාගේ අතට සමරවීරගේ ලියුමක් හසු වී ය. නන්දට වුවමනා කළ යට ගවුමක් සොයනු පිණිස ඇගේ අල්මාරියෙහි ඇඳුම් අතපත ගාන විට විදහන ලද ලියුමක් අනුලා දුටුවා ය. 'My dearest Nanda' යන ඇමතුම කියවූ අනුලා තුළ මහත් කුහුලක් හටගත්තේ ය. පියල් නන්දට ලියුම් ලියුවේත් ලියන්නේත් සිංහලයෙන් බව අනුලා දනියි. ඉංගිරිසි නොදත් මියගිය ජිනදාස නන්දට ඉංගිරිසියෙන් ලියුම ලියන්නේ කෙසේ ද ? එය කොළඹ කිසිවකු විසින් එවන ලද ලියුමක් විය යුතු ය. අනතුරුව අනුලාගේ දෙනෙතට හසු වූයේ ලියුමෙහි අත්සනයි. ඒ අත්සන එක වර හඳුනාගත නොහැකි වූ ඈ පැරණි ශිලා ලිපියක් කියවන්ට වෑයම් කරන පණ්ඩිතයකු මෙන් අත්සන කියවන්ට වෑයම් කළා ය. ඈ අමාරුවෙන් 'Weera' යන අකුරු පස හඳුනාගත්තා ය. 'S-M' යන අකුරු දෙක හඳුනා ගත් ඇට නිතැතින්ම කියවුණේ 'සමරවීර' යන නමයි.

Scanned by CamScanner

කුහුල වැඩිවූයෙන් ඈ අකැමැත්තෙන් හා අමාරුවෙන් ලියුම කියවූවා ය.

'එද ඔබ මහ හෝටලයෙහිදී මා හමුවූ නමුත් මගේ කාමරයට එන්ට අකැමැති වූවා ය. මා ඉවසුම් නැතිව දණින් වැටුණකු ලෙස කළ ආයාචනය ඇසූ ඔබගේ ගත සැලෙන්ට වී ය………… ඔබගේ දෙනෙතට කඳුළු උනනු දුටු මම බිය ගත්තෙමි………

ඔබ හෝටලයෙන් පිටවී ගියේ කෝපයෙන් ද ? ශෝක-යෙන් ද ?''

සමරවීරගේ ලියුමෙන් කොටසක් අනුලා සිංහලයට නගා වටහාගත්තේ මෙලෙසිනි. ඇගේ ඉංගිරිසි දැනුමෙහි අඩු පාඩු ඇතත් ලියුමෙහි මේ කොටස ඈ ඉවෙන් මෙන් වටහා ගත්තා ය. අනුලා වටපිට බලා ලියුම හකුළා හඬ නැඟෙන සේ අල්මාරිය වැසුවා ය.

''අනු……………ඇඳුම සොයාගන්න බැරි නම් කමක් නෑ'' යි ලෙඩ ඇඳේ උන් නන්ද කීවා ය.

අනුලා සන්සුන්ව යළිත් අල්මාරිය ඇර යට ඇඳුම සෙවුවා ය. නන්ද ඌට අහුවෙන්නේ නෑ…………පියල් නන්දගේ සිත දිනා-ගන්න කෙනෙක් වෙහෙසුණා ද ? පිනදස මලේයයි ආරංචිවුණු පසු පියල් එවූ තෑගි පවා නන්ද නොපිළිගත්තා ය. ලෙඩ ඇඳෙහි උන් නන්ද පියල් එවූ මෝල්ටඩ් කිරි පිසි කෙළේ දැඩි කෝප-යෙනි. මා බැණ වැදුණාම. ඈ ළය පැළෙන ශෝකය කටින් පිටවනු වැළැක්වීමට කොට්ටයෙහි මුහුණ ඔබාගෙන කොට්ටය විකාගත්තා ය……………

නන්ද සමරවීරට අහුවෙන්නේ නෑ……………….ඉංගිරිසි උගන්නා කාලයේ ඈ යටි සිතින් පියල්ට ඇල්ම කළා ය. අම්මාත් තාත්තාත් ඔහු තමන්ට නොසමයකු ලෙස සැලකූ නිසා නන්ද තම හැඟීම, පන්නැයකු සපත්තුවෙන් පාගා තළන්නාක් මෙන් තළා දැම්මාය.

ජිනදස මැරී කලකට පසු පියල් පිළිබඳ නන්දගේ හැඟීම යළිත් මතු වී ය. අම්මා පෙර මෙන් පියල්ට අවමන් නොකළ නමුත් නන්ද කුලමානයෙන් ඒ හැඟීම මැඩ ගත්තා ය………… සමරවීරට අහුවන්නේ නෑ………………

නන්දගේ ඇඳුම සොයා එළියට ගත් අනුලාගේ දෙනෙතට එහි වූ ඇබිති පැල්ලමක් හසුවූවා ය. එය රජකයා විසින් තබන ලද නිතකි. අනුලා ඇඳුම ගෙන ගොස් නහාට දී තම කාමරයට ගියා ය. විදුලි පහන දල්වා ඇඳෙහි හාන්සිවූ ඈ සමරවීරගේ ලියුම යළිත් කියවූයේ සන්සුන් සිතිණි. ඇගේ සංවේගය අඩුවනු

වෙනුවට වැඩි වී ය. කාමරයෙහි නිසන්සලය ඇට සිතන්ට අනු-බල දෙයි.

සමරවීරත් නන්දත් අතර හාදකමක් ඇත. නොඑසේ නම් ඔහු මෙවැනි ලියුමක් ඇට නොලියයි. සලෙලුවකුට තමාගේ අත අල්ලාගන්ට පමණක් වුව ද ඉඩ දෙන කවර ගැහැනියක් වුව ද ඔහුගේ පාශයෙහි බැඳෙයි. සමරවීර සලෙලුවෙක් වී නම් ඔහු හමුවන්ට ගිය නන්ද ගෙදර එන්නේ අවංක ගැහැනියක ලෙස නොව වංක ගැහැනියක ලෙසිනි.

පියල් ඔහුගේ රබර් වත්තට ගොස් තුන් දවසක් යන තුරු ආපසු ගෙදරට නොපැමිණියේ ය. තුන් වන දවසෙහි රැයෙහි පොද වැස්සකින් තෙමෙන මිදුලට බැස්ස අනුලා මහපාර දෙපැත්ත දෙතුන් වරක් බැලුවා ය. මොටෝරිය දෙකක් විදුලි ලාම්පු එළියෙන් පාර දෙපැත්තේ ගස් කොළන් එළිය කරමින් වේග-යෙන් ගමන් කෙළේ ය. පියල්ගේ මොටෝරිය එන ලකුණකුදු නැත. යම්තම් තෙමුණු පොළොවෙන් නගින නවමු පුස්ඹ අනුලාට දැනිණ. වාතය මඳක් සීත ය. ඈ නන්දගේ කාමරයට ගොස් පියල් තුන් දවසකින් ආපසු ගෙදරට නොපැමිණියේ කුමක් නිසාදැයි ප්‍රශ්න කළා ය.

"වත්තේ වැඩ ඇති. 'කොන්දෙස්තර රබර් රාත්තල් දහක් විතර හොරෙන් විකුණලා තියෙනවාය, ඒ ගැන සොයන්න ඕනෑ' යි පියල් වත්තට යන්න පිටත්වෙද්දී කිව්වා............."

"පියල් වත්තට ගියෙ නංගී එක්ක අසතුටකින් නෙවී........"

"නෑ" යි නන්ද කීවා ය. "අක්ක එහෙම ඇහුවේ කුමක් නිසා ද ?"

"සමරවීර දෙස්තර ගැන පියල් දවසක නංගී එක්ක තරහෙන් කතාකරනවා මට ඇහුණා. එයා එක්ක ඕනෑවට වැඩිය කතාවට යන්න එපා................"

නන්ද අනුලාගේ මුහුණ බැලුවේ තරහයෙනි.

"සමරවීර එක්ක විතරක් නෙවි; ගෙදරට එන කවුරු එක්කත් මම කතාබහ කරනවා."

"සමරවීර එක්ක ඕනෑවට වැඩිය කතා කරනවා."

"මම එක එක්කෙනා එක්ක කතාකරන්නේ ගණන් බලා-ගෙන නොවේ."

"නන්ද සමරවීර එක්ක ඇවිදින්න යනවා............."

"අනූ සොයන්නේ මම කතාකරන මිනිසුන් ගැනත් යන එන තැන් ගැනත්.............අනුට වෙන වැඩක් නැද්ද ?............"

අනුලා කෝපයෙන් අනික් අතට හැරී කාමරයේ දොරටුව දෙසට පා නැඟුවා ය. පියල්ගේ මොටෝරිය එද්දැයි දැනගනු පිණිස ඈ කන් දෙක ඇරගත්තා ය. මහපාරෙන් රියක ගෝසාවක් නොඇසේ. මුහුදෙන් නැඟෙන ගෝසාව පමණි ඇසෙන්නේ. ඈ ආපසු නන්ද වෙතට ගියා ය.

"මම ඒ එකක්වත් සොයන්නෙත් නෑ; සෙවුවෙත් නෑ" යි අනුලා දැඩි කෝපයෙන් කීවා ය.

තම සහෝදරියගේ මුහුණ බැලූ නන්දගේ කෝපය මැඩගෙන බිය සැක නැංගේ ය. අනු මෙතරම් කෝප වූයේ කුමක් නිසා ද? සමරවීර ගැන පියල් ඇගෙන් කිසිවක් ඇසුවේ ද? පියල් වත්තට ගියේ මා සමඟ අමනාපයෙන්දැයි අනුලා ප්‍රශ්න කෙළේ කුමක් හෙයින් ද? පිපිරෙන තරම් කෝපයකින් හා සංවේගයකින් අනුලාගේ හද පිම්බෙතියි යළිත් ඇගේ මුහුණ බැලූ නන්ද සිතුවා ය. නගර පරිසරය අනුව මෙතෙක් කල් හික්මුණු ඇගේ අදහස් හා සිතුම් කාරම් දියට හසු වුණු දිය සායම් සේ සේදී ගියේ ය.

අනුලා තම චෝලියටත් ළයටත් අතරින් ගත් කඩදසියක් නන්ද දෙසට වීසි කළා ය. නළාවෙන් දමුණු සැපින්න නයිනටවන්නා නිසල වන විට නිසල වන්නාක් මෙන් නන්ද තම සහෝදරියගේ මුහුණෙහි රැඳවූ දෙනෙත් ඇතිව නිසල වූවා ය.

"ඒක ලියුමක්; කියවල බලාපන්."

යකැදුරා කියන දේ කරන ආවේශ වූ ස්ත්‍රියක මෙන් නන්ද පාත්වී ලියුම අතට ගෙන යළිත් අනුලාගේ මුහුණ බැලුවා ය.

"කියවාපන්"

ලියුම කියවූ නන්දගේ දෙනෙත, ඇස්ලොඩී පිට පන්නන තරම් විදැහිණ. ඒ ලියුමෙන් පසු පවා තමා සමරවීරගෙන් ඈත්වන්ට නොසිතූ බව සිහි කළ නන්දගේ මුහුණට බැගෑ වෙසක් ආරූඪ වී ය. ඔහු මහා හෝටලයෙහිදී කළ නොමනා යෝජනාව ඇසූ නන්ද ඔහුගෙන් පලාගියේ අමාරුවෙනි. පලායද්දී පවා ඈට සිහි වූයේ ඔහුගේ ආලිංගනයෙන් ලැබිය හැකි ආස්වාදයයි. දෙතුන් දවසකට පසු නන්ද වෙනදා මෙන් ඔහු ඇසුරු කළා ය. තුන් හතර වරක් ඔහු හමුවීමට ද ගියා ය. ඇගේ කය සමරවීර කෙරෙහි ඇලෙයි; ඇගේ ඇතුළු හද තමාගේ සිතින් හා කයින් කෙරෙන පැතුම පිළිකුල් කරයි. එහෙත් ඒ පැතුම බැහැර කරන හැම විටම බිජුවට රකින කිකිළියක මෙන් නැවත නැවතත් ඇගේ සිතට පිවිසෙයි.

ගමදි නන්ද හැම දෙයක් කෙළේ තමාගේ විනිශ්චයෙහිම පිහිටා ය. තමා සිතූ සිතුමෙහි පිහිටා කතා කළා ය. දැන් ඈ ආත්ම විශ්වාසයෙන් තොරවූවකි. එහෙත් අනුලා කතා කරන්නේත් ක්‍රියා කරන්නේත් දැඩි ආත්ම විශ්වාසයක් හා සිතක් ඇත්තක ලෙසිනි.

Scanned by CamScanner

පුටුවක හිඳගත් නන්දගේ බැගෑ වෙසට හේතුව ඈ සිත කය දෙකින්ම බිඳවැටීම විය යුතු ය. අනුලාගේ කෝපය තුනී විය. තම නඟාට අනුකම්පා කළ නමුත් අනුලා කතා කෙළේ පතිදම් බිඳිනු ලැබූ ගැහැනියකට පිහියෙන් අනින්ට ගැමි තරුණයකු එලවන අහේතුක හැඟීම වැනි හැඟීමක් ඇත්තක ලෙසිනි.

''මම උඹ කරන කතා ගැන සෙවුවේ නෑ''යි අනුලා තෙපලා ය. ''උඹ යන එන තැන් සෙවුවෙත් නෑ. උඹත් සමරවීරත් ගැන මගේ සිත ගිනි ඇවිලුණේ ඔය ලියුම අතට අහුඋණු දවසේ.''

''කලින් සැක නොකළා නම් අනු මගේ ලියුම් ඇවිස්සුවේ කුමට ද?''

''මම උඹේ ලියුම් ඇවිස්සුවේ නෑ''යි අනුලා කෝපයෙන් තෙපලා ය. ''උණගැනී උඹ ඇඳට වෙලා සිටි දවස් වල උඹේ අල්මාරියේ ඇඳුම් පැලඳුම් අතපතගාන්ට සිද්ද උණේ මට. ඒ වැඩේ මට කරන්න සිද්ද නූණා නම් වඩා හොඳයයි මම ඒ වේලාවේ සිතුවා. නමුත් අල්මාරිය අතපත ගාන්න සිද්ද උණේ උඹේත් අපෙත් වාසනාවකට යයි මට දැන් හැහෙනවා. උඹේ යට ඇඳුම් සොයන විට ඔය ලියුම මගේ ඇසට අහුඋණා. ලියුම දිග ඇරිලා-මයි තිඋණේ. එහි ඇමතුම ඉබේටම මට කියවුණා. මට සැක හිතුණෙ ඊට පස්සෙ. පියල් උඹට ඉංගිරිසියෙන් නොලියන බව මම දන්නව......ඒ ලියුම කියෙවුවට පස්සෙ තමයි උඹේත් සමරවීරගේත් ආශ්‍රයත් කතාබහත් අමුතු විදියකින් මට පෙනෙන්ට පටන්ගත්තෙ..........''

''මේ ලියුම අල්මාරියේ තිඋණ බවක්වත් මම දැන සිටියේ නෑ. මම හිතා හිටියේ ඒ ලියුම ඉරා විසි කළාය කියා''යි නන්ද ශෝක යෙන් කීවා ය.

''උඹ ලියුම ඉරා විසි කළා නම් නැවතත් සමරවීර ආශ්‍රයෙන් සන්තෝෂ වෙන්න යනවා ? එයාට මේ ගෙදරට එන්න අනුබල දෙනවා ද?''

නන්ද කතා නොකළා ය. අනුලා තුනී නොවූ කෝපයෙන්ම කතා කළා ය.

''උඹ ඌ හමුවෙන්න ඊට පස්සෙත් ගියා ?''

''ගියා''

''උඹ ඌට අහුඋණා.''

''නෑ'' යි-නන්ද කෝපයෙන් පිළිතුරු දුන්නා ය. අනු එහෙම හිතාය කියා මම හිතුවේ නෑ.''

''ඊට පස්සෙ ඌ බලන්න ගියේ කුමට ද ?''

Scanned by CamScanner

"මම සමරවීරට ලියුම් දෙකක් ලියා තිළණා. ඒ ලියුම් ගන්න හිතාගෙන ගියේ."

"ඒ ලියුම් ලැබුණා ද?"

නන්ද පිළිතුරු නුදුන්නා ය.

"උඹ කියන්නේ ඇත්තද?"

"අනුට මම කවදාවත් බොරු කිව්වේ නෑ."

නන්දගේ කාමරය හැර ගෙයි අනික් තැන් අඳුරෙන් වැසී ඇත. කන්නාඩි මේසයත් කයින් අඩකට වඩා පිළිබිඹු කරන කන්නාඩියත් විදුලි පහන් එළියට හසුව බබළයි. නන්ද හා පියල් නිදන ඇඳත් එහි වාඩිවී උන් නන්දගේ ශෝකාතුර බැගෑ මුහුණත් කන්නාඩියෙහි පිළිබිඹු වෙයි. පුයර ටින්, හිස තෙමන සුවඳ පැන් බෝතල, තොල් රතු කරන සායම් හෙප්පු කෝපවූ අනුලාගේ දෙනෙතට හසුවී ය. ඈ තම නගාගේ මුහුණ සෙවිල්ලෙන් බැලුවා ය. නන්ද තවමත් නොපිරැහුණු රූ සපුව ඇත්තකි. දරුවන් තිදෙනකු ලත් ඈ ඇගේ තරුණ වියත් රූ සපුවත් පිරිහෙන්ට නොදී රැකගනු සඳහා සායම් සුවඳ සුණු, සුවඳ පැන් ආදියෙහි වහල ලබනු පිණිස මෙතරම් වැයම් කරන්නේ කුමක් නිසාදැයි අනුලාට නොවැටහේ.

අනික් කාමරයෙහි නිදන නාලිකා හුස්ම ගනිමින් පිට කරන හඬ අනුලාට ඇසෙයි. ශෝකයෙන් හා කෝපයෙන් අවුල් වුණු හිස ඇති ඈ කාමරයෙන් එළියට පිවිස ආලින්දයට ගියා ය. එහි විදුලි පහන මාසෙ පෝයත් සමඟ එන දැඩි අඳුර පළවමින් බැබළෙයි. වීදියෙහි හන්දිය අසල ගෑස් ලාම්පුවෙහි දුබල එළිය, අඳුර අතරින් දුටු අනුලාට, පියල් සහ බලදාස ද සමඟ පරගොඩ විහාරය වඳින්ට එළිය වැටෙන්ට පෙර පිටත්ව යද්දී තමා නැඟී ගිය ගැලෙහි පැද්දෙමින් පත්තුවුණු ලන්තෑරුම් සිහිවී ය. තමාගේ හා නන්දගේ තරුණ වියත් ගමත් සිහි කළ අනුලාට තම පියා මතක් වී ය. මව තනිකොට දමා කොළඹ මහ ගෙදර ජීවත්වන මව සිහි වී ය. මව තනිකොට දමා කොළඹ මෙතෙක් කල් ජීවත්වීම වරදක් ලෙස ඇට වැටහිණ.

දැඩි අඳුරෙන් වැසුණු වරායෙහි නවතන ලද නැව්වල කුඹ ගස් මුදුන්වල එල්ලී සිටින පහන් කුඩා තරු මෙන් බබළයි. කනමැදිරියන් සේ අඳුරෙහි බැබළෙන පහන් දුටු අනුලාට රැයෙහි කුප්පි ලාම්පුවෙන් පමණක් එළිය කරනු ලැබූ මහ ගෙදර දුක සේ ජීවත්වූ කාලය සිහි වී ය. විෂම තැන් හා වෙනස් කම් නසා ලොව හැම දේට අද්වය ස්වරූපයක් දෙන දැඩි අඳුර, අනුලාගේ කැළඹුණු සිතත් කයත් මඳක් නිසන්සල කෙළේ ය.

වැඩකාරයන් පහන් හා ලිපගිනි නිවා නිදතියි සිතූ අනුලා ආලින්දයෙහි විදුලි පහන නිවා සාලයෙහි දෙර වසා තම කාමරයට ඇතුළුව එහි විදුලි පහන දැල්වූවා ය. තමාගේ ඇඳ ළඟම ඇඳෙහි

නාලිකා නිදයි. නින්ද විසින් ඉඳුරන් හා සිත ද කය ද අකර්මණ්‍ය කරනු ලැබූ නාලිකාගේ අහිංසක මුහුණ සිපින්නට අනුලාට සිතිණ. අනුලා ඇඳෙහි වාඩිවී නාලිකාගේ හිස අතගෑවා ය. ඇ දෑඩි නින්දෙන් නිදයි. අනුලා හිස පාත් කොට නාලිකාගේ කම්මුලක් සිප යළිත් නැඟී පහන නිවා ඇඳෙහි හාන්සි වූවා ය.

කාමරයෙහි දොර නොවසාම ඇඳෙහි හාන්සිවූ නන්දගේ සංවේගය වැඩි වී ය. 'සමරවීර හමුවීමට මා ගියේ මගේ ලියුම් දෙක ඉල්ලාගනු පිණිසමදැ'යි ඈ තමාගෙන් ප්‍රශ්න කළා ය. සමරවීර දැකීමට හා ඔහු හා කතාබහ කිරීමට කෙමෙන් වැඩුණ ආශාව මැඩ ගැනීමට ඈ අසමත් වූවා ය. ගැමි පරිසරය විසින් හික්මවනු ලැබූ ඇගේ ගතානුගතික හැඟීම හා අදහස් ඇට පටහැණිව නැංගේය. සමරවීර හමුවීමට ගියේ තමා ලියූ ලියුම ඉල්ලා ගැනීමේ අදහසින් ය, යන හැඟීම ගැමි පරිසරය විසින් හික්මවනු ලැබූ ඇගේ හදින් නඟින අවලාද මඩිනු පිණිස ගෙවෙන අත්ලසකට සමාන වී ය.

ඈ සමරවීර හමු වී කතා බහ කළ දෙතුන් වාරයෙහි ම හෝටලයෙන් පිට වූයේ 'මගේ ලියුම් මට දෙන්න ඕනෑ' යි කියමිනි. ඒ ලියුම් ලබා ගැනීමට ඈ වෑයම් නොකළා ය. නන්ද අනුලාට කීවේ බොරුවක් ද නොවේ; ඇත්ත ද නොවේ. තමා හා සමරවීර අතර ඇති හාදකම නගරයෙහි කවරකු දැන ගත්තත් එය නන්දගේ සංවේගයට හේතු නොවේ. නන්ද සංවේගයෙන් සිහි කරන්නේ සමරවීරගේ ලියුම අනුලාගේ අතට හසුවීම පමණි. පියල් තමා කෙරෙහි දෑඩි විශ්වාසය ඇත්තකු බව ඈ දනියි. පියල් ඇතැම් දවසක යහළුවන් හා එක්ව මත්පැන් බී සන්තෝෂ වී ගෙදර එන්නේ රෑ බෝවූ පසුයි. මා සමරවීර හා කතාබහ කිරීමෙන් සන්තෝෂ වීම.........

නැංගුරම් නොසිඳිනු ලැබූ යාත්‍රාව කුණාටුවට හසුව හැල හැප්පුණ ද සිටි තැනින් නොසෙල්වී යළිත් නිසන්සල වෙයි. අනුලා, නන්ද ඉක්මවා සංවේගයෙන් ඇළලුණු නමුදු යළිත් සන්සුන් වී ය. ඈ අනික් කාමරයෙහි සුව සේ නිදයි.

නන්ද අනාචාරයෙහි හැසුරුණේ සිතින් මිස කයින් නොවේ. අනුලා, සංවේගයත් කෝපයත් තම සහෝදරිය ඉදිරියෙහි වැමැරීමෙන් හද සැහැල්ලු කොට ගත්තා ය. නන්ද මින් මතු සමරවීර තම සිතින් බැහැර කරනු නියැකය යනු අනුලාගේ හැඟීම වී ය. ඈ සුව සේ නිදගත්තා ය.

නන්දගේ සිත වඩාත් චංචල වී ය. එක අරමුණක රඳවා සිත හසුරුවන්ට ඈ අසමත් වූවා ය. අඳුරෙහි අතපත ගාන්නක ලෙසිනි ඈ අතීතය සිහි කෙළේ.

Scanned by CamScanner

විදුලි පහන නොනිවා ඇඳෙහි වැතිර නන්ද නිදන්ට වෑයම් නොකළා ය. උලමකු මෙන් නැව් නළාවක් හැඬූ කර්කශ හඬ දෙකනෙහි වැකීමෙන් පැරුණු සිත කය ඇති ඈ ඇඳෙන් නැඟී දෙරටුවට ගොස් එබී සාලය දෙස බැලූවා ය. අනික් කාමරයෙහි සුව සේ නිදන නාලිකාත් අනුලාත් හුස්ම අදිමින් පිට කරනු නන්දට ඇසෙයි. අනුලා ඇඳෙහි වැතුරුණු විගස නිදන්නේ කෙසේ ද? නන්ද සාලයෙහි විදුලි පහන දල්වා කාමරය තුළට එබී බැලූවා ය. නාලිකාත් අනුලාත් දැඩිම දැඩි නින්දෙන් නිදයි.

පියල් වත්තට ගොස් දවස් තුනක් ගත වී ය. ගෙදර නොපැමිණියේ කුමක් නිසා ද? පියල් දකින්ටත් ඔහුගේ ඇඟේ හැපෙන තෙක් ළං ව ඔහු හා කතාබහ කරන්ටත් නන්ද ආසා කළා ය. ඇට ඇගේ තනිකම දැනෙයි. ඈ සාලයෙහි දොර ඇර ආලින්දයට පිවිස මහ දෙපස දෙවරක් බැලූවා ය.

මුහුදෙන් එන මන්ද මාරුතය ඇගේ හිසත් ගතත් මදක් සිහිල් කෙළේ ය. තිත්ත අඳුරෙන් අඳ වුණු නුවන් ඇති ඇගේ දෙකන් තියුණු වී ය. අනික් අතට හැරුණු ඈට මෙතෙක් අඳුරෙන් වැසුණු හන්දියට ළඟාවන මොටෝරියක එළිය පෙනිණ; ඇන්ජිමෙහි රොස් පරොස් ගෝසාව ඇසිණ. එය තම සැමියාගේ මොටෝරිය ලෙස ඈ අඳුනා ගත්තා ය. දිගු කලක් සැමියාගෙන් වියෝවූවක ලෙස ඈ මිදුලට බැස පියල් පිළිගත්තා ය.

''මම ගෙදර නා නිසා නන්ද බයෙන් ඉන්නවා ඇතැයි හිතුවා'' පියල් සිනාසෙමින් කීවා ය. ''නන්ද මෙතරම් රෑ වනතුරු අවදියෙන් උන්නේ ඇයි?''

''මම අද අනුලා එක්ක කතා කරකර උන්නා''යි ඈ ඉර්ජුවම පිළිතුරු දුන්නා ය. ''මට නිකම් ඉස්තෝප්පුවට එන්න හිතුණා; ඉස්තෝප්පුවට ආ හැටියේ අද පියල් එතියි හිතුණා.''

නැවු නළා හඬ ඇසුණු විගස සාලයේ දොර ඇරගෙන ආලින්දයට යන්ට ඈට සිතුණේ කුමක් නිසාදැයි ඈ නොදනියි. ආලින්දයට පිවිසි විගස පියල් එතියි ඈට හැඟුණේ මොටෝරියෙහි එළිය දකින්ට පෙර ය.

''බත් කාලා ද?''

''ඔව්. තානායම් පළට ගොස් කෑවා.........''

මඳ සිනාව නිසා ඔහුගේ මුහුණත් මදමත උතුරුවන දෙඇසත් පහන් වී ය.

''කෑවා විතරක් නෙවි.........'' කියමින් නන්ද ද සිණාසුණා ය. ''බීලාත් තියෙනවා!''

''බ්‍රැන්ඩි ටිකක් බිව්වා.........ඇඟට අමාරු නිසා. කොන්දෙස්තර රබර් රාත්තල් හයසීයක් විකුණා තියෙනවා. මම එයාගෙන් ඒ මුදල ගත්තා.''

"ඇයි අස් නොකළේ? ඒ මිනිහා මීට පස්සෙ දැනගන්න ඉඩ නොතියා හොරකම් කරාවි."

"නෑ. එයාට මට නොදැනෙන්න හොරකම් කරන්න බැහැ"යි කියමින් පියල් නන්දගේ අත අල්ලා ගෙන කාමරයට ඇතුළු වූයේ ය.

ඔහු ඇඳුම් උනා ඉවත තබා අලුත් සරමකුත් බැනියමකුත් හැඳ ගත්තේ ය.

"මූණ හෝදු ගන්න; වතුරු නිවේවි"යි නාන කාමරයෙන් එළියට ආ නන්ද කීවා ය.

"මම නානායම් පළේදී හොඳට මූණ සෝදු ගත්තා, ආයිත් සෝදන්න ඕනෑ නෑ."

"ඒ කොන්දෙස්තරම නවත්තාගත්තාට මම නම් කැමැති නෑ. හොරකම් කරලා පුරුදු මිනිහා ආයිත් හොරකම් කරාවි."

"මට නොදැනෙන්න එයාට හොරකම් කරන්න බෑ. මිනිහා හොඳ වැඩකාරයා, හරි සූරයා. එයා වත්තේ වැඩ කරන්නේ දැඩි ආශාවකින්; පඩිය සළකාගෙන නෙවි. එයා වගේ වත්තේ වැඩට ආදරේ ඇති මිනිහෙක් ලැබෙන්නේ කලාතුරකින්."

"එයා අහු නොවෙන්න හොරකම් කළොත්?........."

"අහු නොවෙන්න හුඟක් හොරකම් කරන්න බැහැ. ඒ මිනිහා ටිකක් හොරකම් කරගත්තත් මට අලාබයක් නෑ. එයාට ගෙවන පඩිය වගෙ හතර ගුණයක් ගෙවාලත් එයා වගෙ සමර්ත-යෙක් සොයා ගන්න බැහැ.

අඩු පඩි ගෙවා මිනිසුන්ගෙන් වැඩි වැඩ ගන්නා පියල් ඔවුන් කරන සුළු සොරකම් ඉවසන්ට ද පුරුදු වූයේ ය. තමාගේ සියලුම සේවකයන් ඉඩ ලැබුණොත් සොරකම් කරතියි යන හැඟීම ඇත්-තෙකි ඔහු. එහෙයින් ඔහු හොරකම් නොකරන සේවකයන් සොයනු වෙනුවට තමාගේ සේවකයන් සොරකම් කරනු වැළැක්වීමට උප-ක්‍රම නිපදවීම සඳහා වෙහෙසුණේ ය. පියල් වෙළඳාම් උගන්නා කාලයේ කපටිකම් පමණක් නොව තක්කඩිකම් ද කෙළේ ය.

"සල්ලි හම්බකරන්න දැන් ඔච්චර වෙහෙසෙන්නේ කුමටදැ"යි ඇඳෙහි වැතිරි නන්ද තම සැමියාගේ බඳ වටා අත යවමින් ඇසුවා ය.

නන්දගේ හිසින් ද සුවඳ සුනු ඇතුල්ලූණු මුහුණෙන් ද නිකුත් සුවඳින් පිබිදුණු ආසාව ඇති පියල් නන්ද අල්ලා වඩාත් ළං කර ගත්තේ ය.

"සල්ලි නැති නම් නගරෙ මිනිසුන් අපට මෙච්චර සලකන්නෙ නෑ. තාලිකා කසාද බන්ද දෙන්නේ සිවිල් නිලධාරියෙකුට."

Scanned by CamScanner

''නාලිකා කැමැති නූණොත්'' කියමින් නන්ද සිනාසුණා ය. කඳුළු උනන්නාක් මෙන් ඇගේ දෙනෙතින් ආසාව ඉතිරෙයි.

''ඒක එයාගේ වැඩක්.''

විදුලි පහන් නිවන ලද කාමරය එළිය වූයේ බිත්ති මුල්ලේ කනප්පුවක් උඩ දැල්වෙන ඉටිපන්දමෙන් පැතිරෙන මුදු එළියෙනි. කන්නාඩි මේසයෙහි එක් අංශයක වූ පිත්තල අඩියෙන් නැගී සිටින හඳුන්කූරු තුනකින් නඟින දුම් කෙහෙළි සුළඟින් ලෙලෙන සීත් පට රෙදි පටි සේ කන්නාඩියෙහි පිළිබිඹුවනු නන්ද ආසාවෙන් බලා සිටියා ය.

''සමරවීර කඩුවෙල තානායමේ උන්නා''යි පියල් රහසක් කියන්නෙක් මෙන් තෙපලේ ය.

''සමරවීර?'' යි නන්දට නිතැතින් කියවිණ.

''ඔව්...........එයාත් එක්ක නෝනා කෙනෙක් උන්නා.''

''කවුද?''

නන්ද සසල වන තමාගේ සිත මැඩගන්ට වෑයම් කළා ය.

''වෝල්ටර් දියලුමගේ නෝනා.''

ඉදිකටුවක් තමාගේ කයෙහි කෙළින් නොව හරස් අතට ඇනෙනු දකින්නක මෙන් නන්ද සිතින් හා කයින් මද වේදනාවක් වින්ද ය. පියල් දෙඩීම නැවැත්වූ කල නන්දගේ ඒ වේදනාව සන්සිඳිණ. සමරවීර අනික් ගැහැනියක සමඟ තානායමෙහි රැය ගතකරතියි ඇසූ නන්ද තුළ ඊර්ෂ්‍යාවක් හටනොගත්තේ ය. ඈ සමරවීරට ආලය නොකළා ය. ඈ සමරවීර දැකීමෙන් හා ඔහු හා කතාබහ කිරීමෙන් සන්තෝෂයක් ලැබුවා ය. ඒ සන්තෝෂයෙන් තෘප්ත විය නොහැකි වූ ඈ ඔහුගේ කායික ස්පර්ශය පැතුවා ය.

පියල් නිසා ඈ තුළ උපන් ආදරය තැන්පත් හැඟීමක් වී ය. සමරවීර හා ඈ අතර ඇති හාදකම අනුලා දැනගැනීම නිසා නන්දගේ අර තැන්පත් හැඟීම වඩාත් දැඩි වී ය.

''තානායමට නොගොහින් කෙළින්ම ගෙදර ආවා නම් මෙච්චර රෑබෝ වෙන්නේ නෑ''යි කියමින් නන්ද පියල්ට වඩාත් ළංවූවා ය.

Scanned by CamScanner

# 10

අනුලා කහින විට සෙමත් සමඟ ලේ බිඳු නිකුත් වන බව දැනගත් පසු නන්ද දරුවන් කොග්ගලට කැඳවාගෙන නොගියා ය. දරුවන්–විශේෂයෙන් ඇලන්–දකින්ට නො ලැබීම නිසා අනුලා ශෝක වන බව නන්ද දනියි. ඈ වෙතට දරුවන් එක්ක යනු දැකීමට පියල් කොහෙත්ම කැමැති නැත.

"මම දැන් නිතර කහින්නේ නෑ. කැස්සත් දැන් ලේ යන්නේ නෑ" යි අනුලා මේ වර ඈ බලන්ට ගිය නන්දට කීවා ය. ඈ එසේ කීවේ ඇලන් දකින ආසාවෙනි. එහෙත් 'ඇලන් එක්ක එන්නය'යි ඈ යෝජනා නොකළා ය.

"ලොකු අම්මා බලන්න යන්න ඕනෑ" යි කියමින් ඇලන් දෙවරක් තම මව සමඟ කලහ කළේ ය.

"ලෙඩෙක් බලන්න ගිය හැටියේ ඒ ලෙඩේ, ලෙඩ බලන්න යන කෙනෙකුට බෝවෙන්නේ නෑ මම්"යි තම මවගේ අදහසට පට-හැණි වූ ඇලන් තෙපලේ ය. "ලොකු අම්මා අපට කොච්චර ආදරෙන් හිටියා ද? රෑට නිදගන්න ගියාම මට ලොකු අම්මා මතක් වෙනවා. ලොකු අම්මා බලන්න දවසක අපි එක්ක යන්න."

අනුලාගේ කයත් මුහුණත් පෙර මෙන් දැන් බිය නො එළවන බව නන්ද සිහි කළා ය. එහෙත් ඇගේ සුවදුක් සොයන්ට මීට පෙර වරක් කොග්ගලට ගිය අවස්ථාවෙහි හටගත් බිය ඈට සිතින් බැහැර කළ නොහැකි ය. කෙමෙන් වැඩුණු සයරෝගය විසින් විනාශ කළ කය, මුහුණ හා සන්තුෂ්ටිය ද ඇති තම සහෝදරියගේ මුහුණ දුටු නන්ද තුළ හටගත්තේ මරණය සිහි කරවන බියකි. අනුලා ලේ බිඳු සමඟ සෙම නිකුත් කරමින් කහිතියි ඇසූ ඈ තම දරුවන් කැඳවා-ගෙන ඒම විපතකට හේතු විය හැකියයි සිතුවා ය.

මේ වර කොග්ගලට ගිය නන්ද තුළ තම සහෝදරිය දුටු විගස හටගත්තේ බිය නොව සන්තෝෂයකි. අනුලා කෙමෙන් සුව ලබයි. 'මම දැන් නිතර කහින්නේ නෑ. කැස්සත් ලේ යන්නේ නෑ' යි ඈ තෙපලේ ද රෝගය සුව වෙතියි යන විශ්වාසයෙනි. එහෙත් දරුවන් සමඟ යෑමට සිතන විට යටගිය බිය නන්දගේ සිතට නඟියි.

"ලොකු අම්මා දකින්න ඔයහැටි ආසා නම් ඇලන් එක්ක යන්නම" යි නන්ද කීවා ය.



Scanned by CamScanner

නන්ද පවුලේ දෙස්තර හමුවීමට ගොස් අනුලාගේ සුවදුක් කීවා ය.

"ළමයින් ලෙඩා බලන්න එක්ක ගියාට වරදක් නැද්ද ?"

"ළමයින් බෝවන ලෙඩක් හැදුණ ලෙඩෙක් බලන්න එක්ක යන්නේ කුමට ද ?"

"ලෙඩා ළමයින්ගේ ලොකු අම්මා, ඒ ගොල්ලන් එයාට හොඳට ආදරෙයි. බලන්න යන්න ඕනෑයයි කියමින් මට වද දෙනවා."

දෙස්තර කල්පනා කෙළේ ය. නිරෝගී සිත කය ඇති ඒ ළමයින් තිදෙනාම තමා විසින් පරීක්ෂා කළ බව ඔහුට සිහි වී ය.

"එක්ක යන්න" යි දෙස්තර කීවේ ය.

"එක්ක ගියාට බයක් නැද්ද ?"

"මට ඒ ගැන කිසිවක් කියන්න බැහැ. ඒ ගැන සිතා ගැනීම ඔබ සතු කාරියක්."

"මම එහෙම ඇහුවාට අසතුටු වෙන්න එපා" යි නන්ද ලජ්ජාවෙන් කීවා ය. "මම එහෙම ඇහුවේ මගේ හිතේ තියෙන බය නිසා. මගේ වැඩුමල් පුතා ඉගෙන ගන්න හොඳටම සමර්තයා. රාජකීය විද්‍යාලයෙහි හැම පන්තියෙහි දීම පළමුවන තෑග්ග දිනා ගත්තා."

"ඒ ළමයා ගෙදර ඉන්දෙද්දී යන එක නොව කරන්න තියෙන්නේ."

"යන්න ඕනෑමයයි කියන්නේ එයා !"

"ලෙඩ ගැනත් දෙස්තරුන් ගැනත් ඔය තරම් හිතන්න ඕනෑ නෑ" යි කියමින් දෙස්තර සිනාසුණේ ය. "ගෙයි නිදගන්න විට සමහර විටක වහලේ පරාළයක් කැඩී ඇඟ උඩ වැටීමෙන් තුවාල ලබන්ට බැරිද ? විදුලි පහන් පත්තු කරන්න ගොස් ඇනයට අත ගහන කෙනෙක්, සමහර විට විදුලි සැරය ඇඟට ඇතුල් වීමෙන් මැරෙන්න පුළුවනි ! අපි හොඳින් නොදන්නා දේ ගැන දැඩි විස්වාසයක් ඇතිව ඕනෑවට වඩා හිතන්න හොඳ නෑ."

ලජ්ජාවූ නන්ද දෙස්තරගේ කාමරයෙන් පිට වූයේ සිනා-සෙමිනි.

නන්ද, දරුවන් තිදෙනා ද සමඟ අනුලා බලන්ට තම මවු-පියන්ගේ ගෙදරට ගියා ය. ඇස් ලැබූ කන ගැහැනියක තම දරුවාගේ මුහුණ දැකීමෙන් සන්තෝෂ වන්නාක් මෙන් ඇලන්ගේ මුහුණ දුටු අනුලා සන්තෝෂ වූවා ය. ඇලන් බඳගෙන මුහුණ සිඹින දැඩි ආසාව නිසා නිතැතින් ඉස්සුණු ඇගේ දෑත පණ නැති

වූවාක් මෙන් සෙමින් පාත් වී ය. අනුලා නන්ද ගේ මුහුණ බැලුවා ය.

තමා බෝවන ලෙඩකින් පෙළෙතියි යන හැඟීම අනුලාගේ ශෝකයටත් කෝපයටත් හේතු වෙයි. ඒ හැඟීම ඇ තුළ බහාලූයේ නගරයේ දොස්තරුන් ද, පියල් හා නන්ද ද විසිනි. ඒ හැඟීම අනුලාගේ සිතින් පැලවීමට වෑයම් කරන්නේ පියල්ගේ මව පමණි. තම දරුවකු සහෝදරියක කවර ලෙඩකින් පෙළුණ ද ලෙඩා වෙන් කොට තබා අන්‍යයන් ලෙඩාගේ අහලකට නොයැම ගැමියන්ගේ සිරිත නොවන බව සිහි කළ අනුලා උදහස් වූවා ය.

ගමෙහි ඇතිදැඩි වුණු අනුලා නාගරික සිරිතට අවනත වූයේ අමනාපයෙන් නොවේ. එහෙත් දැන් ඇ ඇගේ ඒ ක්‍රියාව සිහි කරන්නේ අමනාපයෙනි. තමාගේ පිහන් කෝප්පවලම කන බොන පියල්ගේ මව සිහි කරන අනුලා යටි සිතින් සන්තෝෂ වෙයි.

ඇලන් තම මව කුප්පමින් ලොකු අම්මාගේ කරවටා අතක් දමාගෙන ඇගේ ගෙලත් කම්මුලත් සිම්බේ ය.

''ඔය මදෑ'' කියමින් නන්ද තම මුහුණට නඟින අසන්තෝෂය මැඩගන්නට වෑයම් කළා ය. නාලිකා හා චන්ද්‍රසෝම ද ඇලන් අනුකරණය කළෝ ය.

''ලොකු අම්මා මහන්සි කරන්න එපා'' යි කියමින් නන්ද මේ වර සිනාසෙන්ට වෑයම් කළා ය. පියල්ගේ මව තම ලේලිය දෙස බැලුවේ අසන්තෝෂයෙනි.

''ලොකු අම්මාට මහන්සියක් නෑ. පුතාලාත් දුවත් ආදරේ කිරීම ලොකු අම්මා වෙහෙසීමක් වෙන්නේ කොහොමද ?''

''ආච්චි එහෙම කිව්වට මොකොද ලොකු අම්ම ළඟට අපි යනවට මම් වැඩිය කැමැති නෑ'' යි නාලිකා තෙපලා ය.

නැන්දත් ලේලිත් අතර කටගැහුමක් වෙතියි බියගත් අනුලා නැඟී කිසියම් වුවමනාවකට යන්නාක් මෙන් අනික් කාමරයට ගියා ය. දෙනෙතට ඉනූ කඳුළු පිසදමා ඇ රැකඩ මුව ඔළුවක් දැතින් ගෙන කාමරයෙන් පිට වූවා ය.

''ලොකු අම්මට ඕක උස්සන්න හොඳ නෑ; බර වැඩියි'' කියමින් ඇලන් රැකඩ හිස අතට ගත්තේ ය.

''බරක් නෑ; කඳුරු ලීයෙන් කපාපු මුව ඔළුවක්'' යි කියමින් අනුලා යළිත් ඇඳෙහි වාඩි වූවා ය.

සැබෑ අං තට්ටුව නිසා ලී මුව ඔළුව, ඇලන් සිතුවාට වඩා මඳක් බර ය. මුව අං තට්ටුවක් වද්ද ඉටියෙන් වසා සායම් ගා

තින් ද තබන ලද ඒ මුව හිස දකින කවරෙක් වුව ද බෙහෙත් කවා පුළුන් ඔබා සකස් කරන ලද මුව ඔළුවක් යයි රැවටෙයි.

"මේ අලුත් මුව ඔළුවක් කොයින් ද ?" යි නන්ද පුදුමයෙන් විචාළා ය. "අං ගැළවීගිය පරණ මුව ඔළුව මම අවුරුදු ගණනකින් දැක්කේ නැ."

"මේ පරණ මුව ඔළුව තමයි" කියමින් අනුලා සිනාසුණා ය. "නොතාරිස් අප්පු හිටි කාලේ එයා තාත්තාට තෑගි කළ මුව ඔළුව. අං නටවුව ගැලවිලා සායමත් මැකී ගොහින් තිවුණ ඒ මුව ඔළුව හදන්ට දුන්නෙ අවුරුදු පහළොවකට පමණ උඩදී. මීට සුමාන තුනහතරකට උඩදී මට මතක් උණා, මුව ඔළුව හදන්න දුන්නේ නොතාරිස් අප්පුගෙ පුතාට බව. නොතාරිස් අප්පු මැරුණට පස්සෙ පුතා රූකඩ කපන්න පටන් ගත්තා. නොතාරිස් අප්පු තරම් හොඳින් රූකඩ කපන්න එයා දන්නේ නැහැ. නමුත් රූකඩ පින්තාරු කරන්න එයා හරි සමර්තයෙක් උණා"

"මෙච්චර කල් මේක තිළුණේ නොතාරිස් අප්පුගේ පුතා ළඟද" යි ප්‍රශ්න කළ නන්ද හරින ලද කවුළුවෙන් පෙනෙන කොග්ගල ඔය දෙස බැලුවා ය. බිඳ වැටුණු ගෙයක ගරා වැටුණු බිත්තියකින් කැබැල්ලක් ඔයට යන පාරෙහි දකුණු පැත්තේ බෝවිටියා පඳුරක් අතරින් නන්දගේ දෙනෙතට හසු වී ය. නොතාරිස් අප්පුගේ රූකඩ මඩුව සිහි කරවන සොහොන් කොතක් සේ අහසට නැඟුණු තුඩ ඇති බිත්ති කැබැල්ල නන්ද හඳුනා ගත්තා ය. අඳුර වැටෙන්ට පෙර, දර සෑයෙන් නික්ම පැතිරෙන එළිය වැනි සැඳෑ එළියෙන් කොළපාට ගන්නා අහස නන්දගේ දෙම්නස දියුණු කරයි. අහස පිළිබිඹු කරන වානේ පටක් සේ තිසල වූ ගඟ දිය තැනින් තැන සැඳෑ එළියෙන් රත් පැහැ ගනියි, ගඟින් එගොඩ ක්ෂිතිජයෙහි වළාන් දැලි පැහැගත් ගස් කොළන් නන්ද වළපන්න තරම්, ශෝකාතුර කරයි.

'එයා මේක අලුත්වැඩියා කරලා පින්තාරු කරලා තියෙන්නෙ ළඟදි; හදිසියේ මතක්වෙලා මම එයාට පණිවිඩයක් යැවුවා. මිනිහ ඇත්ත කිව්වා. අවුරුදු ගණනක් සුන්බුන් ගොඩේ තිළුණු මුව ඔළුව මිනිහ අලුත්වැඩියා කොට පින්තාරු කරලා විකුණන්න මහන්සි අරගෙන තියෙනවා. රුපියල් පහකටවත් ඒක ගන්න කෙනෙක් නොසිටි නිසා මිනිහා ඒක රුපියල් දෙකකට උකස් තිව්වා. මම රුපියල් දෙකයි පොලියයි ගෙවා ගෙන්නාගත්තා."

ඇලන්, නාලිකා හා චන්ද්‍රසෝම ද, මේසය උඩ තබන ලද මුව ඔළුව බලා සන්තෝෂ වෙති. නැන්දම්මාත් ලේලිත් කොහු-මිටි හරස් කරගනු වළකන්ට ලැබීම අනුලාගේ සන්තෝෂයට හේතුවකි. අනුලා මුව ඔළුව කාමරයෙන් එළියට ගත්තේ දරුවන් සන්තෝෂ කරන අදහසිනි.

Scanned by CamScanner

''නොතාරිස් අප්පුය කිව්වේ කාට ද ?'' යි ඇලන් ප්‍රශ්න කෙළේ ය.

''ගමේ කෝපි කඩයක් දමාගෙන හිටි මිනිහෙක්'' යි නන්ද තෙපලා ය. ''ඒ මිනිහා රූකඩ කපන්න කාගෙන්වත් ඉගෙනගත්තේ නෑ. සෙල්ලමට රූකඩ කපන්න පටන් ගත්තා තුන්-හාර මාසයක් යන්න ඉස්සර එයාගේ රූකඩ දුටු දුටු මිනිහා ගන්න උණා. මිනිහා ඊට පස්සේ සතුන්ගේ රූකඩ කපා පින්තාරු කරලා ගාල්ලට අරගෙන ගොස් වැඩි ගණන්වලට විකුණුවා.''

''අලුත් දේ නිපදවන්න පුළුවන් මිනිහෙක් වෙන්න ඕනෑ'' යි කියමින් ඇලන් මුව අං දෙක අල්ලා බැලුවේ ය. ''හැබෑ මුව අං තට්ටුවක් මේ ලී ඔළුවට අල්ලන්න හැමෝටම හිතෙන්නේ නෑ. මෙච්චර බර අං තට්ටුවක් කදුරු ලීයේ හයි කෙළේ කොහොම ද?''

''ඉස්කුරුප්පු ඇනවලින්'' යි අනුලා කීවා ය.

''බිත්තියේ සවිකරලා තොප්පි තියන්න පුළුවන් විදියට මේක ගමේ මිනිහෙක් හැදූ එක පුදුමයක්.''

''බෝකොළ හැඩේට කපාපු ලැලි කෑලිවල සවි කළ මුව අං තට්ටු, තොප්පි තියනු සඳහා සිදදියේ මිනිස්සු පාවිච්චි කළා. ඔවුන් මුව අංතට්ටු එසේ පාවිච්චි කෙළේ නොතාරිස් අප්පු මුව ඔළු කපන්න ඉස්සර. මුව අං තට්ටු හැබෑ මුවකුගේ ඔළුව වැනි රූකඩයට සවිකරන්න පළමුව හිතුවේ නොතාරිස් අප්පු වෙන්න පුළුවනි.''

''ඉස්සර ගාල්ලේ පොහොසත් මිනිස්සුන්ගේ ගෙවල්වල ඉස්තෝප්පු බිත්තිවල මුව ඔළු ගහලා තිව්වා'' යි නන්දගේ නැන්දම්මා සිනාසෙමින් කීවා ය. ''කාලෙකදී ඒ පන්නෙ නැති උණා. ඉංග්‍රීසි ඒගොල්ලන් මුව ඔළු උගුල්ලා දමා තොප්පි එල්ලන්න ලී ඉස්කිරිඤ්ඤ ඉස්තෝප්පුවේ තියන්න පටන් ගත්තා. ඊට පස්සෙ නොතාරිස් අප්පු මුව ඔළු කැපීම අත්ඇරියා.''

''මම මේක කොළඹට ගෙනියනවා'' යි ඇලන් කීවා ය.

''අම්මා කැමතිවෙන එකක් නෑ.''

අනුලා මේසයට ළංව පිත්තල පහනෙහි වැටිය මඳක් දික් කොට පත්තු කළා ය. මුදු එළියෙන් වඩාත් එළිය වූයේ මුව ඔලුව බලමින් සිටි ඇලන්ගේත් නාලිකාගේත් මුහුණුයි.

අනුලාගේ මුහුණින් හා දෙනෙතින් උතුරන්නේ සොම්නසකි-දරුවෝ ගමට පමණක් නොව මහගෙදරට ද ප්‍රිය කරති. තමා පමණක් මහගෙදරින් පමණක් නොව ගමින් ද පිටවන්ට නොඉවසුම්ව දෙම්නසින් ඉන්නේ කුමක් නිසාදැයි නන්දට නොවැටහෙයි : කුඩා කල පටන් මා ජීවත් වූයේ පොල් තෙල් පහනින්

එළිය කරනු ලැබූ කාමරයක ය; පොත් කියවූයේ පොල් තෙල් පහන් එළියෙනි. අනුලාගේ කාමරය හැර අනික් කාමරවලින් දුන් නඟින්නේ ඇතුළුවූවකු කිවිස්සන මුඩු පුස්ඹකි. අම්මා තම කාමරයට පිවිසෙන්නේ රැයෙහි නිදනු පිණිස ය. එද පාළු කාමරයක් වැන්න. අනික් කාමරවල තෙත් බැහුණු කොට්ට මෙට්ට හා කබල් ඇතිරිලි මගේ සිත ද තෙත් බස්සයි.

තමාගේ උපන් ගමත් ගෙදරත් නිසා නඟින සුහද හැඟීම් අවමඟුල් ගෙයකට පිවිසියකගේ දොම්නස් හැඟීම් වලට හැරෙනු දත් නන්ද කනගාටු වූවා ය. අවිවාහකව සිටි කාලයේ ඇ කවර දෙයක් ගැන වුව ද වහා තීරණයට බැස්සා ය. එහි එල්බ නිර්භයව තමා විසින් කළයුතු දේ කළා ය. දැන් ඈට තමා හරියයි සිතන අදහසෙහි ම පිහිටා ක්‍රියා කළ නොහැකි ය. ගම මතක නැති කොට නගරයේ ඉහළම පන්තියට නඟිනු පිණිස වුවමනා උසස්ම උගැන්ම තම දරුවන්ට ලබාදීමට නන්ද ආශා කරයි. මවත් සහෝදරියත් නිසා ගැමි පරිසරය පිළිබඳ හැඟීම් ඈට සිතින් ඉවත් කළ නොහැකි ය. මවටත් අක්කාටත් කළයුතු සත්කාර හා කායඹියන් නොපිරිහෙලා කරතත් නන්දට එයින්ම තෘප්ත විය නොහැකි ය. මව කරින් ගෙන සයුර තරණය කළ බෝධිසත්වයන් පිළිබඳ කථාව ඈට සිතින් බැහැර කළ නොහැකි ය.

පරපුරේ අතීතය විසින් අරක් ගන්නා ලද තැනකි මහගෙදර. මහගෙදරට එන හැම අවස්ථාවෙහිම නන්දගේ ශෝකය වැඩෙයි. ඈ තුළ අනියත බියක් හටගනියි. තම පරපුරේ අතීතය මහගෙදර ඉතා සෙමින් කාබාසිනියා කරතියි නන්ද හඟියි. පියා ද තම පරපුර නමැති අතීතයට එක් වී ය. ඒ අතීතයෙහි කායික ස්වරූපය මහගෙදරයි. මව, මියගිය තම සැමියා පමණක් නොව පරපුර ද බදගන්නාක් මෙන් මහගෙදර බදගනියි. ඈ සිත කය දෙකින් කෙමෙන් දිරන්නේ මහ ගෙදර දිරන්නාක් මෙනි. අනුලා සිත කය දෙකින් දිරවන්නේ ද පරපුරේ අතීතය විසිනි. ඈ යළිත් මහ ගෙදරට කැඳවූයේ ද අතීතය විසිනි. සිත කය දෙක දෙදරවන තරම් අහේතුක බියක් නන්ද තුළ හටගත්තේ ය. 'උපන් ගම අත්හැරීම වැදූ මව හැර දැමීම වැන්න'යි නැන්දම්මා තමාට දෙස් නඟන බව නන්ද අසා ඇත.

අනුලාගේ ඇඳ ළඟ කනප්පුව උඩ සුදු වැලියෙන් පිරුණු උණ පුරුක් අඩිය මැද ගැසුණු හඳුන් කූරෙන් නඟින සුවඳ නන්දගේ සිතෙහි එකිනෙකට පටහැනි හැඟුම් නඟන අරමුණක් වී ය.

ගැමියන් හඳුන්කූරු පත්තු කෙළේ පන්සලෙහිදී පමණි. අනුලා රැයෙහි හඳුන්කූරු පත්තු කරන්නේ කොළඹ ජීවත්වන නන්ද අනුකරණය කරන්නක ලෙසිනි.

Scanned by CamScanner

හඳුන් දුම් සුවඳ ඇසූ නන්දට පළමුව සිහි වූයේ තරුණ වියෙහිදී වැඳුම් පිදුම් කරන්ට ගිය පන්සල ය; අනතුරුව සිහි වූයේ තමාගේත් පියල්ගේ විෂයාසක්ත ජීවිතයයි. කොළඹදී තමා විහාරස්ථානයට යන්නේ වෙසක් පොහෝ ද පමණක් බව සිහි කළ නන්ද තමාටම දෙස් නඟා ගත්තා ය. හැම පසළොස්වක පෝය දවසෙහි නන්ද හොඳින් ඇඳ පැලඳගෙන හඳුන්කූරු ඉටිපන්දම් හා මල් වට්ටියක් ද වැඩකාරියක ලවා ගෙන්වාගෙන තම සහෝදරියත් මවත් සමඟ ගමේ පන්සලට ගියා ය. විවාහවූ පසු ද ඒ සිරිත කඩ නොකළා ය. ඇලන් ඉපිද අට මසකට පස්සේ නන්ද තම බිළිඳා ගමෙහි විහාරස්ථානයට ගෙන යනු පිණිස ගමට ආවා ය. කොළඹින් ගෙනා ඉටිපන්දම් හඳුන්කූරු කපුරු හා උඩ රටින් ගෙන්වාගත් සුදු මල් ද ගෙන ඇ අනුලාත් මවත් නැන්දත් සමඟ ඇලන් වඩාගෙන ගමේ පන්සලට ගොස් මල් පහන් පුද කිරි බෝතලයකින් බෝරුක නාවා තම දරුවා තිසරණ සරණින් හා දෙවියන්ගේ පිහිටෙන් නිරෝගිව ජීවත් වෙමින් හොඳින් ඉගෙන ගනීවායි පැතුවා ය. නන්ද ගමෙහි පන්සලට ගෙනාවේ ඇලන් පමණි. නාලිකා උපදින්ට පෙර ඒ ආගමික සිරිත නන්දගේ සිතින් ගිලිහිණ. ඒ සිරිත තමා ඇසුරු කරන නගරයේ උගත් ගැනුන්ගේ සිනාවට ඉලක්කය වෙතියි ඈ සිතුවා ය.

හඳුන් දුම් සුවඳ ඇලන්ට නොව නාලිකාට ප්‍රිය වී ය; චන්ද්‍රසෝම මිදුලට බැස අඳුර නොතකා ලොවි ගසට ගල් ගසමින් ඉඳුණු ලොවි පොකුරු කඩා බිම දමයි. ඇලන්ගේ නෙත් ඇදුණේ හඳුන්කූරු තුඩින් නැඟී ලියවැලක් මෙන් ලෙලෙමින් අතුරුදහන් වන සිනිඳු දුම් කෙහෙළි වලට ය. ඉරටු තුඩක් සේ පටන් ගන්නා දුම්පට, සුළඟින් ගත් සියුම් පට රෙදි පටියක් මෙන් ලෙලෙමින් නැඟී සුළි නඟා යළිත් කුණ්ඩලීවල ස්වරූප ගනියි. අනතුරුව දුම් පට සැලෙන සෙමෙර වලග මෙන් විසිර අතුරුදහන් වෙයි. හඳුන් කූරෙන් නොනැවතී නොබිඳී නගින දුම්පටෙහි නෙත් රඳවාගත් ඇලන්, ඇසින් ඇසිය හැකි සංගීතයක් ඇසුවකු මෙන් සන්තෝෂ වෙයි. 'නංගි බලන්න'යි කියමින් ඇලන් නාලිකාගේ අත අල්ලා ගත්තේ ය. මඳ වේලාවක් සඳුන් දුම් කෙහෙළි දෙස බලා සිටි නාලිකා ගුඪ ලොවකට පිවිසියක මෙන් මෝහනය වූවා ය.

''ආච්චිලයි ගෙදරට ගොහින් බත් කාලා නිදගන්නේ එහේ''යි කියමින් නන්ද අසුනෙන් නැංගා ය.

''ආච්චි ඉන්නේ මෙහේ නොව''යි නාලිකා කීවා ය.

''ආච්චි දූත් ගෙදර යනවා. ආච්චි මෙහේට ආවේ බත් උයන්න පංගාඩම් කරලා''

"මුනුපුරාලත් මිනිපිරිත් අපේ ගෙදරට යන්න ඕනෑ. අද රෑට කෑම කන්නේ එහෙන්" කියමින් පියල්ගේ මව ද අසුනෙන් නැංගා ය.

"පුතාලාත් දුවත් ගොහින් බත් කාලා ඒ ආච්චිලයි ගෙදර බුදිය ගන්න. මෙහේ ඇඳවල් පමණයි; කුලිච්චන් තෙත් බැහැලා"යි කියමින් මාතරහාමිනේ පළමුව නාලිකාගේ මුහුණ සිම්බා ය. අනතුරුව ඇලන්ගේත් චන්ද්‍රසෝමගේත් මුහුණ සිඹ හිස අත ගෑවා ය.

ඇලන් තම මවත් සමඟ ගමන් කෙළේ සන්තෝෂයෙන් නොවේ. ලොකු අම්මා ළඟින් වාඩිවී ඇ සමඟ කතා කරනු මව නොඉවසූ බව ඇලන් දනියි. ලොකු අම්මාගේ රෝගය ගැන මව මෙතරම් බියගන්නේ කුමක් නිසා ද?

"රෑ කෑම කා නිදන්ට ගිය ඇලන් සිහි කෙළේ තම ලොකු අම්මා ය. ලොකු අම්මා ලෙඩෙන් මියෙතියි ඉව වැටුණකු මෙන් ඇලන් ශෝකවූයේ ය. ඇගේ ඇඟෙන් හා ඇඳුම්වලින් පෙර නිකුත්වූ සුවඳ ඇලන්ට පුරුදු ය. ඔහු ඒ සුවඳට ප්‍රිය කෙළේ ය. මේ වර ලොකු අම්මා වැළඳගත් ඇලන්ට දැනුණේ අර සුපුරුදු සුවඳට වෙනස් සුවඳකි. ඒ සුවඳ දැනුදු ඔහුට දැනෙයි. ඔහු තමාගේ කමිසය අල්ලා ඉඹ බැලුවේ ය; අත් දෙක ද ඉඹ බැලුවේ ය. ඔහුට ලොකු අම්මාගේ ඇඟෙන් අද නිකුත් සුවඳම දැනුණේ ය. සඳුන් කූරු දුමෙහි සුවඳ ප්‍රිය නොවූයේ තමා වෙලාගත් අර සුවඳ නිසායයි ඇලන් සිතුවේ ය.

වරක් තම මව කොළඹ නගරයේ ගෙදරක ලෙඩකු බලන්ට යන විට ඇලන් ඇගේ තනියට ගියේ ය. ඒ ලෙඩාගෙන් නොවේ නම් කාමරයෙන් නිකුත් සුවඳ ඇලන්ට මතක ය. ඒ ලෙඩා තුන් අවුරුද්දක් ඇඳෙහි වැතිර සිට මිය ගියේ ය.

ඒ ලෙඩා බලන්ට ගිය අවස්ථාවෙහි තම මව තමා නිසා බිය නොගත්තා ය. ඔහුගේ ලෙඩේ බෝ නොවන්නක් වන්ට ඇත. එහෙත් මව, ලොකු අම්මාගේ ලෙඩේ බෝවෙතියි මෙතරම් බිය ගන්නේ කුමක් නිසාදැ යි ඇලන්ට සිතාගත නොහැකි ය. තමා ලෙඩවෙතියි මැරෙතියි ඇලන් නොසිතයි. කවර ලෙඩක් වුව ද ඔහුගේ බියට හේතු නොවේ.

ඇඳෙහි වැතුරුණු නන්දට නිදිමතක් නොදැනිණ. තමා සමඟ රෑ කෑම කෑ නැන්දම්මා අනුලාගේ කාමරයෙහි නිදනු පිණිස මහ ගෙදරට ගියා ය. "අනේ ඒ දරිවි තනියම නෙව කාමරේ නිද-ගන්නේ"යි මහගෙදරට යන්ට සිතූ නැන්දම්මා කීවා ය. "අනුලා තනියම ඉන්දෙද්දී මට මෙහි නවතින්න හිතෙන්නේ නෑ."

Scanned by CamScanner

අනුලාගේ රෝගය අරබයා ඇතැම් ගැමි ගැහැනුන් කියන කතාවක් තම නැන්දම්මා අදහන බව නන්දට දැනගන්ට ලැබුණේ රෑ කෑම කන්ට පෙර ය. අනුලාට රැයෙහි තනියම නිදන්ට හැරීම වරදක්යයි නැන්දම්මා සිතන්නේ ඒ ඇදහීම නිසා ය. විවාහ විය යුතු වයස ඉක්මවා සිටින අනුලා මදන යකින්නගේ දිස්ටියට හසු වූවකි. ඇ කෙට්ටු වන්නේ එහෙයිනි. ඇට වෙදකම් කරවීම නිෂ්ඵල ය. නන්ද වරක් ලෙඩ වූයේ මදන යකින්නගේ දිස්ටියට හසුවීමෙනි. තොවිලයෙන් හා යකැදුරු කමින් සුව වූ පසු ඈ ජිනදසට විවාහ කොට දෙන ලදි. ඈ නැවත ඒ යකින්නගේ දිස්-ටියට ගොදුරු නොවූයේ එහෙයිනි.

ගැමි ගැහැනුන්ගේ මේ කතාව තම නැන්දම්මා කියනු අසා සිටි නන්ද වචනයකුදු නොතෙපලා ය. ඈට පටහැණි වුවහොත් ඈ වඩාත් දැඩිව ඒ කතාව අදහන්නට පටන් ගනියි. අනුලාට යකැදුරු කම් කරවිය යුතුයයි නැන්දම්මා යෝජනා කළ විට නන්ද එය අනු-මත කළා ය. එහෙත් අනුලා කිපෙතියි ඈ සිතුවා ය. අනුලා තෙල් මතුරවා නූල් බන්දවාගත් නමුත් තොවිල්වලට තරුණ වියෙහි සිටම විරුද්ධ වන්නක බව නන්ද දනියි.

"අම්මා අනුලා කැමැති කරවාගෙන යකැදුරුකම් කරවන්න."

"අනුලා කැමැති වේවි" යි නැන්දම්මා දැඩි විශ්වාසයෙන් තෙපලා ය.

Scanned by CamScanner

# 11

බාල කල පටන් ගැමි පරිසරයත් අපිස් ජීවිතයත් කුලමානයත් විසින් හික්මවනු ලැබූ අනුලා අවුරුදු හයක් පමණ තමාගේ සිත කය දෙක ලෙවකන රෝගය හා සටන් කළා ය. ඇගේ හටන සාර්ථක වෙතියි මව හා නැන්ද පමණක් නොව නන්ද ද සිතුවා ය. තම රෝගය සුව නොවතියි යන හැඟීම අනුලාගේ සිතින් නම් කිසිම අවස්ථාවක තුරන් නොවී ය.

ඒ හය අවුරුද්දෙහිම මැදින්, බක්, වෙසක් තෙමස අනුලා ගත කෙළේ රෝගය ජය ගත්තක ලෙසිනි. වැස්සෙන් හා කුණාටුවෙන් තොර ඒ තෙමසින් වැඩි කාලයක් ඇ එළිමහනෙහි ජීවත් වූවා ය. වියළුණු පොළොවෙහි කෙළ ගණන් කුපයන්ගෙන් පිටවන වායුවත් වියලි සුළඟත් ආශ්වාසයෙන් අනුලාගේ සෙමෙන් පෙඟුණු පෙණ-හළු ද වියළීමෙන් සැහැල්ලු වෙයි. වැල වරකා අඹ හා කජු පුහුලන් සුලභවීම නිසා ගැමියන්ගේ සන්තුෂ්ටිය ද ඒ කාලය තුළ වැඩෙයි. මහගෙදර විසාල ගල් වැට අසළින් දිවෙන ගම්සබා පාරෙන් ඔබ පිහිටි සුදු වැලි තලාවෙහි වූ සෙල්ලම් පිටියෙන් උදය වරුවේ සිට කෙළි සෙල්ලමින් ප්‍රීති වන දරුවන් නහන ඔල්වර හඬ හවස් වන තෙක් නොනවතියි. බුහු කෙළියෙන් පැරදුණවුන් බිම වාඩිකරවා, දිනුවන්, ඔවුන් වටා යමින් කියන ජල්ලි කවි අසන අනුලා ද සිනා-සෙයි. ගම්සබා පාර මැද වළකජු කෙළින ගැමි දරුවෝ තමන්ගේ කෙළිය අවසාන වන තෙක් පාර දෙපැත්තෙන් එන කරත්ත නවත්වති. කරත්තකාරයෝ ද කරත්ත නවතා දරුවන් වළකජු ගසනු ආශාවෙන් බලා සිටිති.

වෙසක් පෝය දවසෙහි හවස් වරුවේ අනුලා, තම මව, සාද හා වැඩකාර ගැහැනිය ද හා එක්ව මහ ගෙදර ඉස්තෝප්පුවේ ගරාදිවැට උඩ පෙළට තබන ලද මැටි පහන්වල තෙල් වත්කොට තිර තබා දල්වීමෙන් සන්තෝෂ වෙයි. පියල්ගේ මව ද උතුරා යන තරම් සන්තෝෂයෙන් ඔවුන් හා එක්ව මැටි පහන් දල්වයි. මැටි පහනින් එළිය වුණු මලසුන් ගෙයින් නික්මෙන මල් සුවඳින් ඉස්තෝප්පු-වෙහිත් මිදුලෙහිත් වාතය සුවඳ වෙයි. පුරසඳ මඬලින් එළිය වුණු අහසෙහි නිර්මලත්වය දකින අනුලා සුරංගනා ලෝකයකට පිවිසි-යක මෙන් සන්තෝෂ වෙයි. නිල් වියනක සුළඟින් විසුරුවනු ලබන පුළුන් ගොඩවල් මෙන් සුදු වලා අහස පුරා පැතිරෙයි. අනු-ලාට රෝගය අමතක වෙයි. අහස, නෙතටත් සිතටත් අවිෂය වූ



Scanned by CamScanner

ගුඪ ලෝකයක් නොව පොළොවට ළං කොට අඳින ලද විසිතුරු සිත්තම් සහිත මහා වියන්පටක් සේ අනුලාගේ නෙත් සිත් පිනවයි.

හත් වන අවුරුද්දේ බක්වෙසක් දෙමස තුළ අනුලා ගෙයින් එළියට බැස්සේ කලාතුරකිනි. තමාගේ රෝගය නරක අතට හැරෙන බව අනුලාට හැඟිණ. කෙමෙන් දියුණු වුණු හතිය ඇති ඈට වෙහෙසත් දුබලකමත් දැනෙයි.

ඇලන් උගැන්ම හැරදමා ලන්සි තරුණියක සමඟ ලංකාව හැර ගිය බව ඇසූ අනුලා කාලය ගෙවූයේ තාන්තුවාවෙනි. සමස්ත ශාස්ත්‍ර ශාලාවේ උගන්නා ඇලන් අවසාන විභාගයෙන් උසස්ම ලෙස සමර්ථවනු දැකීමට ඔහුගේ මවුපියන් මෙන් ම අනුලා ද දැඩි ආශාවකින් බලා සිටියා ය. තරුණ වියෙහිදී විවාහ විය නොහැකි වූ අනුලාගේ සියලු ආසා හා ආදරය ද ඇලන් නිසා දරු සිනෙහයක වේශය ගත්තේ ය. ඇලන් නිතර දකින්ට නොලැබීමෙන් ඈ කෙමෙන් ශෝකාතුර වූවා ය.

අනුලා වැඩි උගැන්මක් නොලබා ගමෙහි ම වැඩුණක නමුදු හොඳ වැටහෙන නුවණක් ඇති ස්ත්‍රියකි. මුහුණුවරින් හා මනසෙහි තියුණුව ද විසින් අනුලා ඇලන්ට සමානයයි පියල් පමණක් නොව නන්ද ඇසුරු කළ එක් ගැහැනියක් ද කියනු අනුලා අසා ඇත. ඇලන් වයසට වඩා පැසුණු හිසක් ඇත්තකු බව අනුලාට හැඟුණේ රැයෙහි ඔහු තම උකුලෙහි හෝ තමා ළඟින් හෝ වාඩි කරවාගෙන ගම කතා කියූ ඇතැම් අවස්ථාවලදී ය.

ගම කතා ඇසීමෙන් ඇලන් හැකුළුණු මනසක් ලබතියි සිතු නන්ද ඇතැම් විටක අනුලාට දෙස් නැඟුවා ය. ඒ දෝෂාරෝපණය සාධාරණයයි සිතූ අනුලා ඇලන්ගේ ආශාව නැති කරන්ට වෑයම් කළා ය. සමහර විට ඈ ගම කතාවකින් උපුටාගත් මෝඩ පුවතක් වස්තු කොට ගෙන තමාම නිපදවූ අනන්මනන් කතාවක් කීවා ය. ඈ එසේ කෙළේ ඇලන්ට ගම කතා එපා කරවන අටියෙනි. ඇලන් වැඩි ආසාවෙන් හා සිනාවෙන් ඒ අනන්-මනන් වලට කන් දුන්නේ ය. ඔහු එවැනි කතා අසමින් විචාළ ප්‍රශ්න අනුලාගේ පුදුමයට හේතු වී ය. පොතින් පතින් වැඩි උගැන්මක් නොලැබූ ඈ ඇලන්ගේ වැටහෙන නුවණින් විස්මයට පැමිණියා ය. අනතුරුව ඈ මතක් කොට ඒ පැරණි ගම කතා වෙනස් නොකොට කියන්ට පටන් ගත්තා ය.

මුවන්තිස්ස කුමාරයාගේ කතාව මහත් ආසාවෙන් අසාගෙන උන් ඇලන් දෙතුන් වරක් කට කොනට සිනා නැඟුවේ ය. මුවන්-තිස්ස කුමාරයා කැලයට වැදී මුවන් දහසකට නායක මුවා අල්ලා-ගෙන උගේ පිටින් ගිහින් එතරට පනියි. මේ පුවත අසන විට ඇලන්ගේ කට කොනට නැඟුණේ සිනාවකි. අලින්තිස්ස කුමාරයා

Scanned by CamScanner

ඇමට අලියකුත් බිලිපිත්තට කිතුල් ගසකුත් ගෙන මාළු බැමේ ය. මේ පුවත ඇසූ විට ඇලන් සිනාසුණේ ය. යකඩතිස්ස කුමාරයා යකඩ බෝල උඩ වීසි කොට, අල්ලමින් යනු දුටු මුවන්තිස්ස කුමාරයා ඔහු නවතා ඔහුගේ නම හා වගතුග ද ඇසුවේ ය. ඇලන් ගේ කට කොනට සිනාවක් නොනැංගේ ය.

තමා කියන කතා ඇසීමෙන් ඇලන් තුළ ඇති වන හැඟීම් දැන ගැනීමට අනුලා මහත් උනන්දුවකින් වෑයම් කළා ය. ගම කතා අසන විට ඔහු හෙළි කළ හැඟීම හා වැටහෙන නුවණ ද දුටු අනුලාගේ විචාර බුද්ධිය පිබිදිණි. ගම කතා කියන්ට පුරුදු වුණු අනුලා කතා-වල එන පුවත් කිසි විටක සිතින්වත් විවේචනය නොකළා ය. ඇලන් ඇතැම් පුවත් අසා සිනාසෙනු දුටු ඈ සමහර විට ලජ්ජා වූවාය. ඇලන් සිනාසෙන්නේ ඒ පුවත්වලට ද නොඑසේ නම් ඒ පුවත් වලින් ලබන ආස්වාදය නිසා ද? ඔහු මා මෝඩ ගම මහගෙක කොට සිතන්නේ ද?

ඈ වටින්පිටින් විවාළ ප්‍රශ්නවලට ඇලන් පිළිතුරු දුන්නේ ය. තමා කියන කතාවලින් ඔහු විනෝදයක් පමණක් නොව උගැන්මක් ද ලබන බව අනුලාට නිසැක ය.

තමා රෝගාතුර නොවී නම් ඇලන් තරුණියකට ආලය බැඳ-ගෙන තමාගේ ඉගෙනීම හැර නොදමතියි අනුලා තීරණය කළා ය. ඔහු ලංකාව හැර ගියේ නන්දගේත් පියල්ගේත් වරදිනි. ඔවුන් දෙදෙනා ඇලන්, තමන්ගේ දරුවකු පමණක් නොව රේස් අස්වයකු ලෙස ද සැලකූහ. පමණ ඉක්මවා ඇලන්ට ඇල්ම කළ ඔවුහු, ඔහු ඉගෙනීම අවසාන කොට ආංඩුවේ ඉහළම රක්සාවක් ලබතියි යන හැඟීමෙන් ද මඩනා ලද්දෝ වූහ.

අනුලා මැරෙන්ට තුන් මසකට පෙර නන්ද කොග්ගල මහ ගෙදරට ගියා ය. ඒ අවස්ථාවෙහි ඈ නන්දට දෙස් නැඟුවේ කෝපයෙනි.

''ඇලන් වයසට වඩා පැසුණු සිතක් ඇති දරුවෙක් බව මම නන්දට කිහිප වතාවක් කිව්වා.........නමුත් නන්ද නගරෙ සමහර ගෑනුන් අනුව යමින් ඇලන් හික්මවන්න වෑයම් කළා......''

දැඩි ශෝකයෙන් තැවුණු තම සහෝදරියගේ මුහුණට ආරූඪ වුණු බැගෑ බව දුටු අනුලා තම කෝපය මැඩගත්තා ය.

''පියල් උදේ වෙළඳ කටයුතු සඳහා කන්තෝරුවට ගියාම ගෙදර එන්නේ රෑ හතට පමණ. එයා දරුවන් එක්ක දවසකට වචන හත අටකට වඩා කතා කෙළේ නෑ.........ඇලන් ගැන සොයන්ට නන්දටත් ඉස්පාසු අඩු උණා.........''

''මම ඇලන් කියූ හැම එකක් කළා. එයාට ඕනෑ කළ දේ අරගෙන දුන්නා.''

Scanned by CamScanner

''වොරන් සර්කස් එක ආ කාලේ අම්මාත් තාත්තාත් එයා සර්කස් බලන්න එක්ක යාවියයි හිතාගෙන උන්නා. නමුත් දෙන්නාම ගියේ නැහැ. ඇලන් ඉස්කෝලේ ළමයින් දෙදෙනෙක් සමඟ සර්කස් බලන්න ගියා.''

''එයා වැඩියෙන් කැමැති උණේ ඉස්කෝලේ ළමයින් එක්ක යන්න.''

''අම්මත් තාත්තත් දෙන්නම නොගිය නිසා, ගෙදරදී ඇලන් එක්ක ඉංගිරිසියෙන් කතා කරන්න පටන්ගත්තේ මොකොට ද?''

''ඇලන්ගේ ගුරුවරයා කී නිසා. සිංහලෙන් ගෙදරදී කතා කිරීම එයාගේ ඉංගිරිසි උගැන්මට බාදවක්යයි ගුරුවරයා කිව් බව අනුලා දන්නවා.''

''ගුරුවරයාට වඩා හොඳින් ඇලන් හඳුනන්නේ අපි. ගමේ මිනිහෙක් කොළඹට ආ දවසක ඇලන් ඔහු එක්ක කතා කරමින් ගම තොරතුරු අහනවාට නන්ද කැමැති උණේ නැහැ.''

''ඔවුන් එක්ක කතාවට ගියාම ගමේ මිනිසුන්ගේ නරක ගති පුරුදුවෙනවා.........අනුලාත් ඒ කාලේ එහෙම හිතුවා.''

''ඇලන්ට අපට වඩා මොළේ තිඋණා'' යි කියමින් අනුලා සිනාසුණා ය. ඈ සිනාසුණේ ඇගේ කෝපය පිට කිරීමෙන් තම සහෝදරියගේ සිත තළන්ට නොසිතූ බැවිනි. ''ඇලන් නිවාඩු කාලේ ගමට ගියාම ගහේ ඔරු පදින්ට ගියා. කජු කඩන්න ගමේ කොල්ලන් සමඟ කැලේ වැදුණා. එයා ගමට යන්න ආසා කෙළේ ඒ නිසා; එයා ගම මිනිසුන් එක්ක කතා කරමින් ගම තොරතුරු ඔවුන්ගෙන් ඇසුවේ නිවාඩු කාලේ ගමට යන ආසාවෙන්.''

''ඉගෙනීමට බාද ඇති වෙන නිසා එයාට වැඩිපුර ගමට යන්න මම අනුබල දුන්නේ නෑ.''

''නන්ද උපන්නේත් ගමේ; වැඩුණෙත් ගමේ නගරේ මිනිසුන්ගේ ඕපාදූප කතාවලට අසු නොවී ඉන්න පුළුවන් උණා.''

''දූන් ඔය පසුගිය දේවල් ගැන කතා කිරීමෙන් පලක් නෑ''යි නන්ද ශෝකයෙන් හා අසන්තෝෂයෙන් කීවා ය.

''ඇලන් අපට ආයිත් දකින්න ලැබෙන්නේ නෑ''යි කියමින් ඈ දැඩි ශෝකයෙන් හැඬුවා ය.

''මම එහෙම හිතන්නේ නෑ නංගි''යි අනුලා දැඩි විශ්වාසය ඇත්තක ලෙස තෙපලා ය. ඇලන් කොතෙක් අකීකරු කම් කළත් හොඳ මිනිසකු වෙතියි අනුලාට නිසැක ය; ඇලන් හිතුවක්කාරයකු වූයේ මවුපියන්ගේ සිත තළන අදහසිනි. ඔහු හිතුවක්කාරයෙක් නොවේ. ඔහුගේ සිතුම් පැතුම් හා හැඟීම් වැඩුණේ මවුපිය පරපුරෙහි පිහිටි මුල් ඇතිව වැඩෙන පැළෑටියක් ලෙසිනි. ඔහු තුළ ගමට ඇල්මක් උපන්නේ එහෙයිනි.

Scanned by CamScanner

"එයා ලංකාවට ඒවියයි හිතන විට මගේ හැඟීම් ඒකට පට-හැණි වෙනවා."

"නෑ නංගි" ඇලන්ට අපි කවුරුත් මතක නැති වෙන්නේ නෑ. එයා කනගාටුවේවි; දුක්වේවි. එවිට එයා නෝනාට උණත් කීකරු වෙන්නේ නෑ. නමුත් පියල්ගේ අම්මා කියූ කියුමක් ඇත්තක්ය කියා මට හිතෙනවා."

"ඒ මොකක්ද අනු" යි නන්ද දැඩි කුහුලකින් හා බියකින් ද ප්‍රශ්න කළා ය.

" 'ඇලන්ට පය ගැහු අත්තත් නැති උණා; ඇල්ලූ අත්තත් නැති උණා'යි දවසක් නැන්ද කිව්වා. නගරෙ ඉපිද ඉගෙන ඇතිදැඩි උණු නමුත් ඇලන් නගරෙ මිනිහෙක් උණෙත් නෑ. ගමට ආශා කළ නමුත් ගමේ මිනිහෙක් උණෙත් නෑ. ඇලන් පන්සලට ගියෙත් නෑ; පල්ලියට ගියෙත් නෑ."

"නගරෙ හැදෙන ළමයින් පන්සල් යන්නෙත් නෑ; පල්ලි යන්නෙත් නෑ"යි නන්ද තෙපලා ය.

"නගරෙ ළමයින්ගේ මවුපියන් පල්ලි යනවා."

"අපිත් පන්සල් යනවා" .

"ඔව්, අවුරුද්දකට සැරයක්; වෙසක් පෝය දට විතරක්."

තමාගේ කොළඹ ජීවිතය සිහි කළ අනුලා තම නඟාට දෙස් නැඟීම කුහක කමින් සන්තෝෂවන්ට වැයම් කිරීමක්යයි සිතුවා ය. ඈ කොළඹ දී පන්සලට ගියේ අවුරුද්දකට වරකි; නැති නම් දෙවරකි. ඈ ආගම ඇදහුයේ නන්දට වෙනස් විදියෙන් හෝ හැඟීමෙන් නොවේ. අනුලාට ඇගේ පැරණි ආගමික ජීවිතය මතක්වූයේ ගමට පැමිණි පසුයි. ඇගේ සැදැහැ බැතිපෙම් යළිත් මතුවූයේ ගමේ පන්සලට ගිය අවස්ථාවෙහි ය. කොළඹදී වෙසක්, පොසොන්, පොහොය දවස්වල විහාරස්ථානයට ගිය එකම අවස්ථා-වකදිවත් ඇගේ පැරණි ආගම භක්තිය හා ආගමික ජීවිතය සිහි නොකළ බව ඈ දනියි. යටගිය ඇගේ සැදැහැ බැතිපෙම් කැටකින් පවා සසල නොකරනු ලැබූ දිය බඳුනක් සේ කොළඹ සිටි කාලයේ නිසල වී ය. නන්දට දෙස් නැඟීම වරදකි.

"නන්ද තරහ වෙන්න එපා. ඒක නන්දට පමණක් නොව මගේ හදින් මටත් නැඟුණු චෝදනාවක්. මම කොළඹ සිටිද්දී පන්සලට ගියේත් අවුරුද්දට සැරයයි; නැති නම් දෙසැරයයි."

"පියල් කොළඹ වෙළඳාම් කරද්දී මම විතරක් ළමයිනුත් එක්ක ගම ඉන්නේ කොහොමද? ගමේ කොල්ලන් එක්ක සෙල්ලමට වැටුණාම ළමයි හොඳටම නරක් වෙනවා. තිසාට ඉගෙන ගන්න බැරි උණේ ගමේ ගැටයන් ආස්‍රය කරන්න පටන් ගත්තට පස්සෙ."

''නෑ'' යි අනුලා පිළිතුරු දුන්නා ය. ''තිසාගේ ඉගෙනීම කඩා කප්පල් උණේ අපට වියදම් කරන්න බැරි උණු නිසා. තිසා ගමේ ඉලන්දරින් ආස්රය කරන්න පටන් ගත්තෙ ඉගෙනීමට බාද ඇති උණාට පස්සෙ. ගාල්ලේ හැර ගමේවත් ගමට නුදුරු නියම් ගමක-වත් හොඳ ඉස්කෝලයක් තිඋණේ නෑ. තිසා ඇලන් වගේම ඉගෙනීමට හොඳටම සමර්ත ළමයෙක්. එයා ගාල්ලේ නවත්තා උගන්නන්ට අපට වියදම් කරන්න බැරි උණා. නන්ද හත් අට අවුරුද්දක් ගම හිටියා නම් ඊට පස්සෙ කොළඹ පදින්චියට ගොස් ළමයින්ට උගන්නන්න තිඋණා. එහෙම කරා නම් පය ගැහු අත්තත් ඇල්ලූ අත්තත් යන දෙකම ඇලන්ට නැති වෙන්නේ නෑ.''

''එහෙම කළා නම් පය ගහගත් අත්තත් කඩාගෙන බිම වැටී ඇලන් අතපය කඩා ගන්නවා''යි නන්ද තෙපලා ය.

අනුලා කරබාගෙන කල්පනා කළා ය. ඇලන් වෙනස් වූයේ තරුණ වියෙහි කවරකුට වුව ද මුහුණ පාන්ට වන දුෂ්කර අවස්ථාවකදී ය. ගම සිටියත් නගරයෙහි සිටියත් ඔහු ඒ අවස්ථා-වෙහි වෙනස් වෙයි. ගම සිටියා නම් ඔහු ඇතැම් විට වෙනස් වන්නේ වඩාත් නරක මඟක් ගැනීමෙනි යි නොසිතන්ට කාරණයක් නැත. ඇලන්ගේ වියෝගයෙන් පෙළෙන නන්දට පීඩා කිරීම නොමනායයි අනුලා සිතුවා ය.

''ඇලන් දකින්න ලැබෙන්නේ නැයි නංගි කණගාටු වෙන්න එපා''යි අනුලා ශෝකයෙන් හා දයාවෙන් තෙපලා ය. ''ටික කලකින් ඇලන් වෙනස් මිනිහෙක් වෙනවාට සැක නෑ. එයා තාත්තාත් අම්මාත් කවදාවත් මතක නැති කරන්නේ නෑ. ඇලන් ගැන ඒ හැඟීම එන්නේ මගේ හද පතුලෙන්. තිසා පොඩි කාලේ හිතුවක්කාර කම් කළා. තරහ උණාම කෲර කම් කළා. තිසා පොඩි කාලේ දවසක තරහයෙන් අම්මාට බැණ වැදුණා. පැ බාගයක් යන්න ඉස්සර එයා අඬන්න පටන් ගත්තා. ඇඬුවේ අම්මාට බැන්න නිසා හටගත් කණගාටුවෙන් යයි තිසාම මා එක්ක කිව්වා.''

පියල් නිවෙසට එන ගෑනුන් හා පිරිමින් හා වෙනද මෙන් කතාවට නොයයි. නන්ද ද ඔවුන් නිතර පැමිණීම කන්දෙස් කිරියාවක් ලෙස සලකයි. තමන්ට ළැදිකම් දක්වමින් තමන් ආශ්‍රය කළ ගෑනුන් හා පිරිමින්, ඇලන් තරුණියක හා රට හැර යෑම ගැන යටි සිතින් සන්තෝෂවෙතියි පියල් සිතයි. ඉතා ළංව තමන් ඇසුරු කළ නාගරික ගැහැනුන් හා පිරිමින් ගැන කුකුස් උපදවන්ට පටන්ගත් ඔහු, ඔවුන් පෙර කළ කී හැම දෙයක් ම අලුත් පොහොසතකු වන තමාට නින්ද කරන යටි අදහස ඇතිව කළ කී දේ ලෙස සැලකුවේ ය. පියල්ගේ මෙතෙක් යටපත් වී සිටි හීනදීන හැඟීම් ඉස්මතු වී ය.

Scanned by CamScanner

''මුදලාලිලා දන්නේ අනුන්ගේ ඉණ ඉහ අතගා ගන්නාක් මෙන් සල්ලිහම්බ කරන්න විතරයි'' සර් සිරිමල් අලවතුකිස්ස වරක් කීවේ පියල්ගේ ගෙදර පවත්වන ලද උත්සවයකදී පියල් හා කතාබහ කරන අතර ය. පියල් එය තමාට පසසමින් අනික් වෙළෙන්දන්ට නින්ද කරන අදහසින් කියූවක් ලෙස සලකා සන්තෝෂ වූයේ ය. දැන් ඔහු සිතන්නේ එය තමාටම එල්ල කරන ලද ඇනුම්පදයක් ලෙස ය. අනික් ගැහැනුන් හා පිරිමින් ඉත සිතින් කියූ තෙපුල් පවා, පියල් තමාටත් නන්දටත් එල්ල කරන ලද ඇනුම්පද ලෙස සලකා ඒ තෙපුල්වලට අලුත් අරුත් දෙන්ට වෑයම් කරයි. තමා ඇසුරු කළ සියලු දෙනාම යටි සිතින් තමාට සිනා-සෙමින් ඉච්චා බස් තෙපුලුවන් ලෙස සලකන්ට පටන් ගත් පියල්, කුකුසින් ආවෙශ වූවකු ලෙස, දෙඩවන්ට වූයේ ය. ඒ කුකුස ඔහුගේ සිත එකම කළු සායම් බඳුනක් කෙළේ ය. එහි පිවිසෙන සිතුම් හා හැඟුම් කළු පැහැ ගත්තේ ය.

නන්ද පියල්ගේ සිත සනසන්ට වෑයම් කළා ය. එයින් කිපුණු ඔහු නන්ද ද සැකකරන්ට වී ය.

''අපි කොළඹ පදින්චි වූයේ අම්මා කෝප කරමිනි.''යි පියල් තරහයෙන් කීවේ ය.

'කොළඹ වාසයෙන්, උඹලාට හොඳක් වෙන්නේ නෑ'යි අම්මා කියූ කියුම පියල්ට මතක් වෙයි. කොළඹ පදිංචි වීමට පළමුව යෝජනා කෙළේ නන්ද නොව පියල් ය. එහෙත් පියල් දෙසතිය-කින්වත් ගමට නාවොත් නන්ද ඔහුට දෙස් නැඟුවා ය. 'කොළඹ පදින්චියට යමු'යි යෝජනා කළ විගස නන්ද ඒ යෝජනාව දැතින් බද ගන්නක ලෙසිනි කැමැති වූයේ. ඈ කොළඹට පැමිණ හමසක් ගතවන්ට පෙර පුළුන් ගෝනියක් දිය උරා ගන්නාක් මෙන් නාගරික සිරිත් විරිත් උකහා ගත්තා ය. පියල් නගරයේ ගැහැනුන් හා පිරිමින් ඇසුරෙන් සන්තෝෂ වන්ට උගත්තේ නන්ද නිසා ය.

නන්ද පමණක් නොව පියල් ද වෙනදට වඩා ළැදිකමින් හා ශෝකයෙන් තිස්සගේ අදහස් විමසයි. එහෙත් තිස්ස ඇතැම් විට කියන කියුම් ඉවසිය නොහැකි තරම් කටුක ය. ඔහුගේ කටුක කියුම්වලට යටින් ඇති ඇත්ත වහා වටහා ගන්නේ නන්ද නොව පියල් ය.

''ගෙදරදි අම්මාටත් තාත්තාටත් ඇලන් එක්ක ඉංගිරිසියෙන් කතා කරන්න හොඳ නම් ඇලන් ලන්සි තරුණියක් විවාහකර ගන්න සිතීම වැරදි වන්නේ කෙසේ ද?''

තිස්ස නන්දට ද ඇසෙන සේ දවසක තාලිකාගෙන් ඇසූ ප්‍රශ්නයකි මේ. ඇලන් තරුණියක හා හාදවීමත් අනතුරුව ඈ කසාද බැඳගැනීමත් තිස්සගේ කෝපයට හේතු නොවී ය. ඇලන්

ලංකාවෙන් පිට වී යෑම තිස්සගේ කෝපයට හේතු වී ය. 'ඒක ඇලන්ගේ ගොන් කමක්' යි තිස්ස තරහයෙන් දෙපලේ ය. ඇලන් ඒ ගොන්කමට එලවූයේ අම්මාත් තාත්තාත් විසිනි.

''තිස්ස මාමා කියන්නේ ඇනුම් පද'' යි නාලිකා සිනාසෙමින් කීවා ය. ''ඉගෙනීමට ඉස්සර වෙලා ඇලන් අය්යා කසාද බැන්දේ මොකොට ද? ඇලන් අය්යාට කසාද බඳින්න වයසක් ද? මමිලා විරුද්ධ උණේ ඒ නිසා ය.''

''ඇලන් කසාද බඳින්න හිතා හිටියේ ඉගෙනීම ඉවර උණාට පස්සෙ. අම්මාත් තාත්තාත් තරහයෙන් තරවටු කරන්නත් සංඝු-වෙන්නත් පටන් ගත් නිසා ඇලන් ඒ ගෑනු ළමයා කසාද බැඳ ගත්තා. තාත්තා තර්ජනය කරන්න පටන් ගත්තා, ඇලන්ට කිසි වක් අයිති වෙන්න ඉඩ තියන්නේ නෑ කියා.''

''තරහ ගිය නිසා ඩැඩී එහෙම කියන්න ඇති. කිව්වට එහෙම කරනවාය.........''

''ලන්සි ගෑනුය කියන්නේත් ගෑනුන්ට. ලන්සි ගෑනුත් සිංහල ගෑනු වගේම කනවා, හිතනවා, ආදරය කරනවා, තරහවෙනවා. ඇලන් ලන්සි තරුණියක් කසාද බඳින්න හිතුවාම ඕකට මවුපියන් පණ ඇරගන්න හැදුවේ මොකොට ද?.........''

''නාලිකා කතා නොකර නිකම් ඉන්න'' යි කාමරයෙහි ඇඳෙහි හාන්සි වී උන් නන්ද කීවා ය. ''කණපිටට කතා කරන මිනිසුන් එක්ක කතාවට යන්න ඕනෑ නෑ.''

''තිස්ස මාමා කියන්නේ ඇලන් අය්යා බාල වයසෙහිදීම කසාද බැඳගෙන ලංකාව හැර යෑම හරිය කියා ද?'' යි නාලිකා සෙමින් ඇසුවා ය.

''පියල් එයාගේ අම්මා අසන්තෝස කරලා කොළඹට ඇවිත් පදින්චි උණා. ඇලන් කසාද බඳින්න අදහස් කරගෙන උන්නේ විබාගෙන් සමර්ත වෙලා රක්සාවක් කරන්න පටන් ගත්තාට පස්සෙ.''

''මගේ ප්‍රශ්නයට ඒක පිළිතුරක් නෙවී. තිස්ස මාමා හදන්නෙ මම වාදෙකට අල්ලා ගන්න!''

''ගම හැරදමා කොළඹ පදින්චියට ආ එක ගොන්කමක්ය කියා දූන් අම්මාත් තාත්තාත් දෙන්නාම හිතනවා. ඇලන් ලංකාව හැරදමා එංගලන්තයට ගිය එකත් මහ ගොන් කමක් ලෙස ඇලන්ට හිතෙන අවස්ථාවක් ඒවි.''

''මම් එහෙම හිතන්නේ නෑ. ඇලන් අය්යා වරදක් කෙළේ නෑයි ඔප්පු කරන්න තිස්ස මාමා තර්ක කරන්නේ සිතීමෙන් ඉබා-ගාතේ යන්නෙකු වාගෙ.''

Scanned by CamScanner

''සිතීම ඉබාගාතේ යෑමක්. තර්කය පිහිට වන්නේ කෙනෙකුට උවමනා හැටියට සිත ඉබාගාතේ යවන්න විතරයි.''

තිස්ස හා කතාබහ කිරීමෙන් ලත් පුරුද්ද ඇති නාලිකා තමා පළමුව ඇසූ ප්‍රශ්නයම යළිත් ඇසුවා ය.

''හරිත් නෑ වැරදිත් නෑ''යි තිස්ස පිළිතුරු දුන්නේ ය. ''ගොන් කම හරි වැරදි දෙකින් තොර වූවකි. ඉදහිටලාවත් ගොන් කමක් කරන්නෙ හොඳ මිනිහෙක් විතරයි.........''

සාහසික වේශයකින් චන්ද්‍රසෝම සාලයට ඇතුළු වූයේ ය.

''මම් අන්න මල්ලි ගැන සොය සොයා ඉන්නවා!''යි නාලිකා කීවා ය.

චන්ද්‍රසෝම නැවැති නාලිකා දෙසත් තිස්ස දෙසත් බැලුවේ ය. අවුල් වුණු කෙස් වැටිය හා ඩාදියෙන් සේදුණු දූවිලි ද සහිත මුහුණ ඇති චන්ද්‍රසෝම මං පැහැරීමකින් පසු සැඟවෙන තැන් සොයන්නකු වැන්නයි තිස්ස සිතුවේ ය. ඇත්ත වශයෙන් තිස්ස බියගත්තේ ය. චන්ද්‍රසෝමගේ මුහුණ යළිත් වරක් බැලූ තිස්ස ඔහු කිසියම් සාහසික අපරාධයක් කොට පළා යන්නෙකියි සැක කෙළේ ය. තිස්සගේ සිතට නැංගේ කෝපයක් නොව අනුකම්පාවකි.

''මම් මම සොයන්නේ මොකටද''යි චන්ද්‍රසෝම ප්‍රශ්න කෙළේ ය.

''මම දන්නේ නැහැ. මල්ලි දවස් දෙකකින් ගෙදර නා නිසා වෙන්න ඇති.''

''තිස්ස මාමා මම එක්ක තරහ ද? මම ගැන සැක කරන්නාක් මෙන් බලන්නේ''යි චන්ද්‍රසෝම විචාළේ ය.

''තරහෙන් ඉන්නේ මම නෙවි අම්මා.........චන්ද්‍රසෝම මගෝඩි ගමනක් ගිය බව මම දන්නවා. මම ටිකක් බය උණේ මොකුත් පටලැවිල්ලක් කරගෙන ආවාදැයි සැක හිතුණ නිසා.''

''නැහැ'' යි කියමින් චන්ද්‍රසෝම සිනාසුණේ ය. කලිසන් සාක්කුවට අත යැවූ පරණ පත්තර කැබැල්ලක් දවටන ලද කුඩා පොදියක් එළියට ගෙන තිස්සට පෙන්නුවේ ය.

''මොකක් ද?''

''කියන්නේ නෑ.''

ඔහු ගෙදරට පැමිණියේ කිලිටි ඇඳුම් උනා දමා අලුත් ඇඳුම් ඇඳගෙන, පියා එන්ට පෙර ගෙයින් පිට වන අදහසිනි. ඔහු පියාට නොදන්වා කුඩා මොටෝරිය ගෙන යහළුවන් දෙදෙනකු සමඟ නුවර එළියට ගියේ ය. පසු ද උදය වරුවේ නුවර එළියෙන් පිටත්වී එද්දී රඹඩදී තවත් රියක හැපීමෙන් චන්ද්‍රසෝමගේ රියෙහි

මඩපෝරුව තැලිණ. ඔහු යහළුවන් දෙදෙනාත් සමඟ කොළඹට පැමිණ තම මොටෝරිය, කම්මලකට බාර කෙළේ ය.

''චන්ද්‍රසෝම''

අනිකක් සිතන චන්ද්‍රසෝමට ඒ හඬගෑම නොඇසිණ. ඔහු කල්පනා කරන්නේ ඔහුත් යහළුවන් දෙදෙනාත් බේරුණු බේරිල්ල ගැනයි. වේගයෙන් පැදවූ ඔවුන්ගේ රිය පල්ලමක වැටෙන්ට ගියේ ය. අඩි සියකට වැඩි ඒ පල්ලමෙහි වැටිණි නම් ඔවුනුත් සමඟ රිය සුන්බුන් වෙයි. ඒ අන්තරායෙන් ඔවුන් බේරුණේ චන්ද්‍රසෝමගේ ශූරකමත් මහා ගඳපාන පඳුරකුත් නිසා ය. රියෙහි මඩපෝරුව තැළුණේ මේ අන්තරායෙන් බේරුණු පසු ය.

තමාගේ ශූරකම සිහි කිරීමෙන් උපන් ගර්වය ඇති චන්ද්‍රසෝම තිස්ස සමඟ මඳ වේලාවක් කතාබහ කරන්ට සිතුවේ ය.

''චන්ද්‍රසෝමට අම්මා කතා කරනවා ඇහෙන්නේ නැද්ද''යි තිස්ස මඳක් අසන්තෝෂයෙන් ප්‍රශ්න කෙළේ ය.

චන්ද්‍රසෝම මවගේ කාමරයට ගියේ කැමැත්තෙන් නොවේ. ඔහුගේ ගොරෝසු මුහුණ බැලූ නන්දගේ කෝපය යට ගියේ ය. චන්ද්‍රසෝම ඉගෙනීම හැරදමා මැරකම් කරන්ට වී දැවුරුද්දක් පමණ වෙයි; පියාගේ වෙළඳ සැලෙහි අවුරුද්දක් පමණ සේවය කළ ඔහු පියා සමඟ කලහ කොට එතැනින් අස්වූයේ ය.

ඇලන්ගෙන් වියෝ වූ නන්ද චන්ද්‍රසෝම කෙරෙහි තම ඇල්ම දැඩි කරගැනීමෙන් සැනසෙන්ට වෑයම් කළා ය. එහෙත් චන්ද්‍රසෝම නිසා නන්ද දුන් කාලය ගෙවන්නේ බියෙනි; ශෝකයෙනි. උගැන්මට අසමත් වුණු සමහර ගැමි දරුවන් මැරකම් කොට සිරගෙට ගිය සැටි නන්ද දනියි; ඇතැමකු සතුරකුගේ වෙඩි පහරින් මිය ගියේ ය. බලදසගේ සහෝදරයෙක් උගැන්මට ආසා නැත්තේ තරුණයන් හාද කොටගෙන මැරකම් කෙළේ ය. හත්අට අවුරුද්දකට පසු ඔහුගේ කාංඩයෙහිම එකෙකුගේ වෙඩි පහරින් ඔහු මළේ ය. ඔහුගේ අවමඟුලට තිසා සමග නන්ද ද ගියා ය. පපුවෙහි වැදුණු වෙඩි පහර උරහිස අතරින් පිටවීම නිසා ඔහු එවේලේම මළේ නාහෙන් කටින් ලේ පිට කරමිනි යි ගැමියන් කියූ කියුම, ඔහුගේ ශෝක ජනක මරණය සිහි කළ නන්දට තම සිතින් බැහැර කළ නොහැකි ය. ඔවුන් දෙදෙනා ඔවුනොවුන් කෙරෙහි වෛර බැඳ ගත්තේ එකම ගැමි තරුණියකට ආසා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

නන්ද චන්ද්‍රසෝමගේ අනාගතය ගැන තැතිගත්තා ය. ඇලන්ගේ වියෝගයෙන් පසු නන්ද තමාගේත් සැමියාගේත් දරුවන්ගේත් ජීවිතයෙහි අසුබ ලකුණුම දකින්ට පුරුදු වූවා ය. උගැන්ම හැරදමා මැරකම් කළ ගැමි තරුණයෝ වෙළඳාමෙන් ධනවතුන් වී මහ

Scanned by CamScanner

ගෙදරට නුදුරින් විසාල අලුත් ගෙවල් සාදවාගෙන සන්තුෂ්ටියෙන් වෙසෙති. ඔවුන්ගෙන් එකකුගේ දූවක විසාල දැවැද්දකුත් සමඟ අද්වකාත් කෙනකුට ළඟදී සරණ කර දුන් බව නන්දට සිහි කළ නොහැකි ය.

"උඹ පෙරෙයිද ගියේ කොහේ ද?" යි නන්ද තරහයෙන් ප්‍රශ්න කළා ය.

"මම නුවරඑළියට ගියා" යි ඔහු සාහසික ලෙස පිළිතුරු දුන්නේ ය.

"තාත්තාගෙන් අහලද උඹ කාර් එක ගෙනිච්චේ?"

"නැහැ."

චන්ද්‍රසෝමගේ සාහසික වේශය නිසා නන්ද කෝප වූවා ය.

"තාත්තාගේ කන්තෝරුවෙන් උඹ සල්ලි කොපමණ පැහැරගත්ත ද?"

"මම සල්ලි පැහැරගත්තේ නැහැ. මගේ පඩිය වෙනුවෙන් රුපියල් දෙසීයක් ගත්තා."

"කැෂියර්ට තරවටු කරලා උඹ ඒ සල්ලි ගත්තේ තාත්තාට නොකියා."

"හොරකමට නෙවි. හොරකම් කරනවා නම් මට රුපියල් දෙතුන් දහක් හොරකම් කරගෙන යන්න තිබුණා."

"තාත්තා පඩියට හරි යන්න සල්ලි දීලා තියෙනවා නෙව ද?"

"තාත්තා රුපියල් දහය පහළොව බැගින් මට දීලා තියෙනවා. පඩියක් නියම කරලා මට මාසෙ අන්තිමේදී ගෙවුවේ නෑ.

"තාත්තාගේ සල්ලි උඹෙත් අපෙත් සල්ලි. මාසෙන් මාසෙට පඩි ගෙවන්න උඹ පිට මිනිහෙක් ද?"

"මම කන්තෝරුවේ වැඩ කෙළේ පිට මිනිහෙක් වගේ. කන්තෝරුවේ ඉහළම වැඩ කරන්නේ පිට මිනිස්සු. මම ඔවුන් යටතේ වැඩ කළා. තාත්තාගේ කන්තෝරුවය කියා මට අමුතු සැලකිල්ලක් කෙළේ නෑ."

"වැඩ ඉගෙන ගත්තාට පස්සෙ උඹට වෙළඳාම බාර දෙන්න නෙව තාත්තා උඹට වෙළඳාම උගන්වන්න හැදුවේ."

"මම කන්තෝරුවේ වැඩ කරන කාලේ තාත්තා හිටියේ බයේ. මම තාත්තාගේ වෙළඳ පළෙන් සල්ලි අරගෙන නාස්ති කරාවිය කියා තාත්තා හිතුවා. බයට හේතුව ඒකයි."

"ඇයි මිනිහෝ උඹට වැටහෙන්නේ නැද්ද, තාත්තා හම්බ කරන සල්ලි උඹටත් නංගිටත් බව, ඒවා වෙන කාටද? ඇලන් අය්යා ආවොත් එයාට කොටසක්........."

Scanned by CamScanner

''මට තාත්තාගේ සල්ලි ඕනෑ නෑ''

''උඹ ගත්තු රුපියල් දෙසීය කාගෙ ද?''

''මගෙ පඩිය''

''රුපියල් දෙසීයම නැති කළා දවසට!''

''මගේ ළඟ දැන් රුපියල් පන්සීයක් තියෙනවා!''යි කියමින් චන්ද්‍රසෝම පොදියක් කලිසන් සාක්කුවෙන් ගෙන එහි දවටී සිටි කඩදාසිය ඉවත් කොට පෙන්නුවේ ය. ඔහු සිනාසෙමින් රුපියල් පන්සීය යළිත් සාක්කුවේ දමා ගත්තේ ය.

''දෙසිය පන්සිය උණේ කොහොම ද? උඹ කන්තෝරුවෙන් තව සල්ලි අරගෙන තියෙනවා.''

''නෑ'' යි ඔහු ගර්වයෙන් පිළිතුරු දුන්නේ ය.

තාත්තාට පමණක් නොව තමාට ද මුදල් සපයන්ට ශක්තියක් ඇති බව මවට දන්වන්ට අවස්ථාවක් ලැබීම ගැන ඔහු සන්තෝෂ වූයේ ය.

නන්ද තුළ කුහුලක් පමණක් නොව බිය සැක ද හටගත්තේ ය. පියල්ගෙ කන්තෝරුවෙන් ගත් රුපියල් දෙසිය පන්සීයක් වූයේ කෙසේ ද? නුවරඑළියට යන්ටත් එන්ටත් පැට්‍රල් තෙල්වලටත් වියදම් කළ යුතු ය. හෝටලවලට ගෙවිය යුතු ය. ඔහු යහළුවන් දෙදෙනකු සමඟ හදිසියේ නුවරඑළියට ගියේ කුමට ද? ඔහු කිසිවකු ගෙන් මුදල් උදුරා ගත්තේ ද? සොරා ගත්තේ ද?

චන්ද්‍රසෝමගේ කටින් මත්පැන් ගඳ නිකුත් වෙතියි නන්ද සිතුවා ය. එය මත්පැන් ගඳදැයි සැක හැර දැනගන්නා අදහසින් ඈ ඇඳෙන් නැඟී ඔහුට ළං වූවා ය.

''උඹට ඔච්චර සල්ලි ලැබුණේ කොහොම ද?''

චන්ද්‍රසෝම මදක් ඈත් වී කන්නාඩි මේසය උඩ තුබුණු පනාව ගෙන කෙස් වැටියෙහි අවුල් හරින්ට වූවා ය.

''තාත්තාට විතරක් නෙවි මටත් සල්ලි හම්බ කරන්න පුළුවනි'' යි චන්ද්‍රසෝම පිළිතුරු දුන්නේ ය.

''අපට උඹේ සල්ලි ඕනෑ නෑ. තාත්තා අපි ඔක්කොටම සල්ලි හම්බකරනවා.''

''ඔම්ට මගේ සල්ලි ඕනෑ නැති නම් මට කමක් නෑ.''

''සල්ලි හම්බකරන්න පස්සෙ පුළුවනි''යි නන්ද සැරකරන්නාක් මෙන් තෙපලා ය. ''තාත්තාගේ කන්තෝරුවේ වැඩ ඉගෙන ගන්න බැරි නම් වෙන කන්තෝරුවකට ගොහින් වැඩ ඉගෙන ගනින්. තාත්තා හොඳ තැනක් සොයාදෙවි.''

"මටත් පුළුවනි රක්ෂාවක් සොයාගන්න. මට රක්ෂාව දෙන්න ලොකු සමාගම් දෙකක් පොරොන්දුවෙලා තියෙනවා."

"උඹ දැන් ලොකු මිනිහෙක්! මවුපියන් ඕනැත් නෑ; නංගි ඕනැත් නෑ; අය්යා ඕනැත් නෑ."

"තාත්තාට මම පිට මිනිහෙක් තරම් වත් විස්වාස නෑ. සේප්පුවේ යතුර මම අතට ගන්නවාටවත් තාත්තා කැමැති නෑ. මම තාත්තාගේ සල්ලි අරගෙන පැනල යාවිය කියා තාත්තා බයේ ඉන්නවා. මම හම්බවෙන්න යාළුවෙක් ආවොත් තාත්තා එයාටත් මටත් රවනවා. මම නැති වෙලාවක මම හම්බවෙන්න ආ මගේ යාළුවෙකුගෙන් තාත්තා නොයෙකුත් ප්‍රශ්න අහලා තියෙනවා."

"උඹ ඔහොම පැහිච්චකම් කතාකරන්නේ උඹේ වයස කීය ද? තාත්තා නාම උඹටත් සලකන්නේ ඉස්කෝලේ යන වයසේ ළමයෙකුට වාගේ. උඹ ආස්රය කරන්නේ හිතුවක්කාරකම් කරන ඉලන්දාරි. තාත්තා උඹේ යාළුවන්ගෙන් ප්‍රශ්න අහන්නේ ඒක දන්න නිසා."

චන්ද්‍රසෝම ගැන කිපී කලකිරී සිටින පියල් වෙළඳාම හැර දැමීමට වරක් යෝජනා කෙළේ ය. නන්ද ඊට පටහැණි වූවා ය. පුත්‍ර මවුපිය දෙදෙනාගේ සිතුම් පැතුම් සුන්බුන් කළහ. කොළඹ පදිංචි වූ තැන් සිට නන්ද හා පියල් ජීවත් වූයේ පුතුන් දෙදෙනා උසස්ම උගැන්මක් ලැබ සමාජයේ ඉහළම තැනට නඟිනු දකින ආසාවෙනි.

"උඹ හම්බවෙන්න එක යාළුවන්ගෙන් තාත්තා ප්‍රශ්න ඇහුවාම උඹ තරහ වෙන්නේ මොකොට ද? තාත්තා උඹට වඩා නැළිල පොඩිවෙච්ච මිනිහෙක්. උඹ ඉස්කෝලේ යන කාලේ සිට උඹ ආස්රය කළ දඩු ළමයින්ට මමත් කැමැති නැහැ. සමහරුන්ගේ මුහුණු බැලුවාම තාත්තාට විතරක් නෙවි මටත් එවුන් එපා උණා."

"මුහුණ බලා මිනිහෙක් අඳුනාගන්නේ කොහොම ද?" යි අසමින් චන්ද්‍රසෝම සිනාසුණේ ය. "එහෙනම් මම ආස්රය කරන්න ඕනෑ ඩැඩියි, මමියි මුහුණ බලා හොඳයයි කියන මිනිස්සු විතරයි!"

"මම එහෙම කිව්වෙ නැහැ"යි නන්ද සැරකළා ය.

තමාගේ කටින් පිට වූ ඒ වචන අනුචිතයයි නන්ද සිතුවා ය. දරුවකු තම දුර්වලකම දුටුවත් එය පිළිගැනීම ඔහුට අකීකරුකම කිරීමටත් මවුපියන්ගේ වචන ඉක්මවීමටත් අනුබල දීමකි.

"උඹ ඉගෙනගන්න කාලේ උපසේන උඹ හම්බවෙන්න නුමානෙකට හත් අට වරක් ආවා. සමහර දවසක එයා එක්ක මම

Scanned by CamScanner

කතා කෙළේ තරහෙන්. ඒත් එයා හැම දම වාගේ උඹ හම්බ-වෙන්න ආවා. උඹට ජූනියර් විබාගෙවත් පාස්කරන්න බැරි උණේ එයා හින්ද. එයා හොඳ මිනිහෙක් නෙවි............''

''මෙී හොඳ මිනිහා ය කියන්නේ කාට ද?''

''අපරාධ නොකොට වැදගත් විදියට ජීවත් වන මිනිහා හොඳ මිනිහා.''

''උපසේන කරලා තියන අපරාදේ මොකක් ද? සර් සිරිමල් අලවතුකිස්ස මෙීල ආශ්‍රය කරන හොඳ මිනිහෙක්. එයා එයාගේ සහෝදරිට සිහිය නැත කියා පිස්සන්කොටුවට යැව්වා!''

''නංගි පිස්සන් කොටුවට යවන්න ඇත්තෙ පිස්සු නිසා. මම දන්නවා; එයාගේ නංගිට එක විදියක ඔල්මාදයක් තිඋණා. නංගි පිස්සන්කොටුවට යැවීමෙන් සර් සිරිමල්ට ලාබයක් වෙනවා ය.''

''ලාබෙ'' කියමින් චන්ද්‍රසෝම මුව දෙස බලා සිනා සුණේ ය. ''එයින් එයාට ලැබෙන්නේ ලොකු ලාබයක්. නංගි පිස්සන් කොටුවට යැවුවේ නංගිගෙ දේපල අයිතිකර ගන්න. ඒ ගෑනි කසාද බැඳගන්න වයසින් වැඩි පෙරකදෝරුවෙක් කැමැති වෙලා හිටියා. ඒක දැනගත් හැටියේ තමයි අලවතුකිස්ස නංගි පිස්සන් කොටුවට යැවුවේ.''

''උඹ මිනිස්සුන් කියන ඕපාදූප විස්වාස කරනවා...........''

''මම ඒ තොරතුරු දැනගත්තේ සර් සිරිමල්ගේ නීති ඥයාගෙන්.''

''පිස්සන්කොටුවට කෙනෙක් යවන්න උසාවියෙන් අවසර ගන්න ඕනෑ.''

''සිරිමල් වගේ ලොකු මිනිහෙකුට ඒක පහසු කාරියක්.''

'චන්ද්‍රසෝම කියන්නේ ඇත්තක්ද' යි නන්ද තමාගෙන්ම ප්‍රශ්න කළා ය. ඔහු කී කිසිවක් ඈ විශ්වාස නොකළා ය. ඔහු කපටි මිනිසුන් ආශ්‍රය කරතියි නන්ද සිතුවා ය.

''සර් සිරිමල්ගේ චිත්තියක් අපට ඕනෑ නෑ''යි නන්ද තරහ-යෙන් කිවා ය. ''තාත්තාගේ කන්තෝරුවේ වැඩ කරන්න කැමති නැතිනම් වෙන තැනකට බැඳිලා වැඩ ඉගෙන ගනින්. යාළුවන් එක්ක සවාරි යන්න එපා. ඇලන් ලංකාවෙන් පිටවෙලා ගියා. උඹ හිතුවක්කාරකම් කරනවා; දැන්ම හිටම තාත්තාට විරුද්ධකම් කරනවා.''

පියල්ගේත් තමාගේත් චන්ද්‍රසෝමගේත් අනාගතය සිහි කළ නන්ද ශෝක වූවා ය. ඇගේ දෙනෙතට කඳුළු නැගිනු දුටු චන්ද්‍ර-සෝමගේ දැඩි සිත මදක් මෙලෙක් වී ය.

Scanned by CamScanner

"මම් අඩන්නේ ඇයි?'' ඔහු මුදු හඬින් ඇසුවේ ය. "මම් මම තරහ කරමින් කතාකළ නිසා මම අදහස් නොසභවා කිව්වා. මම ඩැඩී එක්ක තරහ නැහැ. මමීත් බයේ ඉන්නවා මම සල්ලි නාස්ති කරාවිය කියා. මම සල්ලි නාස්ති කරනවා නම් කරන්නේ මම හම්බකරන සල්ලි විතරයි.''

"අපි දෙන්නාම සල්ලිවලට ආසා නෑ පුතා''යි නන්ද ශෝක-යෙන් තෙපලා ය. "තාත්තා සල්ලි හම්බකරන්නෙ පුතාලටත් දුවටත්. අපි දෙන්නාම බයේ ඉන්නේ උඹ සල්ලි වියදම් කරාවිය කියා නෙවි; සල්ලි අතට අහුඋණාම යහළුවන් එක්ක ඇවිදින්ට ගොස් විපතක් කරගනියි කියා. කාර්එකේ මඩගාඩ්එක නැමුණේ යන්තම් ගහක හැපීමෙන් යයි පුතාම කිව්වා. ඔයිට වැඩිය ලොකු අන්තරායක් උණා නම් වෙන්නේ මොකොද?''

තමා භයානක අන්තරායකින් බේරුණු සැටි මව නොදනියි. තමා ඕනෑ අන්තරායකින් බේරෙන්ට දන්නා බව මවට දන්වන අදහසින් මොටෝරිය අන්තරායෙන් බේරුණු සැටි ඈට කිව යුතුයයි සපන්කම් කීමෙහි ආසාව නොමැඩගත හැකි වූ චන්ද්‍රසෝම කල්පනා කෙළේ ය.

"මමී බයවෙන්න එපා''යි චන්ද්‍රසෝම කීවේ ය. "අන්තරා-වලින් බේරිලා වැඩකරන්න මම දන්නවා. කාර්එක පල්ලමකට වැටෙන්න ගියත් බේරාගන්න මට පුළුවනි. මම නුවරඑළියේ රේස් පලේදී රුපියල් පන්සීයක් දිනුවා!''

පුරසාරම් දෙඩන සාහසිකයකු මෙන් චන්ද්‍රසෝම දෙඩවනු ඇසූ නන්ද වඩාත් ශෝක වූවා ය. නුවරඑළියට ගිය දවසෙහිම චන්ද්‍ර-සෝම රුපියල් පන්සීයක් දිනුවේ කෙසේ ද? ඔහු කියන්නේ බොරුවක් විය යුතුයි. ඔහු තාත්තාගේ කන්තෝරුවෙන් රුපියල් දෙසීයට වඩා ගත්තේ ද? නොඑසේ නම් යහළුවන් සමඟ ගොස් ප්‍රයෝගයකින් කිසිවකුගෙන් මුදල් ලබාගත්තේ ද? යහළුවන් දෙදෙනකුන් සමඟ හොර අත්සන් ගසා චැක්පතක් මාරු කළ තරුණයකු තුන් අවුරුද්දකට සිරගෙට ගිය බව නන්ද දනියි. ඒ තරුණයා අනිකකු නොව සර් සිරිමල් අලවතුකිස්සගේ නෑයෙකි.

# 12

අනුලා මැරෙන්ට පෙර තිස්ස කොග්ගලට ගිය එක් වතාවක දෙමසක් පමණ එහි නැවතුණේ ය. ඔහු ටික දවසක් මහගෙදර ද අනතුරුව පියල්ගේ මවගේ ගෙදර ද වාසය කෙළේ ය.

ජීවිතයෙහි දුක සැප දෙකත් එහි ප්‍රියංකරත්වය හා භයංකරත්වයත් අරබයා ඒ දෙමාසය තුළ ඇසූ දුටු දේත් ඒ ගැන සිතීමෙන් ලත් දැනුමත් නිසා ඔහුගේ සිතුම් පැතුම් මඳක් වෙනස් වී ය. ඔහු නගරයෙහිදී බොහෝ විට කතාබහ කෙළේ අවස්ථාව අනුව සිතනු පිණිස තම සුහද හැඟීම් මතුවන්ට නොදීමෙනි. නිවැරදි විනීත සමාජ සිරිත් විසින් හික්මවනු ලැබූ උගත් නාගරිකයන්ගේ ජීවිතය ඔහුට පෙනුණේ දුක සැප දෙකින් තොරවූ ගතානුගතික විනෝද එකක් ලෙසිනි. ඔවුන්ගේ ජීවිතය මුහුදේදී දිය මතුයෙහි යාත්‍රා කෙරෙන නැවක් වැන්න. එයින් කැලඹෙන්නේ හිරු එළියෙන් එළිය වන නොගැඹුරෙයි වන දියකඳ පමණි. තෝරුන් හා බලයන් මරනු පිණිස කුඩා ඔරුපියලිවලින් සක්වළගල තෙක් යාත්‍රා කරන නිර්භය මසුන්මරන්නන් මෙන් ගැමියෝ ද ආදිකාලීන සමාජ සිරිත් හා මෝඩ අදහස් නමැති ඔරුපියලිවලින් ජීවන සයුරෙහි යාත්‍රා කරන්නෝ ය. ආපද නමැති සුළඟට හසුව දිළිඳුකම හා නොදන්නාකම නමැති ගල්පරවල හැපී සුන්බුන් වන ඒ ඔරුවලින් යාත්‍රා කරන්නෝ ගැඹුරෙහි සරන බියකරු අබිසර දුක් පීඩා විඳින්නෝ ය.

දැඩි දුකින් හා වේදනාවෙන් පීඩා විඳින්නකු තිස්ස දුටුවේ ඉප්පිරි තාලයෙහි දී ය. සිතින් හා කයින් දැඩි දුක්පීඩා හා වේදනා විඳින්නකු ඔහු නගරයෙහි උසස් පන්තියේ එකම ගෙදරකදීවත් නුදුටුවේ ය. ඇඳ ඇතිරිලි, කොට්ට-මෙට්ට, ආදිය නිසා පහළ වන පරිසරය හා වාතාවරණය ද වේදනාව නසන අලුත් බෙත් ද නගරයේ මැද පන්තියේ ගෙදරක වුව ද අමාරු ලෙඩකු විඳින භයංකාර වේදනාව හා දුක පවා සඟවන විසිතුරු පට කඩතුරාවකි. ඒ පට කඩතුරාවෙන් මුවා වුණු දුකත් වේදනාවත් දකින්ට තිස්ස වෑයම් නො කෙළේ ය. නගරයෙහිදී ලැබූ නොගැඹුරු සුලභ අත්දැකීම නිසා ඔහු නගර ජීවිතයෙහි පිටත්තර විසිතුරුව ඉක්මවා දකින්ට තරම් සියුම් නුවණක් නොලැබුවේ ය.

ඔහු නාගරිකයන්ගේ සමාජ ජීවිතය නමැති පට කඩතුරාවෙන් වැසුණු සුහද ගෘහ ජීවිතයෙහි දුක සැප විනිවිද නුදුටුවේ ය. සැබ-



Scanned by CamScanner

වුණු දේ වටහාගැනීමට අනුබල දෙන දයාබර තියුණු හැඟුමක් ඔහුට නොවී ය.

ආනන්දය ලෙස හැඳින්විය හැකි ප්‍රීතියක් ද ඔහු නගර ජීවිතයෙහි නුදුටුවේ ය. නගර ජීවිතයෙහි සුලභ ප්‍රීතිය වනාහි උත්සවයකදී නැටුම් හලකදී දකින්ට ලැබෙන පිටත්තර ප්‍රීතිය මෙන් ඔහු කුප්පන්-නක් වී ය.

නගරයෙහි අවමඟුල් පෙරහැරෙහි රෙදි කඩින් වැසුණු දවුලෙන් නැඟෙන්නේ බොල් හඬකි. ශිෂ්ට ව්‍යවහාරය නමැති කඩතුරා-වෙන් වැසුණු සමාජ ජීවිතය නඟන දුක සැප වේදනා ද බොල් හඬකි. ගැමියන්ගේ අවමඟුලෙහිදි රෙදි කඩින් නොවැසුණු දවුල හා නළාව නඟන හඬ දෙකන් විනිවිද ගොස් හද කම්පනය කරන්-නෙකි. ඒ හඬ දුකින් විලාප නඟන ගැමි ගැහැනුන්ගේ ශෝකය අහසට නඟා පතුරුවන ආදිකාලීන ජනවාදන වෙසෙසක්යයි තිස්ස සිතුවේ ය.

කොළඹදී ඉඳහිට විහාරස්ථානයකට ගිය තිස්ස දුටුවේ ගතානු-ගතිකව වැඳුම් පිදුම් කරන්නන්ගේ ආමිස පූජා පමණි. ආගමික හැඟීම විසින් කම්පනය කරනු ලැබූ ඇතුළු හද ඇත්තන් කී දෙනකු ඔවුන් අතර සිටිද්දැයි සෙවීමට ඔහු නොවෙහෙසුණේ ය. ඔහු පල්ලියකට ගියේ පියල් හා නන්ද ඇසුරු කරන ගැහැනියකගේ හෝ පිරිමියකුගේ විවාහ මඟුලක් හෝ අවමඟුලක් සඳහා පමණි. අඹු සැමියන්ගේ ගේහසිත ප්‍රේමය ලෝකෝත්තර අකාම කාමයට නැකම් ඇත්තක් කරනු පිණිස පැවැත්වුණු ගුඪ සිරිත් තිස්සට රුචි නොවී ය. ඔහු දන්නේ නගරයේ බෞද්ධයන්ගේ ආගමික ජීවිතය පමණි. ඒ දැනුම ද නගරයේ විහාරස්ථාන තුන හතරකට යැමෙන් ලත් අත් දැකීමට සීමා වී ය.

ආගම් ඇදහීම සමාජයේ ශිෂ්ට ආචාර විශේෂයක්.වී ඇතැයි යන හැඟීම නගරයේ ඇතැම් විහාරයකට ගිය අවස්ථාවෙහි ඔහුගේ සිතට නැංගේ ය. නගරයෙහිදී ඔහු උකහාගත් හැඟීම් හා අදහස් වැරදි බව ඔහුට හැඟුණේ මේ වර ඔහු කොග්ගල වාසය කළ දෙමාසය තුළ ය. ඔහු ඒ දැක්ම ලැබුවේ ගරාවැටුණු මහගෙයි වෙසෙන තම මවගේ දිරුණු සිත කය දෙක දැකීමෙනි; අනුලාගේ රෝගය ගැන සිතීමෙනි. ඒ දෙදෙනාම තනිකම හා දුක් වේදනා ද ඉවසමින් ප්‍රීතියෙන් පමණක් නොව ආනන්දයෙන් ද ජීවත් වෙති. පියල්ගේ මව අනුලාට සාත්තු කරමින්, ඈ කෑම කන පිඟානෙහිම බත් දමාගෙන කමින්, ඇගේ කාමරයෙහිම නිදමින්, මිඩියක මෙන් ඇට සේවය කරමින් ප්‍රීතියෙන් ජීවත් වෙයි. නැන්ද නන්ද කෙරෙහි කිපී කලකිරී සිටින බව තිස්ස දනියි. එහෙත් ඈ අනුලා සුව ලබනු දැකීමේ ආසාවෙන් වෙහෙසෙන්නේ ආගමික හැඟීමට සමාන හැඟීමකිනි.

Scanned by CamScanner

ඒ ආගමික හැඟීම, නන්ද කෙරෙහි කලකිරුණු ඇ විසින් ආරූඪ කරගත්තක් නොව, ඇගේ අධ්‍යාත්මයෙහිම අංගයකි. ඈ ඇගේ දයාවත් කරුණාවත් නන්දගෙන් ඉවත් කොට දුක් විඳින අනුලා කෙරෙහි රැඳවූවා ය.

ගැමියන් තමන්ගේ අවංක සුහද හැඟීම විහාරස්ථානයෙහිදී බුදු පිළිමය, බෝගස, ස්තූපය යන අනුහස් ඇති සංකේතයන් ඉදිරියෙහිදී උතුරුවා වගුරුවනු තිස්ස දුටුවේ ය. ඔහු තම මව හා සහෝදරියන් ද අනික් ගැමි ගැහැනුන් ද විහාරස්ථානයෙහිදී වැඳුම් පිදුම් කරනු කුඩා කල දහස් වරක් දැක ඇත. එහෙත් කුඩා වියෙහිදී ඔහු ඒ දැකුම් වටහා ගත්තේ සුරංගනා කතාවලින් හැඳින්වෙන පුවත් සිහිකරන්නකු ලෙසිනි. තරුණ වියෙහිදී ඒ දැකුම් ඔහු දුටුවේ උගැන්මෙන් හා බුද්ධියෙන් යට කරනු ලැබූ ආගමික හැඟීම් ඇත්තකු ලෙසිනි.

හදවත කාගෙන ගොස් අධ්‍යාත්මය වෙනස් කරන අවිතථ දුකත් සැපත් දැක්වෙන ගැමි ජීවිතය ප්‍රකෘති ජීවයෙන් ඈත් නොවූවකියි යන හැඟීම තිස්සගේ සිතට පිවිසියේ ය. ඔහු වෙන ද ගැමි ජීවිතයෙහි කුහකකම දුටු තැන මේ වර දකින්නේ සකස් නොකරනු ලැබූ නිර්ව්‍යාජත්වයයි; වෙන ද මෝඩ ඇදහිලි දුටු තැන මේ වර ඔහු දකින්නේ මූඪ භක්තියට යටින් ඇති නියම ආගමික හැඟීමයි.

දිළිඳුකම නිසා තරුණ වියෙහිදීම අපිස් ජීවිතයට පුරුදු වුණු ඔහු ජීවයෙහි ගැඹුර තර්ක බුද්ධියෙන් දැකීමට අසමර්ථයෙක් වී ය. ඔහු ජීවයෙහි ගැඹුර හඟින්නේ ශිෂ්ටත්වය විසින් නොහික්මවනු ලැබූවන් ගොළුවන් මෙන් දුක්පීඩා හා වද වේදනා විඳිනු දැකීමෙනි. උගැන්මෙන් හා බුද්ධියෙන් වැළැක්විය හැකි දැඩි දුක් වේදනා විඳින ගැමියන්ගේ ජීවිතය ජීවන සයුරෙහි ගැඹුර දක්වන එළියක්යයි ඔහු සිතුවේ ය.

ගම සිටි කාලය තුළ තිස්ස හත් අට වරක් සෝමා දකින්ට ගොස් ඈ හා කතාබහ කෙළේ ය. පළමුවර ඔහු ඈ දකින්ට ගියේ හැකුළුණු බුද්ධිය හා එයින් නැඟුණු හැඟීම් ද ඇත්තකු ලෙසිනි. ස්ත්‍රිය පතිදම් රැකීමට ශක්තිය ඇතිව උපන්නක නොවේයයි ඔහුගේ දැනුමත් බුද්ධියත් ඔහුගේ හදට කොඳුරා කියයි. එහෙත් සෝමා නිසා පිබිදුණු ආසාවෙන් තමා කොළඹදී වෙසඟනක කරා යෑමෙන් කිලිටු වූවෙකියි යන හැඟීම ඔහුට සිතින් බැහැර කළ නොහැකිය.

නැන්ද (පියල්ගේ මව) තිස්ස අරබයා තමාට යෝජනාවක් කළ බව සෝමා සෘජුවම තිස්සට කීවා ය.

''මම ඒකට කැමැති උණේ නෑ''යි ඈ කඳුළු රැඳි දෙනෙත් ඇතිව තෙපලා ය. ''මම මෙතෙක් කල් කිසිවෙකුට ආලය කෙළේ නෑ. නමුත් මම තිසාට මගේ මුළු හිතින් ආලය කරනවා. මම තිසාට

ආලය කරන්න පටන්ගත්තේ කොළඹදී. මෙතෙක් කල් මම ඒ හැඟීම මැඩගන්න වෑයම් කළා.''

විවාහ ජීවිතයට ඇතුළු වන අදහසක් නැතිව තමා සෝමා වෙතට යැම පවක්ය යන හැඟීම මැඩීමට තිස්සගේ බුද්ධිය හා දැනුම අපොහොසත් වී ය. ඇගේ රූ සපුව බලා ආස්වාදයක් ලැබීම තෙරිණියකගෙන් කාමාස්වාදය ලබන්ට වෑයම් කළ ධූර්තයාගේ සාහසික කම වැනි සාහසික කමක් යයි ඇතැම් විටක තිස්ස සිතුවේ ය. එහෙත් සෝමා තමා දැකීමට එන්ට ඔහුට අනුබල දුන්නාය.

හත් අට දවසක් ම තිස්ස ඇ හා කතාබහ කෙළේ ය. ඇ විවාහ නොවන්නට තීරණය කෙළේ කුමන කරුණක් නිසාදැයි ඔහුට නොදත හැකි වී ය. අනුමානයෙන් ඒ කරුණ සිතාගැනීමට මඟ පාදනා කිසිවක් ඇ නොකීවා ය. තේරවිලි කුමාරියක ලෙස සෝමා තිස්සගේ කුහුල වැඩුවා ය.

''විවාහ ජීවිතයට ඇතුල් නොවන්ට මම තීරණය කරගත්තේ මීට අවුරුදු ගණනකට පෙර'' යි සෝමා ශෝකයෙන් කීවා ය. ''ඊට පස්සේ මම අපේ නෑ තරුණයන් හා කතාබහ කරමින් සන්තෝෂ උණා. ඔවුන්ගෙන් දෙදෙනෙක් මට ආලය බැඳගන්ට වෑයම් කළා. කර්කශ තෙපුල් තෙපලීමෙන් මම ඔවුන් දෙදෙනාගේ ඇල්ම විනාශ කළා. ඔවුන් දෙදෙනාම මගෙන් ඈත් උණේ මට අමූලික චෝදනා නඟමිනි. අම්මා මා කොළඹ පියල්ලයි ගෙදරට යැවුවේ ඊට පස්සේ.''

''විවාහ ජීවිතයට ඇතුළු නොවන්ට සිතාගත්තේ කුමක් නිසා ද'' යි තිස්ස තුන් වන වරටත් ප්‍රශ්න කෙළේ ය.

තිස්ස මේ ප්‍රශ්නය අසන හැම විටම සෝමාගේ සිතෙහි හටගන්නේ කැලඹීමකි. ඒ කැලඹීම ඇට සඟවාගත නොහැකි ය. ඇගේ මුහුණ මලානික වේශයක් ගනියි. ඇගේ සිත පමණක් නොව ගත ද සැලෙන බව ඇගේ කටහඬින් හෙළි වෙයි. ඇගේ කටින් පිටවන්නේ වේදනාව ආවේග වුණු වදන් ය.

''ඒක ගැන මගෙන් අහන්න එපා.''

මේ අර ප්‍රශ්නයට සෝමා සැම විට දුන් පිළිතුරයි. තිස්ස ඒ ප්‍රශ්නය නැවත නැවතත් ඇසූ අවසක සෝමා කිපී පිරිමින්ට බැණ වැදුණා ය. ඇ බැණවැදුණේ කෝපයෙන් නොව ද්වේෂයෙනි. සුහද සිතක් ඇති ඇගේ හද, සැඟවුණු ද්වේෂයකට ගඳකිළියක් වූයේ කෙසේ ද?

සෝමා නිසා තිස්සගේ සිතට ඇතැම් විට නැංගේ නොවිසඳිය හැකි ප්‍රශ්නයකි. 'සෝමා නිසා මා විවාහ ජීවිතයට ඇතුළත් විය යුතු ද?' යන ප්‍රශ්නය තිස්සගේ සිතට නොයෙක් වර නැඟිණ. කිසි

විටක ඔහු එය නොවිසඳුවේ ය. තමා විසින් කිය යුතු කළයුතු දේ පිළිබඳ ප්‍රශ්නයක් සිතාමතා විසඳීමට තිස්ස අසමර්ථයෙකි. ඔහු එවැනි ප්‍රශ්න බොහෝ විට විනිශ්චය කරන්නේ හැඟීමෙනි. සිතන්ට ගියොත් ඔහුට විනිශ්චයකට බැසගත නොහැකි වෙයි. තිස්සට විසඳිය නොහැකි වූ අර ප්‍රශ්නය සෝමා නිසා ඉබේම විසඳුණේ ය. සෝමා ''මම විවාහ ජීවිතයට ඇතුල් වන්නේ නැහැ' යි කියනු පළමු වර ඇසූ තිස්ස සිතින් සන්තෝෂ වූයේ ය.

''මම සෝමා බලන්ට නිතර එන එක වැරදියි'' තිස්ස කීවේ ය.

''නෑ'' යි කියමින් සෝමා සිනාසුණා ය. ඇගේ ද්වේෂය හෝ දෙමනස පිළිබඳ සලකුණකුදු ඇගේ මුහුණෙහි නොවී ය.

''තිසා නිතර මම බලන්න එන්න. මම තිසා දකින්න ආසයි; තිසා එක්ක කතාකරන්නත් ආසයි. නැන්ද මට අඩගැහුවා කොග්ගලට යන්න. මම විවාහ වෙන්නේ නැහැයි කියන්නේ බොරුවටයයි නැන්ද හිතනවා. එහේ හුඟක් දවස් නැවතිලා ඉන්න-යයි නැන්ද කිව්වා. මම එහේ මාස දෙක තුනක් නවතින්න යන්නයි හිතාගෙන ඉන්නේ. තිසා කොළඹ ගොහින් ආයිත් කොග්ගලට එන්න.''

''සෝමා බලන්න මම නිතර එන කොට.........''

''අපට මොකොද, මිනිසුන් ඕපාදූප දෙඩුවාම? ඕපාදූපවලට බයවෙන්න ඕනෑ මම කසාද බඳිනවා නම්'' කියමින් සෝමා යළිත් සිනාසුණා ය.

''අම්මා කැමැති වෙන එකක් නෑ.........''

''අම්මා හොඳටම කැමැතියි.''

සෝමා විවාහ ජීවිතයට ඇතුළත් නොවන්ට තීරණය කෙළේ කුමක් නිසාදැයි තිස්ස නොදනියි. සෝමා හමුවී කතාබස් කිරීමට තමා නුසුදුස්සෙකියි තිස්ස සිතන බව සෝමා නොදනියි; දැනගත්තත් ඒ නිසා කිසිම කුහුලක් ඇ තුළ හටගනිතියි ඔහු නොසිතුවේ ය.

''ආදරය'' විසිතුරු අරුත් උකහාගත් සාටෝප වචනයක් කොට සලකන්නක මෙන් විවාහ ජීවිතය ගැන කතා කිරීම තිස්සගේ පුදුමයට හේතු නොවී ය. එහෙත් ඇ එසේ කථාකිරීමත්, විවාහ ජීවිතයට ඇතුළු නොවන්ට තීරණය කිරීමත්, ඒ තීරණය ගැන ප්‍රශ්න කරන විට ඇ තුළ ද්වේෂයක් හට ගැනීමත් එකිනෙකට ඇඳී සිටින අදහස් හා හැඟීම් ලෙස තිස්ස දකියි. සෝමා පොතින් පතින් ලත් දැනුමකින් නොව කිසියම් දුර්ලභ අත්දැකීමක්, විඳි දුක් වේදනාවක් නිසා තැන්පත් නුවණක් ලැබුවක විය යුතු ය. ඒ අත්දැකීම කිසි-වකුට නොකිව යුතු රහසක් ලෙස සලකන හෙයිනි, ඇ විවාහ නොවන්නේ කුමක් නිසා ද?'' යි අසන විට කිපෙන්නේ.

# 13

පියල් වෙන ද මෙන් ආසාවෙන් හා සන්තෝෂයෙන් කන්තෝරුවේ වැඩ නොකරයි. ඔහුගේ වෙළඳාම කෙමෙන් පිරිහෙන්ට වී ය. ඔහු කන්තෝරුවේ තම සේවකයන් හා කලහ කරයි.

සේප්පුවේ චැක් පොතෙන් කොළයක් නැති වීම ගැන පියල් සේවකයන් කැඳවා ඔවුන්ගෙන් ප්‍රශ්න කෙළේ ය. සේප්පුවේ යතුර චන්ද්‍රසෝමට නුදුන් බව කැෂියර් දිවුරා කී නමුත් පියල් ඔහුගේ කීම විශ්වාස නොකෙළේ ය. කන්තෝරුවෙන් අස් කරනු ලැබූ ඔහු පියල්ට අලාභ හානි කරන අදහසින් ක්‍රියා කරන්ට පටන් ගත්තේ ය. චැක් පත සොරකම් කරන ලද්දේ කවරකු විසින් දැ යි නිසැකව දත නොහැකි වී ය. එය බැංකියට නොගිය නිසා එය සොරකම් කළ මිනිහා සොයන්ට පියල් වැඩිපුර නොවෙහෙසුණේ ය. ඔහු චන්ද්‍රසෝමගෙන් චැක්පත ගැන ප්‍රශ්න නොකෙළේ ය.

චැක්පත නැති වී තුන් මසකට පසු චන්ද්‍රසෝම පියාගේ වත්තට ගොස් කොන්දෙස්තර බියගන්වා රබර් රාත්තල් හත්සීයක් පමණ වැන්රථයක පටවාගෙන ගොස් විකුණුවේ ය.

චන්ද්‍රසෝම මුදල් නාස්ති කරන්නේ යහළුවන් සමඟ සෙල්ලම් ගමන් යෑමටත් මත්පැන් බීමටත්යයි පියල් කල්පනා කරයි. එහෙත් චන්ද්‍රසෝම යහළුවන් උදෙසා අත මිට දිගහැර වියදම් කරන්නෙක් නොවේ; ඔහු යහළුවන් ලවා ද වියදම් කරවන්නෙකි. ඔහු සාහසික කම් කිරීමෙන් ආස්වාදයක් ලබන්නකු වුව ද මුදල් සැපයීමටත් මුදලටත් ආශා කරන්නෙකි. ඔහු පියාගේ වත්තෙන් රබර් රාත්තල් හත්සීයක් ගෙන ගොස් විකුණුවේ වියදමට මුදල් වුවමනා කළ නිසා නොවේ. මුදල් අත ගෑමට ආසා කළ හෙයිනි.

යහළුවෝ ඇතැම් විට 'මුදලාලි' යයි කියමින් චන්ද්‍රසෝමට සරදම් කළෝ ය. ඔහුගේ සාහසික වේගයට යටින් ඇති මේ මුදල් පිළිබඳ ආසාව ඔහු නොදැනුවත්වම තම පියාගෙන් ටිකින් ටික ලත් ඇබ්බැහි කමකි. ඒ ශික්ෂණය ඔහු ඔළමොළ කමින් වළකන්නක් නොවී ය. එහෙත් මුදල් වියදම් කළ යුතු අවස්ථාවෙහි ඔහු තම මිතුරන් පවා අසන්තෝෂ කරමින් ක්‍රියා කරන්නේ ඒ හික්මීම නිසා ය.

චන්ද්‍රසෝම හා ඔහුගේ යහළුවෝ ද විනෝද ගමනක් යන සමහර විටක නාගරික තරුණියක හෝ දෙදෙනකුන් හඬගාගෙන



Scanned by CamScanner

යති. අත මීට දිගහැර මුදල් වියදම් කළ හැක්කේ චන්ද්‍රසෝමට පමණි.

වරක් ඔවුන් සමඟ ගිය තරුණියක් මහනුවර සාප්පුවකට ගොස් රුපියල් විසි පහක් වටනා බෑගයක් තෝරා ගත්තා ය. සාප්පු-කාරයා බිල ගෙනා විට තරුණිය චන්ද්‍රසෝමගේ අත මිරිකා බිල ඔහු අතට දුන්නා ය.

''මා ළඟ මාරු කරපු සල්ලි එච්චර නෑ''යි කියමින් ඔහු රුපියල් පන්සීයක වැක් පතක් සාප්පුකාරයාට දුන්නේ ය. ඒ වැක්පත සාප්පුකාරයා ආපසු චන්ද්‍රසෝමට දුන්නේ ය.

''අඳුනන්නේ නැතිව මේ තරම් මුදලක වැක් එකක් මාරු කරන්න බැහැ.''

''මේ මහත්තයා කොළඹ පියල් වැලිවල මුදලාලිගේ පුතා''යි එක් තරුණයෙක් චන්ද්‍රසෝම හඳුන්වා දුන්නේ ය. ''ආංඩුව පළමු වරට මුදලි තනතුරක් දුන් සිංහල වෙළෙන්ද වැලිවල මුදලාල''

සාප්පුකාරයා චන්ද්‍රසෝමගේ හිසේ සිට දෙපා තෙක් බැලුවේ ය. අනතුරුව ඔහු තරුණිය දෙස බැලුවේ ප්‍රශ්නයක් නඟන්නාක් මෙනි. මුහුණ බැලූ පමණින් මිනිසුන්ගේ ගති ගුණ මනින්ට පුරුදු වූණු වෙළෙන්ද වැක්පත මාරු කිරීමට වැඩි කැමැත්තක් නොදැක්වී ය.

''වැලිවල මුදලාලි නම් අපි හොඳටම දන්නවා. ඒ මුදලාලිගේ රුපියල් දෙතුන් දහක වැක්එකක් උණත් අපි මාරු කරනවා. දූන් වැක් ගනුදෙනුව ටිකක් පරෙස්සමෙන් කරන්න ඕනෑ කාලයක් හොර අත්සන් ගහපු වැක්...........''

වෙළෙන්ද චන්ද්‍රසෝමගේ මුහුණ බැලුවේ ය.

''හොඳයි මම කොළඹට ටැලිපෝන් කරලා අහලා වැක්එක මාරු කරන්නම්.''

''එපා; ඕනෑ නෑ. කොළඹට ටැලිපෝන් කරන්න ගියොත් අපට මෙතන දෙපැයක් ප්‍රමාද වෙන්න වෙනවා.''

තරුණියත් අනිත් තරුණයෝ දෙදෙනාත් කතාබහ කළෝ ය. එක් තරුණයෙක් රුපියල් දහයක් සාක්කුවෙන් එළියට ගත්තේ ය. තරුණිය ද තම අත් බෑගයෙන් රුපියල් පහක් එළියට ගත්තා ය.

''කීය ද අඩු?'' යි ප්‍රශ්න කරමින් චන්ද්‍රසෝම ඔවුන් වෙතට ළංවූයේ ය. ''දහය ද අඩු? මෙන්න රුපියල් දහය.''

චන්ද්‍රසෝම ළඟ රුපියල් අනූවකට අඩු නොවන ගණනක් ඇතැයි පියසේන දනියි. ඔහු ස්වාමියා පස්සේ යන බල්ලකු මෙන් චන්ද්‍ර-සෝම ඇසුරු කරන්නෙකි. චන්ද්‍රසෝම මෙතරම් කපටි නුවණ

ඇත්තෙකියි පියසේන නොසිතුවේ ය. ඔහු කලකිරෙනු වෙනුවට තම යහළුවා ගැන දැඩි විශ්වාසයක් ඇති කරගත්තේ ය.

පියසේන මුලදී සිතුවේ චන්ද්‍රසෝම 'උඩ හිටියත් එකයි බිම හිටියත් එකයි' යන හැඟීමෙන් සාහසික කම් කරන්නකු ලෙසිනි. ඔහු නුවරඑළියට ගිය අවස්ථාවේ රේස් ඔට්ටු ඇල්ලීමෙන් රුපියල් හාරසියක් දිනුවේ ඔහුගේ ම ශූරකමිනි. නුවරඑළියෙන් එද්දී අතර මඟදී එක් යහළුවෙක් 'තානායමට ගොස් කෑම කමු'යි යෝජනා කෙළේ ය. චන්ද්‍රසෝම සැන්ඩ්විච්, පැටිස්, කට්ලිස් සහිත පොදියක් හා විස්කි බෝතලයක් ද පෙන්නා 'අන්න අර ගහ යටට වෙලා අපි හොඳටම කමු'යි කීවේ ය.

හිරු රැසින් නොතවනු ලබන ගස් සෙවණෙහි පිරිසිදු වියලි තණ බිස්සෙහි හිඳගත් ඔවුහු පිපාසාතුරයන් මෙන් විස්කි බී, හාමත්වූ කොටියන් මෙන් මස් පාන් කෑහ.

''තානායමට ගියා නම් වැඩිපුර සල්ලි ගෙවා අපට කන්න වෙන්නේ පිලුන් මස් මාළු'' යි කියමින් එකෙක් විස්කි වීදුරුව උගුරු තුනට බිවේ ය.

''මිට පස්සේ තානායම් පලකට යන්නේ නෑ''යි ඩැරල් සේනාරත්න කීවේ ය.

කෑම කෑ ඔවුහු හිරු රැසින් උණුසුම් වුණු සුළඟින් සනසනු ලැබූහ. ගල් කුළුවල හැපි හැපී පෙණ නඟමින් පල්ලම ඔස්සෙ බැස යන නදිය කරා, හිස් විස්කි බෝතලය ගත් පියසේන ගමන් කෙළේය. 'ගෙනා වතුර ඉවරදැ'යි චන්ද්‍රසෝම ඇසුවේ ය.

ඈත තියාගත් බල්ලෙක් කෑම කන්නන්ගේ කටවල් දෙස බලමින් කෙල ගිලියි. ඩැරල් බල්ලා දෙසට වීසි කළ මස් කැබැල්ල බිම වැටෙන්ට පෙර කපුටුවෙක් ගසා ගෙන ගියේ ය. බල්ලා 'හව්' ගාමින් කපුටුවා වෙතට පැන්නේ ය.

''කාක්කා පුරුදු කාරයෙක් වගෙයි.'' චන්ද්‍රසෝම කීවේ ය.

''නුවරඑළියට යන නුවරඑළියෙන් එන කාර්වලින් සමහරක් නවත්තන්නේ මේ ගහ යට''යි ඩැරල් කී ය. ''කාර්වල මිනිසුන් කෑම කන්නේ මේ ගහ යට වාඩිවෙලා. කාක්කාන්ට ඔය ගසාකෑම පුරුදුවෙලා තියෙන්නේ මිනිස්සු උන්ට අල්ලාගනු පිණිස මස් කෑලි උඩ වීසිකරන නිසා.''

තරුණිය නුවර සාප්පුවෙහිදී අත් බෑගය තෝරා ගත්තේ චන්ද්‍ර සෝම ලවා මුදල් ගෙවන අදහසිනියි පියසේන සිතුවේ ය. ඇ අතර මඟදී චන්ද්‍රසෝමගේ සිත් ගන්ට වෑයම් කළා ය. ඔහුට සරදම් කළා ය; ඔහු දෙඩවනු පිණිස ප්‍රශ්න ඇසුවා ය. ඈ එක සැමියකු පතන සීතාවක නොවූව ද විනීත ගති හා පැවතුම් ඇති

Scanned by CamScanner

තරුණියකි. ඇගේ බැල්මට හා ගමනට යටින් කාමය කුප්පන ගති-යක් ඇතැයි සිතූ පියසේන චන්ද්‍රසෝම ඇ හා හාද නොවීම ගැන පුදුම වූයේ ය. ඇ තෝරාගත් අත් බෑගයට මුදල් නොගෙවූ චන්ද්‍රසෝම චරිත ශක්තිය ඇත්තෙකි. එහෙත් ඔහුගේ ක්‍රියාව ඔහුට පියාගෙන් ඇබබෑහි වුණු වෙළඳ ප්‍රයෝගයක් විය යුතුයයි පියසේන සිතුවේ ය.

ඇලන්ගේ වියෝගයෙන් ශෝකාතුර වූ පියල්, චන්ද්‍රසෝමගේ සාහසික කම් නිසා බිඳුණු සිත කය ඇත්තෙක් වී ය. නාලිකා, සුළු වෙළෙන්දකුගේ පුතකුට ආලය කරන බව ටික දවසකට පෙර පියල්ට දැනගන්නට ලැබිණ. ඔහු කලබල නොවී ය. නාලිකා පිළිබඳ පුවත ඔහු නන්දට නොකීවේ ය. ඒ පුවත නන්ද දැනගත්තොත් නාලිකාට බැණ වැදී කලහ කරයි.

ඇලන් ලංකාවෙන් පිට වී ගිය පසු පියල්ගේ සිතුම් පැතුම් වෙනස් වී ය. සමාජයෙන් ඈත්ව ජීවත් වන වෙළෙන්දන් හා ඔවුන්ගේ දූ දරුවන් ඇසුරු නොකිරීම වරදක්යයි ඔහු සිතයි. ඔහු අඳුනන වෙළෙන්දෝ ඔහුට සිනාසෙති. ඇතැමෙක් 'දරුවන්ට මේ කාලේ හුඟක් දුරට ඉංගිරිසි උගන්නන එක හොඳ නෑ'යි කීවේ ය.

නීතිඥයන්, දොස්තරුන්, ආණ්ඩුවේ උසස් නිලධාරීන් ඇසුරු කළ පියල් දූන් ඔවුන්ගෙන් ඈත් වන්ට සිතයි. නාලිකා වෙළෙන්-දකුට ආලය කරන බව දැනගන්ට ලැබීම ඔහුගේ කෝපයට හේතු නොවී ය.

දූන් වෙනදටත් වඩා රැ බෝ වී පියල් ගෙදර එයි. වෙනද මෙන් ඔහු කතා නොකරයි. වෙනද නන්ද හා කතාබහ කරමින් සන්තෝෂ වන ඔහු දූන් කතා කරන්නේ නන්ද අසන ප්‍රශ්නයකට පිළිතුරු දෙනු පිණිස පමණි. තම සැමියාගේ මේ වෙනස විපතක පෙර ලකුණක්යයි සිතූ නන්ද ඔහු සනසන්ට වෑයම් කළා ය. ඉක්-මනින් ඔහු කිසියම් රෝගයකට ගොදුරු විය හැකි ය.

චන්ද්‍රසෝම ගැන ළතවන්නේ කුමට ද? ඔහුට ඉගැන්වීමට අප කෙතෙක් මහන්සි ගත්තා ද? ඔහු දඟකාරයකු වනු වළකන්ට ඔබ කෙතරම් වෑයම් කළා ද? එයාගේ කොටස වෙනුවෙන් මුදලක් බැංකියේ තැන්පත් කොට මාසෙකට නියමිත ගණනක් එයාට බැංකියෙන්ම ගෙවන්ට සලස්සන්න. එයාට ඕනෑ විදියකට ජීවත් වන්ට හරිනවා මිසක් වෙන කුමක් කරන්ට ද? දුව සෑහෙන කෙනෙ-කුට කසාද බන්ද දී අපි වත්තට ගොස් එහි පදිංචි වෙමු. මාස් පතා මුදලක් අතට ලැබෙන කොට චන්ද්‍රසෝම ඒ මුදල පරෙස්සම් කරගන්න හිතාවී.

"අපි යෝජනා කරන කෙනෙක් එක්ක දුව විවාහ වෙය කියා මට හිතෙන්නේ නෑ" යි පියල් ශෝකයෙන් තෙපලේ ය.

Scanned by CamScanner

''අපි කියන එහෙකට නාලිකා කැමති වේවි'' යි නන්ද දැඩි විශ්වාසයෙන් කීවා ය.

''නාලිකා කරෝලිස් සිල්වාගේ පුතාට ආලය කරනවා.''

''මොනවා!''

අන්දමන්ද වූ නන්ද පුටුවෙන් නැඟී සිටියා ය.

සැමියාත් නන්දත් කතාබහ කෙළේ ඉරිදවක දහවල් කාලයෙහි ය. එහෙත් පුටුවෙන් නැඟවුණු නන්ද දුටුවේ වටින්පිටින් එන දැඩි අඳුරකි. නාලිකා දෙස්තරකුට හෝ ආංඩුවේ උසස් සේවකයකුට හෝ විවාහ කොට දීම නන්දගේ පැතුම්වලින් නොනට එකම පැතුම වී ය. එය ඇගේ හද වසා පැතිරෙන දුක් අඳුර මැද පහනක් සේ මෙතෙක් බැබළිණ.

''දුව සවිමන් කබලාන සමඟ විවාහ වෙන්න පොරොන්දු වෙලා තියෙනවා.''

''කරෝලිස් සිල්වාගේ පුතා එක්ක !''

''ඔව්.''

''නාලිකා සවිමන් කබලාන අඳුනාගත්තේ කොහොමද? මොන උළව්වක් ද? එයා කවදද මෙහි ආවේ? හරි අපරාදයක්! එයා ආවා නම් එලවනවා.........''

''කලබල වෙන්න එපා නන්ද. දැන් කලබල වීමෙන් වැඩක් නෑ. සවිමන් ඇලන්ගේ යාළුවෙක්.........''

''මොනවා! මොන අපරාධයක් ද?''

''අපි මෙතෙක් කල් ජීවත් උණේ අපිම සිතින් හදගත් ලෝකෙක. එයින් පිට සිදුවෙන කිසිවක් අපට පෙනුණෙත් නෑ; අපි සෙවුවෙත් නෑ. සවිමන් සමස්ත සාස්ත්‍රසාලාවේ දැවුරුද්දක් ඉගෙනගත්තා. අවසාන විබාගය තෙක් ඉගෙනගත්තේ නෑ. එයා වෙළඳාමක් කරනවා; වෙළඳාමට නම් සූරයා..............''

පියල්ගේ කටින් පිට වූ අවසාන වදන් නන්දගේ ශෝකය දියුණු කෙළේ ය. පියල් කබලානට විරුද්ධ නොවෙතියි යන හැඟීම නන්දගේ සිතට ආරූඪ වූයේ ය.

කඳුරු සේ තිත්ත කසායක් ගිලින්නාක් මෙන් නන්ද, නාලිකා පිළිබඳ පුවත සිතින් ගිලගත්තා ය. ගිල ගත් පසු ඇට තිත්ත රස නොදැනිණ. එහෙත් ගිල ගත් වසවිස වෙසෙසක් මෙන් ඒ පුවත හද දවන්ට වී ය. විපත් පිට විපත් ඉවසීමෙන් බිඳුණු සිත කය ඇති තම සැමියාට තවත් වධයක් විය හැකි බැවින් නන්ද තම ශෝකයත් කෝපයත් පිට නොකරන්ට සිතාගත්තා ය.

Scanned by CamScanner

''නාලිකා එහෙම එකක් ගැන සිතන්න ඕනෑ අපෙනුත් අහලා. එයාට ඕනෑ හැටියට වැඩ කරන්න දෙන්න බැහැ. මීට මාස කීපෙකට උඩදී නාලිකා ගැන සිරිල් විජේතුංග දෙස්තරට මම යෝජනාවක් කෙරෙව්වා. මගේ කීමට ඒ යෝජනාව කෙළේ කුලසූරිය දෙස්තරගේ නෝනා–මාලිනී. එයා අපේ නැන්ද කෙනෙකුගේ දුවෙක්. සිරිල් කැමතිවෙලා තියෙනවා. එයා නාලිකා අඳුනනවා. නාලිකා හොඳ මොළයක් ඇති කෙල්ලක්''යයි එයා කියා තියෙනවා. චන්ද්‍රසෝම ගැන හිතහිතා සිටි නිසා මට ඒක ගැන පියල්ට කියන්න බැරි උණා.''

නන්ද කී පුවත ඇසූ පියල් වැඩි කුහුලක් නොදක්වූයේ ය. ඔහු දුන් හැම දෙයක්ම සලකන්නේ දැඩි උදසීනත්වයෙනි. නාලිකා පිළිබඳ පුවත ඔහු නන්දට කීවේ ද තමා ඇසූ පුවතක් සංවේගයෙන් තොරව කියන්නකු ලෙසිනි. ඔහු කෝපයක් හෝ ශෝකයක් පළ නොකෙළේ ය. ඔහු ජීවිතය විසින් හෙම්බත් කරනු ලැබූවකු මෙන් සිතයි; කතා කරයි; ක්‍රියා කරයි. පියල්ගේ මේ වෙනස් වීම නන්ද ඉවෙන් මෙන් දැන ගත්තා ය.

''නාලිකා, කබලාන හැර වෙන කෙනෙක් කසාද බඳින්න කැමති වෙන එකක් නැහැ; අවුරුදු ගණනක සිට ලියුම් ගනුදෙනු කරනවා එයා එක්ක.''

''ලියුම්!'' යි නන්ද කෝපයට වැඩි විස්මයෙන් තෙපලා ය. නාලිකා තරුණයකුට අවුරුදු ගණනක සිට ලියුම් ලියයි. එහෙත් නන්ද නොදනියි! නාලිකා විසින් තමා රවටන ලදැයි සිතූ නන්ද කෝප වූවා ය. නන්දත් සැමියාත් මෙතෙක් කල් වාසය කෙළේ සිතින් මවාගත් ලෝකයකය යන කීම ඇත්තකි. නාලිකා තරුණයකුට ලියුම් ලියන බව සැමියාට පෙර නන්ද විසින් දැනගත යුත්තකි. ඇගේ කාමරයට නිතර යන්නේ පියල් නොව නන්ද ය. නාලිකා නමින් ලැබුණු ලියුම් ඇ අතට යන්ට ඇත්තේ තමා අතින්මයයි සිතූ නන්දගේ සංවේගය වැඩි වී ය. නාලිකාගේ හිතුවක්කාර කම ගැන වගකිව යුත්තා නන්ද ය. නන්ද කෙරෙහි දැඩි විශ්වාසයක් තැබූ පියල් දරුවන් සඳහා ඇ කියූ හැම කාරියක්ම කළා ය. පියල් සිත කය දෙකි න්බිඳ වැටීම ගැන තමා ද වගකිව යුතුයයි සිතූ නන්ද තුළ බලවත් සන්තාපයක් හටගත්තේ ය.

තම තරුණ විය සිහි කළ නන්ද නාලිකාට වඩාත් කිපිණ. පියල් එවූ ලියුම් එකකටවත් තමා පිළිතුරු ලියුම් නොලියූ බව නන්ද සිහි කළා ය. පියල් නිසා හටගත් ඇල්ම, මවුපියන් සිහි කොට, කරටියක් කඩා දමන්නාක් මෙන් කඩා දැම්මා ය. නාලිකා වැඩුණේ දෙමවුපියන්ගේ පා සෙවණෙහි ය. තරුණයකුට ලියුම් ලියන්ට ඇට සිතුණේ කෙසේ ද? ඇ මවුපියන් සිහි නොකෙළේ කුමක් නිසා ද? නන්ද තමා ගැනම කලකිරුණා ය. තම සැමියාගේ උදසීනත්වයට හේතුව කායික හෝ මානසික රෝගයක් විය හැකි ය.

Scanned by CamScanner

තමා මෙතෙක් කල් ක්‍රියා කෙළේ ඔහු නිසා උපන් දූඩි ඇල්මක් ඇත්තක ලෙස නොවේ. දැන් තම සැමියා උදෙසා කළ යුතු දෙයක් ඉවසිල්ලෙන් කළ යුතු ය. නො එසේ නම් ඔහු රෝගියකුව ඇඳෙහි වැතිරෙයි.

තිස්ස නිතරම නාලිකා ඇසුරු කරයි: ඇ සමඟ කතා බහ කරයි. වාද කරයි; ඇට සරදම් කරයි. නාලිකා කබලානට ලියුම් ලියන බව තිස්ස දනියි. ඔහු ඇහැත් කනත් පියාගෙන සිටියේ කුමක් නිසා ද? දරුවන් හා තම සහෝදරයා ද විසින් තමාත් තම සැමියාත් රවටන ලදැයි සිතූ නන්ද තුළ හටගත් සන්තාපය සියලු ආසා දවා ඇගේ හද පාලු පිටියක් කරන තරම උග්‍ර වී ය.

''නාලිකා මම හොඳට ම විශ්වාස කළා'' යි තමා කළ පාපය වමාරන්ට වෑයම් කරන්නක මෙන් නන්ද තෙපලා ය. ''මගෙන් අහන්නේ නැතිව කිසිවක් කරන්නේ නෑයි ඇලන්ගේ පටලැවිල්ලෙන් පස්සෙ නාලිකා කිව්වා. එයා මම රැවටුවා. මමයි වැරදිකාරි. එයාගෙ අදහසට මම ඉඩ දෙන්නේ නෑ.''

තම සැමියාගේ දෙනෙතට කඳුළු නඟිනු නන්ද දුටුවා ය. ඇගේ ඇතුළු හද වඩාත් දෙස් නඟන්නේ ඇට ය. සමාජ ජීවිතය මහත් කොට සලකන්ට වූයේ පියල් නොව නන්ද ය. තමා අනුගමනයට පියල්ට අනුබල දුන්නේ නන්ද ය. තමා කියූ හැම දෙයක් ඔහු කර බාගෙන කෙළේ ය. දරුවන් කරන අකීකරු කම් ගැන වගකිව යුත්තා නන්ද ය. එහෙත් දරුවන්ගේ අකීකරුකම් ගැන පියල් කිසි විටක තමාට දෙස් නොනැගූ බව නන්ද සිහි කළා ය. හැම විපතක් ඔහු කරබාගෙන ඉවසයි. ඒ ඉවසීමෙන් තුවාල ලබන්නේ ඔහුගේ ඇතුළු හදවතයි. කයටම ලේ ගැලෙන තුවාලයක් ලැබූවකු මෙන් තම සැමියා වේදනා විඳිතියි නන්දට හැඟිණ.

තම පරපුරත් අතීතයත් ජීවතුන් බිලි කොට ගන්නා උවදුරක් ද? රුපියල් දහස දෙදහස බැගින් වියදම් කිරීමෙන් අලුත්වැඩියා වුණු මහගෙදර දැන් කොයි වෙලේ සුන්බුන්ව විසිරෙද්දැයි නොකිව හැකි සේ දිරැණකි. මව මහලු විය තෙක් ජීවත් වුණු නමුදු කෙමෙන් දිරීමෙන් බිඳ වැටෙන්නක මෙන් මළා ය. අතුලා මළේ රෝගයකින් නොව මහගෙය දිරවන අතීතයම විසින් ටිකින් ටික ඇගේ ජීවය උරා ගැනීමෙහි විපාකයක් වසයෙනි. ඉමක් ගමක්, ඉන්ට හිටින්ට තැනක්, නැත්තකු සේ තිස්ස ඇවිද්දන්නේ ද තම පරපුරේ අතීතය විසිනි. මහගෙදර ඒ අතීතය අරක් ගත් තැනකි. එය සුන්බුන් කරවන්ට සිතවන තරම් ලාමක බියක් නන්දගේ සිතට ආවේ ය.

''කනගාටු වෙන්න එපා'' යි කියමින් නන්ද පියල්ගේ හිස තුරුළු කර ගත්තා ය. ''දරුවන් ගැන උණත් ඕනෑවට වැඩිය

හිතන්න ඕනෑ නෑ. අපි ඒ ගොල්ලන් උදෙසා කරන්න ඕනෑ හැම දේම කළා. දැන් ඒ ගොල්ලන් හදන්න මහන්සි වීමෙන් වැඩක් නෑ. ඒ ගොල්ලන්න හැදෙන්න ඉඩ ඇරලා අපි දැන් ජීවත් වෙන්න ඕනෑ. පරණ ගේ කඩවා දම්මන්න ඕනෑ. අපි වත්තට ගොස් එහි පදින්චි වෙමු.''

''ඒ පරණ පාලු ගේ කඩවා දමන්න තිබුණේ මීට කලින්'' යයි පියල් කීවේ ය. මහගෙදර නම ඇසූ පියල්ගේ සිතට නැංගේ ද්වේෂයකි. ඒ ද්වේෂය තම හදෙහි කොතනක සැඟවී සිටි හැඟීමක්දැයි නොදත් ඔහු පුදුම වී ය.

''මම කනගාටු වෙන්නේ නාලිකා ගැන නෙවි'' යි පියල් තෙපලේ ය. ''මම කනගාටු වෙන්නේ ඇලන් ගැන. නාලිකා කවරෙකු කසාද බැඳගත්තත් අපට දකින්ට ලැබෙනවා. චන්ද්‍ර-සෝම මැරකම් කළත් අපට දකින්ට ලැබෙනවා. ඇලන් අපට දකින්ට ලැබෙන එකක් නැයි හැඟෙනවා. එයාට ඕනෑ ගෑනියෙක් කසාද බැඳගන්න ඇරලා අපි නිකම් හිටියා නම් එයා ලංකාව හැර-දමා යන්නේ නෑ. සවිමන් කබලාන නරක තරුණයෙක්යයි මම හිතන්නේ නෑ.''

සවිමන් කබලානට නන්ද කොහෙත්ම කැමැති නැත. ඔහුගේ පියා කොළඹ ධනවතකුගේ මුඩුක්කු ගෙවලින් බදු කාසි අය කළ නපුරු මිනිසකු බව නන්ද අසා ඇත. ඔහු අනතුරුව වීදිවල කුණු ඉවත් කරවනු සඳහා නාගරික සභාවේ කොන්තරාත් කාරයෙක් වූයේ ය. ඔහු රුපියල් දහ දෙලොස් දහක් සපයාගන්නේ ඒ කාරි-යෙනි. ඔහුගේ පුතා වැඩුණේ මුඩුක්කුවල දරුවන් ඇසුරු කරමිනි. රාජකීය විද්‍යාලයට ඇතුළුව ඉගෙනීමට පටන්ගත් පසු ඔහු ඉහළ පන්තියේ මිනිසුන්ගේ දරුවන් ඇසුරුකරන්ට වූයේ ය.

''සවිමන් කබලාන හොඳ උණත් අපට උවමනා නෑ''යි නන්ද කීවා ය.

මහගෙදර ඇදහෙළන්ට යෝජනා කළ නන්දගේ සිතින් කුල-මානය ඉවත් නොවීම පියල්ගේ පුදුමයට හේතු වී ය. ගරාවැටුණු මහගෙදර වනාහි දිරීමෙන් පුස් බැඳුණු කුලමානය ගැමියන්ගේ ඇසට හසුකරන සංකේතයකියි පියල් සිතයි. එහෙත් ඔහු නන්දට පටහැණි නොවූයේ ය.

''සවිමන්ට මම කැමති නිසා නෙවි එහෙම කිව්වෙ. අපි ඇලන්ට විරුද්ධ උණා............''

''නාලිකාට එච්චර හපන්කම් කරන්න මම ඉඩ දෙන්නේ නෑ'' යි දැඩි සිතින් නන්ද තෙපලා ය. ''ළමයින්ට ඕනෑ විදියට හැම දේම කරන්න ඉඩ දෙන්න බැහැ. ඇලන් ලන්සි ගැහැනියෙක් එක්ක එංගලන්තෙට ගියේ අපේ වරදකින් නෙවි.''

Scanned by CamScanner

හරින ලද කවුළුවෙන් පියල්ට නැව්තොටත් එහි නවත්වන ලද නැව් හම්බන් ආදියත් පෙනෙයි. පියල්ට ඔහුගේ වෙළෙඳාමත්, නාගරික සමාජයත්, ඇලනුත්, ලංසි තරුණියත් සිහි කරවන තැනකි නැව්තොට. ඔහු කොළඹට පැමිණ මුදල් සපයන්ට වෑයම් කළ අවස්ථාවෙහි හෝටල්වලටත් නැව්වලටත් මස් මාළු බිත්තර සැපයූවේය. එයින් ලාබ ලබනු සඳහා ඔහු ඇතැම් විට වංක ක්‍රියා කෙළේ ය.

වරායෙහි නවත්වන ලද සමහර නැව්වලින් විශාල බඩු පෙට්ටි බෑවෙන්නේ බත්තල්වලටයි. බඩු පැටවූණු බත්තල් රේගුව දෙසට යාත්‍රා කරයි. බඩු පෙට්ටි පටවන ලද කබල් ගැල් තම නිවෙසට නුදුරු පාරෙන් ගමන් කරනු දුටු පියල් දැන් කෙමෙන් පිරිහෙන තමාගේ වෙළඳාම සිහි කෙළේ ය.

වරායට ඇතුළු වන නැව් දකින පියල් මාළු අහින් දැක සන්තෝෂ වන මස් මරන්නකු මෙන් සන්තෝෂ වූයේ ය. දැන් වරාය දෙස බලා සිටින ඔහු එවැනි සන්තෝෂයක් නො ලබයි. දුමාරයෙන් වැසුණු ක්ෂිතිජය ඔහු කලකිරවන්නකි. එය ඔහුට සිහි කරවන්නේ බටහිර දේශය ය; එංගලන්තය ය. එංගලන්තය තම පුත්‍රයා පණ පිටින් ගිලගත්තකි.

"වෙළඳාම අත්අරින්නයි වෙලා තියෙන්නේ" යි පියල් තෙපලේ ය. "මට දැන් වෙළඳාම් ගැන වෙහෙසෙන්න බැහැ. කැෂියර් අස්කළාට පස්සේ වෙළඳාම බලා සොයාගන්න කෙනෙක් නැහැ. කැෂියර් අස්කරන්න උණෙත් චන්ද්‍රසෝම නිසා. මේ අවුරුද්දේ වෙළඳාමෙන් අලාබ වෙන්න පුළුවනි."

"අලාබ නම් වෙළඳාම අත්හැර දමන එකයි කරන්න තියෙන්-නේ. දැන් සල්ලි හම්බකළා ඇති. ළමයින් හිතුවක්කාරයන් උණේ අපි ඒගොල්ලයි අනාගතේ ගැන හිතාගෙන සල්ලි හම්බකළ නිසා. දැන් වෙළඳාම බදගෙන මහන්සි වෙන්න එපා. සන්තෝ-සෙන් ඉන්න........"

"තිස්සට හොඳට මොළේ තියෙනවා. මිනිහත් හොඳට තැලිල පොඩිවෙලා හැදුණෙ. එයා දවසකට දෙතුන් පැයක් වෙළ-ඳාමේ වැඩ කළත් ඇති. වෙළඳාම අත්හැර දමන්න ඕනෑ නෑ......"

"තිස්සට කිසි දෙයක් ඕනෑ නෑ. කිසිවක ආසාවකුත් නෑ. හොඳ වැටහෙන නුවණක් නම් එයාට තියෙනවා. එයා වෙළඳාමට අත-ගහන්න කැමති වේද දන්නේ නැහැ. තිසාට දැන් එක පළාතක ඉන්න බැහැ. ඉස්සර එයා පොත් කියවනවා. දැන් එයාට ඒකත් එපාවෙලා. ඔක්කොම පොත් පුළුස්සා දැම්මත් මිනිසුන්ට පාඩුවක් වෙන්නේ නැයි කියනවා. හැම දේම ගැන කලකිරුණු මිනිහෙක් ලවා වෙළඳාම් කරවන්න පුළුවන් ද?"

''එයා සුමානෙකට දෙතුන් සැරයක් ගොහින් වැඩ කළත් ඇති. අවුරුදු දෙකෙකට තුනකට උඩදී මම පටලැවිලි සහිත වෙළඳ ගනුදෙනු නැවැත්තුවා. දැන් තිස්සට පහසුවෙන් වෙළඳාම බලාසොයාගෙන ටිකක් දියුණු කරන්න පුළුවනි. වෙළඳාමෙ නැති නොවී තිබුණොත් කාට හරි ඒක දියුණු කරගන්න පුළුවනි.''

චන්ද්‍රසෝම ගැන කොතෙක් කලකිරුණු නමුදු ඔහු කවද හරි වෙළෙන්දකු වෙතියි යන හැඟීම පියල් තම සිතින් ඉවත් නොකෙළේය. සව්මන් කබලාන ද වෙළඳාමට ශූරයෙකි. නන්ද මෙන් පියල් කබලානට විරුද්ධ නොවෙයි.

''තිස්සට එක තැනක ඉන්න බැරිවෙලා තියෙන්නේ එක වැඩක යෙදී ඉන්න පුරුදු නූන නිසා, වෙළඳාම ගැන සොයන බලන කොට තිස්සට එක තැනක ඉන්න පුරුදු වේවි.''

''තිසා මිනිසුන්ට රැවටෙනවා.''

''නෑ'' යි කියමින් පියල් සිනාසුණේ ය. ''එයා මිනිසුන්ට උපකාර කරන්නේ ඒගොල්ලන්න රැවටෙන නිසා නෙවි. හොරෙක්, කපටියෙක්, හොඳ මිනිහෙක් උණත් අඳුනාගන්න එයාට නුවණ තියෙනවා. එයා හොරාට උණත් උපකාර කරන්නේ හොරා බව දැනගෙන. තිස්ස වෙළඳාමට හොඳයි. අමාරුව එයා කැමැති කරවා ගන්න එකයි.''

අහස වැහි වලාවෙන් පිරීම නිසා ගෙය වෙන දාට වඩා කලින් ඇඳිරි වී ය. නන්ද නැඟී ගොස් විදුලි පහන දැල්වූවා ය. ඈ ළඟ කනප්පුව උඩ තුබුණු ඇලන්ගේ පින්තූරය නන්දගේ දෙනෙතට හසු වී ය. එය ඇලන් එංගලන්තයෙහිදී ගත් ඡායාරූපයක පිටපතකි. බුද්ධිය, විනීතකම, ශූරකම ප්‍රකට කරන ඇලන්ගේ ස්වරූප දැක්වෙන ඒ ඡායාරූපය දෙස බලන කවරෙක් වුව ද ඇලන්ට පැහැදෙයි. නන්ද තුළ හටගත්තේ ගර්වයකි. ඇගේ වියෝ දුක අලුත් වී ය. 'ඇලන්ට ඕනෑ ගැහැනියක් කසාද බැඳගන්න ඇරියා නම් එයා ලංකාව හැර යන්නේ නෑ' යි තම සැමියා කියූ කියුම ඇත්තක්යයි නන්ද කල්පනා කළා ය. 'ඇලන් ලංකාව හැරදමා ගියේ වරදකින් නොවේ' යයි නන්ද ඒ වේලාවේ කිව්වේ තම සැමියා සනාසන අටියෙනි.

සුළඟට හසුවුණු සින් වැස්ස වරායෙහි නැව් හා යාත්‍රා වසා විදූ ගෙන දැල් පටක් සේ කවුළුවෙන් එබී බැලූ පියල්ට පෙනිණ. කැන්වස් රෙදිවලින් වැසුණු බඩු පෙට්ටි සහිත බත්තල් තුනක් නැවක් අසල රැඳී සිටියි. වරායෙහි මීට පෙර පැවැති සසල බව දැන් නොදක්නා ලැබේ. වරායෙහි පාලුවත් නිසොල්මනත් පියල්ගේ සිතෙහි වූ පාලුව තියුණු කෙළේ ය.

මෙතෙක් කල් තමා ජීවත් වූයේ නොසිතමින් ක්‍රියා කළ එකකු ලෙසිනියි පියල් කල්පනා කෙළේ ය. ඔහු සිතාමතා ක්‍රියා කෙළේ වෙළෙඳාමෙහිදී පමණි. ඔහු දරුවන් ගැනත් නන්ද ගැනත් සිතන්ට වූයේ මැතදී ය. ඔහු නන්ද කියූ දෙයක් කෙළේ ය. දරුවන් ඉල්ලූ දෙයක් ගෙනැවිත් දුන්නේ ය. බිරිඳ නිසා උපන් ඇල්ම වචනයෙන් හා ක්‍රියාවෙන් පිට කරන්ට ඔහු වැයම් නොකෙළේ ය. දරුවන් නිසා උපන් ඇල්ම වචනයෙන් හා ක්‍රියාවෙන් පිට කළ යුතුයයි ඔහු නොසිතුවේ ය. ඔහු ඒ සියල්ල ගිලගනිමින් ජීවත් වූයේ ය. දරුවෝ කයින් ඔහුට ළංව ජීවත් වූ නමුත් සිතින් ඈත් වූහ. නන්ද කයින් හා සිතින් ඔහුට ළංව ජීවත් වූවා ය. එහෙයින් ඔවුහු සමාන සිතුම් පැතුම් ඇත්තෝ වූහ; ඔවුනොවුන්ගේ දුකෙහිදී දුක් වූහ: ප්‍රීතියෙහිදී ප්‍රීති වූහ. පාඩම් බහුල වීම නිසා දරුවන් සන්තෝෂ වූයේ ගෙදරින් පිටදී ය.

පියල් තම අනාගතය දකින්නේ මීදුම් පටලයෙන් වැසුණු කාන්තාරයක් ලෙසිනි. හැට අට ඉක්මවූ ඔහු කයින් දුබලයකු නොවූව ද සිතින් දුබලයෙකි; ඔද සුන් ඔහුගේ හද පෙරට වඩා තියුණුව දුක් දෙම්නස් හඟින්නකි. නගර පරිසරයට අනුරූපව ජීවත්වන්ට වැයම් කළ ඔහුගේ සිතේ යටි මඩියෙහි වැටී සිටි ගැමි ගති හා හැඟීම් නැඟීම නිසා ඔහුගේ සන්තාපය තීව්‍ර වෙයි.

වරායෙන් ඔබ සක්වල ගලත් අහසත් මුහුදත්, වැස්ස හා වැහිවලා නිසා එකම අවුල් ජාලයක් ලෙසිනි පියල්ට පෙනෙන්නේ. මීට පෙර මෙවැනි දැකුම්වලට ඔහුගේ සිත ඇදී නොගියේ ය. දෙනෙතට හසුවුණත් ඔහුගේ සිත එවැනි දැකුම් නොවදින සේ වැසුණු දොරටුව ඇත්තක් වී ය. ඒ දොරටු ඉගිලීගිය ඔහුගේ සිතට පිවිසෙන්නේ ශෝකය වඩන දැකුම් ය.

තිස්සගේ කටහඬ ඇසූ නන්ද ඇඳෙන් නැඟී කවුළුව අසල සිටි තම සැමියා කරා ගියා ය.

"තිස්ස ගෙදර ඇවිත් තියෙන හැඩයි. මම හිතා හිටියේ තව මාසයක් යන තුරු එයා කොග්ගලින් එන එකක් නෑ කියා. එයා ආ එක හොඳයි. මම එයා එක්ක කතාකරලා බලන්නම්."

Scanned by CamScanner

# 14

නන්ද සචිමන් කබලාන ගැන නාලිකාගෙන් ප්‍රශ්න කෙළේ කෝපයෙනි. ඔහු තමාට ලියුම් එවන බවත් තමා ඔහුට ලියුම් ලියන බවත් නාලිකා සෘජුවම පිළිගත්තා ය. එය වරදක්යයි ඇ නොසිතයි. මව මෙතරම් කිපෙන්නේ කුමක් නිසා ද? මව කිසියම් තරුණයකු ගැන සිතාගෙන සිටියා නම් ඒ බව කලින් කිව යුතු ය. කබලාන ඇලන්ගේ මිතුරෙකි; ඔහු නොයෙක් විට ගෙදරට පැමිණියේ ය. ඇලන් සමස්ත ශාස්ත්‍ර ශාලාවේ උගන්නා කාලයේ සචිමන් රාජකීය විද්‍යාලයට ඇතුළු වී උගැන්ම ලැබුවේ ය. තම මව පමණක් නොව පියා ද දවසක සචිමන් ගැන පැහැදී කතා කළ බව නාලිකාට මතක ය. ඔහුට ලියුම් ලියන බව දැනගත් මව මෙතරම් කිපෙන්නේ කුමක් නිසා ද?

''උඹ එයාට ලියුම් ලිව්වේ කුමට ද?''යි නන්ද දෙවන වරටත් ප්‍රශ්න කළා ය. ''එයා ගැන අදහසක් තිඋණා නම් අපට කියන්න ඕනෑ.''

''මුලදී මම එයාට ලියුම් ලිව්වේ විවාහ වන අදහසකින් නොවේ''යි නාලිකා ශෝකයෙන් පිළිතුරු දුන්නා ය.

''තරුණයෙකුට ලියුම් ලියන්නේ වෙන මොන අදහසින් ද?''

මව වඩාත් කිපෙතියි සිතූ නාලිකා සිනාව මැඩ ගත්තා ය.

''සචිමන් මට ලියුම් දෙකක් ලිව්වා. මම ඊට පස්සේ එයාට ලියුමක් ලිව්වා.''

''අවුරුදු ගණනක් තිස්සේ එයාට ලියුම් ලියුවේ නිකම් ද?''

''අවුරුදු කිහිපයක්ම එයාට ලිව්වේ එයා එක්ක විවාහ වන අදහසකින් නොවේ. එහෙම අදහසකින් ලියුම් ලියන්ට පටන් ගත්තේ මෑතදී.''

''නිකම් ලියුමක් ලියන කොට උඹට හිතන්න බැරි උණාද ඔය ටික වෙන බව. තරුණියක් ඉලන්දරියෙකුට ලියුම ලියන්නේ වෙන මොන උලව්වකට ද?''

''මම් හිතන හැටියට මම හිතන්නේ කොහොම ද?''

''හිතන්න බැරි නම් අහන්න බැරි ද?''

''අහන්නෙ මොකක් ගැන ද? එහෙම අදහසක් ඇති උණා නම් මම්ගෙන් අහන්න තිඋණා. එහෙම අදහසක් නොතිඋණ නිසා මම එයාගේ ලියුම්වලට උත්තර යැවුවා.''



Scanned by CamScanner

''එහෙනම් උඹ වෙන තරුණයන්ටත් ලියුම් ලියා තියෙනවා ද?''

''නැහැ''.

''ඒ මොකො ද? නිකම් ලියනවා නම් අනික් තරුණයන්ටත් ලියුම් ලියන්ට එපා ය.''

''සවිමන් හැර වෙන කවුරුවත් මට ලියුම් එවවෙ නැහැ.''

''එයා එක්ක විවාහ වෙන්න පොරොන්දු උණේ කුමට ද? උඹට ඕනෑ විදියට ඒ වැඩ කරන්න බැහැ. සවිමන්ගේ අම්මල තාත්තල ගැන උඹ දන්නව ද?''

''නැහැ; මම මොකුත් දන්නේ නැහැ.''

''එයාගේ තාත්තා මුඩුක්කුවක් ගානේ ඇවිදපු මිනිහෙක් බව කවුරුත් දන්නවා. ඒ මිනිහා ජීවත් උණෙත් මුඩුක්කුවක.''

''මම ඒ මොකුත් දන්නේ නෑ.''

නාලිකාගේ පිළිතුර නන්දගේ සන්තෝෂයට හේතු වී ය. සවිමන්ගේ පියාගේ තොරතුරු අසන විට නාලිකා කලකිරෙයි.

''සවිමන්ගේ තාත්තා නපුරු මිනිහෙක්. එයා.........''

''මම ලියුම් ලිව්වේ සවිමන්ට; එයාගේ තාත්තාට නෙවි.''

''උඹ ඕනෑවට වඩා පැහිලා තියෙනවා''යි නන්ද කෝපයෙන් කීවා ය. ''සවිමන් නපුරු මිනිහෙකුගේ පුතෙක්.''

''පුතා එයා වගෙ නෙවි.''

''තාත්තාගේ ගති පුතාට පිහිටනවා.........''

''මේ කියන්නේ ගමේ ගොඩේ මිනිස්සුන්ගේ අදහස්.........''

''කට වහගනින්'' යි නන්ද කෝපයෙන් ගිගුරුවා ය. ''උඹ දන්නේ කොහොම ද ගමේ මිනිස්සුන්ගේ කතා?''

නාලිකා ඒ වදන් තෙපලේ කටට ආ නිසා මිස සිතා මතා නොවේ. මව ගමෙහි ඉපිද වැඩුණක බව නාලිකාට මතක් වූයේ මවගේ දැඩි කෝපය නිසා ය.

නාලිකා ඒ වදන් තමාගේ කටින් පිටවන්ට හැරීම ගැන ශෝක වූවා ය. මවගේ සිත සනසනු පිණිස කුමක් කිව යුතු ද? ඇ ඒ වදන් උගත්තේ තිස්සගෙනි. ඇතැම් දවසක ඇ කියූ කියුමක් වුව ද 'ගමේ ගොඩේ කතා' යි කියමින් තිස්ස බැහැර කෙළේ ය.

''ගමේ ගොඩේ කතා මට කියා දුන්නේ තිස්ස මාමා!''

''ඒ පිස්සා තමයි උඹ තරක් කෙළේ. මම එයාටත් දෙකක් තුනක් කියන්නයි හිතාගෙන ඉන්නේ.''

මවගේ උදහස බැහැර වියයි සිතූ නාලිකාගේ සිත සැහැල්ලු වී ය.

Scanned by CamScanner

''තාත්තා උඹට හොඳට ම ආදරේ බව උඹ දන්නවා නෙවද?'' යි නන්ද ශෝකී හඬින් ප්‍රශ්න කළා ය.

තාත්තා රුපියල් පණස් දහක් වුව ද දුවට දැවැද්ද වශයෙන් දෙන්ට කැමැතියි. සිරිල් විජේතුංග නාලිකාට කැමැතියි. ඔහු ඉහළම තැනට නඟින්ට පුළුවන් දෙස්තරෙක්. ඔහු ඉතාම හොඳ තරුණයෙක්. දුව එයාට කැමැති වෙනවා ඇතියි තාත්තා සිතයි.

මවගේ මේ යෝජනාව නාලිකා නොසිතුවක්ම නොවේ. නාලිකා ඉහළම පන්තියේ තරුණයකු හා විවාහ වනු දැකීමට මව ආසා කරයි. 'නාලිකා සිවිල් නිලධරියෙකුට කසාද බන්ද දෙනවා' යයි දවසක තාත්තා කියූ වග මව කවටකමට මෙන් කීවේ වරක් පමණක් නොවේ. එහෙත් මවගේ ඒ කියුම නාලිකා මේ තාක් සැලකුවේ කවටකමක් ලෙසිනි. තමාගේ සිත් ගත් තරුණයකු හා විවාහ වනුවට මව මේ තරම් කිපෙතියි නාලිකා නොසිතුවා ය.

''සිරිල් මම එක්ක කතා කරනවා. දවසක් එයාගේ ඔය අදහස මට දන්වන අදහසින් වාගේ කතා කළා. එයා මට යෝජනාවක් කෙළේ නෑ. නමුත් මම කැමැති නැති බව එයාට ඇහෙන විදියට කතා කළා. මමීලා එයා ගැන හිතාගෙන ඉන්න බවක් මම දන්නේ නෑ. දන්නවා නම් මම කට වහගෙන ඉන්නවා.''

''මොනව? උඹ ඔය තරම් පැහිච්ච බව මම දන්නේ නැහැ. උඹට එක පාරටම එහෙම කියන්න යුතු කමක් නෑ. උඹ හිතාගෙන ඉන්න ඇත්තේ අම්මත් තාත්තාත් උඹ කියන එකක් කරන පඹයන් ලෙස!''

නන්ද අසුනෙන් නැංගේ කෝපයෙනි.

''සචිමන් කබලාන එක්ක විවාහ වෙන්න උඹට කොහෙත්තම ඉඩ දෙන්නේ නැහැ. උඹ විවාහ වෙන්න ඕනෑ මවුපියන් කියන තරුණයෙක් එක්ක. කොළඹ මෙච්චර වැදගත් උගත් තරුණයන් සිටිද්දි මේකි හොයා ගෙන තියෙන්නේ කොහේදෝ මුල්ලක උපන් මුඩුක්කුකාරයෙකුගේ පුතෙක්!''

''මමී සචිමන් ගැන හිතන්නේ තරහෙන්'' යි නාලිකා ශෝකයෙන් තෙපලා ය. ''එයා සමස්ත ශාස්ත්‍ර ශාලාවට ඇතුල් වෙලා දැවුරුද්දක් හොඳින් ඉගෙන ගත්තා. අස්උණේ ඉගෙනීමට අසමර්ත කමක් නිසා නෙවී. එයා අඳුනන සුදු මිනිහෙකුගේ යෝජනාවක් පිළි ගෙන වෙළඳාමක් පටන් ගත්තා. සුද්දන්ගේ වෙළඳාමකට දෙවෙනි නොවන වෙළඳාමක් තව අවුරුදු දහයකින් කරනවා යයි එයා මම එක්ක කිව්වා.........''

''උඹ නෙව මේ ගෙදර අම්මා'' යි කියමින් නන්ද සිනාසුණා ය. ''ඔය මිනිහා මහ පුරසාරම් කාරයෙක්. නාලිකා රැවටෙන්න එපා.''

Scanned by CamScanner

මව කාමරයෙන් පිට වූයේ තුනී වුණු කෝපයෙන් ද? නොඑසේ නම් දැඩි වුණු කෝපයෙන් ද?

නන්ද තිස්සට බැණ වැදුණා ය. ඇගේ කෝපයට හේතුව නොදැන අන්දමන්ද වූ තිස්ස කරබාගත්තා ය.

"අර කරෝලිස් සිල්වාගේ පුතා නාලිකාට ලියුම් එවන බව උඹ දන්නවා; මට කිව්වේ නැහැ. උඹ ඒකිට දැනමුතුකමක් කිව්වෙත් නැහැ. උඹ මහදැනමුත්තෙක් වගේ කතා කරන්නේ අපි එක්ක විතරයි!"

නන්ද කිපී සිටින්නේ කුමක් නිසාදැයි තිස්සට වහා වැටහිණ. ඔහු සිනාසුණේ ය.

"උඹ දන්නේ කියවන්න විතරයි."

නන්ද පුටුවක වාඩි වූවා ය.

"නාලිකා සවිමන් කියන මිනිහාට ලියුම් ලියන බව උඹ දන්නවා නෙව ද?"

"ඔව්; මම දන්නවා."

"උඹ ඒකිට අනුබල දුන්නා."

"නැහැ. මම අනුබල දුන්නේ නෑ."

"ඒක අපිට දන්නන්න ඕනෑ කාරණයක් බව හිතන්න උඹට බැරි උණා."

"මම හිතුවේ නන්ද දන්නවා ය කියා."

"මම දන්න කෙහෙල්මලක් නැහැයි" නන්ද දැඩි කෝපයෙන් කීවා ය. "ඒ මිනිහ නාලිකාට කැපෙනවය? ඒක ගැන හිතන්න උඹට බැරිඋණා."

"ඇයි නොකැපෙන්නේ?"යි තිස්ස ඉතා සන්සුන් ලෙස ඇසුවේ ය. "සවිමන් මොළේ ඇති, හොඳ හැදෙන තරුණයෙක්. දැනටමත් හොඳ දනවතෙක්."

"එයාගේ සල්ලි මොකොට ද අපට? එයාගේ තාත්තා නපුරු මිනිහෙක්."

"එයාගේ තාත්තා ගැන මම සෙව්වේ නෑ. නාලිකා එයාගෙ තාත්තාට ලියුම් ලිව්වායයි මම හිතන්නේ නෑ" යි කියමින් තිස්ස යළිත් සිනාසුණේ ය.

"උඹ දන්නෙ ඇනුම්පද කියන්නත් දත් විරිත්තන්නත් විතරයි" නන්ද කෝපයට වැඩි ශෝකයෙන් කීවා ය. "ළමයිත් අපට විරුද්දයි. සහෝදරයාත් අපට විරුද්දයි. අපේ අවාසනාව."

නන්ද හඬන්ට වූවා ය. තිස්ස කතා කෙළේ ශෝකයෙනි.

''නාලිකා සචිමන්ට ලියුම් ලියන බව මම දැන ගත්තේ මෑතදී. මම ඒ ගැන ඇහුවාම නාලිකා සියලු තොරතුරු මට කිව්වා. 'දන්න් අම්මාට කියන්න එපාය'යි කිව් නිසා මම නන්දට කිසිවක් කිව්වේ නෑ. මම සචිමන් ආශ්‍රය කරන්න පටන්ගත්තේ ඊට පස්සේ. මම ඒක කෙළේ එයා කොහොම මිනිහෙක් ද කියා දැන ගන්න අදහසින්. එයා හොඳටම දියුණුවෙන මිනිහෙක්. නාලිකා මෝඩියෙක් නෙවි...........මේවා ගැන මට වඩා හොඳින් නාලිකාට හිතන්න පුළුවනි...........''

තිස්ස කතා කෙළේ සානුකම්පික හැඟීමෙනි. එහෙත් නන්ද ශෝක වන්නේත් කිපෙන්නේත් සුන්වුණු බලාපොරොත්තු ඇත්තක සේ ළතවන්නේත් කුමක් නිසාදැයි ඔහුට නොවැටහේ. නාලිකා ආලය කරන සචිමන් ඉතා හොඳ ශූර තරුණයෙකි. ඔහුගේ මවුපියන් ගැන සිතමින් නන්ද සචිමන්ට විරුද්ධ වන්නේ කුමක් නිසාදැයි තිස්සට වටහා ගත නොහැකි ය; ඔහුගේ සිතට නඟින්නේ කෝපයකි. එහෙත් නන්ද හඬන්නේත් ශෝක වෙන්නේත් කිපෙන්නේත් නාලිකා සචිමන්ට ආලය කරන නිසා නොවේ. ඇලන් මවුපියන්ට අකීකරුව ලන්සි තරුණියක කසාද බැඳගෙන ලංකාව හැර ගියේ ය; චන්ද්‍රසෝම සාහසිකයෙක් වී ය. නාලිකා මවුපියන් නොතකා තමාගේ සිතැඟියට වහල්ව සචිමන් පතයි. තම සහෝදරියගේ සිත සනසන්ට වෑයම් කළ යුතුයයි කළ තිස්සගේ කටින් මේ වදන් ගිලිහිණ:

''නන්ද නාලිකා ගැන ළතවන්නේ කුමට ද? එයා කවුරු එක්ක විවාහ උණත් අපි හිතන තරම් හොඳක් හෝ නරකක් සිදු වෙනවා ද? නාලිකා නන්දටත් පියල්ටත් කීකරු වෙන්න ඕනෑ බව ඇත්ත. නමුත් එයා සචිමන්ට ආලය බැඳගැනීම ඒ කිසිවක් නොසැලකීමක් ලෙස මට වැටහෙන්නේ නෑ.''

''එයා ඔහොම එකක් කරාය කියා අපි බලාපොරොත්තු උණේ නැහැ''යි නන්ද ශෝකාකූල ස්වරයෙන් කීවා ය. ''ඇලන් අප හැර දමා ගියා. චන්ද්‍රසෝම හිතුවක්කාරයෙක් උණා.........නාලිකාත් මෙහෙම කරන්න ගියාම අපි ඉවසන්නේ කොහොමද?''

''මට තේරෙනවා. ඇලන් කෙළේ වරදක් නොවේයයි මම කියන්නේ නෑ. චන්ද්‍රසෝම මවුපියන්ට වද දෙන හිතුවක්කාරයෙක් වෙලා ඉන්නවා. නමුත් ඒ සියල්ලම මහා විපත් ලෙස සලකන්නේ කුමක් නිසාද?''යි තිස්ස දයාවෙන් ඇසුවේ ය. ජීවිතය අපට වුවමනා පරිදි හරිගස්සන්න සිතන්නේ කුමට ද? දරුවන් නිසා උපදින ඇල්ම බුද්ධියෙන් සකස් කොට නොගන්නා කල ආත්මාර්ථකාමී හැඟීමක්-වෙයි. ඇලන් තව අවුරුදු තුන හතරකින් මවුපියන් බලන්ට ලංකාවට එනවා නිසැක ය. චන්ද්‍රසෝමට හැමදම හිතුවක්කාරයකු ලෙස ජීවත් වන්ට නොහැකි ය. ඔහු හිරගෙට යෑමෙන්

Scanned by CamScanner

ඔහුගේ හිතුවක්කාරකම ඉවර කළ යුතු ය. නොඑසේ නම ඔහු මුදල් සැපයීමෙහි ශූරයකු වීමෙන් ඔහුගේ හිතුවක්කාරකම කෙළවර වෙයි. ඔහු කවද හරි ශූර වෙළෙන්දකු වෙතියි යන හැඟීම වෙනස් කරන්ට කාරණයක් ඇතැයි නොවැටහේ.

තිස්සගේ මේ බණ දෙසුම නන්දට හොඳින් නොවැටහිණ. එහෙත් ඔහු තුළ තමාත් තම සැමියාත් නිසා උපන් දයානුකම්පාව ඔහුගේ ඒ දෙසුමට හේතු වී ය. නන්දගේ තැවුණු සිත මඳක් සැනසිණ.

නන්ද තිස්සගේ අතීතය සිහි කළා ය. තම මවුපියන් දිළින්-දන් වූයේ තිස්ස උපදින්ට පෙරය. අනුලා හා නන්ද වැඩි විය පැමිණෙන තෙක් අගහිඟ නිසා දැඩි දුක් පීඩා නොවින්දෝ ය. තිස්ස උගන්නා කාලයේ සිට දුක සේ ජීවත් වූයේ ය. උගැන්මෙහි ශූරයකු වූ ඔහු උගැන්ම හැරදමා සුළු පඩියක් ලැබෙන රක්සාවක් කෙළේ ය. අගහිඟ වලින් මිරිකෙමින් ජීවත් වූ මවටත් සහෝදරි-යන්ටත් ඔහු ඒ පඩිය නොමසුරුව දුන්නේ ය. ඔහු කිසිවක් ඉතිරි-කර නොගත්තේ ය. කටුක ජීවිතයට පුරුදු වුණු ඔහු කිසි කලක සුව පහසු කම් නොසෙවුවේ ය; සුව පහසු කම් ගැන නොසිතුවේ ය.

තිස්සගේ අතීතය සිහිකළ නන්දගේ සිතෙහි සන්තාපයක් හට ගත්තේ ය. අනුලාගේ අකාල මරණයට තමාගේ කිත්යසස් ලෝභය කොහෙත් හේතු නොවීයයි කිව හැකි ද? අනුලා බංඩාර-වෙලට හෝ හම්බන්තොටට හෝ යවා පිළියම් කරවන්ට නොසි-තුණේ කුමක් නිසා ද? දරුවන්ට රෝගය බෝවෙතියි බියගත්තේ තමා ද බියවූ හෙයිනි.

"අනේ තිසා" යි නන්ද කන්නලව් කළා ය. "අය්යාට සනීප නැහැ. මම හිතුවේ චන්ද්‍රසෝමගේ හිතුවක්කාරකම නිසා ටිකක් හිත නරක්වෙලාය කියා නමුත් පියල් ශරීර ආබාදෙකින් පෙළෙන-වාය කියා මම හිතනවා. හිතේ කනගාටුවක් නම් මෙච්චර කල් පවතින්නේ නැ."

"දෙස්තර බලන්න ගියේ නැද්ද?"

"ගියා; දෙස්තර පැ බාගයක් පමණ සෝදිසි කරලා ඇඟ ඇතුළේ ලෙඩක් නැයි කිව්වා. නමුත් දෙස්තර කිව්වා සල්ය වෛද්‍යවරයෙකුට පෙන්නන්නය කියා. පෝල් දෙස්තරට ලියුමක් දෙන්න හැදුවා. අය්යා කැමති උණේ නැ."

"දෙස්තර එහෙම කියන්න ඇත්තේ ඇඟ ඇතුළේ අවයවයක ආබාදයක් ඇතැයි සැක කරන නිසා වෙන්න ඇති."

"මම කිව්වට එයා අහන්නේ නැ. මම පියල් එක්ක යන්න මහන්සි ගත්තා. කැපුම් කෙටුම් කරාවිය කියා අය්යා ටිකක් බයයි."

Scanned by CamScanner

"සැත් කමකින් හොඳ කළ යුතු ලෙඩක් නම් සැත්කම කරන එක හොඳයි"

"තිසා අය්යාට තෝරා කියන්න. තිසා කිව්වම සමහර විට අය්යා කැමැති වේවි."

නන්ද අනතුරුව පියල්ගේ වෙළඳාම ගැන තිස්ස හා කතාබහ කළා ය. වෙළඳාම ගැන දැන් පියල්ගේ සිතෙහි කිසිම ආසාවක් නැත. එහෙත් වෙළඳාම හැරදමා කන්තෝරුවත් ගබඩාවත් වසා දමන්ට අදහසකුත් නැත. නැති නොවී තිබුණොත් චන්ද්‍රසෝම උණත් කවද හරි ඒ වෙළඳාම අතට ගනිතියි පියල් සිතයි.

"තිසා සුමානෙකට දෙතුන් සැරයක් ගොහින් සොයා බලනවා නම් වෙළඳාම කරගෙන යන්න පුළුවන් වේවි යි අය්යා කියනවා."

"ගොහින් සොයන්න බලන්න නම් මට පුළුවනි"යි තිස්ස ඉවත බලාගත්වනම පිළිතුරු දුන්නේ ය. "වෙළඳාම ගැන දැනුමක් මට නෑ..........."

"වෙළඳාමට කාලෙ යොදනවා නම් තිසා හොඳ වෙළෙන්දෙක් වෙනවායයි අය්යා ළඟදි කිව්වා. චන්ද්‍රසෝම කවදහරි වෙළඳාම අතට අරගෙන කරාවියයි හැඟීමක් පියල්ගේ හිතේ තියෙනවා. නමුත් මම නම් හිතන්නේ නෑ චන්ද්‍රසෝමට වෙළඳාමක් කරන්න පුළුවන් වේය කියා. එයා අත ගැහුවොත් වෙළඳාම විනාශ වේවි......."

පියල් අත්දැකීමෙන් හොඳ දැනුමක් ලැබුවේ වෙළඳ ලෝකය ගැන පමණි. චන්ද්‍රසෝම කලකදී වෙළෙන්දකු වෙතියි ඔහු සිතන්නේ ඒ අත්දැකීමෙන් නොවේ. එය දරුවන් නිසා උපන් ඇල්මෙන් පතන පැතුමකි. චන්ද්‍රසෝම කලකදී තමාගේ ඔල-මොළ කම් වෙළඳාම උදෙසා යොදතියි තිස්ස සිතන්නේ පොතින් පතින් ලත් දැනුම වහල් කොට ගැනීමෙනි. චන්ද්‍රසෝම ඇතැම් විට මුදල් සැපයීමට මෙන් වියදම් කිරීමට ද පියල්ට වඩා සමතකු විය හැකි ය. ඔහු නුවරඑළියට ගොස් රුපියල් පන්සීයක් දිනා ගත්තේ කනකු ගල් ගසන්නාක් මෙන් රේස් ඔට්ටු ඇල්ලීමෙන් නොවන බව තිස්ස දනියි. ඔහු සති ගණනක් රේස් අසුන්ගේ වගතුග සොයමින් උගත්තේ ය. ඔහු කැෂියර් බියගන්වා රුපියල් දෙසීයක් ගෙන නුවරඑළියට ගියේ රේස් ඔට්ටු ඇල්ලීමෙන් දිනිය හැකිය යන හැඟීමෙන් මඩනා ලද හෙයිනි. රේස් අසුන් ගැන විනිශ්චයකට බැසීමට අසුන් ගැන දැනුමකුත් ඒ දැනුම් සසඳා තීරණයකට බැසීමට බුද්ධියකුත් වුවමනා ය. රුපියල් තිහ-හතළිහක් නොව රුපියල් දෙසීයක්ම ඔට්ටු අල්ලනු සඳහා ගෙන ගියේ ලාබ ලබනු සඳහා බිය නැතිව මුදල් වියදම් කළ හැකි අංකුර වෙළෙන්දකු බැවිනි.

Scanned by CamScanner

''චන්ද්‍රසෝම හැම දම හිතුවක්කාර කම් කරන එකෙක් නෑ''යි තිස්ස කී ය. ''එයා මැර කම් කරලා හිරගෙට නොගියොත් කවදා හරි පියල්ගේ වෙළඳාම අතට ගෙන දියුණු කරාවි.''

''තිසා හිතන්නේ තව අවුරුදු පහළොවකින් විස්සකින් විය හැකි දෙයක්. එතෙක් කල් අපට ජීවත් වෙන්න ලැබේ ද? වෙළඳාම නැති නොවී තියේ ද?........''

''නාලිකාට මොළේ තියෙනවා. වෙළඳාම බලා සොයා ගන්න එයාට පුළුවනි........''

''එයාට ඒවා කරන්න පුළුවන් කමක් නෑ..........''

''සච්මන් ........පියල් හීනෙන්වත් නොසිතූ තරම් ලොකු වෙළඳාමක් කරාවි..........''

''තිසා මම සච්මන්ට කැමති නෑ. නාලිකාට අනුබල දෙන්න එපා. නාලිකාට දෑවැද්දට දෙන්න රුපියල් පනස් දහක් බැංකියේ දමා තියෙනවා........සල්ලිත් දේපලත් දෙනවා නම් නාලිකා සච්මන්ට දෙන්නේ මොකොට ද?

''සච්මන් ඒ රුපියල් පනස්දහ අවුරුදු පහකින් පන්ලක්සයක් කරාවි.''

''නාලිකාට සල්ලි මොකොට ද? පියල් සල්ලි හම්බ කරා. එයාට වෙන දෙයක් ගැන හිතන්න කාලයක් නැතිව ගියා.''

වෙළෙන්දන්ගේ දරුවන් හිතුවක්කාරයන් වෙතියි යන හැඟීමෙන් නන්ද කතා කළා ය. හිතුවක්කාර පුතුන් පමණක් නොව දූන් ද ඇති නිතිඥයන් හා දොස්තරුන්ගේ නම් දුසිම් ගණනින් කිව හැකියයි තිස්ස කීවේ ය.

''තිසා නාලිකාට කියන්න සච්මන් මතක නැති කර දමන්නය කියා''යි තිස්සගේ වදන් නොඇසුණක මෙන් නන්ද කීවා ය.

නන්දට තමාගේ අත්දැකීම ඉක්මවා සිතන්ට නොහැකි වීම තිස්සගේ පුදුමයට මෙන් කෝපයට ද හේතුවකි. ඈ සිතන්නේ කොළඹදී ඈ ඇසුරු කළ ගෑනුන් පිරිමින් සිතන පරිදි ය. පරපුර ගැන සිතන විට මවුපියන් සිතූ පරිදිම සිතයි. නන්දගේ සිත තම අත්දැකීම නමැති සිරකුඩුවෙහි දැමුණු කුරුල්ලකු සේ අත්තටු ගසයි.

කොටුවේ සාප්පුවකට ගොස් ආපසු පැමිණි නාලිකා ලියුම් දෙකක් අතින් ගෙන ඇතුළු වූවා ය.

''එක ලියුමක් මටිට''යි කියමින් නාලිකා දිග ලියුම් කවරයක බැහුණු ලියුමක් මවට දුන්නා ය. බරින්ම එය පිටු හත අටක ලියුමක් විය යුතුයයි නන්ද සිතුවා ය.

''ලියුම ඇලන් අයියාගෙන් වෙන්න ඕනෑ''යි කියමින් නාලිකා කාමරයට ගොස් තිස්සට හඬ ගෑවා ය.

Scanned by CamScanner

රෝගාතුර වුණු සැමියා මළ විට තමා තනි වෙතියි ළතවන නන්ද ලියුම් කවරයෙහි ලියන ලද ලිපිනය දෙවරක් කියවූවා ය. ඇලන්ගේ අත් අකුරු හැඳිනගත් ඇ ඇලන් දුටුවක මෙන් සන්තෝෂ වූවා ය. ඒ අකුරු දුකින් තැවෙන්නකු නොව සන්තෝෂයෙන් ජීවත් වන්නකු හැඳින්වෙතියි නන්දට හැඟිණ. තමාගේ තවත් කිසියම් හැඟීමක් ඇලන්ගේ අත් අකුරුවලට ආවේශ කළ නන්ද ඇලන් ගමට එන අදහසින් ඒ ලියුම ලියන්ට ඇතැයි කල්පනා කළා ය. ඇතැම් විට ඇලන් මුදල් එවන්නයයි ලියුමෙහි ලියා ඇත. රුපියල් තුන්හාරදහක් වුවත් විදුලි මඟින් ඔහුට යැවිය යුතු ය. ඇලන්ගේ ලියුම පියල්ගේ ප්‍රීතියට හේතු වෙයි.

''ඇලන් අය්යා ආයිත් කසාද බැඳලා!''යි නාලිකා තිස්ස මාමාගේ කනට කට ළංකොට කීවා ය. නාලිකා තුළ හටගත්තේ ශෝකයක් නොවේ. ඇලන් ඉන්ජිනේරු විබාගයෙන් සමර්ථව හොඳ රක්සාවක් කරන බව දැනගැන්ම නාලිකාගේ සන්තෝෂයට හේතු වී ය. ඔහු ඉක්මනින් යළිත් කසාද බැන්දේ කුමට ද? එය හරි ද වැරදි ද? හොඳ ද නරක ද යන ප්‍රශ්න ඇගේ සිතට නොනැංගේ ය.

''සිංහල තරුණියක්?'' යයි තිස්සට කියවිණ.

''නෑ, සුදු තරුණියක්!'''

නාලිකා තිස්ස අතින් අල්ලාගෙන කාමරයෙහි අනික් කෙළවරට ගියා ය. ඔවුන් දෙදෙනා කතාකරනු සාලයෙහි වාඩි වී ලියුම කියවන්ට වෑයම් කරන නන්දට නොපෙනෙයි.

වසන ලද කවුළු නිසා මුහුදු සුළඟ කාමරයට ඇතුළු නොවෙයි. නියං කාලයෙහි සැර අව් රස්නය නාලිකාට වඩාත් දැනෙයි. ඈ කවුළු දෙර හැර ඈතට යැවූවා ය.

''තිස්ස මාමා, මමීට මේක දැන්ම දැනගන්න අරින්න හොඳ නෑ. මමී චන්ද්‍රසෝම ගැනත් මම ගැනත් තරහෙනුත් කනගාටුවෙනුත් ඉන්නේ. ඩැඩීට සනීප නෑ. අය්යා සුදු ගෑනියෙක් කසාද බැඳගත්තායයි දැනගත්තාම දෙන්නාටම මේ වෙලාවේ ඉවසන්න බැරිවේවි.''

තිස්ස කල්පනා කෙළේ ය. දැඩි සුළඟින් නඟින බසින පකුල් ඇති වරායෙහි දියකඳ, පතුලෙන් නඟින මහා ගින්නකට පසුව කැකෑරෙමින් තැටෙවන්නක් වැන්න. මාරියාව නිසා නැඟී පෙණ විසුරුවමින් අකුරුදහන් වන රළ පෙළ ඇති ඈත මුහුද තල්මසුන්ගේ හා මෝරුන්ගේ මහා හටනකින් කැලඹුණක් වැන්න. මුහුදෙහි ප්‍රචණ්ඩත්වය දුම් කෙහෙළි වෙසින් පැතිරෙන්නා සේ විසිරෙන වලාවෙන් අහස අඳුරු වෙයි. ක්‍රමයෙන් ප්‍රචණ්ඩ වන මුහුද දෙස බලා සිටි තිස්සගේ පිළිතුර ප්‍රමාද වී ය.

Scanned by CamScanner

''ඇලන් අය්යා ආයිත් කසාදයක් බැන්ද බව මීට නොකියන එක හොඳ නෙව ද තිස්ස මාමේ''යි නාලිකා ඇසුවා ය.

''අම්මාගේ අතට එක පාරටම ලියුම දුන්නේ කුමට ද ? අම්මා දූන් ලියුම කඩලා බලනවා ඇත.''

''මීට ලියුම හොඳට තේරෙන එකක් නැහැ.''

''ඔය කාරණේ නම් එක පාරටම හොඳට තේරේවි. ඇලන් ලියාපු සමහර කරුණු අම්මාට තේරුම්ගන්න අමාරු වේවි. 'මම ආයිත් කසාදයක් බැන්ද'යි කියන එක යන්තම් ඉංගිරිසි දන්නා කෙනෙක් උණත් තේරුම් ගන්නවා.''

''මී හිත නරක් කරගන්නවාට මම බයයි; කනගාටුයි'' කියමින් නාලිකා ශෝක වූවා ය.

''නාලිකා අම්මාට කියන්න සවිමන් පිළිබඳ අදහස හැර දූම්-මාය කියා!''

තිස්ස සරදම් කරතියි නාලිකා සිතුවා ය. ඇ කෝප නොවූවා ය.

''අම්මාට එහෙම කියන්න පුළුවනි. නමුත් සවිමන් පිළිබඳ මගේ හැඟීම වෙනස් කරගන්න පුළුවන්ය කියා තිස්ස මාමා හිතනවා ද ?''

''ඇලන් සුදු ගැහැනියෙක් කසාද බැඳගත් බව දූන් අම්මා දන්නවා ඇති. තාත්තාට ඒ බව කියන්න එපායයි මම අම්මාට කියන්නම්. ඇලන් ලංකාවට ඒය කියා දූන් නම් මට විශ්වාස නැහැ''යි තිස්ස ශෝකයෙන් තෙපලේ ය.

''ඇලන් අයියා ලංකාවට ඒවි. දෙන්නාම ගමට ඇවිත් යන්න එනවාය කියා මගේ ලියුමේ ලියා තියෙනවා.''

''ඇවිත් යන්න!''යි තිස්ස කීවේ තමාගේ කියුම එයින්ම ස්ථිර වියයි සිතන්නකු ලෙසිනි. ''ඇලන් එක වරක් නොව දෙතුන් වරක් ලංකාවට ඇවිත් යාවි. 'ඇලන් ලංකාවට ඒය කියා දූන් නම් මට විශ්වාස නැහැ'යි මම කීවේ එයා ලංකාවේ පදිංචි වෙන්න එන එකක් නැයි හැඟුණ නිසා.''

''තිස්ස මාමා මීට කියන්න 'ඇලන් අය්යා ලංකාවට ඒවිය' කියා'' තිස්ස කියා.'' සාලයට ගිය විගස නන්ද තමාගේ අත තුබුණ ලියුම තිස්ස දෙසට විසිකළා ය.

''මේ ලියුමේ ලියා තියෙන වල්බූත මට හොඳට තේරෙන්නේ නැහැ. එයා දන්නා සිංහලෙන් උණත් ලියුම් ලියනවා නම් මට තේරුම්ගන්න පුළුවනි. ආයිත් ඇලන් කසාදයක් බැඳගත් බව කියන ටික නම් මට හොඳට තේරුණා. ඒ විත්තියක් පියල්ට කියන්න එපා.''

Scanned by CamScanner

"ඇලන් අම්මට ලියුම් ලියන්න ඕනෑ සිංහලෙන් නොවෙන්-නම්" යි තිස්ස තමාට ම කියාගත්තාක් මෙන් සෙමින් තෙපලේ ය.

සාලයේ බිත්තියෙහි එල්ලී සිටින අඩි තුනක් පමණ දිග රාමුවක දමුණු තුන් පාටින් මුද්‍රිත සිත්තම තිස්සගේ බැල්මට හසු වී ය. සුප්‍රසිද්ධ ඉංගිරිසි සිත්තරකු විසින් අඳින ලද සිත්තමක ඒ පිටපත කුලවත් තරුණියක සමුව ආදර බස් තෙපලන රදළ තරුණයකු දක්වෙන්නකි. ඒ ගෑනු රුවත් පිරිමි රුවත් ඔවුන්ගේ සිත් සතන් දක්වෙන මුහුණුත් දුරදිම හැඳිනගත හැකි ය. එහි මාතෘකා පාඨය ළං නොවී කියවිය නොහැකි ය. දවසට හත් අට වරක් ඒ සිත්තම දකින තිස්සගේ සිතට ඒ මාතෘකා පාඨය නිතැතින්ම කියවිණ 'THE TRYST.' කාංඩ විසිපහකින් යුතු ENCYCLOPAEDIA BRITANNICA යන විශ්ව කෝශය ඒ පින්තූර රාමුව යට වූ අලංකාර රාක්කය තුළ ගර්වයෙන් පෙළ ගැසී සිටියි. ඒ පොත් පෙළ ඉංගිරිසි ගුරුවරයකුගේ උවදෙස් අනුව ඇලන්ගේ උගැනුමට අනුබල දෙනු පිණිස මිලට ගන්නා ලද්දකි. ඒ ග්‍රන්ථාවලිය නන්දට පමණක් නොව පියල්ට ද ඇලන් සිහි කරවන සංකේතයකි. ඇලන් රාජකීය විද්‍යාලයෙහි උගන්නා කාලයෙහි ඇතැම් විෂයන් පිළිබඳ දැනුම පළල් කරගනු සඳහා ඒ පොත් පෙරළා බැලූ සැටි තිස්සට සිහි වී ය.

Scanned by CamScanner

# 15

තිස්ස ඇලන්ගේ ලියුම කියවා අවසාන කොට හකුළා සාක්කුවේ දමාගත්තේ ය.

''තිසාට මම ලියුම දුන්නේ සාක්කුවේ දමාගන්න නෙවි. මට තේරුම් කරලා දෙන්න''යි මෙතෙක් බුම්මාගෙන සිටි නන්ද කීවා ය.

ලියුම සාක්කුවෙන් එළියට ගත් තිස්ස නන්දගේ මුහුණ බැලු-වේ ය. ශෝකයෙන් පමණක් නොව කෝපයෙන් ද තැවෙන ඇගේ දෙඇසෙහි වූයේ බැලූ අතම බැලෙන හිස් බැල්මකි. නන්දගේ සිතෙහි වේදනාව අඩු වන පරිදි ලියුම සිංහලට නඟන්ට තිස්ස සිතා ගත්තේ ය.

''මා මේ ලියන්නේ අම්මාගෙනුත් තාත්තාගෙනුත් සමාව ඉල්ලනු පිණිසයි''

මෙය ඇලන්ගේ ලියුමෙහි පටන් ගැන්ම නොවේ. දෙවන පිටු-වෙන් උපුටාගත් ඒ කියුම තිස්ස පළමුව කියවී ය. අනතුරුව ඔහු කියවූයේ ඇලන්ගේ ලියුමෙන් උදුරා ගත් පාඨ පමණි:

ඉංජිනේරු විබාගයෙන් සමර්ථ වුණු පසු මට මෙහි හොඳ රක්සාවක් ලැබුණා. මා ජීවත් වූයේ තනිවයි. ලංකාවෙන් එන කිසිවකු හමුවීමට මම නොගියෙමි. මෙහි පැමිණියවුන් අතර අම්මාත් තාත්තාත් හඳුනන කිහිප දෙනෙක් සිටි නමුත් මම ඔවුන්-ගෙන් කිසිවකු හමුවීමට නොගියෙමි. සමරසිංහ දෙස්තර මෙහි අවුරුද්දක් පමණ ඉඳලා ළඟදී ලංකාව බලා යැවූ නැංගේ ය. ඔහු මා හා කතා කළ නමුත් මා හඳුනා නොගත්තේ ය. මම මගේ වගතුග ඔහුට නොකීවෙමි.

මා ජීවත් වූයේ එංගලන්තය ගැන කලකිරීමෙනි. මගේ කලකිරීමට හේතුවන්ට ඇත්තේ මෙහි හුදෙකලාව ජීවත් වීම වෙන්ට ඕනෑ.

හදිසියේ නිවමෝනියාව සෑදුණු මම හදිසියේම ඉස්පිරිතාලයට ඇතුළු වීමි. මගේ අසනීපය ඉක්මනින් අසාධ්‍ය අතට හැරිණ. මා වැඩ කරන කන්තෝරුවේම ලිපිකාර කමක් කරන කාන්තාවක් දවසට දෙවරක් මා බලන්ට ආවා ය. මට අමාරු වුණු අවස්ථාවෙහි



Scanned by CamScanner

ඇ වෙහෙස නොබලා මට සාත්තු කළා. සනීප ලබා මා නැවත සිටින තැනට ගිය පසුත් ඇ මගේ සුව දුක් සොයමින් මට සාත්තු කළා. මා හොඳටම සුව ලැබුවේ නැවතුම් පලට ගොස් දවස් දහයකට පසුයි. මා මරණයෙන් බේරුණේ ඇ නිසා.

''ඇලන් ඔවා ලියන්නේ ඒ ගැනි කසාද බැඳගත් බව කියන්න මඟ පාදන්ට. ඔවා සිංහලෙන් නොකිව්වත් කමක් නැහැ'' යි නන්ද මහත් සේ වෙහෙසුණක මෙන් කීවා ය. ඇ සිනාසෙන්ට වෑයම් කළා ය. ඇගේ මුහුණට ආරූඪ වූයේ සිනාවක් නොව වේදනාවකි.

තිස්ස කරබා ගත් වනම ලියුමෙහි නෙත් රඳවාගෙන සිටියේ ය.

''ඇලන් වෙන මොනවද ලියා තියෙන්නේ'' නන්ද අනතුරුව ඇසුවා ය.

''ඒ තරුණිය කසාද බැන්දට පස්සේ 'මාලතී' කියන සිංහල නම ගත්තායයි ඇලන් ලියා තියෙනවා.''

''සිංහල නමක් ගත්තාට එයාගේ ජාතිය වෙනස් වෙන්නේ නැතෙව නිසා''යි නන්ද තරහයෙන් තෙපලා ය.

නන්ද ඒ වදන් තෙපලේ තමා දෙඩවන අදහසින්යයි තිස්ස කල්පනා කෙළේ ය. ඇලන්ට දෙස් නඟන විට නන් දගේ ශෝකය මඳක් අඩු විය හැකි ය. ඔහු ඇලන්ට දෙස් නැඟුවේ ය. රක්සාව ලැබුණු පසු නිවාඩු අරගෙන ඇලන් ලංකාවට එන්ට නොසිතුවේ කුමක් නිසා ද? මවුපියන් දකලා ආ පසු යන්ට ඔහුට නොසිතිණ. සුදු ගැහැනියකට සිංහල නමක් දීමෙන් සිදුවන වෙනසක් නැත.

තිස්ස තමාගේ අදහස් අනුමත කරනු ඇසීමෙන් නන්ද මඳ අස්වැසුමක් ලැබුවා ය.

තිස්ස ඇලන්ගේ ලියුම තව වරක් පළින් පළ කියෙවූයේ ය.

''නන්දට ඇලන්ගේ පළමු ලියුම මතක ඇතැයි මම හිතනවා'' යි තිස්ස කීවේ ය.

''ඔව් මට මතකයි. අපේ වැරදි කියමින් අපට කළ චෝදනා මට මතකයි.''

''ඇලන් මේ ලියුම ලියා තියෙන්නේ ඒ අදහස සම්පූර්ණයෙන් වෙනස් උණු නිසා වෙන්න ඕනැ. පළමු ලියුම ඇලන් ලියන්ට ඇත්තේ කවදවත් ලංකාවට නොඑන අදහසින්. එයාට ලියුම ලැබෙන හැටි ඒ ලියුමේ සඳහන් නොකෙළේ ඒ නිසා වෙන්න ඇති. මේ ලියුම ලියා තියෙන්නේ එයාට ලියුම් ලැබෙන සැටි විස්තර ඇතිව සඳහන් කරමින්. මේ ලියුමෙහි කීප තැනක අම්මාගෙනුත් තාත්තාගෙනුත් සමාව ඉල්ලා තියෙනවා.''

තිස්සගේ කියුම පිළිගන්ට මැලිවූ නන්ද කල්පනා කළා ය. නාලිකා තිස්ස කාමරයට කැඳවූයේ කුමට ද? තිස්ස ඇලන්ගේ ලියුම කියවා සාක්කුවේ දමාගත්තේ කුමක් නිසා ද?

''තිස්ස කියන්නේ ඇත්ත ද?'' යි නන්ද ප්‍රශ්න කළා ය.

''ඔව්'' යි තිස්ස වහා පිළිතුරු දුන්නේ ය. ''නන්ද මම විශ්වාස කරන්න. නාලිකා අම්මාත් තාත්තාත් ගැන කනගාටු වෙනවා; ශෝක වෙනවා.........ඇලන් ගමට එනවායයි නාලිකාගේ ලියුමේ ලියා තියෙනවායයි නාලිකා කිව්වා. ඇලන් මවුපියන් නෑයන් පමණක් නොව ගම රටත් සිහි කරන බව එයාගේ ලියුමෙහි අවසාන කොටසින් එළිවෙනවා. ඇලන් ලංකාවෙන් උගන්මට එංගලන්තෙට යන ශිෂ්‍යයන් වර්ණනා කරනවා. නමුත් එහි එන ලොකු සිංහල ගෑනුන්ට හා පිරිමින්ට දෙස් නඟනවා. ඔවුන්ගෙන් කාංඩයක් ලංකාවෙන් ගිය සිංහල ඇමතිවරයෙකුට නින්ද කරවන අදහසින් කරපු කුමන්ත්‍රණයක් විස්තර කරලා අවසානයේ මෙසේ කියා තියෙනවා 'පන්ති, කුල, පවුල්, ආදී භේද නමැති බලු වමන-යෙන් කැප වුණු ඇඳුම් ලංකාවෙහිම ලිහා දමා ඔවුන්ට එංගලන්-තෙට එන්ට බැරි ද? ඔවුන්ගේ ඒ කැත ඇඳුම් මෙහේදී අව්වේ වනන්න හදන්නේ කුමක් නිසා ද?''

''තිසා කියන්නේ ඇලන් තම ලියුමෙහි ලියන ලද කරුණුම ද? නොඑසේ නම් ඒ ලියුම කියවූ පසු තිසා තුළ ඇතිවූ අදහස් හා හැඟීම් ද'' යි නන්ද ප්‍රශ්න කළා ය.

''මම මගේ වචනයෙන් කිව්වේ ඇලන් එයාගේ ලියුමෙහි ලියා තියෙන තොරතුරුමයි'' කියමින් තිස්ස ඇලන්ගේ ලියුම යළිත් දිග හැරියේ ය. ''සමහර කියුමක් මම සිංහලට ගැළපෙන සේ වෙනස් කළා. ලියුමේ තවත් වගන්ති කීපයක් මම ඇලන් ලියාපු සැටි-යෙන්ම සිංහලට නගන්නම්:වාම් ලෙස ජීවත්වන්ට හොඳට පුරුදු වුණු ඇ බි. ඒ. විබාගයෙන් සමර්ථ වුණු කාන්තාවක්. එවැනි උගැන්-මක් ලැබූ සිංහල කාන්තාවකට වඩා නිරහංකාර ලෙස ඇ ජීවත් වෙයි. ගැමියන්ගේ සිරිත් හා සමහර පැවතුම් ලොකු අම්ම කියනු මා අසා තිබේ. මා ගමට ගිය ඇතැම් විටක එයින් සමහර සිරිත් පවත්වනු දැක තිබේ. ඒ සිරිත්වලට යටින් ඇති අදහස් ඇ වහා තේරුම් ගත්තා ය. මා පවා නොදත් කරුණු ඇ හෙළිකරනු ඇසූ මම පුදුම වීමි. අමුත්තන්ට වතුර අල්ලන්නේ කෑමට ආරාධනා කරනු පිණිස නොව කටවල් හා අත ද සෝදගනු පිණිස-යයි ඇ කීවා ය. අමුත්තන්ට වතුර අල්ලනු මා ගමට ගිය දෙවරක දැක තිබේ. ඒ දෙවාරයෙහිම අමුත්තෝ වතුර වීදුරුවලට අත් තබා ගොස් කෑම කෑහ. එක් කෙනෙක් පමණක් වතුර වීදුරුව අතට ගෙන මේසය ළඟ වාඩිවී එය පසෙක තබාගෙන බත් කෑවා. වතුර ඇල්ලීම කෑමට ආරාධනා කෙරෙන සිරිතක් මිස අමුත්තන්ගේ

අත් හා කටවල් සෝදවන අදහසින් පැවැත් වෙන්නක්යයි මට පවා නොවැටහිණ. මේ කරුණු ලියන්ට වුවමනාවක් නැතත් මා ලියන්නේ සුදු ගැහැනියක් කසාද බැඳගැනීම අසා අමනාප වී අම්මාත් තාත්තාත් කලකිරී දුක්වනු වළකනු අදහසිනි. තිස්ස මාමාගේ තොරතුරු ඇසූ මාලතී, 'තිස්ස වගේ කලකිරීමෙන් සමාජය, ආගම, සිරිත්, සාහිත්‍යය, කලාව ආදී කිසිවක් නොතකා උදසීනලෙස ජීවත් වන්නෝ ලන්ඩන් නගරයේ සිත්තරුන්, කවීන්, නළුවන්, සොරුන් හා හිඟන්නන් අතර බහුල වෙති'යි කීවා ය.

''ඇලන් තිසාගේ සායම් ඇරලා තියෙනවා''යි නන්ද තෙපලා ය.

''නෑ'' යි තිස්ස වහා පිළිතුරු දුන්නේ ය. ''මම සායම් ගා නොගෙන ජීවත් වෙන්න හදන මිනිහෙක් ලෙස ඇලන් මා හඳුන් වන්න ඇති.''

නියඟින් වියළුණු පාලු පිටියක් වැනි නන්දගේ හද යන්තම් තෙතමනයක් ලැබී ය. එහෙත් ඇලන් ලංකාවට එතියි යන තිස්සගේ කියුම පිළිගන්ට නන්ද මැලිවූවා ය. ඇලන් ලංකාවට එතියි මීට පෙර තිස්ස නොයෙක් වර කීවේ ය. අනුලා ද කිහිප වරක් එසේ කීවේ දැඩි විශ්වාසය ඇත්තක ලෙසිනි. මේ කියුම් ඇසූ නන්ද ද ඇලන් ලංකාවට එතියි සිතුවා ය. සුදු ගැහැනියක කසාද බැඳගත් බව දන් වෙන ලියුම නිසා ඇගේ ඒ සිතුම වෙනස් වී ය.

නන්දගේ හද ශෝකයෙන් අඳුරු වෙයි. මුහුදෙහි වැටුණු ඊයම් බරු මෙන් ඇගේ සිතුම් පැතුම් සිත තුළම කිඳෙයි. තම කාමරයෙන් නිකුත් වුණු කෙඳිරීමක් ඇසූ නන්ද අවදිවූවක මෙන් වටපිට බැලුවා ය. වටින් පිටින් එන අඳුර ගෙය තුළට වදිනු පිණිස ළුවහු කවුළු විවරයන් අතුරෙන් එබිකන් පාන විපත් සේ නන්දට වැටහිණ. ලැගුම්පල බලා ගෙට උඩින් පියැඹූ කපුටු අහිනකින් දෙතුන් දෙනෙක් නාද කළහ. කෙඳිරිය බලාපොරොත්තු නොවූවක් බැවින් ඈ බියගත්තාය. ඈ විපතක් ඉව වැටුණක මෙන් නාලිකාට ද හඬගාමින් විදුලි පහන දල්වා කාමරයට ගියා ය.

Scanned by CamScanner

# 16

පියල් සිත කය දෙකින්ම බිඳී ටිකින් ටික රෝගාතුර වූයේ අක්මාවේ හැදුණු විසප්පුවක් මේරීමෙන්යයි සැත්කමෙහි ගුරු දෙස්තරු දෙදෙනෙක්ම තීරණය කළහ. ඔහු මරුගෙන් බේරාගත හැකියයි දෙස්තරු විශ්වාස නොකළෝ ය.

පියල් ගෙදර ගෙන ගොස් වෙදුන් කැඳවිය යුතුයයි නන්ද තීරණය කළා ය. නාලිකාත් තිස්සත් එකඟ නොවූහ. දෙස්තරුන්ගේ රෝග නිරූපණය නිවැරදි නම් ගෙදර ගෙන ගොස් කවර වෙද කමක් වුව ද කරවීම නිෂ්ඵලයයි තිස්ස කීවේ ය. එය සුව කරතොත් සුව කළ හැක්කේ සැත් කමකිනි. හැබැයි දෙස්තරුන්ගේ රෝග නිරූපණය වැරදි නම් ලෙඩා ගෙදර ගෙන ගොස් ඔහුට සිංහල වෙදකම් කරවීම ඉතා හොඳ ය.

නන්ද නොසිතූ විරූ පරිදි පියල් ඉස්පිරිතාලයට ඇතුළු වීමට කැමැති වී ය. මීට පෙර හැම විට ගෙදර නැවතී සිංහල වෙදකම් කරවා ගන්ට සිතූ පියල් අද ඉස්පිරිතාලයට ඇතුළුවන්ට එක වර කැමැති වූයේ කුමක් නිසා ද?

පියල්ගේ මුහුණ මරණය අරක් ගත් තැනැක්යයි තිස්සට හැඟිණ. තමා මැරෙතියි පියල් දනියි. ඔහු ඉස්පිරිතාලයට ඇතුළුවන්ට සිතා ගත්තේ එහෙයිනි. ගෙදර නැවතී සිට ගෙන නන්දටත් දරුවන්ටත් වධ දෙන්නේ කුමටදැයි ඔහු සිතන්ට ඇත. සුව ලැබෙතියි ඉව වැටිණි නම් ඔහු ඉස්පිරිතාලයට ඇතුළු නොවෙයි. ජීවය මරණය බඳගන්නේ එය නොවැළැක්විය හැකියයි ඉව වැටුණු විට ය. ගැමියන් කිහිප දෙනකු පමණක් නොව අනුලා ද මව ද මැරෙනු තිස්ස දැක ඇත. තම සහෝදරිය හා මව මැරෙනු දුටු අවස්ථාවල ඔහු ඔහුගේ ඇස්වලට නැඟුණු කඳුළු දෙඇසින්ම ගිලගත් බැවින් පිට නොවී ය. එහෙත් ඒ කඳුළු ඔහුගේ ඇතුළු හදට පිවිස විසප්පු වී ය.

**පියල්ට දැඩි ඇල්මෙන් හා දයානුකම්පාවෙන් සාත්තු කිරීමෙන් පමණි නන්දට සිත සනසා ගැනීමට ඉඩ තුබුණේ. පිහිය තුඩක් හදෙහි ඇනෙන කලක මෙන් තියුණු වේදනාවක් ඇට දැනෙයි. ඇගේ මමත්වයෙහි එක් අංශයක් ගින්නට උණුව වැගිරෙන ඉටි මෙන් වැගිරෙයි. ඒ සමඟ අනාගතය පිළිබඳ හැඟීම පාන්කඩ මෙන් දැවෙයි.**



Scanned by CamScanner

ඇගේ සිතට නඟින හැම අතීත තොරතුරක් ඇගේ හද තවයි. සිත සනසන අතීත තොරතුරුත් ඇගේ සිතට නොනඟියි. කුලමානය ඇගේ ආත්මාර්ථකාමී සිතෙහි පියවි ගතිය වැසූ වෙස් මුහුණකි. පියල් බැහැර කොට නන්ද ජිනදාස හා විවාහ වූයේ මවුපියන්ට කීකරු වීම පිණිස ද? ජිනදාසගේ මරණයෙන් පසු ද නන්ද තමාගේ සිතින් පියල් බැහැර කරන්ට වෑයම් කළා ය. කොළඹ පදිංචිවන්ට පළමුව යෝජනා කෙළේ පියල් වුව ද අදහස් කෙළේ තමාය යන හැඟීම නන්දට සිතින් බැහැර කළ නොහැකි ය. පියල් කොළඹට ගොස් මසකට පසු ගමට ආ අවස්ථාවේ නන්ද තම අසන්තෝෂය හෙළි කළා ය. 'අපි කොළඹ පදිංචි වෙමු'යි පියල් යෝජනා කෙළේ ය. ඒ යෝජනාව පිටවූයේ පියල්ගේ කටිනි. එහෙත් එය තමාගේම හදින් නැඟුණක් නොවේදැයි නන්ද තමාගෙන්ම ප්‍රශ්න කළා ය. අනුලාගේ මරණය සිහිකළ ඇට තමාගේ ඇතුළු හද රත්යවටය සිපගත් හම් කැල්ලක් ලෙස දැවෙන්නාසේ දැනිණ.

මවගේ රෝගය නන්දට ආරංචි වූයේ සතියකට පමණ පසු ය. ආරංචි වුණු විගස නන්ද පියල් පමණක් නොව දෙස්තරකු ද සමඟ කොග්ගලට ගියා ය. එහෙත් මවගේ රෝගය සුව කළ හැකි අවස්ථාව ඉක්මෙන්ට පෙර ඔවුන්ට කොග්ගලට ළඟාවන්ට නොහැකි වී ය. ඔවුන් දෙස්තර ලවා බෙහෙත් කරවන්ට පටන්ගෙන තුන් දවසකින් ලෙඩා මළා ය.

පියල් ඉස්පිරිතාලයට ඇතුළුවූ ද සිට නන්දත් නාලිකාත් දවසකට දෙවරක් ඔහුගේ සුවදුක් සෙවීමට යති. හවස් වරුවේ ඈ ගෙදර එන්නේ අටට හෝ නවයට පමණ ය. පියල් සුව නොලබන බව දෙස්තරුන්ගෙන් දැනගත් නන්ද තිස්සට දෙස් නැඟුවා ය.

''අය්යාගේ ලෙඩේ සුව නොකළ හැකි එකක් බව තිසා දන්නවා. සුව නොකළ හැකි ලෙඩක් නම් අය්යා ගෙදර නවත්තා ගෙන සාත්තු කිරීමයි අපට කරන්න තිවුණේ. මට ඉවසන්න බැරි එයා ළඟින් ඉඳගෙන මගේ හිතේ හැටියට එයාට සාත්තු කරන්න ඉඩ නැති වීම ගැනයි.''

''නන්දත් නාලිකාත් දුකින් හා ශෝකයෙන් තැවෙන බව පියල් දන්නවා. එයා වේදනාව ඉවසාගෙන ඉන්න සැටි දුටු මම පුදුම වුණා. එයා බලන්ට යන විට එයාගේ සිත සැනසෙන සැටියෙන් කතා කරන්න.''

පියල් ඉස්පිරිතාලයට ඇතුළුවී තුන් දවසක් ගිය තැන සමරවීර දෙස්තර දවසකට වරක් බැගින් ලෙඩා බලන්ට පැමිණ ලෙඩාගේ සුව දුක් සෙවුයේ ය. නන්ද සමඟ කතාබහ කෙළේ ය. තුන් වන සතියෙහි ඔහුගේ පැමිණීම නන්ද නොඉවසුවා ය

''මගේ සැමියාට හොඳම දොස්තරුන් දෙදෙනෙක් වෙදකම් කරනවා. සමරවීරට කරන්න වෙදකමක් නැහැ''යි නන්ද කෝප-යෙන් පමණක් නොව ගර්වයෙන් ද තෙපලා ය.

සමරවීර දොස්තර දවස් පතා පියල් බලන්ට පැමිණීම පියල්ට වෙදකම් කරන දොස්තරු දෙදෙනාම නොඉවසූහ. එහෙත් පියල්-ගේත් නන්දගේත් කිට්ටුම නෑයෙකියි සිතූ ඔවුහු සමරවීර ලෙඩාගේ සුව දුක් සෙවීම ගැන පටහැණි නොවූහ.

හතර වන සතියෙහි පසළොස්වක පෝය දවසෙහි හවස්වරුවේ පියල්ගේ රෝගය හදිසියේ ඉතාම නරක අතට හැරිණ. නන්ද, නාලිකා හා චන්ද්‍රසෝම හා තිස්ස ද සමඟ ඉස්පිරිතාලයට ගියා ය. නොගෙවන වාට්ටුවක් පසු කොට ගමන් කළ ඔවුන්ට පළමුව ඇසුණේ වේදනාවෙන් තැවෙන ලෙඩකුගේ කෙඳිරියයි. 'අපෝයි! අම්මෝ'යි ඔහු නහන හඬ ඇසූ නන්දගේ ළය උණු වී ය. පියල්ගේ කාමරය දොරටුවට පැමිණ නන්ද දෙස බැලූ විශේෂ සාත්තු සේවිකාවගේ පරවුණු මුහුණ දුටු නන්දගේ හද පරවුණු මලක් සේ හැකිළිණ. කාමරයට ඇතුළුවූ නන්ද වවුලකු එක් මුල්ලක සිට අනික් පැත්තේ කවුළුවෙන් පිට වූහයි සිතුවා ය. වවුලා ඇගේ සිතින් මවා ගත්තකු ද නොඑසේ නම් සැබෑ එකකු ද යනු නොසන්සුන් සිත් ඇති ඈට නිශ්චය කළ නොහැකි වී ය.

තම සැමියා නන්ද දෙස බැලුවේ හිස් බැල්මකිනි. එහෙත් ඔහු මහත් ආසාවෙන් ඇගේ අත අල්ලා ගත්තා ය; නාලිකාත් චන්ද්‍ර-සෝමත් ලංව ඇඳෙහි අත් තැබූහ, ලෙඩා ඔවුන්ගේ අත් දෙක අල්ලා ගෙන ඔවුන්ගේ මුහුණු දෙසට ඇස් හැරවූයේ ය. තවත් එකකු සිටිද්දැයි සොයන්නාක් මෙන් ඔහු වටපිට බැලුවේය. ඔහුගේ දෑසට කඳුළු නැංගේ ය. තම සැමියා වටපිට බැලුවේ ඇලන් සිටිද්දැයි සොයනු පිණිස බව නන්දට ඉව වැටිණ.

ලෙඩා වචනයකුදු කතා නොකෙළේ ය. පතුල හිල්වුණු ඔරුවක් ටිකින් ටික දියෙහි ගිලෙන්නාක් මෙන් ඔහු ජීවන සයුරෙහි ගිලෙයි. ඔරුව ගිලෙත් ම නඟින බුබුළු සිහි කරමින් ලෙඩාගේ මුහුණ අමුතු පණක් ලැබී ය. ඔහුගේ දෙනෙත අඩවන් වෙයි. තම සැමියා සුව ලබතියි සිතූ නන්ද වඩාත් නැඹුරුව ඔහුගේ මුහුණත් දෙඇසත් බැලුවාය. ඔහුගේ කටින් හුස්ම නිකුත් වී ය.

නන්ද ලේන්සුව කටට තබා ගැනීමෙන් හදින් නඟින විලාපයට කටින් පිටවන්ට ඉඩ නුදුන්නා ය. ඇගේ උඩුකය දෙදරිණ.

කලින් යවන ලද විදුලි පුවත ලත් ඇලන් හා ඔහුගේ බිරිඳ ද ලංකාවට පැමිණියේ පියා මැරුණු දවසට පසුදා ය.

මිනී කරත්තය කනත්තේ දොරටුවට ළඟාවූ පසු මිනී පෙට්ටිය කරත්තයෙන් ඉවතට ගෙන චන්ද්‍රසෝම එක් කෙළවරක් කරට

Scanned by CamScanner

ගත්තේය. ඇලන් හා තිස්ස අනිත් කෙළවර කරට ගත්හ. චන්ද්‍රසෝමගේ යහළුවන්ගෙන් දෙදෙනෙක් මිනිපෙට්ටිය මැද දෙපැත්තට කරදුන්හ. තිස්ස මිනිපෙට්ටියේ කොකුවලින් එල්ලී වැටෙන පොහොට්ටු සහිත සුදු පටලණු පටවල් හකුළා පෙට්ටිය මුදුනෙහි තබා පෙට්ටියට කර දුන්නේ ය. ''කරගහන්න''යි ඇලන් තමා ළඟ උන් බිරිඳට කීවා ය. ඈ ඇලන් අනුකරණය කරමින් මිනීපෙට්ටියට අත ගැසුවා ය.

පියල්ගේ මවත් නාලිකාත් නන්දත් වත්තන් කරගෙන මිනිය පස්සෙන් ගමන් කළෝ ය.

ආදහනයෙන් දෙසතියකට පසු ඇලන් හා ඔහුගේ බිරිඳත් එංගලන්තය බලා යනු පිණිස නැව් නගිද්දී නන්ද, ඇගේ දරුවෝ, තිස්ස හා පියල්ගේ මව ද උදය වරුවේ නැව් තොටට ගියෝ ය.

හිරුමඬල නැඟෙනහිර අහස වසාගත් කළු වලා දවමින් පළවන්ට වෑයම් කරයි. එක් වලාවක් විසුරුවමින් මතුවන හිරු මඬල තවත් වලාවකින් වැසෙයි. අඩ අඳුරු තිර පටක් පිටිපස දැල්වෙන පහනක දුබල එළිය ලෙස උදගිරි මුදුනට නඟින්ට වෑයම් කරන හිනිපෙත්ත හඳුනාගත හැකි ය.

වරාය, අහස් වතෙහි නිරානන්දය පිළිබිඹු කරන කැටපතක් වැන්න. බෝට්ටුවෙන් නැව කරා යන ඇලන් හා මාලතී ලේන්සු දෙකක් නොනවත්වාම ලෙලවති. ඊට පිළිතුරු වශයෙන් දෑත් වනන නාලිකා හා සව්මන් කබලාන ද දෙසට නන්ද සිහිනෙන් ඇවිදින්නක ලෙස ගමන් කළා ය.

ඔවුන් දෙදෙනාම ඇලන්ට අත වනන්නේ ශෝකාකුල සිතින් නොව සොම්නස් සිතිනි. දෙතොල් අතරින් පිට නොවන සිනාවෙන් ඔවුන්ගේ මුහුණ එළිය වනු නන්ද දුටුවා ය. දියකඩනයෙහි ඈත කෙළවර අසළ වූ නැවට නැඟුණු ඇලන් හා මාලතී ඔවුන්ට පෙනෙන්නේ දුම් වලායෙහි පැටලී අතුරුදහන් වන පැල්ලම් දෙකක් ලෙසිනි.

''ලංකාවට ඇවිත් පදිංචි වන අදහසක් ඇලන්ට නැ''යි ආපසු හැරී ජැටියේ උඩ තට්ටුවට නඟින තිස්ස සෙමින් කීවේ ය.

මවගේ ශෝකය වැඩි වෙතියි සිතූ නාලිකා මෙසේ කීවා ය.

''ඇලන් අයියා ලංකාවට එනවාය කිව්වා.''

එය නාලිකා සිතාමතා කියූ බොරුවක් බව තිස්සට වැටහිණ. ඒ බොරුව අසා සන්තෝෂවූ තිස්ස නන්දගේ මුහුණ බැලුවේ ය. ආපද නමැති සිය දහස් පාදතලයන් හා ගැටීමෙන් ඇකිමැකී ගිය සලකුණු ඇති කාසියක් ලෙසිනි තිස්සට ඒ මුහුණ පෙනුණේ. බාහිර පරිසරයට අනුරූප නොවන කය මෙන් අධ්‍යාත්ම පරිසරයට

Scanned by CamScanner

අනුරූප නොවන සිත ද බිඳී විසිරෙයි. ඉබේ අලුත්වැඩියා වන යන්ත්‍රයක් මෙන් ජීවය සිත කය දෙකෙහි ඒ බිඳීම වළකයි. නන්දා ගේ සිත ඇතුළු පරිසරයට අනුව අලුත්වැඩියා වූවකි. ශෝකය මෙන් දුක ද කලකිරීම මෙන් අනාගතය ද පිළිබඳ හැඟීම් ද ඇගේ සිතින් අතුරුදහන් වී ය.

හුදී ජන ප්‍රසාදය උදෙසා කොග්ගල–මලලගම මාර්ටින් වික්‍රමසිංහ විසින් වර්තමාන සිංහල ජනවංශයෙන් බින්දු මාත්‍රයක් කියනු පිණිස ලියන ලද 'කලි යුගය' මෙයින් නිම වී ය.

Scanned by CamScanner